සුමිත්‍රා රාහුබද්ධ

සාන්දක් සේමා



1

පළවැනි වතාවෙ මේ දේම සිද්ද වෙනකොට මගේ වයස අවුරුදු දාහතයි. එතකොට හිටියෙ ලංකාවෙ. ඉස්කෝලෙ යන කාලෙ. ඒක තමයි මුල. ඒක විතරකුත් නෙවෙයි. තව හුඟක් දේවල්. මේ දෙවැනි වතාව. මම ඉන්නෙ නින්දෙන්ද අවදියෙන්ද කියලා දන්නෙ නැහැ. සිහි ඇත්තෙත් නැති නැත්තෙත් නැති අමුතු පාවෙන ගතියක්. හීනෙන්ද - හැබැහින්ද? සිහි නැති කරන්න ඇති. ඒත් සිහිය වළාකුලක් වගේ මගේ හිස වටේ කරකැවෙනවා. කතා කරන සද්ද ඇහෙනවා. කතා කරන්නෙ රහස්. වතුර සද්ද ඇහෙනවා. කුස්සියක වැඩ කරනවා වගේ සද්ද ඇහෙනවා. හැඳි, වළං, වීදුරු ගැටෙන සද්ද. ඒ සද්ද කොපමණ වෙලාවක් තිබුණද - කොපමණ වෙලාවකින් ඉවර වුණාද කියලා කාල රේඛාවකින් වෙන් කරගන්න තරම් හිත අවදියෙන් හිටියෙ නැහැ. ඒ සද්ද බද්ද ඉවර වුණහම මම හීනයක් දැක්කා. මීට කලින් හැඩහුරුකම් නොදන්න සතෙකුගේ මූණ කැරකිලා කැරකිලා, සුළියක් වගේ. හරියට මඩ සුළියක් වගේ මගේ ඉදිරිපිට. තවම් කරකැවෙනවා. ඒ මඩ සුළියට ලෝකෙම ගහගෙන ආවා. මම හීනෙත් එක්ක කතා කර කර හිටියා.

එයා මගේ දරුවා. ඉපදුණේ නැති දරුවා. එයා මගේ දරුවා කියලා මම දැනගෙන හිටියා. මූණ කට හොඳට වෙන් වෙලා හැදිලා වැඩිලා තිබුණා. පෙකණිවැල තාම මගේ දරුවට මට අල්ලලා දීලා තිබුණා. එයා මගේ දරුවා. අත්දෙක ගුලිකරගෙන නිසොල්මනේ ඉන්න බැරි බව එයාට ඉවෙන්

...තිබුණු බව පෙනුණා. වගේ දැනෙමින් එසවිලා ආරක්ෂාවක් හොයනවා ඇති. තුළම ඉහේම ඉහළට ... පෙනුණෙ නැහැ. මහා හුළඟක් මහා ගැහුවද විරිමද කියලා පෙනුණෙ නැහැ. මඩ සුළියක් එක්ක මගේ වෙනෙකින් දරුගැබ ඇතුළට ආවා. මඩ සුළියක් එක්ක. මගේ දරුවගේ මූණ අතපය සුළියට විරූප වෙලා යනවා. දරුවා ඒ දරුවගේ මූණ අතපය සුළියට විරූප වෙලා යනවා. දරුවා ඒ මහා හුළං කෝඩයට මූණ දෙන්න දැනගෙන හිටියෙ නැහැ. මාස ගණනාවක් උණුසුමට හිටපු ස්ථානෙකට මේ වගේ සුළිසුළඟක් එයි කියලා තේරුම් ගන්න දරුවට බැහැ. මඩ සුළියක් එක්කම දරුවා කැලි කැලිවලට කැඩිලා අවසානෙට මගේ කුස අත ඇරලා යනකොට මගේ එක දණහිසක් අනෙක් දණහිසේ වැදුණා. ඒ දරුවා යන බව කියන්න වෙන්න ඇති. අනේ අම්මා මාව බේරග න්න කියලා දරුවා කෑගහලා අඬනවා හීනෙන් වගේ ඇහුණා. මහා හුළඟක් කුස ඇතුළට විදපු උපකරණය මගේ දරුවව හොය හොයා දරුගැබ අනුමුල්ලක් නැර ගිය හැටි, මහා භූමිකම්පාවක මූල, අද වගේ මතකයි. මූණ අතපය සුළියට විරූපී වෙලා යනවා. ඇයි මට මෙහෙම කරන්නෙ කියලා දරුවා අහන්න ඇති. මගේ දරුවා ආදරය උණුසුම ආරක්ෂාව තිබුණාය කියලා හිතපු ඉහළම තැනක ඉඳගෙන ඒ මහ සුළි සුළඟට අහු නොවෙන්න අප්‍රමාණ වෙහෙසක් ගන්න ඇති. මගේ දරුවා බඩෙන් එළියට ඇදලා ඔතකල් මම සිහි ඇති නැති මැද්දෙ නිදියගෙන හිටියා. ඒ වෙලාවෙ දැනුණෙ දුකක්ද? කලකිරීමක්ද? වේදනාවක්ද? දරුවා ඇදලා එළියට විසි කළේ. දරුවාගේ කැලි කැලි භාජනයකට එකතු කළේ සතුටක්, සොම්නසක්, නිදහසක් ලබන්නද? ආයෙ කවදාවත් ඒ වගේ දුකක් දැනෙන්න එපා කියලා හිතුවට මුළු සංසාරෙටම ඒ දුක ගෙනියන බව දැනුණා. මට හැඟීම්, දැනීම් දැනුණෙ හිතට විතරයි. ශාරීරික වේදනාව සඳහටම නොවෙයි. හිතට දැනුණු. හිත අතහැර නොයන දුක සඳහටමයි. හිත මුළු ශරීරය පුරා දුවමින් හිටියා.

මගේ දරුවා ශාරීරිකව වින්දා. උපදින්නත් කලින්ම දරුවා, මමයි. දරුවගේ ජීව විද්‍යාත්මක පියායි කළ වරදට දඬුවම් වින්දා. මාස තුනකට ... ... වැඩෙමින් හිටියා. දෙස්තර ... ...

උපදින්න දින දීලා තිබුණෙ මැයි පස් වැනිදට. ජපානයේ ළමා දිනය. ඔක්තෝබර් දහනව වැනිදා ඒ මහා සුළි සුළඟ ආවෙ, විශේෂම මත් පැහැළොවක්. රුපියල්වලින් නම් ලක්ෂ විස්සකට ... සෝරා සාන් දැනගෙන හිටියා මගේ දරුවා මගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයගෙ නොවෙයි කියලා. ඒත් මගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා හැටියට දරුවා අස්කරලා දාන්න මගේ මහත්තයා අත්සන් කළ යුතු වුණා. මුද්‍රාව තැබුවා. නීත්‍යානුකූල ස්වාමිපුරුෂයෙකුගේ බල මුද්‍රාව මට සේලයින් දීදී බොහෝ නැති කරන්න ගෙනිච්චා. වෙන මිනිහෙකුගෙ දරුවෙක් අස්කරලා දාන්න තව මිනිහෙකුගේ නීත්‍යානුකූල මුද්‍රාව තැබුවා.

කලලයේ සැබෑ පියා සුමල්. සුමල් දැනගෙන හිටියා ඒ සුළිසුළඟ හමා එන බව. තමන් තැන්පත් කළ කලලය බේරගන්න සුමල් උදව් කළේ නැහැ. මටයි කියලා ගැනියෙක් අත්දැදී මං කරගත්තු දෙයක් කියලා සුමල් පසුතැවිලි වෙන්න පටන් ගත්තා. මම තනියම දරුවා බේරගන්න හැදුවට කාගෙවත් දරුවෙක් මගේ කුස තුළ ... ... වෙනවා දකින්න මගේ මහත්තයා කැමති වුණෙ නැහැ. ... මමයි කරපු වරදට දඬුවම් වින්දෙ නූපන්න දරුවෙකුයි, උපන්න දරුවෙකුයි අහක ඉන්න මිනිහෙකුයි. උපන්න දරුවා මගේ ස්වාමිපුරුෂයගෙ දරුවා. සෝරා සාන් මං වෙනුවෙන් දුක් වින්දා. නිශාවල මට හම්බ වෙච්ච සෝරා සාන් වගේ කෙනෙක් මට කොහේදිවත් මුණ නොගැහෙයි. සෝරා සාන් මගේ කුස තුළ වැඩෙමින් හිටිය දරුවා බේරගන්න ක්‍රමයක් හෙව්වා. දරුවො දෙන්නත් එක්ක මට නිශාවල එහෙම නැත්නම් ටෝකියෝවල, කෝබෙවල, හකගයාවල හරි ඔසකාවල හරි ඉන්න සුළුවත් ක්‍රමයක් හදලා දෙන්න. සෝරා සාන්ගෙ වයස හැට පහයි. මසායා සාන්ගේ වයසෙම හරි, ඊට වැඩි හරි, අඩු හරි ජපන් මිනිහෙක් වගකීම භාර ගන්න කැමති වෙනවා නම් අවස්ථාවෙ හැටියට මසායා සාන් ගැන දෙපාරක් හිතන්නෙ නැතුව තීරණයක් ගන්න කියලා සෝරා සාන් කියා සිටියා. මසායා සාන් එක විදිහකටවත් සෝරා සාන් තව මිනිහෙකටවත් හිත්වලින් දහ දුකක් වින්දා. ඒත් සුමල් තරදර ...

ජවයකුත් එක්ක. අවුරුදු හැට... වයස තිහත් අද්දර හිටපු ඉලන්දාරියෙක් එක්ක ඔට්ටු වෙන්න. මසායා සාන් එළිපිට ආදරය පෙන්නන්න ලැජ්ජ වෙන ජාතියෙ නියම ජපන් ජාතික ස්වාමිපුරුෂයෙක්. සුමල් උස මහත මිනිහා. සුමල්ට කණ්ඩායමක් හිටියා. තරුණ ජවය උන් හැමෝටම තිබුණා. එකට යනවා උස් හඬින් හිනාවෙනවා. සුමල් වගේම කණ්ඩායමත් කැපිලා පෙනුණා. වීසා නැතුව ඉන්නකොට තිබිය යුතු හික්මීම සුමල්ට තිබුණෙ නැහැ. මසායා සාන් හික්මීම පුරුදු පුහුණු කරපු මගේ ස්වාමිපුරුෂයා.

'සුමල් මගෙ විතරක් නෙවෙයි, ඒ ඔයාගෙත් ළමයා'

වීසා නැති අවදානමේ ඉන්න සුමල් හොයාගෙන ගිහින් මම කිව්වා. ඒ බඩ හේදුවට පස්සෙ. දරුවගෙ තාත්තාට දරුදුක දැනෙන්නෙ නැද්ද? සුමල් කිව්වෙ මට කරන්න දෙයක් නෑ කියලා. ඇයි මාව ප්‍රවේසම් නොකළෙ? මසායා සාන් ගෙ කුස්සියෙ උයපු බත්පත ගෙනත් මං ඔයාගෙ බඩගින්න නිව්වා. මසායා සාන්ගෙ භාර්යාව ඔයාව බලන්න ආවෙ ලංකාවෙන් ඇවිත් වීසා නැතුව අතරමං වෙච්ච තරුණයෙකුට පිහිට වෙන්න. බඩගින්නට බත්කටක් දෙන්න. සීතලට කබායක් දෙන්න. සිංහල ගීත ටිකක් කොපි කරලා දෙන්න. නීගතාවල හිම ගැන කියලා දෙන්න. නීගතා ගැන කියලා දෙන්න. වීසා නැතුව එන කොයි කවුරුවත් ඒ රටේ පිහිටීම හරි, පරිසරය හරි, සංස්කෘතිය හරි හොයන්නෙ වීසා නැතුව රස්සාවක් කරගෙන යාමේ අවශ්‍යතාවට ඒ දැනගැනීමෙන් පිටිවහලක් ලැබෙනවා නම් විතරයි. නීගතාවලට ඇවිත් ජපානය දකින්න කියලා කියමනක් තියෙන බව සුමල්ට කිව්වහම සුමල් කිව්වේ නරිටා ගුවන්තොටුපලේ ඉඳලම ජපානය දැක්කා කියලා. මහ විස්මයජනක රන්වන් පැහැයකින් සිදු කෙරෙන ඉර සේවයයි. හිම පතිත වෙච්ච කඳු මුදුන්වල අලංකාරයයි බලන්න කියලා සුමල්ට බල කළාම සුමල් ඇහුවා ඒ කඳුමුදුන්වල කොහේහරි හැංගිලා කරන්න ... රස්සාවක් තියෙනවද ...

කිව්වා. එයා කුස තුළ වැඩෙමින් සිටියදීම ඝාතනය කළ මගේ දරුවගේ පියා නිසා අහක බලාගෙන ඉන්න හිත දුන්නෙ නැහැ. කුස පුරවන්නත් හිත පුරවන්නත් බැහැයි කියන්න අමාරු වුණා. සුමල්ගෙ පිලිපීන ආලයේ ස්වාමිපුරුෂයා සුමල්ව පොලිසියට කොටු කරලා දෙනකල් සුමල් නීගතාවල කුලියක් මලියක් කළා.

වීසා නැතුව එන එක අවදානම් වැඩක් තමයි. මම ආවෙ වීසා ඇතුව. දැන් නම් අම්මයි තාත්තයි මල්ලියි තුන්දෙනාම මැරිලා. මල්ලි මැරුණෙ එල්ලිලා. අම්මයි තාත්තයි මැරුණෙ කසුම් බඩේ ඉන්දැද්දි. අම්මයි - තාත්තයි නාමමාත්‍රව දැනගෙන හිටියා නීගතා කියලා නගරයක් ජපානයේ තිබෙන බව. හොන්ෂු දූපතේ වුබු පළාතෙ ඒ නගරය තියෙන බව කිව්වට අම්මා තාත්තා ඒවා තේරුම් ගන්නෙ කොහොමද. ජපානය හරියටම කොහෙ තියෙනවද කියන එක තේරුම් ගන්න බැරුව. හිනැහේවී බෝනික්කා ඇස් නටවා බල බලා කියලා අම්මා කවදාහරි මාව තලවලා තිබුණා නම් අම්මට ජපන් රටේ බෝනික්කො මතක් වෙන්න තිබුණා. මං ඉමාන බෝනික්කෙද්ද? එක අතකට බෝනික්කෙකුත් තමයි. කැමිලියා ගස් ගැන, ටියුලිප් මල් ගැන අම්මට තාත්තාට කියන්න තිබුණා නම් හොඳයි. ජපානයේ දිගම ගඟ ෂිනානෝ ගංගාවෙ මෝයකට තියෙන්නෙත් නීගතාවල කියලා තාත්තට කිව්වා නම් තාත්තා මහවැලි ගඟයි, ෂිනානෝ ගඟයි, එක ගඟක් කරගෙන හීන බලන්න ඉඩ තිබුණා. මහ සෙනගක් දිනපතා එහා මෙහා යන නගරයක් තාත්තයි අම්මයි හිතේ මවා ගෙන ඉන්න ඇති. අතුරු සිදුරු නැතුව එහා මෙහා යන මිනිස්සු, ගෑනු. ළමයි. ඒත් නීගතා කියන්නේ ඊට වෙනස් නගරයක්. කෘෂිකර්මය, ධීවර කර්මාන්තය ජයට කෙරෙන සන්සුන් නගරයක් නීගතා කියන්නෙ. මසායා සාන් නම් ඔය කිසිදෙයක් දන්නෙ නෑ වගේ ඉන්නවා. සෝරා සාන් තමයි නීගතා ගැන කියන්නෙ. හොකයිඩෝ දූපත හාල් නිෂ්පාදනයෙන් පළමු වැනි තැන ගන්න බවයි, නීගතා දෙවැනි ... බවයි කිව්වේ සෝරා සාන්. ජපානයේ හොඳම

හදන්නෙ නිගතාවල. අම්මා ඒ දවස්වල [illegible] සුදුඇලි හාල තමයි හාල කියලා. සතෙ හදන්නෙත් නිගතාවෙ. සෝරා සාන් සතෙ ගැන කතා කළේ ශීනියට ගිහා වෙට්. සෝරා සාන් ඇඳපු විත්‍රයකුයි, නිගතාවල විත්‍රයකුයි ගත්තොත් දෙකම පණපිටින් වගේ පේනවා කියලා මං සෝරා සාන්ට කිව්වම සෝරා සාන් අතින් කට වහගෙන හිනාවුණා. රත්මල්, ලිලිමල්, ටියුලිප් මල් ඉච්චි යායක් දිහා බලලා සෝරා සාන්ගේ විත්‍රයක් දිහා බලන කොට කොයි එක ඇත්තද කොයි එක විත්‍රයද කියලා හිතන්න බැරි තරමට සෝරා සාන්ගෙ විත්‍ර ජීවමානයි. සෝරා සාන් ජපානයෙ සිතියම පෙන්නලා කිව්වේ නිගතා කියන්නෙ ජපානය ඇතුළෙ ජපානයක් කියලා. හරියට ගෙයක සැලැස්ම වගේ කිව්වා. ජපානයේ සිතියම ඇතුළෙ තියෙන පුංචි ජපානයක් වගේ නිගතාව ජපානයේ අනුරුවක් වගේ පේනවා කියලා සෝරා සාන් කියන කොට සෝරා සාන්ගේ මහත්තයා හරාද ළඟට ඇවිත් බලාගෙන ඉන්නෙ නිගතාවෙ පිහිටීම මං තරම්වත් නොදන්න විජාතිකයෙක් වගෙයි.

නිගතාවට පාර පෙන්නුවෙ ප්‍රේමදාස මහත්තයා. ඒතකොට ප්‍රේමදාස මහත්තයා අගමැති. බත්තරමුල්ල කොස්වත්ත හන්දියෙදි කතරගම රුම්තිය ගැන, ප්‍රේමලතා මහම්පේරි සහෝදරිය ගැන කියනකොට රැස්කතා හිටපු සෙනග නිසොල්මන් වුණා. ඇලඩින් මාමට කරාබු දෙක දීලා 'මාමේ මේ කරාබු දෙක අම්මට සිහින් දෙන්න' කියලා කිව්වෙ වෙඩිවැදිලා ශරීරෙ බාගෙක පණයමින් තියෙද්දි. ප්‍රේමදාස මහත්තයා කිව්වා ත්‍රස්තවාදය මුලිනුපුටා දමන්න තමුන්ට කතිරය ගහන්න කියලා. කොළපාට තැප් තොප්පිය දාලා. කොළ පාට අත්කොට කමිසය ඇඳලා. සුදු සරමක්ද, ජාතික ඇඳුමෙ යට කෑල්ලද කියන්න බැරි සුදු රෙද්දක් ඇඳලා හිටපු ප්‍රේමදාස මහත්තයා මහම්පේරි සහෝදරී ගැන උද්වේගකර කතාව කියනකොට අඩියක් උස්සලා ආයෙම අඩිය පොළවෙ තිබ්බා. තාත්තා කිව්වෙ ප්‍රේමදාස මහත්තයා හැම ඡන්දෙකටම මහම්පේරිව [illegible] වැදිලා තියෙ[illegible]

සන්දර්ශනය බලන්න ඉන්නවද කියලා. ජයනාථ කුටු කුටු ගානවා දැකලා රැස්වීම බලන්න ආපු අම්මයි, අක්කම්මයි රවලා බැලුවා. අවුරුදු පහළොවක පෝනියන්දූ එක්ක තරුණ කොළු ගැටයෙක් කුටු කුටු ගානවා දකින හැත්තෑවෙ දශකයෙ මුල් භාගයෙ අම්මා කෙනෙකුයි, අසූවෙ දශකයෙ අග භාගයෙ අම්මා කෙනෙකුයි අතරෙ ලොකු වෙනසක් තියෙනවා තමයි. මං ඉඟිබිඟි වලින් කිව්වා සංගීතෙට ඉන්නෙ නෑ කියලා. ප්‍රේමදාස මහත්තයා කිව්වා උස්පහත් බේදයක් නැති සමාජයක් ගොඩනගනවා කියලා. ඇති නැති බේදය නැති කරනවා කිව්වා. නැති බැරි අය ඇති හැකි අය කරනවා කිව්වා. සංගීතෙ බලන්න ඉන්නවද ඇතුළෙ ඇති හැකි අයෙක්. අපි නැති බැරි අය. ඇති හැකි අයෙක් කසාද බැඳගෙන නැති බැරි කෙනෙකුගෙ ජීවිතේ මල් යහනාවක් කරගන්න පුළුවන් කියන හීනෙට හුම්ටි තියන්න අශෝකමාලා සාලියත් එක්ක ඉස්සරහට දුවගෙන ආවා. ප්‍රේමදාස මහත්තයා ගැන පුරසාරම් කියන මාමයි, ඒ පුරසාරම්වලට විරෝධය පාන අපේ තාත්තයි හින්දා ප්‍රේමදාස මහත්තයත් ඉඟිමගක් දිගේ [illegible] තේරුම් ගන්න මට පුළුවන් වුණා. ඒ [illegible] ඇවිල්ලා හිටියෙ.

නැති බැරි අවුරුදු පහළොවෙ පෙම්වතියයි, ඇති හැකි විසිපහේ පෙම්වතායි ප්‍රේමදාස මහත්තයාගෙ කොස්වත්තෙ රැස්වීමෙන් පස්සෙ හොර හොරෙන් මුණ ගැහෙන්න පටන් ගත්තා. පෙම්වත් යුවල හොරෙන් මුණ ගැහෙන කතාව තාත්තගෙ කණේ තියලා තිබුණෙ තාත්තාගෙ ඉස්සෙල්ලා කසාදෙ පවුල. අපේ අම්මගෙයි, තාත්තාගෙයි තිබුණ සමගිය තමයි අපේ සතුට. තාත්තා අසනීප වෙලා ඉන්න කොට කලින් කසාදෙ පවුල හෝර්ලික්ස් බෝතලයක් අරගෙන එනවා තාත්තාව බලලා යන්න. තාත්තා කලින් කසාදෙට කිව්වෙ ලොකු ප්‍රේමා කියලා. අපේ අම්මට කිව්වෙ පොඩි ප්‍රේමා කියලා. දෙන්නම ප්‍රේමලා වෙච්ච එකෙත් දෛවයක් ලියවිලා තියෙන්න ඇති. තාත්තා පොඩි ප්‍රේමාව කසාද බැඳලා නෑ කියලා මට කිව්වෙ අපේ අක්කා චන්දනා. තාත්තා පොඩි ප්‍රේමව බැඳලා නැති හින්දා චන්දනා [illegible]මයි, රංගන මල්ලියි අවජාතකයන් වෙනවා කියලා

ලොකු ප්‍රේමා ලෙඩ බලන්න ආවට කෙලම් කතේ නැහැ. ලොකු ප්‍රේමගෙ පවුල ගැන ඇහැ ගහගෙන හිටියට නිබඩට, පොඩි ප්‍රේමගෙ පවුලෙ සමගි සමාදනයයි, සවි ශක්තියයි හොඳට තිබුණා. තාත්තා සතොසෙ වෘත්තිය සමිති ලේකම් වෙන්නෙ නෙවෙයි. රතු පාට කමිසෙ ඇඳගෙ නිකම්ම බලාගෙන ඉඳලා. උගුර ලේ රහ න, රතුපාට ලේන්සුව කරේ ගැටගහගෙන ඉඳලා. තේ කහට වලින්ම මුළු දවසම වෙනකල් රතු සටන්පාඨ කියලා. රටේ ඕන අහුමුල්ලක භාවිතා වෙන ආණ්ඩුවේ නීතිරීති ගෙවලා. සතොසෙ වැඩ කරන ගැන හොඳ දැනුමක් තාත්තාට තිබුණා. සතොසෙ ගමන්ම තාත්තා පදිකවේදිකාවෙ රට ඉඳි විකිණුවෙ, සතොසෙ පඩියෙන් පවුල් දෙකක් ජීවත් කරවන එක ලේසිපාසු නොවෙන හින්දා වෙන්නැති. ලොකු ප්‍රේමා තාත්තගෙ පඩි දවස වැරැද්දුවෙ නැහැ. ලොකු ප්‍රේමාට ළමයි තුන්දෙනයි. සුදේව, සුනීත, සුජාතා ඒ තුන්දෙනා. තාත්තා අපේ උප්පැන්නවලටත් එක මල් රේණුවක මදි පුංචිකමක් කළේ නැහැ. මව්පියන් විවාහකයි කියලා උප්පැන්නෙ ලියලා තිබුණෙ කසාද බැඳලාද යන වග කියන ප්‍රශ්නයටයි. විවාහයක් වුණත් නූනත් ඒ අම්මාගෙන දරුවා මක්කරන්නද කියලා අම්මා කෙනෙකුට අහන්න පුළුවන් නම් අප්‍රමාණ වෙනසක් සිද්ධ වෙයි. අපේ පවුලෙ එක එක අය එක එක විදිහට දුක් වින්දා. අපේ අම්මයි - තාත්තයි කසාද බැන්දෙ ළමයි තුන්දෙනාම ලොකුමහත් වුණාට පස්සෙ. චන්දනක්කා තමයි කිව්වෙ අම්මටයි තාත්තටයි කසාද බඳින්න කියලා.

'තාත්තා ගෑනු දෙන්නෙක් ගත්තා කියලා හැමෝම අපට හිනාවෙනවා. තාත්තා අම්මව කසාද බැඳලත් නැහැල්නු. කසාද බඳින්න කියන්න ඇන්වත්'

'ඒ මිනිහා ගෑනු තුන්දෙනෙක් ගත්තත් මට කාරියක් නැත්නම් උඹට මොකද?' අම්මා චන්දනා අක්කට ඉගුරන්න ගත්තා.

'අම්මා ... නැති ...

චන්දනක්කා හරිහරියට ගතු කිව්වා. ලොකු ප්‍රේමා දික්කසාදෙ දෙන්නෙ නෑ, මං මිනිහව දෙන්නෙ නෑ කියලා අම්මා අවසානෙට කිව්වා. තාත්තා අම්මව කසාද බැන්දෙ ලොකු ප්‍රේමා මැරුණාට පස්සෙ. මළගම කළේ අපේ ගෙදර. තාත්තා කිව්වා ආතක්පාතක් නැතුව වළ දාන්න දෙන්න බෑ දවසක් හරි එක පැදුරෙ බුදියගත්තු ගෑනිව කියලා. අම්මා තාත්තට නැහෙන්න මොන මොනවද කුටුකුටු ගෑවා. ඒවා කාටවත් ඇහුණෙවත් තේරුණෙවත් නැහැ. ලොකු ප්‍රේමා මැරුණෙ හිටිහැටියෙම. අම්මා කිව්වා යකෙක්වත් ගහන්න ඇති කියලා. තාත්තා කිව්වෙ ඒ ගෑනු මනුස්සයා ලෙඩ හංගගෙන ඉඳලනෙ කියලා. මිනිය ගෙදරට ගෙනාපු වෙලාවෙ තාත්තගෙ ඇස්වල හැංගිච්ච තෙතමනයක් තිබුණා. අම්මා නම් කඳුළු හලලා ඇඬුවා. කවදාවත් අපට තුං නොදකින් කිව්වෙ නෑ කිව්වා.

පොඩි ප්‍රේමා, ලොකු ප්‍රේමාගෙ ඔහු අද්දර තිවෙන්න යන පාතට පොල්තෙල් දාලා, පහනෙන් ඇල්ල හරිගස්සලා අනේ ගෑවුනු පොල්තෙල් ටික ඔලුවෙ පිහදමා ගන්නවා. සුජාතා, ලොකු ප්‍රේමාගෙ ලොකු දූව සුජාතා මිනිය ළඟ හිටගෙන මිනියට පවන් සලමින් ඉන්නවා. ලොකු ප්‍රේමාගෙ පුත්තු දෙන්නා සුදේවයි, සුනීතයි ගස් ගොබ්බයො වගේ ඔහේ බලාගෙන ඉන්නවා. සුනීත තාත්තා වගේ හැඩිදැඩියි. සුදේව තෝන්පල් පාටයි. සුදේව හිටියෙ කකුල් ඇඟට ඇලෙන කලිසමක් ඇඳලා. හැට්ටයක් වගේ කමිසයක් ඇඳලා. සුනීත හිටියෙ සරමක් ඇඳලා. සුනීතට තාත්තා කියන්නෙ රූබට් කියලා. 'රූබට් උඹ ඔතන හිටි පිළිමෙ වගේ ඉන්නෙ නැතුව කනත්ත පැත්තට ගිහින් බලලා වරෙන්, කියලා තාත්තා කිව්වම රූබට් ඇස්ගෙඩි දෙක කරකවලා තාත්තා දිහා බැලුවා. රූබට්ගෙ අත්ගොබ ලොකු කෙසෙල් ගොබයක් තරමට වැඩිලා ඉලිප්පිලා තිබුණා. ඇස් ගෙඩි දෙකේ මද රතක් තිබුණා. ඊට්ටක් ගොඩකරලා පස් පුරවලා ඔපමට්ටම් කරපු පර්චස් තිහහතලිහක ඉඩමෙ අපේ ගේ හදලා තිබුණෙ. ... පස් ඇම්මත් ඔව්වෙ ...

ගත්තා. වත්ත පහළ නැමවෙලාවෙම දිය [illegible] ඒ දිය සීරාවෙ කොහිල වැවුවා. අපේ ගෙදර පල දෙකට හදලා තිබුණෙ. එක පැත්තේ දිගටම කාමර තුනක් තිබුණා. අනික් පැත්තේ සාලෙයි කුස්සියයි. කක්කුස්සිය තිබුණේ වත්ත පහළට වෙන්න. ඕවා හින්දා වල නිතරම වතුරෙන් පිරිලා තිබුණා. අපි නැගෙම්ම කක්කුස්සියට ගියේ මැස්සො එළවන බෝවිට්ටියා අත්තකුයි, ඇඟපත හෝදගන්න වතුර බාල්දියකුයි අරගෙන. සාලෙ හොඳට අස්පස් කළේ අම්මා. චන්ද්‍රකාන්තා නම් කාමරේට වෙලා දොර වහගෙන හිටියා. චන්ද්‍රකාන්තා අම්මගෙන් ඇහුවා තාත්තාට තව ගැහැනුන්ගෙ මිනී ගේන්න තියෙනවද දන්නෙ නෑ කියලා. රංගන මල්ලී නම් හිටියෙ වගේ වගක් නැතුව.

'ඉණකෙරුනක් කියවනවද?' අම්මා තාත්තා කාමරේ තනිවෙච්ච වෙලාවක් බලලා ඇහුවා.

'පියදාස ලැස්තිවෙලා [illegible] කතාවක් පවත්තනන්න
මගෙ හිතේ'

තාත්තා කිව්වෙ වගකට නැතුව. පොඩි ප්‍රේමා මං වුණා නම් නන්දනරත්න ගස් බඳිනවා කියලා චන්ද්‍රකාන්තා කිව්වා. නන්දනරත්න කිව්වෙ අපේ තාත්තා. සාලෙ මැද ලොකු ප්‍රේමා ගාන්තදාන්තව වැතිරී සිටියා. ලොකුමල් වැටිච්ච සුදු සාරියක් ඇඳලා, මේස්දමාපු අත්දෙක පපුවයි බඩයි අතරෙ තියාගෙන. මේස් දමපු කකුල් දෙක ළං කරලා තියාගෙන භාවනාවක යෙදිලා ඉන්නවා වගේ. පුයරු ඇර වෙන කිසිදෙයක් නොගාපු ලොකු ප්‍රේමාගේ මූණෙ රෝස පුයරු තවරලා තිබුණෙ සුජාතාද, එම්බාම්කාරයොද කියලා කියන්න බෑ. එතකොටත් තාත්තගෙ කසාද බිරිඳ ලොකු ප්‍රේමා හින්දා තාත්තට සහොයෙ මරණාධාර සමිතියෙන් මළගමේ කටයුතු කරන්න මුදලක් ලැබුණා. සහොයෙ ශෝකය ප්‍රකාශ කරපු ලොකු බැනර් එකකුත් එල්ලුවා ලොරියකින් ඇවිත්. මළගෙදරට [illegible] ඒ ආවෙ [illegible]

ඇඳගත්තු ගමේ සේනාව ඇවිදින් අම්මටයි, තාත්තටයි ආචාර කරමින් ලොකු ප්‍රේමාගෙ මූණට එබිලා බැලුවා.

පියදාස ගුණ කථනය කිරීමෙන් නවත්තගන්න කාටවත් බැරි වුණා. මළගෙදර පිළිකන්නෙන් ලැබෙන රතමේර ඉඩුස් ගාලා උගුරට හලාගෙන, කට දෙපැත්ත පිටි අල්ලෙන් පිහදාගෙන ඇවිත් ගුණ කථනය නොකර ඉන්න එක හරිහමන් වැඩක් නොවෙයි කියලා පියදාසට හිතෙන්න ඇති. පියදාස ගුණ කථන කතාවේදී තාත්තාගෙ ගුණ ගායනා කළා. ලොකු ප්‍රේමාගෙ මිනිය ගෙදරට ගෙනාපු එක ගැන ස්තුති කළා. පොඩි ප්‍රේමටයි ගරු නම්බු සියල්ලම. පොඩි ප්‍රේමා උත්තම කාන්තාවක් බව කියලා පියදාස ටික වෙලාවක් නිශ්ශබ්දව හිටියා. සභාව මීයට පිම්බා වගේ. අම්මා නම් පස්සෙ දවසක කිව්වේ පියදාසගෙ නාඩගම් කතා කියලා. ලොකු ප්‍රේමගෙ මරණය නුගාක් දේවල් වෙනස් කළා. සුජාතා අපේ ගෙදර නැවතුණා. [illegible] කියලා. සුජාතා [illegible] නැහැ. අම්මා සුජාතාට බත් බෙදුවේ අන්තිමට. උඹ ලොකුයිනෙ සුජාතා කියලා අම්මා කියනකොට ඇත්ත තමයි කියන හැඟීමෙන් වගේ සුජාතා හිනාවුණා. සුජාතා කොහිල පාත්තිය හොඳට හැදුවා. මදවිය ඇටයි, මලිඳ ඇටයි අහුලගෙන ඇවිත් බිත්ති සැරසිලි හැදුවා. උයන්න පිහන්න අම්මට උදව් වුණා. චන්ද්‍රකාන්තා සුජාතාත්තට කතා කළේ නැහැ.

'දැන් ඉතින් ලොකු ප්‍රේමා මැරිච්ච එකේ තාත්තට අම්මව
කසාද බඳින්න පුළුවන්නෙ' කියලා චන්ද්‍රකාන්තා
අම්මට උස් ස්වරයෙන් කිව්වා.

'අනේ අම්මපා චන්ද්‍රෙනෝ මේ කසාදෙ අත්සන් කරන්න
උඹට තියෙන රුදාව මොකද්ද?' කියලා අම්මා ඇහුවා.

[illegible] ආණ්ඩුව පවුල්පිටින් බන්දන්නෙ එක විත නන්දනෙ'

'මෙච්චර කල් පවුල් කෑවා ඔය විකාර අත්සත් නොගැහැව්වට. ඕව මළ සමයන් බං.'

'මළ සමයන් කියන්නෙ කසාද නොබැඳ පවුල් කනවට'

අම්මා ගිනිකනා වැටුණා වගේ බලා හිටියා. ඒ කතාව තාත්තා ඇනගත්තා නම් චන්ද්‍රනක්කව ගෙදරින් එළියට ඇදලා දානවා. කොහොමටත් කවදාවත් තාත්තා අම්මගෙ හිත රිද්දුවෙ නෑ. අන්තිමට චන්ද්‍රා අක්කගෙ යෝජනාව තාත්තට ඉදිරිපත් කළේ අම්මා. කල්යල් බලලා.

'දැන් කසාද නොබැන්දැයි කියලා කවදාවත් මං උඹලව දාලා යනවයැ'

'ඔය අපේ ළමයින්ටත් හොඳයිනේ'

'උන්ගෙ උප්පැන්නවල [illegible] නැහැනෙ'

'ළමයින්ට ඕන කියන්නෙ'

'කාටද චන්ද්‍රාටද නූපාටද?'

'නූපා නම් මොකවත් කිව්වෙ නෑ'

'රංගනද?'

'කෝකටත් හොඳයිනෙ'

'මට නම් ඕවට ඕන මොකද වගේ'

'චන්ද්‍රා ලෑස්ති කරන්නම් කියන්නෙ'

[illegible]

'ඔකිව දෙන්න ඉස්සෙල්ලා සුජාතව දීලා දාන්ඩ එපෑ'

'මෙයාට තියෙන කලබලේ සුජාතට නැහැනෙ'

අම්මයි - තාත්තයි කසාද බැන්දා ලොකු ප්‍රේමාගෙ තුන්මාසෙ දානෙ දීලා ඉවර වුණාට පස්සෙ. ගමේ ගෑනු මිනිස්සු අම්මගෙ ගුණයහපත්කම ගැන දිගින් දිගටම කතා කරන්න ගත්තෙ ලොකු ප්‍රේමගෙ මළගමේ කටයුතුයි, ආදාහන කටයුතුයි අම්මා කර ගහගෙන කළ නිසාද? ලොකු ප්‍රේමාත් හොඳ ගෑනි තමයි. ඒත් ඔහොම බඩබැඳගෙන කරන්නෙ තරහව නැතුව නොවෙයිනෙ. තාත්තා එක්ක නොකිව්වට, තාත්තා නැතිවෙලාවට අම්මා කියන කතා දන්නෙ අපිනෙ. අම්මා ලොකු ප්‍රේමාගෙ චරිත පාරිශුද්ධිය ගැන නොයෙක් නොයෙක් කතා කිව්වා. තාත්තා ලොකු ප්‍රේමාව අත ඇරලා තියෙන්නෙ ඔය චරිත පාරිශුද්ධියෙ දෝෂ හින්දලු. ඒත් ඉතින් සුජාතා කිව්වෙ වෙන කෙනෙක්. ලොකු ප්‍රේමයි, සුජාතලයි අතෑරලා දාලා තාත්තා අතුරුදහන් වුණාලු. සතොසෙට ගිහින් ගේට්ටුව ළඟ මුරකරගෙන ඉඳලා තමයි ලොකු ප්‍රේමා තාත්තාව අල්ලගෙන තියෙන්නෙ. රුබට් කිව්වලු කවදාහරි දවසක තාත්තාගෙන් පලිගන්නවා කියලා. රුබට්ගෙ මූණෙ තියෙන්නෙ නහරවැල් ඉලිප්පෙන තරහක් තමයි. රංගනත්, රුබට් වගේමයි හැඩරුව. බඩවල් දෙකක හැදුණත් එක ලේ හින්දා එහෙම වෙන්නැති.

සුජාතා ඇත්දෙ දිග සායයි, කොට හැට්ටෙයි. දිග කොණ්ඩෙ ගොතලා ගුලියක් වෙන්න බාගයක් දුරට නවාගෙන තිබුණා. සුජාතා ඇවිදින තාලෙට කොණ්ඩෙ කරල එහාට මෙහාට වැනුණා. මූණ ලොකු ප්‍රේමාගේ වගේ. හරි තියුණුයි මූණට. අම්මා සුජාතාට කුස්සියෙ වැඩ රාජකාරියි. මිදුලේ වැලිල්ලයි භාර කළා.

[illegible]

වෙලා හිටියේ සුජාතා හින්දා. සුජාතා කසාදෙකට කතා කළේ නැහැ. මූණ දිහා බලාගෙන හිටියා විතරයි. සුජාතා ඉස්කෝලෙ ගමන නවත්තලා තියෙන්නෙ නවයෙ පන්තියෙදී. ගියත් වැඩක් නැති එකේ නොගිහින් ඉඳපන් කියලා ලොකු ප්‍රේමා අවවාද කළා කියලා සුජාතා කිව්වා.

'තාත්තා ඔයාලට ලස්සන නම් දාලා' සුජාතා මගේ කොණ්ඩෙ පීරන ගමන් කිව්වා.

'අනේ මම නම් ආස නෑ' කියලා මං කිව්වෙ ආසා නැති හින්දා නෙවෙයි. සුජාතක්කා හිත රිද්දව ගැනීම මට හිතට දුකක් හින්දා.

'නුපා කියන්නෙ හරි ලස්සන නමක්නෙ. කොහෙන්ද දන්නෑ තාත්තා ඒවා හොයාගත්තෙ'

'සුජාතාත් ලස්සනයි'

'ඒක හරි පරණ නමක්'

සුජාතා ඔය කියන්නෙ නම ගැන විතරක් නෙවෙයි. තාත්තා සුජාතලට වැඩිය අපිට සලකනවා කියන කතාවත්, ඒ කතාවෙ හැංගිලා තියෙනවා. කසාද දෙකක් තියෙන මිනිහෙකුගෙ හරි, ගෑනු දෙන්නෙකුට ආලය කරන මිනිහෙකුගෙ හරි හිත වැඩ කරන්නෙ කොහොමද කියලා කාටවත් තේරුම් ගන්න අමාරුයි. කවදාවත් පිරිමියෙක් ඒ ගැන සහසුද්දෙන් කතා කරන්නෙත් නෑ. කසාද දෙකක් තියෙන මිනිහා හරි, ගෑනු දෙන්නෙකුට ආලය කරන මිනිහා හරි තමන්ගේ හෘදසාක්ෂියෙන් බේරෙන්න කටයුතු කරනවා ඇති. ගෑනු දෙන්නගෙන් එක ගෑනියෙකුට වැඩිපුර ආලය කරන්නෙ කවර කාරණාවකටද කියන එක දැනගන්න ගෑනු දෙන්නම කැමති වුණත් පිරිමියෙක් කවදාවත් ඒ කාරණාව ගැන ඇත්තක් [illegible]

ගෙදර ආවම තේ ටික, කන්න බොන්න ටික හදලා දුන්නා. හැබැයි කතාබහ කළේ නැහැ. තාත්තා ලොකු ප්‍රේමා එක්ක කතා කරන කොට අම්මා මග ඇරලා හිටියා. අම්මගෙ මූණට මහ අවලස්සනක් කාන්දු වෙන්නේ ලොකු ප්‍රේමායි, තාත්තායි කතා කරන වේලාවට. තාත්තයි ලොකු ප්‍රේමයි කතා කළේ සුජාතලා ගැන. ඒ ඇහෙන්න කතා කරපු දේවල්.

සුජාතා කොහිල කොටුවෙ ඉඳගෙන තනියම කියවනවා දැක්කා කියලා චන්දනක්කා කිව්වා. චන්දනක්කා කළේ සුජාතට සියලුම වැඩ රාජකාරි පැවරීම. හරියට කන්තෝරුවකට අලුතෙන් ආපු සනීපාරක්ෂක කම්කරුවෙකුට සියලුම වැඩ පවරනවා වගේ. කොහිල කොටුවෙදී සුජාතක්කා තනියම හිනාවෙනවා. සුජාතා වැඩිය කැමති වුණේ කොහිල කොටුවට සාත්තු කරන්න.

සුජාතාගෙ බත් [illegible] දිහා බලලයි තාත්තා බත් කන්නෙ. තාත්තගෙ [illegible] සුජාතාට වැටෙන්න පටන් ගත්තා. චන්දනක්කා [illegible] තාත්තාට [illegible] සුජාතාට.

සුජාතා, ජිනදාසත් එක්ක වහන් වෙලා යනකල්ම කවුරුවත් ජිනදාස ගැන දැනගෙන හිටියේ නැහැ. රෑ නැගිටලා ගිහින් තියෙන්නෙ. පොරවන රෙද්ද ඉණට ඇඳගෙන. පොරවගෙන, අත්දෙක ගුලිකරගෙන නිදාගෙන හිටපු සුජාතක්කා රෑ පැනලා යාම වීර චාරිකාවක් වගේ මට දැනුණෙ. මං ඒ සතුට හිත ඇතුළෙන් භුක්ති වින්දා. ටික කාලයක් සුජාතක්කා දිහා මං බැලුවෙ සතුරාට පහරදී ජයගත් වීරවරියක් දිහා බලනවා වගේ. රාස්සයෙක් ඇවිත් සුජාතාව වහන් කරගෙන ගිහින් කියලා තාත්තා කිව්වා. රාස්සයෙකුට අවනත වෙන්න තරම් දුරට පරිසරයක් හැදිලා තිබුණෙ නම් නෑ. තාත්තාට හෙණයක් පතිත වුණා වගේ වුණාට අම්මා නම් යට කරගත්තු සන්තෝසය උඩින් කළු වලාවක් පේ කරගෙන හිටියා. තමන්ගෙ ස්වාමිපුරුෂයගෙ [illegible]වී, ලොකු මහත් වෙච්ච ළමිස්සියෙක් දකින කොට

රාස්සයෙක් වගේ තාත්තා ... ගියේ නෑ. කටකලියාව දාන්න පුළුවන් තාත්තව මෙල්ල කරන්න කොයි වෙලාවටද කියන එක අම්මා හොඳට දැනගෙන හිටියා. චන්ද්‍රානක්කා බොහොම දුකට පත්වුණා. සුජාතා කතා නොකර හිනාවෙවී ඉන්න මූණ මට නිතරම මැවිලා පෙනෙන්න ගත්තා. රංගන තමයි කිව්වෙ ජිනදාස ආණ්ඩුවෙ කන්තෝරුවක වැඩ කරන බව.

'ආණ්ඩුවෙ කන්තෝරුවක ජිනදාස මොනවා කරන්නද? කක්කුස්සි හෝදනවා ඇති' කියලා අම්මා කිව්වා. රංගන ඇහුවා කක්කුස්සි හේදුවත් පඩි ගෙවනවා නම් මොකද කියලා. ජිනදාසයි - සුජාතයි පන්සල් ඇවිත් ඉන්නවා දැකලා තිබුණා. අල්ලපු ගෙදර නැන්දා. චන්ද්‍රනක්කා නිතරම හිටියෙ මැසිවිලි කියමින්. තාත්තා නම් අහන්නෙ උයාගෙන පිහාගෙන කන එක ගෑනුන්ට කෙඳිරි ගාන්න වැඩක්ද කියලා. ගෑනුන්ට කෙඳිරිගාන්න තව කොච්චර වැඩ තියෙනවද? අඬන්න - වැළපෙන්න - ඉකිබිඳින්න! පිරිමි දන්නෙ මොනවද ගෑනුන්ගෙ හිත් ගැන. ගෑනුන්ගෙ ශරීර දුක් ගැන. සුජාතා ලුංජියකුයි දිග බ්ලවුස් එකෙකුයි ඇඳලා, තැඹිලි වල්ලක් කරේ තියාගෙන යන ජිනදාසගෙ අතේ එල්ලිලා යනවා දැක්කා කියලා අල්ලපු ගෙදර නැන්දා අම්මා එක්ක කිව්වා.

'ඒ ගොල්ලො තැඹිලිත් බොනවාද දැන්' කියලා චන්ද්‍රනක්කා ඇහුවා. මටත් සුජාතාව දකින්න ආසාවක් ඇති වුණා. මිනිහෙක් කසාද බැන්දම ගෑනියෙකුට ඇතිවෙන හැඟීම මොකද්ද? වෙනස මොකද්ද? කසාද බැන්දම ගෑනු ලස්සන වෙනවද? සමහර ගෑනු නම් කසාද බැන්දම කෙට්ටු වෙන්න ගන්නවා. සමහර ගෑනු මාස හත අටකට මහත් වුණාට පස්සෙ පරඬැල වගේ වෙනවා. අම්මලා වුණාට පස්සෙ සංසාරෙ කලකිරුණා වගේ වැරහැලි ඇඳගෙන, කම්කරුවො වගේ වැඩ කරනවා. සුජාතක්කා අතේ තිබිච්ච රත්තරන් පාට මුද්දයි, කරේ මාලෙයි ගැන ඔත්තුව අහපු චන්ද්‍රනා [illegible]
වෙනවනේ [illegible]

එල්ලෙන්න හදනවා කියලා තාත්තට වෙදමහත්තයා පණිවුඩයක් එවලා තිබුණා. වෙද මහත්තයගෙ ගෙදර තිබුණේ වෙලෙන් එහා පැත්තෙ. චන්ද්‍රනක්කා ඔච්චර පල්ලෙහාට ගිහින් ඒ තිස්සෙම වෙදගෙදර පත්තුවෙන ලයිට් දිහා බලාගෙන හිටියා.

'ලනිල් කියනවා අපි ළමයි හතර දෙනෙක්වත් හදන්න ඕන කියලා' චන්ද්‍රනක්කා අම්මා නැතිවෙලාවක කෝලම් තාලෙට හිනාවෙමින් කිව්වා. හිතේ සතුටකුත් එක්ක දෝරගලන හිනාවකුත් එක්ක කතාකරන චන්ද්‍රනක්කා, අම්මත් එක්ක රණ්ඩුකරන චන්ද්‍රනක්කට වඩා හුඟක් වෙනස්.

'දැන් කාලෙ ළමයි හතරක් වැඩියි. ඒකට අවුරුදු හතරක්ම ගත වෙනවනේ' මං මගේ අදහස පළ කළා.

'ඇත්ත නංගි. එක්කෙනෙක් හොඳටම ඇති. බබ්බු බඩේ තියාගෙන විඳින්න වෙන්නෙයි, උස්සගෙන එහා මෙහා යන්න වෙන්නෙයි පිරිමින්ට නෙවෙයි ගෑනුන්ටනේ' චන්ද්‍රනක්කත් මගේ කතාවට එකඟ වුණා. චන්ද්‍රනක්කා කසාද බන්දලා දෙන්නත් වැඩිකාලයක් ගත වුණේ නැහැ. බබා කවුරුවත් නොදැනම බඩට ඇවිල්ලා හිටියා. බබාලා හතරදෙනෙක් වුවමනා වෙලා හිටිය ලනිල් ඉස්සෙල්ලම කුස යහනට වැඩිය බබාව නැති කරන්න චන්ද්‍රනක්කව බොරැල්ලෙ ගුබ්බෑයමකට අරන් ගිහින් තිබුණා. ඒත් බබා නැති වුණේ නෑ. වෙද මහත්තයායි, වෙද හාමිනෙයි එකහෙලා කියා හිටියා ඒ කසාදෙට ඉඩදෙන්න බෑ කියලා. ඒ කසාදෙ ගැන කතාව එහාට මෙහාට හැපි හැපි විසිවෙන්න මාස දෙකතුනක කාලයක් යනකොට චන්ද්‍රනක්කගෙ බඩ ලොකු වුණා. අවසානයෙ දි ලනිල්ව අල්ලගෙන ආවෙ රූබට් අයියා.

'රස්සාවක් ඇතා නැතා අමාරුවෙ දාපු ගෑනිව කසාද බැඳපන් පරයෝ' කියලා රූබට්, ලනිල්ට කිව්වා. ලනිල්ගෙ [illegible]ජ්‍ය නොවන සංවිධානයක. හුඟක් පඩිත් ඇති

වෙද මහත්තයාට බැරිවුණා පුතාව බේරගන්න. ලනිල් මාස තුනක, තුනහමාරක බඩකුත් එක්ක හිටි චන්දනක්කව අරන් ඇනෙක්සියකට පදිංචියට ගියා. යන්න ඉස්සෙල්ලා මතු දවසක ළමයින්ට පෙන්නන්න කියලා නිලමෙටයි, මැණිකෙටයි ඇඳලා මගුල් පින්තූර කීපයකුත් ගත්තා. බඩ තදකරලා අන්දන්න එපා කියලා අම්මා අන්දන්න ආව මෝස්තරකාරිට කිව්වා. ළමයා බඩ ඇතුලෙ ඉඳගෙනම අම්මගෙයි තාත්තාගෙයි මංගල පින්තූරෙට පෙනී හිටියා. කොයි ළමයටද මේ වගේ අවස්ථාවක් ලැබෙන්නෙ? රංගන කිව්වා ඊළඟට නූපාගෙ වාරෙ කියලා.

රංගන හැම තිස්සෙම බැලුවෙ ගෙදරින් පිටවෙලා ඉන්න. අම්මා වැඩියම හුරතල් කෙරුවෙ රංගනව. බඩ පිස්සා හින්දා. තාත්තාත් කාටවත් නොපෙන්නන බුරුලක් රංගනට පෙන්නුවා. උදේට එළකිරි කාලක් ගෙන්නලා බොන්න දුන්නා. එළකිරිවල වතුර කියලා එළකිරි ගේන මිනිහත් එක්ක රංගන රණ්ඩු අල්ලන කල්ම තාත්තා රංගනට එළකිරි ගෙනල්ලා දුන්නා. රංගන ඇන්දෙ ඩෙනිම් කලිසම්. අත්කොට කමිස. කෙට්ටු ඇඟ වුණාට උස හින්දා කැපිලා පෙනුණා. නගරෙ කොල්ලන්ගෙ මෝස්තර එක ශරීරෙකට අරගෙන සාරාංශයක් දෙනවා නම් ඒකට හොඳම මිනිහා රංගන.

ජයනාථට උදව් කලේ රංගන. අම්මා ජයනාථ ගැන හරියටම දැනගත්ත දවසේ කිව්වා පුළුවන් නම් දුවේ උඹත් චන්දනා කරපු දේම කරපන් කියලා. ඒහෙම කරන්නෙ කොහොමද අම්මේ? චන්දනාව ලනිල්ට දී ගන්න කොච්චර අමාරු වුණාද? තමුන් කරපු වැරැද්ද දැන දැනම වහන් වුණේ ලනිල්මනෙ. හැමවෙලාවෙම දුර්වල ස්ථානයෙ ඉන්නෙ ගැනියෙක් බව මම දැනගත්තෙ අපේ ගෙදරින්මයි. ඉවිල්ලෙ, පිහිල්ලෙ ඉඳලා එහෙමයි. රංගන කැවට උයන්න උදව් වෙන්නෙත් නෑ, වළං පිඟන් හෝදන්නෙත් නෑ. රංගන ළඟට [illegible]
රංගන [illegible]

කරනවා. ලොකු ප්‍රේමා ඇවිත් හෝර්ලික්ස් හදලා දෙනකොට මූණ පුළුටු කරගෙන, ඉවසගෙන ඉන්නවා. ලනිල් මග ඇරලා යන්න හදනකොට තුන්මාසයක් ඇඬුවෙ චන්දනක්කා. ඒක මම දන්නවා.

ජයනාථ මාව රැවැට්ටුවද, මං ජයනාථව රැවැට්ටුවාද කියලා වෙන්කරලා ගන්න බෑ. කොයික වුණත් එකයි. ජයනාථලා විනෝද ගමනක් ලෑස්ති කළා. රංගනත් යන හින්දා මටත් යන්න අවසර ලැබුණා. ඒත් අම්මා දැනගෙන හිටියෙ නෑ ජයනාථ යන බව. විනෝද ගමන නුවරට. උදේ ගිහින් හවස එන්න. රංගන අන්තිම මොහොතෙ මගටත් ඇවිල්ලා එන්නෙ නෑ කිව්වා. බත් මුලකුත් බැඳගෙන ආවෙ. හදිස්සිය මොකද්ද කියලා කිව්වෙ නෑ. තනිවෙන්න ඉඩ ලැබුණෙ එහෙමයි. අහස අත ළඟ තියෙන කඳු මුදුනක තිබ්බච්ච බංගලාවකට ජයනාථයි මමයි, අපි හැමෝමයි ගියා. ජයනාථලට සල්ලි තිබුණා කියලා දැනගෙන හිටියත් ජයනාථලා ළඟ තියෙන සල්ලිවලට කරන්න පුළුවන් දේවල් කොච්චරද කියලා දැනගත්තෙ එදා. චන්දනක්කව මතක් වුණා. ඒත් තරුණ පිරිමියෙකුගෙ ඉවසන්න බැරි බැල්මයි ආලිංගනයයි එක්ක චන්දනාට වෙච්ච දේ ගැන මතකය විද්‍යුත් මකනෙකින් මැකෙනවා වගේ මැකිලා ගියා. කසාද බඳිනවා නේද මාව කියලා අඬ අඬා ඇහුවෙ ඔක්කොම ඉවර වුණාට පස්සෙ. ජයනාථ ඒ කතාව ඇහුණෙ නෑ වගේ ගිහින් ඇඟ හෝද ගන්න සද්දෙ මට ඇහුණෙ ගං නියම්ගම් යට කරගෙන එන මහ ජලකඳක සද්දෙ වගේ. ජයනාථ හුඟාක් වෙලා ඇඟ හේදුවා. අපේ පවුලෙ අයට ළඟින් ගියත් දරුවෙක් හම්බවෙනවා කියලා අම්මා කියන කතාව අකුණු කොටන්න කලින් වැටෙන විදුලි එළියක් වගේ මතක් වුණා. ජයනාථ තුවාය ඇඳගෙන ඇවිත් ඇඳුම් අඳින්න පටන් ගත්තා.

'ඔයා මාව බඳිනවා නේද?'

ඒ ප්‍රශ්නෙ එහෙම අහන එක හරිද? ජයනාථ දන්නවා ඒ ප්‍රශ්නෙ වැරදි බව. මං ආවෙ මගේ කැමැත්තෙන් නෙවෙයි. කාමරේට ආවත් ආලිංගනයකට එහා දෙයක් සිද්ද වෙයි කියලා හිතුවෙ නෑ. ආලිංගනයට හරි කඩිමුඩියක් තිබුණා. හදිස්සියට හැම දේම වුණා.

'අපිට අදම, නැත්තන් හෙට කසාද බඳින්න බැරිද?'

'එච්චර ඉක්මණට බැහැ බබෝ. මට තව අවුරුද්දක් තියෙනවා පුහුණුව ඉවර කරන්න.'

'මට බයයි'

'ගෑනු බයවෙන්නෙ ඔක්කොම ඉවර වුණාට පස්සෙ'

දුර්වල තැනකට මං විසින්ම පත්වෙලා හිටපු නිසා මං හිතේ තිබුණු කිසිදෙයක් කිව්වෙ නැහැ. මේ වගේ පාහරයෙකුට දෙන නම මොකද්ද කියලා විතරක්ම මගේ යටි හිතෙන් ඇහුවා. චන්ද්‍රනත්තට වෙච්ච දේ මටත් කරගත්තා.

'තෝදගන්න' කියලා ජයනාථ කියනකල් මං ඇඳේ වකුටුවෙලා හිටියා. ජයනාථ බලාගෙන හිටියේ, 'හොඳ වැඩේ උඹට' කියනවා වගේ. දැන් ඉතින් උඹ සළු වුණා. මට යටත් නේද කියන හැඟීම ඒ ඇස්වල තිබුණා. රංගන ආවා නම් මේ කිසිදෙයක් නොවෙන්න ඉඩ තිබුණා. ඒත් 'නම්' කියන ඒවයෙ ප්‍රයෝජනය, හීනයක් මවාගන්න උදව් වෙනවා විතරයි. නම්, නම්, නම්. එහෙම වුණා නම් මෙහෙම නොවෙන්න තිබුණා. If.....?

ඊළඟ අදියර හිතපු විදිහටම සිද්ද වුණා. ළඟම නැයෙක් එනකල් මග බලාගෙන ඉන්නවා වගේ මාසයක් මග බලාගෙන හිටියා. කැරකැවිල්ල වගේ හැදෙන්න ගත්තා. උඩ පැන්නා. දිව්වා. [illegible]
බදින්න [illegible]

'ළමයා නැති කරමු'

'කොහොමද?'

'ඔය පත්තරවල තියෙන්නෙ ක්‍රම සහ විධි. ඔසප්! ඔසප්! ඔසප්!!! තාත්තට, අම්මාට, චන්ද්‍රනත්තා දීපු දුක ඒ විදිහටම දෙන්න බෑ. කොහොමහරි මේ රාහුලයාගෙන් මිදෙන්න ඕන. මේක මහා දුකක්, බැඳීමක්. මේ බැඳීමෙන් මම මාව ගලවා ගන්න ඕන. නුපා මෙහෙම කරගනීවි කියලා අම්මා කවදාවත් හිතන්නෙ නැහැ. අවුරුදු දහනක අම්මා කෙනෙක් හොයාගන්නෙ ඇයි? කසාද නොබැඳපු අම්මා කෙනෙක් හොයා ගන්නෙ ඇයි? ගන්ධබ්බයෙක් වුණත් තමුන්ගෙ අම්මා වෙන්න යන්නෙ පැනලා යන්න හදන පියෙක්ගෙ ලෙයින් කිලිටි වෙච්ච අවුරුදු දහනක කෙල්ලෙක් නේද කියලා හිතන්නෙ නැත්තෙ ඇයි? යන්න තැනක් ඇත්තෙම නැද්ද? කසාද බැඳිල්ල කොහොම වෙතත් දැන් ඕන කරන්නෙ මේ කලල රූපය [illegible] කර ගැනීම.

'මට බැඳිල්ලක් ඕන නෑ. මේකෙන් නිදහස් වෙන්න ඕන' මම කිව්වා. ජයනාථ දොස්තර කෙනෙකුගෙ ශුබ්බැයමකට මාව එක්කරගෙන ගියා. මං වගේ තව කීපදෙනෙක් ඇවිත්. කවුරුවත් කාගෙවත් මුහුණු බැලුවෙ නැහැ. ඔක්කොම හිටියෙ කළ පවක් පඩිසන් දීලා ඉවර වෙන තැනකට ආවා වගේ. මහා අද්භූත ගතියකුත් එතැන තිබුණා. තලත්තැනි ගෑණු කෙනෙක් ඇහුවා මගේ වයස කීයද කියලා. මම කිව්වා විසිතුනයි කියලා. පහළොවක් විතර ඇති කියලා මං හිතුවෙ කියලා ඒ තැනැත්ති කිව්වා. මේ ඔක්කොම ඇවිත් ඉන්නේ ප්‍රාණඝාතයට. උදේ එන්න පිටත්වෙන්න ඉස්සෙල්ලත් පන්සිල් ගන්න ඇති. සියලුම දෙවිදේවතාවුන් වඳින්න ඇති. අන්තිමේදි ප්‍රාණඝාතය කරන්න සිද්ද වෙන්නෙත් පුරුෂයට නෙවෙයි ස්ත්‍රියට. පුරුෂයා අනුබල දෙනවා. ස්ත්‍රිය අවනත වෙනවා. කොහොමටත් ස්ත්‍රියට දීලා [illegible] අවනත වීමේ මානසිකත්වය. [illegible]

ගෙන ගියා. මීවනපලාන බටහිර දොස්තරෙක්ද? ආයුර්වේ දොස්තරෙක්ද කියලා මං දැනගෙන හිටියෙ නැහැ. ජයනාථ එළියට ගියා. දොස්තරට උදව්වට කවුරුවත් නෑ. දොස්තර ප්‍රශ් ඇහුවා. කොච්චර කල්ද? අරකද? මේකද? ඊළඟට පරීක්ෂා කළා. දොස්තරගෙ මූණ මට පෙනුණෙ දහඅට සන්නියෙන් එක සන්නියක මූණක් වගේ. දතක් එළියට ඇවිත් තිබුණා. මම ඇස් දෙක පියාගත්තා. මම ආතුරයා. දොස්තර කපුවා. කපුවා ආවේශ වෙලා. ආතුරයාට විත කරන්නෙ යස්ස දිෂ්ටිය. ඒ යස්ස දිෂ්ටිය තියෙන්නෙ මගෙ බඩ ඇතුළෙ. කපුවා පොල්මල් ගස ගසා යස්ස දිෂ්ටිය එළවනවා. ආවඩා ආයුබෝ වේවා! මහසෝන් දිෂ්ටිය පල පල පල! ආතුරයාගෙ හිස ඒ පැත්තටයි මේ පැත්තටයි නැටවෙනවා. සෙම පෙරෙනවා. යස්සයා කියනවා යනවා යනවා යනවාමයි කියලා. කපුවා ආතුරයාගෙ පපුවට නැඹුරු වුණා. ආතුරයා හිතුවා ඒකත් තොවිලෙ කොටසක් කියලා. කපුවා ආතුරයාගෙ ළමැදට මූණ ඔබා ගත්තෙ ඊළඟට හත් මාසයක් වතුර පොදක් නොදැක්ක පිපාසිතයෙක් වගේ. එළදෙනකගෙ තන බුරුල්ල බලෙන් අල්ලගෙන උරා බොන ගොපල්ලෙක් වගේ තන පුඩු විකන්න පටන් ගත්තා. ඒක කපුවාට අයිති වැඩක්ද? දැන් කපුවගේ වාරෙ. කපුවගෙ දේවාලෙ. වැඳ වැටිලා හරි කරගන්න තියෙන්නෙ එපා දේ අයින් කරගන්න එක. ඒ වියරුව සංසිඳුනට පස්සෙ දොස්තර එපා දේ අයින් කළා. කොන්ද කට කට ගාලා ගැහෙන්න ගත්තා. මැරෙයිද - මැරෙයිද මැරෙයිද? බලාපොරොත්තුව හිටපු දේ ගලාගෙන ආවා.

අකලට කුස යහනට වඩින්න එපා පැටියෝ. උඹේ අම්මත් තවම කිරි දරුවෙක්.

2

සේරම අභිකුණ්ටකයො වගේ මිදුලෙ හිටියා. මහ හෝටලේක එළිපහළියට කියන්නෙ මිදුලද වෙන නමක්ද කියලා මං දැනගෙන හිටියෙ නැහැ. අම්මාගෙ ඔසරිය ඉණවටේට හිර කරලා තිබුණ පටිය කිළුටු පාටට එළියට පැනලා. මං කිව්වා ඒක යටකරගන්න කියලා. අම්මා, තාත්තා, රංගන, රූබට්, චන්දන, ලනිල් ඒ ඔක්කොම හිටියා. තාත්තාගෙ ඇඳුම ආරියසිංහල. චන්දනායි ලනිලුයි අනික් අයයි හැසිරීම, ඇඳුම් පැළඳුම් දිහා බලමින් සිනාසෙමින් හිටිය බව පෙනුණා. රූබට් මොන ඇඳුම ඇඳලා හිටියත් කඳ කෙලින්. අනික් හැමෝම හිටියෙ නාඳුනන මගුල් ගෙදරක ආවා වගේ. රේසර් එකක් මගේ අතට ගෙනත් දුන්නෙ මඟුල් කපුවා නොහොත් මන්ත්‍රීතුමාගෙ සහෝදරයා. ඒජන්සිය මන්ත්‍රීතුමාගෙ කියලා හොයාගෙන තිබුණෙ ලනිල්. රේසරේ අතට දීලා මගුල්කපුවා රහසේ යමක් කිව්වා. ඒක ජයනාථ කළ දේට හපන් වැඩක්. ජපන් මිනිස්සු කැමති විදිහ වෙනස් කියලා කිව්වා.

'මට රැවුලක් නෑ කපන්න' කියලා මං රේසරේ කපුවාගේ සාක්කුවට දැම්මා. අම්මලා මේ කිසිදෙයක් තේරුම් ගන්න බැරි බබාලා බවට ඉබේම පත්වෙලා තිබුණා. අම්මගෙ කට සම්පූර්ණයෙන්ම වැහිලා. තාත්තාගෙ වෘත්තිය සමිති මුවහත අහස ඉඳලා වැටිච්ච වතුර බිංදුවක් වගේ චොරවෙලා ගිහින්. ... කාගෙන බලා හිටියා. පරිසරයට ...

එන්දනක්කා එක්ක දරු සුරතල් බලමින් හිටියා. ලනිලූත් චන්දනක්කා එක්ක ළඟදී. වෙදමහත්තයා හේතේ දා ගිය සළුවෙලා හිල්ටන් එක ළඟදී. කපුවා ටයිකෝට් ඇඳලා. අපි හිටියෙ වැදිරි වගේ වෙලා. කපුවා ටයිකෝට් ඇඳලා. අපි හිටියෙ මන්ත්‍රීතුමාගෙන් රස්සාවක් ගන්න ආපු ඡන්දදායකයො වගේ. සුදුසුකම්, නැතිබැරිකම් එක්ක කලවන් වෙලා. කසාද බඳින්න ඇවිත් මනමාලි අර මිදුලෙයි මේ මිදුලෙයි නම් අඬ ගහනකල් බලාගෙන ඉන්න ඕනද? උදේ හතට ආපු අපි හවස හතර වෙනකල් වෑන් එකේ. ගෙදරින් උයාගෙන ආපු කිරිබත් කෑවේ වෑන් එකේ සීට්වල තියාගෙන. කාපල්ලා බං කාපල්ලා. බඳින්නෙ ජපනෙක්. නූපා බඳින්නෙ ජපනෙක්. හරියට නැකතට මංගල කිරිබත වෑන් එකේ සීට් එක උඩ තියාගෙන කන්න වෙලාව සංඥා කළේ තාත්තා. තාත්තගෙ නළලෙන් දාඩිය ගලා හැලුණා. අම්මා හොටුයි, කඳුළුයි පිහදැම්මා. සීට්වල ඉඳුල් හලන්න එපා කියලා වාහනය අයිතිකාරයා අවවාද කළා.

මනමාලයා කොහේ ඉන්නවද කියලා කවුද දන්නෙ. තවමත් දැක්කෙ නැති කොට. වයසද, තරුණද දන්නෙ නෑ. කකුල් අතපය හතර තිබුණොත් මදෑ. ජපන්නු සූරයෝ. හවස හතරට කපුවා ඇවිත් කිව්වා මනමාලිට විතරක් එන්න කියලා. රූබට් ඇහුවා මනමාලයා ඇවිත්ද කියලා. කපුවා රූබට් දිහා සැර බැල්මක් හෙලුවා විතරයි. මට එන්න කිව්වේ අන්දන්න. මනමාලයා මා වෙනුවෙන් හෝටලේ කාමරයක් අරගෙන තිබුණා. මං අඳින්න කැමති විදිහට අන්දගන්න කියලා කපුවා කිව්වා. කපුවා කියලා මං මෙහෙම කිව්වට මං කපුවාට කතා කළේ සර් කියලා. අන්දන්න ආපු නැනැත්තිය අවුරුදු හතලිහක් විතර පෙනුම ඇති නැනැත්තියක්. කොණ්ඩෙ කපලා තිබුණා. කොලු ගැටයෙක් වගේ. එයාගෙ නම ශ්‍යාමා. ශ්‍යාමා දඩිබිඩියෙ අන්දන්න පටන් ගත්තෙ මනමාලයව ලැබෙන්නෙ කවුරුහරි ඉක්මනට ඇඳ ගත්තු නැනැත්තියටයි කියනවා. වගේ කඩිමුඩියකින් ...

මෙතන තිබ්බේ අනවශ්‍ය රෝමකූප තූල්පටකින් ඇදලා දැම්මා. ඒවට ගත කළේ ඇහිපිල්ලන් ගහන කාලයක්. ඊළඟට යටසායෙ ඉඳලා ඇන්දුවා.

"ඔයාට තියෙන්නෙ හැඩ ඇඟක්" කියලා ශ්‍යාමා කිව්වෙ කොඳු ඇටපෙළ දිගේ ඉහළ ඉඳන් පහළට මගේ ඇඟ අතගාන ගමන්. ඔසරිය ඇඳලා, මාල හත දැම්මම, අර දොස්තරගෙ ගුබ්බෑයමට ගිහින් දරුවෙක් හෝදලා ඇරියා කියලා හිතන්න කොහොමටත් බැරි වුණා. මූණ සම්පූර්ණයෙන් පාට කළා. මටම මාව අඳුර ගන්න බැරි තරමට මූණේ සායම් තැවරුවා. ලස්සනට ඉඳීමේ ආශාව හිතේ උඩපනින්න ගත්තා. ලස්සන කොච්චර වටිනවද? ජීවිතේම මං මගේ ලස්සන දැක්කෙ මනමාලිට ඇන්දමනෙ. මනමාලයා නැති වුණත් මට මගේ ලස්සන දකින්න ලැබීම ප්‍රීතියට කරුණක් වුණා.

'ඔයා හරි ලස්සනයි' කියලා ශ්‍යාමා අන්දලා ඉවරවෙලා මගේ මූණ දෙපැත්ත ඉඹිනකොට මං හිරිවැටිලා ගියා. එයා ඒතරම් ලෙන්ගතු කමක් පෑවා. ඉණ ඇරිලා තිබුණු හරියෙන් රන්වන් පාට ක්‍රීම් එකක් ගෑවා. ඒක ක්‍රීම් ගෑමකට වඩා අත ගෑමක් වුණා. ඒක ඇඟ හිරිවැටෙන අත ගෑමක්!

'කකුල්වල නියපොතු කළු වෙලා මොකද මේ?' කියලා ශ්‍යාමා නියපොතුවල රතුත් නොවන දුඹුරුත් නොවන නිය ආලේපනයක් ගෑවා. ඕවිටේ එහාටත් මෙහාටත් දුව පැන ඇවිදින අපේ කකුල්වල තිස්සෙම මඩ පිපිලා. ඕවිටේ ගෙදර ළමයින්ගෙ කකුල් එහෙම තමයි. මඩ පිපිලා. නියපොතු කළු වෙලා. ඕවා මදින්න දෙල්බූව හොයා ගන්නත් දෙල්ගහක් හොයාගෙන යන්න එපෑ. ගිහින් නිය මදින්න නෙවෙයි වගේ ඒවා හොරෙන් අහුලගෙන එන්න ඕනෑ. නැත්නම් කතන්දර කියන්නෙ මිනිහෙක් එක්ක පැනලා ගිය ගානට. හවස හතරහමාර වෙනකොට අපේ පාර්ශවයට කාමරේට එන්න අවසරය ...

'උඹ ලක්කාරි' කියලා චන්දනක්කා කිව්වා. එහෙම කියන්න තව ඉක්මන් වැඩියි චන්දනක්කෙ. අම්මා, තාත්තා, ලනිල්, චන්දනා, රංගන අපි ඔක්කෝම අපිට ඕන ඕන හැටියට පින්තූර ගත්තා. මනමාලයා මොන විදිහෙ කෙනෙක්ද කියලා දන්නෙ නැති හින්දා සූදානම් ශරීරයෙ ඇඟට ගුණයි. අපි හැමෝම කාමරේට වෙලා හිටියා. අම්මත්, චන්දනක්කත් කාමරේ තිබ්බ වැසිකිළියට ගියා. හද කරගෙන ඉන්න ඇති. මගේ අතට කපුවා ගෙනත් දුන්නා ප්ලාස්ටික් මල් පොකුරක්. ඒ මල් මොනමල් කියලා කියන්න බැහැ. මිනීමල් වුණත් රෝසමල් වගේ ඇත්. ජයනාථ උඹ තමයි මෙතනට මාව එක්කරගෙන ආවෙ කියලා හිත කෑගහන්න ගත්තා කීප වතාවක්.

මනමාලයා ශාලාවට ඇවිල්ලා කියලා කපුවගෙ ගෝලයෙක් දුවගෙන ඇවිල්ලා කිව්වා. නැට්ටුවො හතර දෙනෙක් උඩරට නැටුම් නට නටා මාවයි, අපේ අම්මලවයි ශාලාවට එක්කරගෙන ගියා. අපිත් නැට්ටුවන්ට දෙවැනි නෑ. මගේ අත අල්ලගෙන යන්න කිව්වම තාත්තා මගෑරලා පැත්තකට වුණා. රුබට් තමයි අත අල්ලගෙන ආවෙ. රුබට් ඇඳලා හිටියෙ ටයිකෝට්. කෝට්එක රුබට්ට ලොකු වුණත් රුබට් ඊට වඩා ලොකු කමක් ආරූඪ කරගෙන හිටියා. කපුවගෙ නෝනා මාව අතින් අල්ලගත්තෙ ශාලාව ළඟදී. මිසිස් විලේගොඩ. ඉස්සෙල්ලම කළේ විවාහය ලියාපදිංචි කරන එක. එතනදී තමයි පළවැනි වතාවට මගෙ අනාගත ස්වාමිපුරුෂයව දැක්කෙ. ඉන්තේරුවෙන්ම වයස පනහ පැනලා. මාව දැකපු ගමන් කොන්ද නමලා ආචාර කළා. කහපාට හම. ඇඳලා හිටියෙ සුදුම සුදු යුරෝපීය ඇඳුම් කට්ටලයක්. උස මහත නැහැ. වරදක් කරලා අහු වෙන්න යන පොඩි ළමයෙක් වගේ බිම බලාගෙන හිටියා. රෙජිස්ටාර් නෝනා ඉඳගත්තා. මනමාල ජෝඩුව රෙජිස්ටාර් නෝනා ඉදිරිපිට. ජපන් නම්ගම් ලිවීම පුරුදු පුහුණු වෙච්ච [illegible] රෙජිස්ටාර් නෝනා [illegible]

කළේ ජපන් නියෝජිතයෙක්. ලියාපදිංචියට ඉස්සෙල්ලා මගේ ලිපිනය ඇහුවා. මහනුවර ලිපිනයක් වහාම දුන්නේ විලේගොඩ මහත්තයා. ඇයි එහෙම වැරදි ලිපිනයක් දෙන්නෙ කියන කාරණය අකුණක් වගේ වැදුණෙ හිසටමයි. අපි ඇඩ්‍රස් නැති මිනිස්සු නෙවෙයි. මේ රටේ කොහේහරි, හරිහමන් ඇඩ්‍රස් එකක් අපිට තියෙනවා. තාත්තටයි අම්මටයි මේවයෙ තේරුමක් නෑ වගේ බලාගෙන හිටියා. ඉංග්‍රීසි භාෂාවයි, ජපන් භාෂාවයි කතාකරන තැන සතොසෙ වතුර කටීකයත් ගොලුවෙලා හිටියා. තමුන්ගේ දුව කසාද බඳින සතුටයි. අතඇරලා යන දුකයි දෙකම ඔවුන්ගේ මුහුණුවල පැල පදියන් වුණේ සුමාන දෙකක් තිස්සෙ.

'එක එක ඇඩ්‍රස් දාන්න එපා. අපිට ඇඩ්‍රස් එකක් තියෙනවනෙ ඒක දාන්න' කියලා මං කිව්වා.

'ටිකක් ඉවස්ගෙන ඉන්නකෝ' කියලා විලේගොඩ කිව්වා. කවුරුවත් මගේ හිත ඇතුළෙ [illegible] පත්තුවෙන ගින්දර දැක්කෙ නැහැ. අපේ විවාහය කෙරෙන්නෙ ගිනි කන්දක් උඩ හදපු පෝරුවක. පෝරුව ඉස්සරහ බලාගෙන ඉන්නෙ මකරාක්ෂයෙක්. එයා තමයි සුළඟිලි අරන් තූලකින් ගැට ගහන්නෙ. මනමාලයගෙ මූණ කට බෙරි වෙලා තිබුණා. අම්මයි තාත්තයි බබ්බු දෙන්නෙක් වගේ බලා හිටියා. හිල්ටන් හෝටලේ කා එක්ක පෑහෙන්නද? හිල්ටන් හෝටලේ එහාට මෙහාට යන එන උදවිය බලාගෙන හිටියෙ හදිස්සියෙ පෙන්නන වීදි නාට්‍යයක් දිහා බලා ඉන්නවා වගේ.

මනමාලයගෙ සාක්කුවෙ තිබ්බ මලත්, මගේ අතේ තිබ්බව මල් පොකුර වගේම ප්ලාස්ටික් බව මම එක බැල්මෙන් අඳුනගත්තා. ඒජන්තලා ළඟ තියෙන මල් පොකුරු වෙන්න ඇති. දවස ගානෙ අලුත් මල් ගන්න කොච්චර වියදමක්ද? ප්ලාස්ටික් මල හේදුවා, ගත්තා, [illegible]

මඟුල දිහා බලාගෙන ... මට
තිබුණ එකම සතුට කසාද බැඳීමේ සතුට නෙවෙයි. අම්මලා
සතුටක් වින්දා නේද කියන අප්‍රමාණ වූ සතුට.

ජයනාථ්ට පුහුණුව ඉවරවෙනකල් කසාද බඳින්න බෑ
කිව්වා. දෙමාපියන්ට එහෙම ලේසි පහසුවට පිටුපාන්න බෑ
කිව්වා. නූපන් කළලය ඉතිහාසෙනුත් මකලා දැම්මට පස්සෙ
ජයනාථ්ව නම් කසාද බඳින්නෙ නෑ කියන තීරණයට එන්න
සිද්ධ වුණා. ජයනාථ් කිව්වා හරිහමන් ගෑනියෙක් නම් ඒ විදිහට
තනියම එන්නෙ නෑ කියලා පිරිමියෙක් එක්ක. රංගනට ඔය
කතාවල් කියලා මිනීමරාගන්න බෑ. ගෙදර පත්තිනි අම්මා වගේ
ඉන්නේ බඩ හෝදගත්තු අවුරුදු දාහතේ දෝනියැන්දෑ කියලා අම්මා
දැනගෙන හිටියෙ නැහැ. ජයනාථ් දුප්පත්කමට හිනාවෙන්න
පටන් ගත්තා. වහ ටිකක් කාලා ඉක්මන් මරණෙකට ගිහිල්ලා
ඊළඟ ආත්මයෙ ඇති හැකි අයෙක් වීමට පුළුවන් නම් කොපමණ
හොඳද? ඒත් සියල්ල නසාගැනීම පාපයක්. ඒ පාපයත් එකතු
කර ගත්තොත් ගෙවන්න සිද්ද වෙන්නෙ මටමයි. අපිට කියලා
අයිති කිසිදෙයක් නෑ. කාටද එහෙනම් අයිති.?

අපි කසාද බැන්ද දවසෙ අම්මගෙ සිල්ලර කඩේ වහන්න
වුණා. තාත්තගෙ රස්සාවයි, රට ඉඳි විකිණිල්ලයි අතරෙ අම්මා
සීනි, තේකොළ, පාන් විස්කෝතු එහෙම විකිණුවා. කඩේ තිබුණෙ
ගේ ඉස්සරහ ගහපු පොල් අතු මඩුවක. ණයට නැත කියලා
ගහපු බෝඩ් එක මිසක කඩේ නමක් කඩේට තිබුණෙ නැහැ.

මගෙ ජපන් ජාතික ස්වාමිපුරුෂයාට සිංහල බැහැ. මට
ජපන් බස බැහැ. භාෂාවෙන් නම් ආදරේ ප්‍රකාශ කරගැනීමේ
පුළුවන්කමක් අපි දෙන්නටම තිබුණෙ නැහැ. ආදරේ කරන්න
වචනත් අවශ්‍යයි කියලා එදා තේරුම් ගත්තා. කතා නොකර
ආදරේ කරන්නෙ කොහොමද? මගේ ස්වාමිපුරුෂයා ඇහුවා.
'මගේ ...

බලා හිටියා. කොළඹ ඉඳලා නුවරට ආව වාහනයෙ ගාස්තුව
ඉල්ල ගන්න හිතුවත් භාෂාව නොදන්න කම ඒකට බාධා කළා.
කපුවා, වාහනයක් අරගෙන එන්න කිව්වට වාහනේට ගෙවීම ගැන
කිසිදෙයක් කතා නොකළත්, ඒ හැමදේටම මගේ ස්වාමිපුරුෂයා
ගෙවනවා ඇති කියන දැනීම මට තිබුණා. අම්මලා ගියේ හුඟක්
වෙලා කාමරේ ඉඳලා. යනකොට රෑ අටත් පහුවෙලා මගේ හිතේ.
කපුවා ඇවිත් කිව්වා දැන් ඉතින් දූ කසාද බැඳලනේ අම්මලා
යන්න කියලා. චන්දනක්කා මගේ මූණ ඉම්බා. මං අම්මටයි
තාත්තටයි දණ ගහලා වැන්දා. ජීවිතය දුන්නට, හැදූවට වැඩූවට,
රැක බලා ගන්න උත්සාහ කළාට. රූබට් හිටියේ එළියෙ රංගනත්
එක්ක. අම්මලා යනකල් මං කවුලුවක් අස්සෙන් බලාගෙන හිටියා.
මගේ ස්වාමිපුරුෂයා ගිහින් ඇඟ හේදුවා. මං ඇඳ උඩ ඉඳගෙන
කකුල් දෙක අත ගා ගත්තා. හිර සපත්තු දාලා කකුල් තුවාල
වෙලා. කතා බහ කරන්න භාෂාවක් අපි දෙන්නට තිබුණෙ නෑ.
එයා නානකාමරෙන් එළියට ඇවිත් තුවායක් මගේ අතට දුන්නා.
මං මගේ බෑග් එකෙන් අලුත්ම නිදන ඇඳුම ගත්තා. දෝතින්
තුවාය අරන් මම නානකාමරේට ගියා. එක පාරට ඔක්කොම
වෙනස් වෙලා. හතරහමාර වෙනකල් හෝටලේ මිදූලෙයි වැන්
එකෙයි හිටපු මම දැන් හෝටලේ විල්ලුද දමාපු කාමරේක. නාන
කාමරය පෙනුනෙ විසිතුරු මාලිගාවක අනුරුවක් වගේ. හැමදේම
පිළිවෙලට. ලොකු නාන බේසමක්. රූපවාහිනියෙ දැකලා
තිබුණා මේ වගෙ නාන බේසම්වල බැහැගෙන ඇස් පියාගෙන
ඉන්න ගෑනු පිරිමි. සබන් පෙණ ගොඩක. ඇඟ හෝදගන්න
හුඟක් වෙලා ගියා. කතා කරගන්න බැරි අපි දෙන්නා කාමරේ
එක තැනකදි මූණ ගැහුණා.

'මගේ නම ඔයාට මතකද?' කියලා ඉංග්‍රීසි වචන දෙකතුනක්
එකතු කරගෙන ඇහුවා.

'මගේ නම මසායා සුමිකාවා' එහෙම කියලා පුරුදු විදිහට
... ආචාර කළා. කපුවාගේ ...

'කැමතිද මාත් එක්ක ඇඳට එන්න? පස්සෙ කාමරේට ගෙන්නගෙන කෑම කමු' මසායා සාන් ඒක වෙන්න ඇති කියන්න ඇත්තෙ කියලා මං තේරුම් ගත්තා. මට මතක් වුණේ ජයනාථ්. ජයනාථ් කැමැත්තක් ඇහුවෙ නැහැ. ඒත් ආලිංගනයෙන් මුසපත් කරවලා කැමැත්ත ඉබේටම ගත්තා. ඇඳුමෙ පස්සෙ.

ඇඳ සැපෙන් පිරිච්ච ඇඳක්. ඒ ඇඳේ නිකන් හිටියත් සැපක් දැනුණා. මසායා සාන් මාව කසාද බඳින්න එනවා කියල දැනගත්තු දවසේ ඉඳලා හිත පතුළේ උණුසුමක් තිබුණා. වයස කියලත් ලොකු වයසක් නොවෙයිනෙ කියලා කියපු ඒජන්ත පිරිමියෙක් තරුණයෙක් වෙන්නෙ හතලිහෙදි කිව්වා. එතකොට දැන් මසායා සාන්ගෙ වයස කීයද? නිකමට වගේ ඇහුවෙ. මසායා සාන්ගෙ පෙනුම තිබුණෙ වයසක් නෙවෙයි. වයසත් එක්ක ආව නැන්පත් කමක්. ජයනාථ්ගෙ ආලිංගනය මතක් වෙන කොට හිතේ කෝපයක් ඇති වුණත් ඒක මතක හිටින [illegible]. මසායා සාන් මුළු මධුසමයම තත්පර දෙකට අවසන් කළා. හාදූනන කැනැත්තියකට බරපතල වරදක් කළා වැනි හැඟීමකින් ඇඳෙන් බැහැලා නාන කාමරයට ගියා. ඇඟ හෝදගෙන ඇවිත් ලැජ්ජාවෙන් මූණ හංග ගත්තු පොඩි ළමයෙක් වගේ මහ සයනයක පුංචියට ගුලිගැහිලා නිදා ගත්තා. බඩගින්නෙත් නිදාගන්න අවශ්‍ය නැහැ කියන හැඟීම හිතට ආවා. මං ඇඟ හෝදන්න සෑහෙන වෙලාවක් ගත්තා. දවසකට දෙකෙකට වඩා ඉන්න නොලැබෙන සැපදායක ස්ථානයක උපරිම සුවය ලැබිය යුතුයි කියලා ඇතුළ හිත කිව්වා. මුට්ටියෙ රත්කරපු උණුවතුර මිසක වතුර මලකින් ශරීරයට අවශ්‍ය ගණනට රස්නයෙන් විදින උණුවතුරෙන් නා ගැනීමත් වෙලාවෙ හැටියට ප්‍රබෝධයක්.

මසායා සාන් නින්දෙ. ඒකට මොකද? මට ප්‍රේම කරන මිනිසෙක් [illegible]

භාෂාවකින් කතා කරන නූපාගෙ පෙම්වතා ශරීරයටයි, සිතටයි දෙකටම කාන්දු වෙන මහ රාත්‍රියෙ ඇහෙන සංගීත වාදනයක් වගේ. ඒ වාදනය ඇහෙන්නෙ ළඟින්මද, ඈතින්ද කියන්න බැහැ. මගෙ පෙම්වතා උසයි, කොන්ද කෙලින්. මුළු ශරීරයම හිනාවකින් පිරිලා. එන්න යමු අපි කාමරේට. අර සඳුන් තෙල් පහන දැල්වෙන කාමරේට. ඒ යන්නම් එළියටයි මහ කළුවරටයි මං ආසයි. යමු ඔයාට මං නමක් දෙන්නෙ නෑ. ඔයාට නමක් එපා. ඔයා මගේ පෙම්බරා. පිරිමදින්න මගේ හිත.

'ගිහිල්ලා කමු' කියලා මං මසායා සාන්ට කිව්වා. සමාව යදින ඇසින් මා දිහා බලලා බාගෙට දකිමින් හිටිය ගීතෙකින් නැගිට්ටා වගේ මගේ කසාද පුරුෂයා නැගිට්ටා. මේ කාමරේ අස්සටම රිංගගෙන ඉන්නවට වඩා එළිපහළියට යාමේ හිතුවක්කාර උනන්දුවක් මා තුළ ඇතිවුණා. කිසිදේකට බැහැය කියන්න බැරි හිත හොඳ කමකින් [illegible] පුරුෂයා කාමරයෙන් එළියට ආවා.

මසායා සාන් නැම්බූ මාළු ගෙන්නගෙන කෑවා. නිල් ඇඳුම් ඇඳ ගත්තු වේටර්වරු මට කෑම තෝරගන්න ලොකු සහයෝගයක් දුන්නා. මහ හෝටලේක හොඳි ව්‍යංජන එක්ක බාස්මති හාලෙ බත මට ලොකු බඩගින්නක් නිවලා දුන්නා. මඟුල් මේසෙදි කන්න බැරිවුණ හින්දා බඩගින්නෙ හිටියෙ. අම්මලා, තාත්තලා අවුලක අමාරුවක නොවැටී කන එක ගැන මිසක මගේ කෑමක් ගැන මඟුල් මේසෙදි මට කල්පනාවක් තිබුණෙ නැති හින්දා මං කළේ කෑම අතගගා වට පිට බලන එක.

'මැඩම් ඩෙසර්ට්'

'කිරි පැණි හොඳයි.'

ස්වාමිපුරුෂයා එක්ක ඒ සැපවත් ඇඳට වැටිච්ච ගමන්ම [illegible]

as it is තමයි. මසායා සාන් ටික වේලාවකින් ගොරවන්න ගත්තා. දැන් මට තියෙන්නෙ ඒ ගෙරවීමට රිද්මයක්, සංගීතයක් හොයා ගන්න එකයි.

වීසා ගන්න කොළඹ ආවෙ හෝටලේ මෝටර් රථයකින්. වීසා ගැනීමේ සියලු කටයුතු විලේගොඩ මහත්තයා කරල දුන්නා. සල්ලි කියන්නෙ විශ්ව භාෂාවක්නෙ, ඒක හින්දා භාෂා ප්‍රශ්නයක් මතු වුණේ නැහැ. වීසා ගන්න ඇවිත් හිටිය ශ්‍රී ලාංකිකයන් මා දිහා බැලුවෙ ජපනෙක් එක්ක යන්නෙ මෙහෙ මිනිස්සු නැද්ද කියලා අහන බැල්මෙන්. මොකද නැත්තෙ මෙහෙ මිනිස්සු ඉන්නවා. මෙහෙ මිනිහෙක් කරපු වරදට දඬුවමක් හැටියට තමයි ජපනා බඳින්න වුණේ, ජපානෙට යන්න වීසා ගන්න වුණේ කියලා මගේ හිත උන්ට තරවටු කළා. මසායා සාන් මගේ ස්වාමිපුරුෂයා වුණාට තාම දැන අඳුනගෙන පැය විසිහතරකට වැඩිය නැහැ. ඉදිරි ජීවිත කාලෙ හරි කාලාබීලා සැපෙන් ඉන්න බැරියැ කියලා මං මටම කිව්වා. සැප කියන්නෙ මොකද්ද? කන බොන එකද? සැප කියන්නෙ කනක් ඇහිලා ඉන්න එකද? තමාව රවට්ටපු මිනිහට වැඩිය කසාද බැඳපු මිනිහා හොඳයි කියලා හිතන එකද සැප කියන්නෙ?

වීසා හම්බවෙන්නෙ හවසට හින්දා උදේ ගෙදර යන්න පුළුවන්ද කියලා මම මසායා සාන්ගෙන් ඇහුවෙ සන්නිවේදන දුෂ්කරතාව ජයගනිමින්. මසායා සාන් ඒකට කැමති වුණා. මහහෝටලයක වාහනය පටුපාරක කෙළවර තියෙන අපේ ගේ ඉදිරිපිට නැවැත්තුවම වටේ පිරිස මසායා සාන් දිහා බලාගෙන හිටියෙ සර්කස්කාරයෙක් ගමට ආවා වගේ. බලාගනිල්ලා මසායා මහතා සහ මහත්මිය. උඹලා අඳුරන්නෙ මසායා මහත්මිය මසායා මහත්තයා ජපන් රටේ. වයසක ජපනෙක් කියලද මං එකතුවෙලා ගිහි... වාහන ගේ ඉ...

ආවා නම් අපරාදෙ. හොඳටම රස්තියාදු වෙන්න තිබුණා. මසායා සාන්ව අපේ ගේ ඇතුළට එක්කරගෙන ගියේ පෙරහැරකින් වගේ. මසායා සාන් හැමෝටම හිස නමා ආචාර කළා. කතා කරන්න බැරි වුණාට මුහුණෙ හැම ඉරියව්වකින්ම ස්තුතිය පළ කළා. තාත්තා මසායා සාන්ව අසුනක ඉන්දෙව්වෙ සිංහාසනයක ඉන්දනවා තරම් ආදර ගෞරවයකින්. අම්මා ඇවිත් මහ පුදුමෙකින් වගේ බලාගෙන හිටියා.

'අපි ඉක්මනට යන්න ඕන අම්මෙ' කියලා මම කිව්වා. වීසා ගන්න තියෙනවා. අම්මා ඇහුවා එහෙම කොහොමද මහත්තයට කන්න ටිකක් දෙන්න ඕන කියලා. මහත්තයා ජපන් බෝනික්කෙක් වගේ ඉඳගෙන බොහොම සන්සුන්කමකින් බලාගෙන හිටියා.

'හොඳ ගෙයක්' කියලා මසායා සාන් බොහොම පරිස්සමට වචන තෝරගෙන කිව්වා. ඒ මගේ හිතට සතුටක් දෙන්න කියපු කතාවක් වෙන්න ඇති. මං බයේ හිටියෙ මසායා සාන්ට එළිපහළියට යන්න ඕන වෙයි කියලා. වයසක මනුස්සයනෙ. මං මගෙ ස්වාමිපුරුෂයට බොන්න දෙයක් දීමෙන් අම්මලාව වැළැක්කුවා. වීසා ගන්න පරක්කු වෙයි කියලා අම්මලාට පැහැදිලි කරලා දුන්නා. මසායා සාන් කලින් යන හින්දා මට දවසක් අම්මලා එක්ක නතර වෙන්න පුළුවන්. මසායා සාන් ගියාට දවසකට පස්සෙ මං යන විදිහටයි වැඩ කටයුතු සිද්ධ වෙලා තිබුණෙ.

මසායා සාන් ආපහු යනකොට මං තාත්තත් එක්ක ගුවන්තොටුපලට ගියා. විලේගොඩ මහත්තයයි, ජපන් ඒජන්තයි දෙන්නම ඇවිත් හිටියා. විලේගොඩ මහත්තයා ගුවන්තොටු පලේදී වෙනදට වඩා හොඳට කතාකළා. මං එක්කම තව මනමාලියක් යන්න හිටියා. ඒ මනමාලිගෙ මහත්තයාත් අද ගිහින් මනමාලි යන්නෙ ලබන මාසෙ කිව්වා. විලේගො...

ඇමතිතුමාගේ බිරින්දෑගෙ පියා තමයි මේ ව්‍යාපාරය පටන් … හ තියෙන්නෙ අමතර ව්‍යාපාරයක් හැටියට. වර්ණන් ගුණ… ජපානෙට වෙළඳ ව්‍යාපාරවලට යන එන අතරතුරේ පටන්… අපූරු ව්‍යාපාරයක්. මගෙ ස්වාමිපුරුෂයගෙන් අහගන්න … මාව බිරින්දෑ කරගන්න වර්ණන් ගුණසේකරට කොපමණ මුද… ගෙව්වද කියලා. මන්ත්‍රීතුමාගෙයි, මාමණ්ඩිලගෙයි ව්‍යාපාර…

'වෙනදා එක පෝරුවෙ දහදොළොස් දෙනෙක් තමයි… දුන් බිස්නස් අඩුයි' කියලා විලේගොඩ මහත්තයා කිව… එකම හෝටලයෙ එකම පෝරුවෙ එකම ප්ලාස්ටික් මල්… මනමාලියගෙන් මනමාලිට හුවමාරු කරමින් කරන මං… මහෝත්සවයක කොටස්කාරියක් නොවීම ගැන මං සතුටු වුණ… මගේ කසාද බැඳීම වෙනස්. එක අතකට මමනෙ එහෙ… හිතන්නෙ. විලේගොඩ මහත්තයා මංගල්ලෙට අපේ පැත්තෙ… පහළොස් දෙනෙකුට ආරාධනා කරන්න අවසර දුන්නා… වගේ දුප්පත් මිනිසුන් [illegible] හෝටලයකට [illegible] පැමෙන්නෙ කොහොමද? විලිවෙලකට කුකුල් අණ්ඩක් … ගන්න බැරිවුණොත් නාඳුනන එක එක උදවිය මූණින් මූණ බ… ගන්න දර්ශනය මම කල් ඇතුව අනුමාන කළා.

හැමදේම සිද්ද වුණේ කලබලේට. මට කැඳවීමක් ලැබුණ… හෝටලයට.

'හෙටයි කසාදෙ' විලේගොඩ මහත්තයා කිව්වා. මගේ… කසාදෙ දිනය තීරණය කරන්න ඕන විලේගොඩ නෙවෙයි … වෙලාව දවල් දොළහට විතර ඇති.

'එහෙම කොහොමද? මං තාම මිනිහව දැකලත් නැහැ…' මම කිව්වා.

පින්තූරයක් විතරක් බලලා කසාදෙකට කැමති වෙන්න පුළුවන්ද? පින්තූරෙන් මිනිහගෙ හැමදේම පේන්නෙ නැහැනෙ.

'අතපය හතර හරියට තියෙනවද?' කියලා මම ඇහුවම විලේගොඩ මහත්තයා විදුලි සැරයක් වැදුණා වගේ පස්සට විසිවුණා.

'තමුන්ගෙ කට වැඩියි. එහොම හිටියොත් මේ මඟුල අත ඇරෙයි'

'ඒකට නම් කමක් නෑ.'

දමලා ගහලා ආපහු එන්න හිතුණත් තව ටිකක් ඉවසුවා. රූපවාහිනියෙන් දැකපු ජපානයෙ, සකුරාමල් පිපෙන ජපානයෙ, මල්පෙති විසිරුණ පාරවල් දිගේ කිමෝනෝවක් ඇඳගෙන ගමන් කරන තුපාව, ඒ ගමන් මගින් එකපාරට අයින් කරලා දාන්න හිත [illegible] නැහැ. අම්මලාටත් [illegible] දුක්දොම්නස් පීඩා [illegible] සුරංගනා [illegible] ගෙදරක, සුරංගනා සැප විඳීමේ ආසාව විදුලියක් වගේ හිත කොණකින් මතු වුණා.

'තමුන්ගේ කට සැර වැඩියි. එහේ ගිහින් මේ අහිංසකයා බලාගන්නෙ කොහොමද?' කියලා විලේගොඩ මහත්තයාගෙ බිරිඳ ඇහුවා.

'මං කසාද බඳින්නෙ අහිංසකයෙක් බලා ගන්නද? එහෙනම් මට පඩියක් දෙන්න වෙයි.'

මං එහෙම කිව්වෙ නෑ. හිතුවා විතරයි. මගේ වයස විසිපහයි. ජයනාථ දොස්තරෙක් ළඟට අරන් ගිහින් මාව බරෙන් නිදහස් කළේ වයස දහ අටේදි. අවුරුදු හතක් ගෙවිලා. ස්වාමිපුරුෂයෙක් එක්ක මිනී මරාගන්න අඩුවක් ශරීරයෙ තියාගෙන ලංකාවේ මිනිහෙක් කසාද බැඳීමේ අභියෝගයට [illegible] මං කැමති වුණේ නැහැ. මංගල යෝජනා තාධා…

'එයා කසාද බැඳපු කෙනෙක්ද?'

'නෑ'

'පළවැනි විවාහයද?'

'ඔව්'

'පෝරුවෙ නගිගනවද?'

'ඔව්'

'ඉතින් මේ මඟුල මගෙනෙ. අපේ මඟුලනෙ. අපිට අපේ මඟුල අපිටත් ඕනහැටියට කරන්න දෙන්න.'

'මනමාලයට හිතෙයි එයාව බලා ගන්න තමුන් සුදුසු නෑ කියලා'

'ඒක හරි කතාවක්නෙ. මං මොනවද බලන්නෙ? මනමාලයා එපෑ මාව බලාගන්න.'

'මේ කසාදෙන් අපිටත් ප්‍රශ්න ඇතිවෙයි වගේ.'

'මට නම් මේ කසාදෙ කෙරුණෙ නැතුවට කමක් නෑ'

'එහෙනම් ඉතින් ගිය වියදම් ගෙවන්න වෙයි. මනමාලයා හුඟක් වියදම් කරලා තියෙන්නෙ'

'ඇයි ලැයිස්තුවෙන් තෝරගන්න බැරුවයැ'

'ඒ වුණාට ගිය වියදම් ගෙවන්න වෙනවා. මනමාලයා කැමති වුණේ තමුන්ගෙ පින්තූරෙට'

විලේගොඩ මහත්තයා අතේ තිබුණු ඡායාරූප ඇල්බමයක්

නැමති වෙන්නෙ තමුන්ටත් අඩුවක් ඇතිනෙ කියන බැලු
විලේගොඩගෙ ඇස්වල තිබුණා.

දවසක් ගෙවන්නත් බැහැ. අනාගත හීනය නිකම්ම ඉවරෙ
පාවෙලා යන්න දෙන්නත් බැහැ.

'ඇඳුම් කැවුම්'

'කැන්ඩියන් සාරියකුයි, කනකරයි ගේන්න'

'මනමාලයා ඒවා දෙන්නෙ නැද්ද?'

'කුලියට ගන්න. යන මුදල අප දෙන්නම්. අදම වෛද්‍ය
වාර්තාවකුත් ගන්න ඕන'

'මොකටද වෛද්‍යවාර්තාවක්?'

'මනමාලයාට ඕන කරනවා.'

'ඒඩ්ස් තියෙනවද බලන්නද?' ඔහේ රැව්වට මට මොකද
ඇයි නිශ්ශබ්ද?'

'එතකොට මනමාලයගෙ වෛද්‍ය වාර්තාවක් අපි
දෙනවද?'

මනමාලයගෙ වෛද්‍ය වාර්තාවක් බලාපොරොත්තු වෙන්න
අපට අයිතියක් තිබුණෙ නැහැ. කැන්ඩියන් සාරියකුයි. කනක
ආයිත්තමුයි සොයා ගැනීමේ මෙහෙයුමට වෙලාවත් මදිවුණ
මමයි, රංගන මල්ලියි, තාත්තයි කැළණියෙ තැනකින් ඇඳ
හොයාගන්නකොට රු. දහයත් පනුවෙලා. සාරි හැට්ටෙ වීස
ලොකුයි. චන්ද්‍රනක්කා උදව් වුණා ඒක ශරීරයෙ ගානට පු
කරලා දෙන්න. එක රැයකින් මංගල උත්සවයට අවශ්‍ය හැමදේ

මනමාලයා දැක්ක මොහොතෙ මතක් වුණේ පාසලේ ඉඳිද්දි මිතුරියො එක්ක අනාගතය ගැන කතා කරපු දේවල්. මම ආස විජය කුමාරතුංග වගේ මිනිහෙකුට කිව්වම ආස වෙන්න නම් කාට බැරිද කියලා නිලමිණි ඇහුවා. ගානට උස මහත ඇති සල්ලිය බාගෙත් අතේ ඇති, ඇහැට කනට පේන, ආඩම්බරෙන් අතේ එල්ලිලා යන්න පුළුවන් ස්වාමිපුරුෂයෙක් ගැන මගේ මිතුරියොයි මමයි හීන මැව්වා. එතකොට ආරක්ෂාවයි, ආදරයයි දෙකම ලැබෙනවා. අපි වෙනුවෙන් ජපානයේ ඉඳලා ආව මනමාලයගෙ අතේ ආඩම්බරෙන් එල්ලිලා යන්න මට බැරි බව එක බැල්මෙන් මම තේරුම් ගත්තා. උස මහතකුත් ඒ හැටි නැහැ. සල්ලිය බාගෙ විතරයි තවම බලාපොරොත්තුව.

පහළොස් දෙනෙක් එක්ක එන්න කිව්වට අපි ගියෙ හයහත් දෙනෙක්. හතරැස් කේක් එකක් කැපුවා මසායා සාන් වීසා ගන්න තානාපති කාර්යාලෙට පෙන්නන්න පින්තූරත් ඕන කිව්ව හින්දා ඒ [illegible] පින්තූර ගත්තා. මම මසායා සාන්ට කේක් කෑල්ලක් කැව්වා. මසායා සාන් මට කේක් කෑල්ලක් කැව්වා ලැජ්ජාවෙන් ඇඹරි ඇඹරි. එයිට පස්සෙ බත් මේසයක් දැම්මා. අපේ බිල අපි ගෙවන්න ඕන කියලා විලේගොඩ කිව්වා. 'අපිට එහෙම සල්ලි නෑ ඔයාලා ගෙවන්න' කියලා මං කිව්වා රංගන මාව අතින් අල්ලගත්තා කෑගහන්න එපා කියලා. කන නොකන එක තීරණය වුණේ විලේගොඩලා සල්ලි ගෙවනවා කියන පොරොන්දුව දුන්නට පස්සෙ. මනමාලයා මනමාලි වෙනුවෙන් විවේක ගන්න කාමරයක් කුලියට අරගෙන තිබියට ඒකෙ හිටියේ විලේගොඩගේ නෝනා මහත්තයා. අපි හිටියෙ හෝටලෙනුත් එළියෙ පාරෙ එහා මෙහා ඇවිද ඇවිද. තාත්තා අතින් කනවද හැඳි ගෑරුප්පුවලින් කනවද කියලා එකල මෙකල වෙන කොට 'මගෙනෙ මඟුල' තාත්තා අතින් කන්න කියලා මම කිව්වා. ඊට පස්සෙ හැමෝම වගේ කෑවෙ අතින්. මං අම්මටයි තාත්තාටයි කෑම තෝරලා දුන්නා. ජීවිතේට ඉස්සෙක් දැකලා [illegible] අපේ ගෙදර අය ඉස්සෝ කන්න පටන් ගත්තා. ලෙලි

පිගානට අත තියන්න තැනක් හොයමින් හිටියා. බැදපු මා
ඌරුමස්, කුකුස් මස්, බටුමෝජු, බිත්තර, චට්නි, මාළු ඇඹුල්තියල්
අච්චාරු, පපඩම්, සැලඩ්. පිගන් දෙක තුනකට සෑහෙන කෑ
එක පිගානක. තාත්තා වරින්වර රුබට් අයියා දිහා බැලුව
රුබට් අයියා කාගෙවත් මූණක්වත්, පිගානක්වත් දිහා බැලුවෙ
නැහැ. ලනිල්, චන්දනක්කත් එක්ක එකතුවෙලා සමතල පුහු
මාසයකට හරියන්න ඉතාම පෝෂණදායක ආහාරයක් දිගේ
ව්‍යායාමයක යෙදී හිටියා. විලේගොඩලා හිටියෙ වෙනම මේසෙ
හැදිගැරුප්පු වලින් කෑවෙ. පිහියකුත් පාවිච්චි කළා. මසා
සාන් කෝටු දෙකකින් කෑවා. නොකෑවෙ මනමාලි විතරයි.

කේක් එකේ ඉතුරු ටික විලේගොඩ මැතිනිය අත
ගත්තා. සේවකයෙක් ඒක කොහාටද ගෙනිච්චා. තිකන් හතර
කේක් එකක්. කාට ඕනද? මසායා සාන් ඔය ඔක්කොටම සල්
ගෙවන්න ඇති. විලේගොඩ මහත්තයා සල්ලි අපු කවරය
තාත්තා අතට දුන්නා පැති පාර්සලෙකුත් එක්ක. ඒකෙ රුපි
පාලොස්දාහක් තිබුණු බව අම්මා කිව්වා. පාර්සලේ තිබු
තියෙන්නෙ සබන් කැට දොළහකුයි ජපන් රසකැවිලි වගයකුයි
ඔසරියයි, කනකර අබරණයි කුලියට ගත්තු වියදම පියවගන්න
පුළුවන්නෙ කියලා මම අම්මට කිව්වා. එක අතකට ඇවැ
දෙන්න ඕන මනමාලිගෙ පැත්තෙන්නෙ. මඟුල මෙහෙ නි
චාරිත්‍ර මෙහෙ ඒවා වෙන්න එපෑ.

'පොඩි එකෙක්ගෙ වගේ මහත්තයගෙ මූණ' කියලා තාත්
කිව්වා. ඒ කියමනේ තාත්තගෙ කැමැත්ත අඩංගු වුණා කියල
මං හිතුවා.

'ඇවිදින කොට පොඩි ඇදයක් තියෙනවා' කිය
චන්දනක්කා කිව්වා. ඇදයක් නම් තිබුණම මොකද ඇවිදින
නම්. මිනිහෙක්නෙ ඕන වුණේ.

හුඟාක් ඇති කියලා අපි අපේක්ෂා කරනවා. ඔබතුමියගේ අදහස දැනගන්න කැමතියි.

මම මද සිනාවක් පෑවා. කැමරාවද, විදුලි එළියද කියන්න බැහැ ඇස්වලටම තද ආලෝකයක් එල්ල වුණා. කාටද දැනගන්න ඕන මගේ බලාපොරොත්තු. ජපන් ජාතික ස්වාමිපුරුෂයා ගැන. සකුරා මල් පිපෙන ජපානය ගැන. සකුරා මල් මොන පාටද, පිපෙන්නෙ ගස්වලද වැල්වලද කියලා නොදන්නවා වුණාට සකුරා මල් සුළඟට සෙලවෙනවා දැනෙන්න වුණා. අතුඉති පිරෙන්න පිපිලා. ඒවා ගස්ද වැල්ද දන්නෙ නෑ.

බලාපොරොත්තු හුඟක් තියෙනවා. ජපන් බෝනික්කෙක් හම්බ වුණොත් ඒ හොඳටම ඇති. පොඩිකාලෙත් ඇඩුවෙ ජපන් බෝනික්කෙක් ඉල්ලලා. හිනැහෙන බෝනික්කෙක්. ඊත් මට හම්බවුණේ තට්ටෙ තියෙන බෝනික්කෙක්. හෙළවැලි බෝනික්කෙක්. අතපය මට සුදුවට හැඩි බෝනික්කෙක්.

ඊත් මං ඒ බෝනික්කට මුළු හිතින්ම ආදරේ කළා. ගවුම කැලි මැහුවා. ඇන්දෙව්වා. නැව්වා. පියරු දැම්මා. නැළවිලි ගී කිව්වා.

මගේ බලාපොරොත්තුව ජපන් බෝනික්කෙක්. රූපවාහිනි නිවේදිකාව ජපන් බෝනික්කා ගැන දිගින් දිගටම විස්තර අහන්න පටන් ගත්තා. මගේ ඔළුව ඇතුලෙ හිටපු රූපවාහිනි නිවේදිකාව ආපහු හැරී බලන්නෙවත් නැතුව යන්න ගියා.

මගේ දැන් ඉතින් හීනය එහෙම තමයි. මං ඒ සිහිනය දකිනකල් රාත්‍රිය උදාවෙන තුරු ඉන්නවා. කවදහරි රාත්‍රියක ඒ සිහිනය පෙනේවි. ඉර උදාවුණාට පස්සෙ පිණිබිඳුවක් වගේ වියැකිලා යන හීනයක් දැකීමෙන් වුණත් සෑහෙන්න පුළුවන් විදිහට මං මගේ හිත හදාගත යුතුව තිබුණා. මතකයේ කැළලක් ...ගෙන ජපන් බෝනික්කෙක් හොයාගෙන යන ගමන

මම මසායා [illegible] මසායා මහත්මයා
ගුවන්තොටුපළේදී වෙන්ව ගියා. ජපන්නු ගොඩක් [illegible]
හිටියොත් නම් මේ ජපනාව අඳුරගන්න අමාරු වෙයි කියලා
පොඩි බය සංකාවක් හිතට ආවා. කොයි ජපනත් එක වගේ [illegible]
මිදුලට එන වී කුරුල්ලො එකෙකුගෙන් අනෙකා වෙන් කරලා
අඳුරගන්න බෑ වගේ ජපනෙක් තව ජපනෙකුගෙන් වෙන් කර[illegible]
ගන්න පුළුවන් වෙන එකක් නෑ කියලා හිතුණා. ජාලියා[illegible]
ජිනදාසලා, සිරිසෝමලා, වෙන් කරලා අඳුරගන්න පුළුවනි. [illegible]
ජපන්නු අඳුනා ගැනීම එහෙම කරන්න බැරිවෙයි. ඒක [illegible]
ස්වාමිපුරුෂයටත් ඒ විදිහටම වෙයි. ඒත් මසායා සුමිකෝ[illegible]
මහත්තයාගෙ වටාපිටාවේ ඉන්න එකම සිංහල ගැහැනිය [illegible]
හින්දා මහත්තයට වරදින්න බෑ.

අපි දාහතර දෙනෙක් විතර මහත්තයට සමු දෙන්න
ගුවන්තොටුපළට ගියා. සුදු උදවිය විතරක් නොවෙයි [illegible]
උදවියත් සිප [illegible]
මූණ දිහා බලාගෙන [illegible]
සැරයක් විතර කොන්ද නමලා සමුගත්තා. කොන්ද කෑල්ලි[illegible]

මගේ කසාද පුරුෂයා නොපෙනී යන තුරු මං බලාගෙන
හිටියා. අඬන්න පුළුවන්ද කියලා ඇස්දෙක පියාගෙන හිතුවා[illegible]
ඇතුට කඳුලක් පැමිණීම ප්‍රමාද වුණා. අඬන්න තරම් කැඩී[illegible]
හිත පපුව තුළ නැද්ද? අඬන්න කාරණාවකුත් නැතුව [illegible]
වෙන්වීමක් පමණයි. මහත්තයාගෙ රටේ සතුටා [illegible]
මහා මාවතක අතුරු පාරක තිබෙන කියලා [illegible]
[illegible]

3

හරීටා ගුවන්තොටුපට මම ගියේ මසායා සාන් නිගතා ගිහින් දවස් දෙකකට පස්සෙ. අහස් යානයට කටුනායකින් නැගුණට පස්සෙ අහස් යානාවට වඩා ඉහළින් මගේ හිත ඉගිල්ලෙන්න ගත්තා. වලාකුළුවලට උඩින් ඉගිල්ලිලා ගිය හිත උඩදි ඉගිල්ලෙන්නයි පහළට රූටන්නයි පටන් ගත්තා. ඒත් [illegible] කුරුල්ලෙක් [illegible] නැහැ. කන්දෙක [illegible] කරම වේදනාවක් දැනුණා. හරියට කන්දෙක වැකියුම් කරනවා වගේ. ගුවන් යානය උඩට යනකොට සීංචිලි පදින කිතියක් යටි බඩේ ඇතිවුණාට තව ටිකකින් ඇති වුණේ වමනය යන හැඟීමක්. ගුවන් සේවිකාවො අතින් කටින් සංඥා කරමින් හදිසි අනතුරකදී ආරක්ෂා වෙන හැටි කියලා දුන්නා. ඒත් අනතුරක් ආවා නම් ඒ කිසි දෙයක් මතකයේ තියෙයි කියලා හිතන්න බෑ. සංඥා භාෂාවකින් අනතුරකට මුහුණ දෙන්න ඉගෙන ගන්නෙ කොහොමද? වමනෙ යන ගතිය දිගටම තිබුණා. ඒත් අහස්යානාව ඉහළට ඉහළට යනකොට වලාකුළු පහළට පාවෙවී යන හැටි බලන්න ඇති වුණේ පොඩි ළමයෙකුගෙ ආසාව. කුරුල්ලෙක් අහසේ වියාසර කරනවා වගේ ආසාවකින් හිත වියාසර කරන්න පටන් ගත්තා. එතකොට වලාකුළු තියෙන්නෙ අහසෙ නොවෙයිද? අහසයි වලාකුළුයි එකතුවෙන තැනක් නැද්ද? [illegible] අහසේ යානයක නැගිලා යන [illegible] වෙච්ච එකේ වමනයට එන හැඟීමයි

ඇඹීම මහ දෙයක් වුණෙ ... යානයකට මාරුවීමේ කරදරයට මූණ දුන්නෙ මේ මළඹ... කසාදයත් හින්දා මට වෙච්ච කරදරයක් කියන හැඟීමෙනු... නියමිත බර ප්‍රමාණයට වැඩි, මිරිස්, තුනපහ, ලට්ට ලො... පුරවපු ගමන් මළු කොයිවෙලාවෙ පුපුරයිද දන්නෙ නැ... තරමට පිම්බිලා තිබුණා. සිංහල මිනිස්සු, ගෑනු බොහෝ... දෙනෙක් සිංගප්පූරු ගුවන් තොටුපලේ හිටියට ඒගොල්ලෙ... හිටියෙ නාඳුනන දුරු පුත්තු වගේ. මගේ ස්වරූපයෙ... අතින් කටින් අරන් ගිය බඩුබාහිරාදියෙයි තියෙන්න ඇත්තෙ... ගෘහ සේවිකාවකගෙ ලකුණ. ඒ කාරණාව නිසා දණ්ඩනය... පැනවිලා තිබෙන්න ඇති. වැදගත් සහ නොවැදගත්! ට්‍රොලිය... රෝද බර කරත්තෙක බැඳපු ගොනා පස්ස ගහනවා වගේ... පස්ස ගහන්න වෙච්ච හින්දා, ගුවන්තොටුපලේ පැය හය... හිටියට හුඟ වෙලාවක් කළේ එක තැනක ඉඳගෙන බලා සිටී... නන්නාඳුනන දස දහස් ගණන් මිනිස්සු, ගෑනු ගමනාන්තය... සොයාගෙන මහ කලබලයකින් යන එන බවක් පෙනුණා. ඒ... අතරෙ මුළු ඇඟම වහගත්තු ගෑනුත්, යන්නම් විලිවසාගත්... ගෑනුත් හිටියා. මුළු ඇඟම වහගත්තු ගෑනු මුළු ලෝකෙම දෑ... බලා ගන්නවා හැමෝටම නොපෙනෙන්න. මං ඇඳලා හිටියෙ... දිග සායකුයි, බාග අත් බ්ලවුස් එකකුයි. ඒ ඇඳුම ගත්තෙ... නුවරදී මසායා සාන් එක්ක ගිහින්. මසායා සාන් බිල ගෙව්ව... වෛවාහික ස්ත්‍රී පුරුෂ සම්බන්ධයේ නොපැකිල ඉටුකළ යු... මෙහෙවරක් වගේ මසායා සාන් ඒ හිටපු දවස් ගානම කළේ... නොපැකිල බිල් ගෙවීම!

නරිටා ගුවන් තොටුපලෙන් එළියට එනවත් එක්කම මසාය... සාන් වගේ ජපනුන් දහස් ගණනක් දැක්කා. කොයි මිනිහ... මගෙ ස්වාමිපුරුෂයා? කොයි මිනිහා වුණත් ජපනෙක්නේ. එක... මූණ කට, නහය. එකම විදිහට හිස නමා ආචාර කිරීම. මසා... සාන් මාව හොයාගෙන ආවොත් මිසක මට මසායා සාන් සො... ගැ... කාරණාවක් නෙවෙයි කියලා...

සාන්ට තිබුණේ එක්කෙනෙකුගෙන්. එක්කෙනෙක් හොයා ගැනීම. මසායා සාන් දුවගෙන ආවා. කොන්ද නමලා ආචාර කළා.

මගේ ස්වාමිපුරුෂයා හෙවත් මසායා සාන් හිටියෙ කබ පෙරාගෙන, කුණුකෙළ පෙරාගෙන. මසායා සාන් මං තල්ලු කරගෙන ආපු ට්‍රොලිය තමුන්ගෙ භාරයට ගත්තා. මම ස්වාමිපුරුෂයගෙ මූණ දිහා නොබලා ඉන්න ප්‍රවේසම් වුණේ ඒ කබයි, කුණු කෙළයි ආපහු මාව ලංකාවට හරවලා යවයි කියන බයට. තාත්තා ගෙදරින් එළියට බහින්නෙ කොණ්ඩෙ පීරලා, කන්නාඩියෙන් මූණ බලලා, ජැන්ඩි පහට ඇඳගෙන. ලොකු ප්‍රේමයි, පොඩි ප්‍රේමයි දෙන්නම ඒ පිළිවෙළට, ජේත්තුවට කැමති වෙන්න ඇති. ඉස්සෙල්ලාම ඒ පිළිවෙළට මසායා සාන්ව පුරුදු කර ගන්න ඕන කියන හැඟීම හිතට කාන්දු වුණා. ගුවන්තොටුපලට නැගිට්ට ගමන් දුවන සිරිතක් තියෙනවද කියලා යටි හිත ප්‍රශ්න කළා. අප්පිරිය හිතෙන මූණ ගැසීමක් වුණාට මසායා සාන් හිටියෙ උණුසුම් හැඟීමකින් කියලා පෙනුණා. කතා බහ නොකළට ඒ උණුසුම් පිළිගැනීම හැසිරීමෙ ලියැවිලා තිබුණා. විශ්ව භාෂාව චිත්‍රපටියක් වගේ.

මසායා සුමිකාවා මහත්මියගෙ බරපොදි ටික මසායා මහත්තයා ලේසි පහසුවට තල්ලු කරගෙන ගියා. මම මසායා සාන් පස්සෙන් දුවගෙන ගියා. උස සපත්තු දෙක හින්දා දිවීම එච්චර පහසු වුණෙත් නෑ. මසායා සාන්ගෙ ගමනෙ ඉක්මන්කම හින්දා හිමින් යන්න පුළුවන් වුණෙත් නෑ. පළවැනි වතාවට මසායා සාන් මට ඉංග්‍රීසියෙන් Love you කිව්වෙ ට්‍රොලිය තල්ලු කරගෙන යන ගමන් ආපහු හැරිලා බලලා. එහෙම කියන්න ඇත්තෙ ඇත්තටමත් වෙන්නැති. ඇහිපිල්ලන් ගහන්න කලින් ගහකොළ පහුකරන ෂින්කාන්සෙන් (Shinkansen) විදුලි දුම්රියේ නාඳුනන මූණු අතර එක සිංහල මූණක්. නෑ තව ඇති. ජපන් ජාතික ගෑනු පිරිමි නාඳුනන තාලෙන් හිටියට මසායා සාන්ගෙ මනමාලි දිහා නොබැලුවෙත් නෑ. කිමෝනෝ ඇඳගෙන කවුරුවත් ... තරුණ ගෑනු ළමයි ඉතාම කෙටි සායවල් සහ කෙටි

ඇඳුමෙන්, ආයිත්තමෙන්, හමෙ වර්ණයෙන් වෙනස් ස්වරූපයක් පෙන්නුම් කළා. මුළු දුම්රියම නිහඬයි. මං නීගතාවට ආවෙ වසන්ත කාලෙ. මල් මිස කොළයක් දකින්න නැති මහ අරුම පුදුම වසන්ත කාලෙ. විදුලි දුම්රියෙදී සැරයක් දෙසැරයක් මසායා සාන් මං දිහා බැලුවා. මසායා සාන් ඉන්නෙ දුකින්ද, සතුටින්ද කියන්න බෑ. මූණ කිසි හැඟීමක් දැනීමක් පේන්නෙ නැතු පාර දෙපස පිපිලා සෙලවෙන අතු අග පිපිච්ච මල් යාය පහුකරගෙන විදුලි දුම්රිය යනකොට මාත් මෙහෙම පින්කලාවෙ කියන සිතිවිල්ල හිතට ආවා.

විදුලි දුම්රියෙන් බැහැලා මසායා සාන් කඩිමුඩියෙ දුවගෙන ගිහිල්ලා කුලී රථයක් අල්ලගත්තා. ඒ අපේ ගෙද යන්න! මසායා යුවලගෙ ගෙදරට! නීගතාවෙ කඳුවැටියි, දිය ඇලියි, උයන්වතුයි, පැරණි නගරයෙ මැද්දකම පිහිටලා තියෙන කුඹුරු යායයි හිතේ හැමතැනින්ම ගීතයක ස්වර මතුවෙනවා වගේ හැඟීමක් ඇති කළා. මුළු නගරයම චිත්‍රයක් ඇන්දා වගේ පාට පාටින් [illegible]. ඒ චිත්‍රය නම් [illegible] අමතක නොවන චිත්‍රයක්. නීගතාවෙ [illegible] කියලා මට හිතුණා. මෙහෙම මල් පිපෙන්න මේ පොළවයි මේ දේශගුණයයි කොයිතරම් හොඳට එකිනෙකට පැහෙන්න ඕනද? බිම පිපෙන ටියුලිප් මල් යායයි, උඩ පිපෙන සකුරා මල් පොකුරුයි, එක යායට දිවෙන කුඹුරු යායයි මගේ හිත හීනෙන් දැකපු ලෝකෙකට ගෙනයන්න සමත් වුණා. ටියුලිප් මල් යාය, මල් කුඹුරක් වගේ ඇස් දෙකේ සදහට නිදන් වුණා. මෙහෙම අපූරු වටාපිටාවක යනකොට අලුතෙන් කසාද බැන්ද පුරුෂයෙකුයි ගැහැනියෙකුයි ඔවුනොවුන් දිහා ප්‍රේමාලිංගනයෙන් බලන එක සාමාන්‍ය දෙයක්නෙ. එත් කබ පිරිච්ච ඒ මූණ දිහා බලන්න මට හිතුණෙ නෑ. ඊට වඩා ලස්සනයි සකුරා මල්, ටියුලිප් වර් තව නම් නොදන්න මල්. මසායා සාන් මං දිහා බැලුවෙත් නෑ ඕගෙ හමේ කළුපාට ගැන හරි, මගේ මූණෙ මසායා සාන් දකින් අඩුලුහුඬුවක් ගැන හරි හිත හිතා යනවද දන්නෙ නෑ.

විට එජන්තවරයා එහෙම කියන්න කියලා දැනුවත් කිරීමක් කරපු හින්දා වෙන්නැති. මලින් පිරිච්ච මිදුලක් සහිත ගෙදරක ගිහිකාරිය එහෙමත් නැත්නම් පංගුකාරිය වීමේ ආසාවෙන් මගේ හිත පිම්බෙමින් තිබුණා. චිත්‍රපටියක දැකපු ජපන් ගෙදරක විසිතුරු හිතේ මැවෙන්න ගත්තා. කිමෝනෝව ඇඳගෙන, මිටි මේසෙය වටා ඉඳගෙන කෑම කන හැටි. ඉකෙබානා සැරසිලි වලින් ගේ අලංකාර වෙලා තියෙන හැටි. නවීන පන්නයේ උපකරණ, ගිව කබා එල්ලන පුවරුව, සාලයේ එල්ලෙන කේතලය, බිත්තියේ එල්ලෙන දැවැන්ත චිත්‍ර, උණුසුම් වෙච්ච නිදන කාමරය. මගේ හීන ඔක්කොම හිතේ එහා මෙහා සැරිසරන්න පටන් ගත්තා. එක දිගට කුඹුරු යායක් පහුකරගෙන ගියා. මසායා සාන් කිසි දෙයක් විස්තර කරන්නෙ නෑ. මම පේන දේවල්වලින් කතාවක් හිතේ ගොතාගත්තා. කුඹුරු සමහර තැන්වල ගොඩකරලා. එහෙනම් ජපානෙත් කුඹුරු ගොඩකරලා ගෙවල් හදනවා. හැමදේකටම වැඩිය ලස්සනත් [illegible] නගරය මැද්දෙ තිබුණු කුඹුරු [illegible]. පරණ [illegible] හිතෙන්න පුළුවන් ගෙවල් කඩසාප්පු. ඒ අතරෙ එළවළු කඩයක්, පලතුරු කඩයක්, මල් කඩයක් වෙන වෙනම තියෙනවා ඇක්කා. ගැනුම්කාරයො නම් පේන්න එළියක පාතක හිටියෙ නැති ගානයි. සුපිරි වෙළඳසැලක් ඇතුළෙ එළවළු, පලතුරු, මල් වගේම නානා ප්‍රකාර බඩුබාහිරාදිය අතරෙ ඇවිදින ජපන් ජාතික ගෑනු උදවිය පෙනෙන්න හිටියා. පිරිමි උදවිය කඩේ පිළේ යන්නෙ නැතුව ඇති කියලා එකපාරට හිතට හිතිවිල්ලක් ආවා.

මසායා සාන් එක්ක මම මසායා සාන්ගෙ ගෙදර ළඟට ආවා. මසායා සාන් කුලී රථ රියැදුරා එක්කවත් වචන දෙකකට තුනකට වඩා කතා කළේ නෑ.

මෙයා කතා කරන්නෙ නැති ගල් ඉබ්බෙක්. ඉස්සරහට ඉන්න සිද්ද වෙන්නෙ මේ ගල් ඉබ්බත් එක්ක තමයි. මේ ගල් ඉබ්බගෙ [illegible]ල් ගේ දැකපු මොහොත මගෙ හීන ඔක්කොම ගෙයක්

මහගෙයක් වගේ. අපේ ගෙදරට මේ මිනිහා 'good hou[illegible]
කිව්වෙ මොකද කියන කාරණාව විදුලියක් වගේ හිතට [illegible]
මේ පාළු ගෙයත් එක්ක බලන කොට අපේ ගෙදර හොඳ [illegible]
තමයි. ගේ ඇතුළට යන කොට මට දැනුණෙ වැස්සකට අඳුර[illegible]
යනවා වගේ හැඟීමක්. මහා පාළු ගතියක්, පරණ ගතියක් [illegible]
ඇතුළෙ විතරක් නෙවෙයි වටා පිටාවෙත් තිබුණා. එක විදුලි[illegible]
මලක්වත්, සකුරා මලක්වත්, මං නම් නොදන්න මලක්වත් පිපි[illegible]
තිබුණෙ නෑ. තැලෑවට වැව්ච්ච පඳුරු වගයක මල් පිපිලා තිබුණ[illegible]
ඒවයෙ තිබුණෙ මහ කෙඩෑරි ගතියක්. ගහකොළ පවා පර[illegible]
යෝධයින් වගේ නැඹී හිටියා. මසායා සාන්ගෙ ගස්වල ම[illegible]
පිපෙන්නෙ නැද්ද මුළු නගරෙම මල් පිපිලා තියෙද්දි. මසා[illegible]
සාන්ගෙ ගෙමිදුලෙ තිබ්බ්ච්ච ගහකොළවල පවා තිබුණෙ මහ [illegible]
ගතියක්.

වැහුවට වැහෙන්නෙ නැති දොරවල්. පළවැනි [illegible]
ඇරගෙන මසායා සාන් ඇතුළට ගියා. [illegible]
බලාගෙන හිටියෙ දැන් ඉතින් ආපහු හැරිලා යන්නෙපෑ කිය[illegible]
හැඟීමෙන්. ගල්ගුහාවකට ඇතුලුවන හැඟීමෙන් මම පසුපසි[illegible]
ගමන් කළා. ඇරපු දොර වැහුණට හිඩැස් අතරින් ගේ ඇතු[illegible]
සීතලක් ගලාගෙන ආවා. අද්භූත ගුහාවකට යනවා වගේ මසා[illegible]
සාන් පස්සෙන් වැටුනු නූපා දිහා නූපාගෙ හිත පැත්ත[illegible]
වෙලා බලා හිටියා. පළවැනි සාලය හමුවන තැනදී මසා[illegible]
සාන් සපත්තු ගලවලා තිබ්බා. හරි පිළිවෙළට. සපත්තු ගල[illegible]
ස්ථානය එක්කම ඇති කොරිඩෝවට ගොඩ වුණෙ පසුපසි[illegible]
එන කාන්තාව ගැන හැඟීමක් නැතුව වගේ. වම් පැත්තට [illegible]
පුටු දෙකකුත් කනප්පුවකුත් තිබුණා. දකුණට තියෙන[illegible]
නානකාමරයයි. වැසිකිළියයි කියලා කැඩිච්ච ඉංග්‍රීසි [illegible]
මසායා සාන් කිව්වා. ඉස්සෙල්ලාම නානකමරය ළඟට [illegible]
බලන්න [illegible] කාමරය[illegible]
[illegible]

ළඟ ඉඳලා තව ඒදණ්ඩක් වැසිකිළියට. ඒදණ්ඩ ලිස්සයි කියලා බය හිතුණෙ ඒදණ්ඩට දාපු ලීය හොඳට මැදලා තිබුණු හින්දා. ලිස්සලා වැටෙන්න බැරි නෑ නූපෙ. නාන කාමරයේ ඉඳලා වැසිකිළියට ඒදණ්ඩ දිගේ මීටර් දෙකක විතර ගමනක්. වැසිකිළිය මහා අඳුරුයි. ලංකාවෙදී මහා හෝටලයක මධු සමය ගත කරපු මසායා සාන්ගෙ නානාකාමරෙයි, වැසිකිළියයි මෙතරම් අන්ධකාරයි කියලා හීනෙකින්වත් හිතුණෙ නැහැ. මිනිහා හෝටලයෙදි නම් හිටියෙ මෙහෙම වැසිකිළියකට යන කෙනෙක් වගේ නෙවෙයි. නූපා මවාගත්තු විල්ලුද බුමුතුරුණු සහිත පුංචි මාලිගාවක අනුරුව ඇස් ඉදිරියෙම කඩා වැටෙමින් තිබුණා. චිත්‍රයක දැක්ක බෝනික්කි ගෙදර දිහා මනසින් බලාගෙන හිටියා මොහොතකට හරි හැබෑ කරගන්න බලාගෙන. නූපා කියන පුංචි ගෑණු ළමයා කොණ්ඩ කරල් දෙක වන වනා බෝනික්කි ගෙදරට ඇතුල් වෙන්න බලාගෙන හිටියා. හීනෙකින් හරි පේන බෝනික්කි ගෙදර දිහා නූපා බලාගෙන හිටියෙ මහ කැදර කමකින්. නූපාගෙ[illegible] තියෙන නානකාමර [illegible]ලයි, මධුසමය ගත කරපු හෝටලේ නාන බේසමයි, අපූරු විසිතුරු මූණ හෝදන බේසමයි, තමුන්ගෙම කියන ජපන් ගෙදර දකින්න ආපු නූපාට මේ මොකද වුණේ කියලා ලොකු නූපා, පොඩි නූපාගෙන් ඇහුවා. ගල් බෝර දාලා පුපුරුවනවා වගේ බලාපොරොත්තු ඔක්කොම ඇස් ඉස්සරහම පුපුරලා ගියා. ඒ පුපුරලා ගියේ භෞතික බලාපොරොත්තු. භෞතික නොවන බලාපොරොත්තුව මොකද්ද එතකොට? මහා ප්‍රේමයකින්, ඇස් උතුරා ගලා යන කරුණා ගුණයකින්, හිත සිපගෙන, සත් මුහුද තරණය කරලා මම ඔයාව හොයාගෙන ආවෙ සංසාරෙ පුරා තෙව්ව ආදරයක් හින්දය කියලා කියන ස්වාමිපුරුෂයෙකුගෙ සෙවනෙහි ඉඳිමේ මනෝමය ආසාවකින් හිත වලංගු කරගන්න නූපා උත්සාහ කළා. ඒක නැත්නම් මේක.

ඇත් ඉතින් ජීවිතේට මූණ දෙන්න සිද්ද වෙන්නෙ ඒ විදිහටයි [illegible]ස්වාමිපුරුෂයාගෙ උරහිස මත මගේ හිස තබාගෙන

වගේ පිටේ පිපිලා [illegible] ඇඩිය වටින [illegible] ස්වාමිපුරුෂයගේ ආලය. කිරිඳ බෝනික්කෙක් වගේ බලාගත්ත ස්වාමිපුරුෂයෙකුගෙ කිරිඳ වෙන්න මැව්ව නානාප්‍රකාර හීනවල අවසාන අදියරටද මං මේ ඇවිත් ඉන්නෙ? ඔයා ඔහොම අඬන්න ඔයා කිනාවෙන කොට ඇස්දෙක පියාගන්න හිතෙන්නෙ නෑ. ඔයා රෙදිහෝදන්න එපා, ඔයා මච්චර මහන්සි වෙන්න එපා. ඔයාගෙ තම පරිස්සම් කරගන්න ඕන. ඔයා දත් දොස්තර ළඟට නොවැරදී යන්න. ඔයාට අලුත් ඇඳුම් ටිකක් ගන්න යමු. ඔයා හිත සතුටින් ඉන්නකොට මගෙත් හිත සතුටුයි. ඔයා මගේ පතාගෙන ආ භාර්යාව වගේ කතා කියන ස්වාමිපුරුෂයෙකුගෙ උරහිසට හිස තියාගෙන, ඉහුරැමුණි පෙම්යුවල වගේ ආදරෙන් වෙලිච්ච පෙම් යුවලක් වෙන්න පුළුවන් නම් ඒ මොකක් වුණාම මොකද? මේ කියන්නෙ ආදරය පිරිච්චි නැත. මට ඒ ආදරය පිරිච්චි නැත මෙතැන නම් ඒක බෝනික්කි ගෙදරක්ම වෙන්න ඕන නෑ.

ඒත් ඉතින් [illegible] මාව [illegible] නම් [illegible]

මගේ ස්වාමිපු[illegible] මුළු. තවමත් කාලය මැද්දෙ එහෙමම තිබුණා. ස්වාමිපුරුෂයෙ සුදානම් වෙලා හිටියෙ නිදාගන්න විතරයි. අලුත් මෙට්ට දෙකක් තිදන කාමරයෙ බිම දාලා තිබුණා. ජපානයේ සීතල ගැන හැඟීමක් දැනීමක් නොතිබුණ නිසා මං හිටියෙ ජ ඕගෙට ඇරිච්ච ඇඳුමක් ඇඳලා. මසායා සාන් හොඳට ඇඟ වැහෙන්න ඇඳලා තව හිමකබායකුත් ඇඳලයි හිටියෙ. ඔයාට සීතල ද කියලා අහන්න භාෂාව නොදන්නවා වුණාට, සීතල බව දැනෙන්න හැඟීමක් දැනීමක් ස්වාමිපුරුෂයාට නැතිවුණේ කොහොමද කියන නෝක්කඩු කල්පනාව මොහොතකට හිත ඇතුළෙ විදුලියක් වගේ එහා මෙහා දිව්වා.

ස්වාමිපුරුෂයා නිදාගන්න මෙට්ටෙට වැටුණා. පියාසර කරමින් හිටපු [illegible]

මිනිහෙක් හිටියෙ නෑ. කිරිඳක් නිවසට පැමිණීමේ සතුට පළ වුණා ඉරියව්වලින්. නන්නාඳුනන දුක පළවුණෙත් ඉරියව්වලින්. මම සීතලට නොහෙල්ලී උණුසුම් වීමේ උපාය භාවිතා කරමින් ගොරෝසු රෙද්ද යට ගුලිවෙලා හිටියා. නෙළවුණෙත් සීතල! ස්වාමිපුරුෂයට විවාහයක පළපුරුද්දක් තිබුණෙම නැති සාරයට හොරවමින් නිදාගෙන හිටියෙ. මුළු ගතක් එකා ඉඳලා ආපු ගැනියෙක් උඹ ළඟම වැතිරිලා ඉන්නවා මිනිහෝ කියලා ස්වාමිපුරුෂයව ළඟට ඇද ගැනීමේ ආසාවකුත් ඇතිවුණා. ඒත් නිදා ගත්තාදෙන් කොයිවෙලේ හරි අවදි නොවෙතැයි කියන හැඟීමෙන් මසායා සාන්ගෙ ගෙදර පළමු රාත්‍රිය පහන් කළා.

මසායා සාන් අවදි වෙන පාටක් තිබුණෙ නැහැ. පරම්පරා ඉඩමක් මැද්දුවෙ කොම්පිට්ටුවක් වගේ තියෙන පරම්පරා නිවසක අලුත්ම හිමිකාරිය [illegible] කාරියක් වීමේ සතුට භුක්ති විඳින්න [illegible] තිබුණා. අද ඉඳලම [illegible] ම තිබුණා. මසායා සාන් පාලු ගඳ ගහන ගෙදරක අයිතිකාරයා වුණාට ආසාව නැතු පාලු ගඳ ගහන ගෙදරක ඉන්න. කුස්සියට ගිහින් කුස්සියෙහි අධිපතිනිය වීමේ පළමු පියවර තැබුවා. ගේ පුරා දවිල්ලා වගේ සිටගෙන හිටියා එක එක ප්‍රමාණයේ පෙට්ටගම්. කුස්සිය පුරාම කබඩ් හා ලොකු ලොකු භාජන පරණ උරුමක්කාරයො වගේ පෙළ ගැසී හිටියා. ඒ ලොකු භාජන ලොකු ලොකු දාන මාන කටයුතු වලට යොදාගන්න භාජන තරම් ලොකුයි. මේ ගෙදර වාසය 'කළේ හරි, වාසය කරන්නෙ හරි ගොවි කර්මාන්තයෙ යෙදෙන උදවිය කියන එක නම් අනුමුල්ලසින්ම දැනුණා. කල එළියක් ගැන වුවමනාවක් නැත්තු පරම්පරාවටම තිබිලා නැහැ. එදාවේල සොයා ගැනීමේ බොහොම සරල වුවමනාවක් විතරයි තියෙන්න ඇත්තෙ.

[illegible] පාන්දරම ඒ දණ්ඩ දිගේ ගිහින් නානකාමරය ළඟ [illegible]

ශරීර කෑතයි ... ඇඟ තබා ඉඳගැනීමේ
අභ්‍යාසයේ යෙදෙන්න සිදු වුණා. වැසිකිළිය අඳුරුයි - වළ ...
ඇති මලපහ නොපෙනී හැංගී සිටියෙ ඒ අඳුරේ උපකාරයෙ[illegible]
ලැබූ ඒ දණ්ඩ දිගේ නානකාමරයට ඇවිත් ඇඟ හෝදගත්[illegible]
සීතලේ ගැහෙමින්. ඇඟ නොහෝදා ඉන්න බැරිකමක් තිබුණ[illegible]
තකුල් අතපය විතරක් හෝදලා බෑ. ගමන් මල්ලක් ඇරලා [illegible]
බ්ලවුසයකුයි, කලිසමකුයි ඇඳ ගත්තා. කලිසමක් නැතුව [illegible]
ඉචිත්ලෝන් ටිකක් ඔළුවට හලා ගත්තෙ ස්වාමිපුරුෂයට සුවඳ[illegible]
දැනෙන්න. අපේ අම්මා ඉචිත්ලෝන් දැම්මෙ නැහැ. ඒ වුණ[illegible]
හවස් වෙනකොට අම්මා ළඟ කපුරුමල් සුවඳක් තිබුණා. [illegible]
කපුරුමල් සුවඳ ආවෙ කොහෙන්ද?

මගේ ස්වාමිපුරුෂයට තේ එකක් හදලා දෙන්න[illegible] පිළිගැනීමේ වුවමනාවයි, මටත් තේ කෝප්පයකින් උණුසුම් වීමේ වුවමනාවයි. බිරිඳක් වීමේ වගකීම හිතට දැනිලා [illegible] [illegible] සීතකරණයේ තිබ[illegible] දෙකක් [illegible] ව සිටියා. [illegible] යටිහිතේ හිටපු බිරිඳ යටිහිතේ හිටපු ස්වාමිපුරුෂයාගේ [illegible] ඔබගෙන දානයකට හදන සිලන්පස කෝප්පයක් වගේ [illegible] කෝප්පයක් හැදුවා. තේ කෝප්පය බොන්න ස්වාමිපුරුෂයා[illegible] නැගිට්ටෙ නැහැ. කට දෙපැත්තෙ කුණුකෙළ බේරිලා. කුණුකෙ[illegible] කැටිත් උණුම දෙයක්. කුණුකෙළ නොපෙරන ස්වාමිපුරුෂයෙ[illegible] නෑ. නොරිදින්නෙ නැති ස්වාමිපුරුෂයෙක් හරි සොයා ගැනී[illegible] පහසු වෙන එකක් නෑ. මිනිහෙකුට හොඳටම නින්දයාම පිළි[illegible] ලක්ෂණයක් තමයි කුණුකෙළ කියන්නෙ.

මම තේ කෝප්පය තියලා හිමින් උදේට කෑම පුදානම් [illegible] බත් උයලා [illegible] අරගෙන ආපු සීනි සම්බෝලයි. [illegible] [illegible]

වගේ. මසායා සාන් කතා නොකරම බත් කෝප්පයක් බෙදා ගත්තා. බත් කෝප්පෙට අමු බිත්තරයක් කඩලා දාගෙන කෝටු දෙකෙන් හරඹ කරමින් විනාඩි දෙක තුනකදි බත් කෝප්පෙ කාලා ඉවර කළා. ඇවිදින්න යනවා කියලා බයිසිකලේක නැගලා යන්න ගියා. ඇවිදින්න බයිසිකලයක් මොකටද? සංඥා භාෂාවෙනුයි, කැඩිච්ච ඉංග්‍රිසියෙනුයි, ජපන් භාෂාවෙනුයි කියන කතාවලින් සාරාංශයක් ගොනු කරගන්න මං උත්සාහ කළා. මොකක් වුණත් දැන් පීනන්නනෙ තියෙන්නෙ. හිලෙන්න බැහැනෙ. හිලෙන්න වුවමනාවකුත් නැහැනෙ. එදා මසායා සාන් ආවේ හුඟක් රෑ වෙලා.

මසායා සාන් මං හදපු කෑම කෑවෙ අප්පිරියාවෙන් වගේ. මම තරහ ගන්නෙ මොකටද කියලා මං හිතුවා. මසායා සාන් කෑම කන හැටිත් මට අප්පිරියයිනේ. ස්වාමිපුරුෂයගෙ මූණෙ [illegible] [illegible] සම එකතුවෙන තමයි [illegible] [illegible]ත්තෙ. ඒ අප්පිරියාව සමනය වෙන්න කාලයක් යයි.

'බිත්තරයක් බැදලා දුන්නා නම් ආසාවෙන් කයි. මවවර දේවල් කරන්න එපා' කියලා පසුකලෙක මට අවවාද කළේ දිස්නා. දිස්නාත් නීගතාවෙ නැවතැවිරිදි ගෙවියෙකුගෙ තරුණ බිරිඳ.

ඒත් මං හදන කෑම කන්න පුළුවන් කෙනෙක් මසායා ගෙදරට කැඳවාගෙන ආවා. ඒ මසායා සාන්ගෙ සාත්තාගෙ තුන්වැනි බිරිඳ. එයාගෙ නම මිචිකො. වයස අසූ හරියි. 'සාපන්' කිය කියා මං උයන. මසායා සාන්ට අප්පිරියාව ගෙනෙන කෑම මසායා සාන් මිචිකො නැන්දාට කැව්වා. මට ඉරණම තියන් කරපු මිනිහා ජපානෙ ඉඳලා ඇවිත් මාව කසාද බැඳගත්තෙ ඉරණම තියම කරලා තියෙන්නෙ කසාද බැඳ ගැනීම විතරයි.

[illegible] අලුත් විදිහෙ සාලයක්. කුස්සියක් හදාගන්න.

සාලයට පැදුරු දැම්මෙ මෙයි. මිච්කොයි [illegible] මම පැදුරු කියලා [illegible] පැදුරු වගේ. [illegible] චූටි චූටි ජපන් කෝප්ප, [illegible] කුස්සියෙ තිබිලා අපි සාලෙට ඇල්ලුවා. [illegible] ටිකක් අඩුක් කරලා. මිච්කො [illegible] වගේ කටයුතු කරන්න පටන් ගත්තා. [illegible] නෙවෙයි. නොගිහින් ඉන්න. [illegible] ඒ මිනිහගෙ ගේ දොර වත්ත පිටියයි, [illegible] මිනිහා, මගේම ගේ දොර. [illegible] පුරුදු වෙමින් හිටියා. [illegible] කම නොලැබුණාට ලියලා [illegible] කියන එකක් තිබුණා [illegible] වගේ චරිතාකමක්. [illegible] ගැනු සත්වයගෙ නමට ඉදිරියෙන් [illegible] හින්දම [illegible]

ගෝවා, කැරට්, ලීක්ස්, රාබු, සූචිනි, ඇස්පැරගස්, ට්‍යුලිප් අල අරගෙන එන එළවළු වෙළෙන්දි ජපන් ක්‍රමයට ඒ එළවළු හදාගන්න නොයෙක් නොයෙක් විධික්‍රම කියලා දෙන්නත් අමතක කළේ නැහැ. මිච්කො නැන්දා, එළවළු වෙළෙන්දිගෙ එළවළුවල අලුත්කම වර්ණනා කරන කොට මසායා සාන් ඈතට වෙලා බලාගෙන හිටියා. ලෝකෙම එපාවෙලා වගේ බලාගෙන ඉන්න කසාද පුරුෂයෙක් දැක්කම ඒ පුරුෂයගෙ කසාද බිරින්දෑට මොනවා හිතෙන්න පුළුවන්ද? උඹ ලෝකෙම ඉන්න මහ දුර්වලම මිනිහා, උඹ හත්මුහුදක් පීනගෙන ඇවිත් මාව හොයාගත්තෙ ඔහොම නිකමෙක් වගේ බලාගෙන ඉන්නද කියලා තූපා කේන්තියෙන් පුපුරන්න ගත්තා. ඊත් ඉතින් පිපිරිල්ල තියෙන්නෙ හිත ඇතුලෙ. මැරිච්ච ගිනිකන්දක්.

'මසායා සාන් ඔහේට හරිගියා එහෙනම්' කියලා වෙළෙන්දි මුකුළු හිනාවක් පෑවා. මසායා සාන්ට [illegible] මුකුළු හිනාවල අර්ථ [illegible] නෑ. [illegible] ගිහින් [illegible] ගාන ඉනු නැටියෙක්.

'මසායා සාන් ඡන්දයක් ළඟ එනවා කියන්නෙ' ඒ පාර වෙළෙන්දි කතාව වෙනතකට හරවන ගමන් බණ්ඩක්කා කරල් කීපයක අලුත්කම පෙන්නන්න උත්සාහ කළා.

'අපේ කුඹුරෙ ගොයම් පැහෙනවා නම් අපිට රෑට හොඳට නින්ද යනවා නම්, පාර්ලිමේන්තුවට මොනවා වුණත් අපට මොකද?' කියලා මසායා සාන් වෙළෙන්දිගෙන් ඇහුවා. මසායා සාන් දේශපාලනයට වැඩි මනාපයක් නැති බව කිව්වෙ මිච්කො නැන්දා. මසායා සාන්ගෙ පියාට යහමින් සල්ලි තිබුණු බව මිච්කො කිව්වෙ අතිශයෝක්තියෙන් කියලා මසායා සාන් බැණ වැදුණා. පියා ගමේ ජනප්‍රිය දේශපාලඥයෙක් වෙලා හිටිය හින්දම නිස්කලංක බව අගය කරන පුතාට දේශපාලනය [illegible] ගෙයි එක කාමරයක තිබුණා අපේ මාමණ්ඩිට අයිති [illegible]

යන්නෙ කියලා
හිටියෙ නෑ. කොහේද වැඩට යන්නෙ කියලා අහන්න ජපන් ව
මං දැනගෙන හිටියෙ නෑ. ගොළුවෙක් ඉන්න තැනක භාෂා
ඉගෙන ගන්නත් බෑ. භාෂා ඥානයක් එන්න භාෂාවක් ඇහෙන්
එපායැ. බලහත්කාරෙන් වගේ මාව ගෑනියෙක් කරපු ජයත
මේ ස්වාමිපුරුෂයට වැඩිය දහස් ගණනක් වටින මිනිහෙක්
මා ඉස්සරහ උජාරුවට බලා ඉන්නවා පෙනුණා. අවට ගෙ
ඔක්කොම මල්වැටවලින් මායිම් වෙලා. මල් එල්ලි එල්ලි හුළඟ
සෙලවෙනවා. කෙළවරක් නැති පාට. ගොළුවෙකුට ආදර
කරන්න පුළුවන් නම් ගහකොළවලට, මල්වලට ආදරය කරන්
හොඳටම පුළුවන්. සංඥා භාෂාව ඉගෙන ගැනීමේ උත්සාහය
මම, යෙදෙමින් හිටියා. කෝම්පිට්ටු ගේකට ඇවිල්ලා මිදු
බම්බුවක් තියලා තියෙනවා වගේ ඉඳගෙන බලාගෙන ඉන්
මිසක වෙන වැඩක් තිබුණේ නෑ. දුවන්න, පනින්න, නටන්
දඟලන්න කැගහන හිත කොනිති ගහලා පැත්තකට අලා තිබ්
පරණ පෙළපත් නාමයක් තියෙන බව නම් මසායා සාන් මිචි
සාන් ලව්වා කියවා ගත්තා. ඒවට නම් සන්නිවේදන සාර්
භාවිතා කරනවා. සන්සිඳෙන්නෙ නැති ආසාවල් එක්ක කෝ
ඉස්මතු වෙනකොට ධම්මචක්කපවත්වන සූත්‍රය බෙල්ලෙ එල්ලු
වැඩක් වෙන්නෙ නෑ. දාංගලේ බැඳලා දාපු බලුපැටියෙක් ව
පැත්තකට වෙලා බලාගෙන හිටියා. ඒ දාංගලේට මේ ජපන
ලන්සු තියන්නවත් බෑ. ඒ දාංගලෙත් එක්ක පුංචි කාලෙ කියපු
සින්දු හෙමින් හෙමින් මතුවෙන්න පටන් ගත්තා. හත්මුද තරණ
කරලා ඇවිත් නතර වෙච්ච කෝම්පිට්ටුවට වෙලා දැන් ඉති
අනිත්‍ය තමයි මෙනෙහි කරන්න වෙලා තියෙන්නෙ. මසා
සාන් නීගතාවල මූලික අධ්‍යාපනය ලබපු කතාව කිව්වෙ මිචි
සාන්. මසායා සාන් කනගවා නගරයෙන් සරසවි අධ්‍යාපන
ලබපු බව පෙන්නන්න මිචිකො සාන් ජපානයේ සිතියම අරගෙ
ආවා. ඉංග්‍රීසියෙන් ස්ථාන නාම ලියවෙච්චි සිතියමක්. හනා
(Hanada) ගුවන් තොටුපලේ ...
කර

වුණාට. හනාඩා ජපානයෙ ඉස්සර ජාත්‍යන්තර ගුවන් තොටුපල කියලා මිචිකොගෙ දුව විස්තර කළා. ඒක මහ ඉවසන්න බැරි රස්සාවක් කියලා මසායා සාන් කිව්වෙ. ඉවසන්න බැරි රස්සාව වුණාට මන්වලටයි, යෙන්වලටයි ඉවසන්න සිද්ද වෙනවනෙ. අවුරුදු විස්සයි තිස්පහයි අතරදි අසනිපෙ හැදෙන්න පටන් ගත්තෙ. තරුණ මදයට ඉඩක් නැතිවුණාම හැදෙන ලෙඩක් කියලා මිචිකො නැන්දා කිව්වා. ඉඩක් ලැබිලත් නිකන් ඉන්න මිනිහා. ජපානෙ මිනිස්සු රස්සාවකට බැඳුණොත් හරියට කසාදෙකට බැඳුණා වගේ. ගැලවීමක් නෑ. එකම තැන විශ්‍රාම ලබන තුරු. මසායා සාන් ගුවන්තොටුපලේ රාජකාරිය කරද්දි. රාජකාරියෙ ස්වභාවයයි. රාජකාරියෙ යෙදෙන්න තියෙන කාල වේලාවයි, කැපවීමයි ඉවරවෙන කොට දවස ගිහින් ඉවරයි. ඒ දවසෙ ශෘංගාරයට වෙලාවක් ඉතිරිවෙන්නෙ නැහැ. ශෘංගාරය ගැන හිතනකොට ඇගේ මහන්සියට නින්ද ගිහින්.

මම කළේ තතමි පොළවෙ ඉඳගෙන අතීතෙයි, වර්තමානෙයි, අනාගතෙයි ගැටගහපු එක. එහෙම වෙච්ච හින්දා මෙහෙම වුණා. මෙහෙම වෙච්ච හින්දා එහෙම වුණා. තාත්තා කියපු දේවල් මතක් වෙන්න පටන් ගත්තා. තාත්තා කිව්වෙ හැමදෙයක්ම එකකට එකක් සම්බන්ධයි කියලා. තාත්තා කියන්නෙ ඩඩ්ලි හාමු නොමැරුණා නම් ලංකාවෙ විධායක ජනාධිපති ධූරයක් එන්නෙ නැහැ කියලා. විධායක ජනාධිපති ක්‍රමයක් ආවෙ නැත්නම් වෙන්නෙ නැති හුඟක් දේවල් තාත්තා සතොසෙ වැඩකරපු යාළුමිත්‍රයෙක් එක්ක කියනවා මං අහගෙන ඉඳලා තියෙනවා. එහෙනම් ඉතින් ප්‍රේමදාස මහත්තයගෙ ඝාතනයට ... රැස්වීමට ගියෙ නැත්තන්, මං ජපානයට එන එකකුත් නෑ. මගේ කුසෙ හැදිච්ච දරුවො දෙන්නෙක් මහ දිය සුළියකට අහුවෙන පාප කර්මයෙ කොටස්කාරියක් වෙන එකකුත් නෑ. ගෑනියෙක් තමන්ගෙ කුසෙ ඉන්න දරුවෙක් දෝතට ගන්නවා වෙනුවට මහා පීඩාවක් කරලා පිටුපාන එක සමච්චල් කරන තරම් පහසු කටයුත්තකුත් නෙවෙයි. සුමල්වත්, ජයනාථවත් ...යට ලක්වුණෙත් නැහැ. වේදනාවට පත් වුණෙත් නැහැ.

[illegible] කොට ගැති වී
හැදෑගැනීයක් වෙන්නෙ කොහොමද? ළමයෙක් හැදෙන්
ශුක්‍රාණුවකුයි, ඩිම්බයකුයි එකතුවෙලා නම් ශුක්‍රාණුව අයිති මිනි
නිකම්ම නිදොස් වෙන්නෙ කොහොමද? හැබැයි මහා පො
අන්සන් කරලා, අඹුසැමියන් ලෙස ඉදිරියට ජීවත් වෙනවා කිය
ප්‍රසිද්ධියෙ කියලා ඇවිත් එකතුවෙන ශුක්‍රාණුවකුයි, ඩිම්බය
වුණා නම් වාසගමත් ශුක්‍රාණුව අයිතිකාරයාගෙනුයි. ගෞර
අයිතිය පුරුෂයට, නිග්‍රහයයි - වේදනාවයි ස්ත්‍රියට. මමත් ඉති
ස්ත්‍රියක්නෙ. එකනෙ මේ විදියට ජපානයෙ නීගතාවලට එන්
සිද්ද වුණේ. මේ තතමී පොළවේ ඉඳගෙන, හිත හතිවැටෙන
ලංකාවට දුවනවා බලාගෙන ඉන්න සිද්ද වුණේ. මං කොළ
පාවල් හිතේ මවාගත්තා. තැන තැන කෙළ ගහපු, කැහි කාර
අපු පාවල් වුණාට දැන් දුවගෙන යන්න හිතෙන තරම් ආසාව
ඇති වෙනවා. වීසායි, ටිකටුයි මොකටද හිතට ලංකාවට යන්
මං හැම මොහොතෙම ලංකාවට ගියා. ගෙදර ගියා. ජයනා
ගෙ නුරතල් මතක් වුණා. මේ තාපසයයි, ජයනාථ කියන
නාම්බයි අතර ලොකු වෙනසක් තිබුණා. මේ තාපසයා මොක
හිතාගෙන ගෙදරට ගෑනු මනුස්සයෙක් ගෙනාවද? දිස්නා කිව්
නීගතාවෙ මිනිස්සුන්ටත් පවුලක් පන්සලක් ඕනනේ කිය
නමන්ටම කියලා කෙනෙක්. ලෙඩට දුකට බලන කෙනෙ
මොන කෙනෙක් හරි තරුණ ගෑනියක්. අවිවාහක පිරිමි වැඩිපු
ඉන්නෙ නීගතාවෙ කියලා දිස්නා කිව්වා. දිස්නා ගණන් ඉලක්
පිටින් තොරතුරු දන්නවා. සකෙ හාලට නීගතාව හරි ප්‍රසිද්

'සකෙ හාල හරි රසයි. සකෙ හදන්නෙ මෙහෙනෙ. හව
සකෙ ටිකක් බොන්න. මිනිහටත් හොඳට පොවන්
මෙහේ ඉන්න හුඟ දෙනෙක් ගොවියෝ. උන් ඔක්කෝ
සකෙ බැරල්.' දිස්නා මට පැහැදිලි කළා. වාසනාවකට
මසායා සාත් ගොවියෙක් නෙවෙයි. ඒත් ගොවි පවුලකින් පැ
එන මහ ගල් ඉබ්බෙක්. කටුව ඇතුළෙමයි ඉන්නෙ.

හිතාවුණා. එහෙම ආපු එක කුමාරිකාවක් තතමී පොළවෙ ඉඳගෙන, පස්සට හරි ඉස්සරහට හරි අත්තටු සලන්න බැරුව දඟලනවා. ඒත් තතමී පොළවෙ සීතලට ඇඟ පුරුදු වෙනකොට, විදුලි බුමුතුරුණක රස්නය දැනෙනවා. මම බිරිඳ.

මහ විධානයක් වගේ මගේ හඬ මටම ඇහුණා. බිරිඳ නම් බිරිඳ විය යුතුයි.

මම නුඹගේ බිරිඳ වෙමි.

පෙම්බරා, නුඹ පලකයෙහි හිඳගෙන වීණාව වාදනය කරයි. ඒ සිහිනයෙහි සැතපෙන කුමරිය මම වෙමි. අහසෙහි පලකයක් බැඳගෙන ආලය කරන්නේ කිමද? මා නොරවටන්නේ ඔබ පමණකි. මගේ ළය මත ඔබේ හිස පොවන දවස නොව ඔබේ ළය මත මගේ හිස තබා ගන්නා දවස උදාකර දෙන්න! ගෙඳ, සිතද [illegible] පෙම්වතුන් අතරෙහි සැඟවී නොයන්න. සිහිනය සහ බලාපොරොත්තුව සැබෑව සහ යථාර්ථයට වඩා මට අගනේය. පෙම්බරා පලකයෙහිම හිඳින්න.

ජයනාථ සහ මසායා!

ජයනාථ හෝ මසායා යන දෙදෙනාම ඉදිරියෙහි සිටින ආතුරයා මම වෙමි. නුඹ දෙදෙනාම රාම නොවෙති. රාවණාද නොවෙති. මම කිසිවෙකු ළඟ වැතිර සිටින්නට කැමැත්තෙමි. මගේ දෙනෙතෙහි ඇත්තේ නුඹ වසඟ විය හැකි නිල් උපුල් හැඩ රුව නොවේ. මගේ දෙනෙත් කඳුලට විවර වූ කපොලු වෙයි. රාම, නුඹ හෝ රාවණා හෝ සිපගත්තේ මගේ ඉරිතලා ගිය දෙකපොල්ය. පුපුරු ගැසී ගිය දෙතොලය. ප්‍රේමය මගේය. ස්ත්‍රියගේ ප්‍රේමයට නව නමක් තබන්නෙහිද? ඒ නම නම් මූර්ඛ භාවයයි. මගේ හෘදය ප්‍රේමය ඉල්ලා කළහ කරයි. ඔබ ප්‍රේමය

දූෂණය නොවන්නට මම ...
නුඹ මගේ පිට පිරිමදින තුරු බලා සිටිමි. නුඹ මගේ තළල
සිපගන්නා තුරු බලා සිටිමි. නුඹ මගේ දැසට ළංවී තොරතුරු
නොදකින සිහිවිලි හොයා යන හැටි බලා සිටිමි.

මම බිරිඳ වෙමි. මම මසායා මහතාගේ බිරිඳ වෙමි.

මසායා සාන්, පලකයෙහි පෙම්බරා මා ඔහුගේ දෑතට සි
කොටගෙන සිටියි. එහෙත් නුඹ මගේ ස්වාමිපුරුෂයා වෙයි. ම
රහසිගත ජීවිත. මුදලට ගත්තු වෙන ඕනම වංචල දේපලක් වගේ
මම? පෙට්ටගමක්ද? කැබිනට්ටුවක්ද? ඇඳක්ද? මිටි මේසයක්ද
ඒජන්තට සල්ලි දීලා ගත්ත හින්දා එහෙමද දැනෙන්නෙ?

මසායා සාන් ගේ සහෝදරියන් දෙදෙනාද බාල සහෝදරයා
පැමිණ මසායා සාන් සමග කතා කරන්නට වුණා.

ගෙදර සේප්පු එකකවත් අරින ඒවා නොවෙයි. ඒවගෙ
යතුරු තිබුණෙ මසායා සාන් භාරයේ. මසායා ස්වාමිපුරුෂයා
තමයි. යතුරු තියෙන්නෙ කොහේද කියලා මසායා සාන්
කියලත් නෑ. අහන්න වළිකන ස්ත්‍රියක් හිත ඇතුළෙ. අහ
උසටම ආදරේ හොයාගෙන ආවට සේප්පුවෙ යතුර තියෙන්නේ
රහස් ස්ථානයක. සේප්පුවල තියෙන දේවල් ගැන ස්වාමිපුරුෂයා
සහෝදරයොත් එක්ක ජපන් බසින් කතා කළේ. ඕක ඉගෙන
ගන්න බැරි භාෂාවක් යැ? මසායා සාන් වුණත් උපදිනකොට
ජපන් භාෂාව දන්නවයැ. මම කවුද මේ ජපන්නු මැද? ගෙදර
පිටරටකින් අරන් ආපු ආවතේව කාරියක්ද? බිරිඳ කියන න
තිසත් සතුටු කරන්න දීපු නමක්ද? සේප්පුවල තියෙන දේවල්
ගැන රහසේ කතා කරන්නේ මං පිට කෙනෙක් හින්දනෙ? ඒ
සේප්පුවල තියෙන වටිනා කියන දේවල්වලට වැඩිය වටින

නොගත්තු අම්මට තාත්තට. අකලට කුස යහනට වැඩිය
අර මරුමුවට පත්වෙච්ච කළලයට. සේප්පුවල දාලා වහලා
තියෙන්නෙ බුදලේද? පෙට්ටගම්වල දාලා වහලා තියෙන්නෙ
අතීතයද? තමුන්නැහෙලගේ අතීතය නීගතාවෙ කඳුකපලා
ගෑනුන්ගේ හිස්මතින් සැතපුම් තුනහතර ඈතට ගෙනිහින් දාපු
මඩපස් වගේද? තමුන්නැහෙලා ගොවියො. තමුන්නැහෙගෙ
පියා නගර සභිකයෙක්. ඒත් තමුන්නැහෙ ලංකාවෙන් බිරිඳක්
කැන්දගෙන හරි අරගෙන හරි ඇවිත් දැම්මෙ ලස්සන නගරයක
අවලස්සන ගොඩනැගිල්ලකට. විවාහයේ මුල ඉඳලම මට කිව්වෙ
ඉවසන්න කියලා. මං නාම ඉවසනවා. ලංකාවෙ ක්‍රමයට පොල්
බින්දා. බුලත් බිම දැම්මා. මුදු මාරු කළා. ඉටිපන්දමකින්
පොල්තෙල් පහනක් දැල්වූවා. ඒ පහන දල්වලා මහා ආලෝකයක්
බලාපොරොත්තු වුණා.

මසායා සාන් රහසේ කතා කරලා පෙට්ටගම්වල තියෙන
බඩු භාණ්ඩ සහෝදරියන්ටයි සහෝදරයන්ටයි බෙදලා දුන්නා
කියන හැඟීමෙන් [illegible] වුණා. [illegible]ට ලොකු ප්‍රේමා, පොඩි
ප්‍රේමාට තියාගන්න ඉඩ නොදී ගෙදර තිබ්බ්ච්ච් නැදුන් අල්මාරියයි,
බුරුත ඇඳයි, කනප්පුවයි කරත්තෙක පටවගෙන ගියා වගේ. පොඩි
ප්‍රේමා කිව්වෙ ඔය බඩු මුට්ටු වගේද මිනිහගෙ අයිතිය කියලා.
අම්මා, තාත්තාව අයිති කරගත්තෙ ඒවගෙ ආල හැඟීමකින්. ඒක
ආල හැඟීමක්ද, අයිති කරගැනීමේ ස්වභාවික ඊර්ෂ්‍යා සහගත
හැඟීමද කියලා කියන්න බැහැ. අපේ තාත්තා ඔය ගෑනු දෙන්නට
ම එක වගේ කොහොම ආලය කළාද කියන එකනේ ප්‍රශ්නය.
මිනිහෙකුට පුළුවන්ද ගෑනු දෙන්නෙකුට එක වගේ ආලය
කරන්න? එක වගේ නෙවෙයි අඩුවැඩි වශයෙන්වත්? එක අතකට
මසායා සාන් ආදරය පෙන්නන්නෙත්, තාත්තා ආදරය පෙන්වන
විදිහටමයි. 'මම ඔයාට ආදරෙයි' හරි 'ඔයා මගෙ මැණික' හරි
කියලා තාත්තා අම්මට හරි, අම්මා තාත්තට හරි කියනවා ඇහිලා
නැති වුණාට 'ළමයින්ගෙ අම්මා' හරි 'ළමයින්ගෙ තාත්තා' හරි

තිරිඹුවලින් වගේම භාෂාවෙනුත් ප්‍රකාශ වෙන්න ඕන. ගොළුවෙකු වුණත් සංඥා භාෂාවෙන් ආදරය ප්‍රකාශ කරන්න පුළුවන්. ආදරේ තියන්නෙ හංගගෙන ඉන්න ඕන කරන දෙයක්වත්, කොන්දේසි සහිත හැඟීම් හෝ හැසිරීම් මාලාවක්වත් නොවෙයි.

මසායා සාන් නෙවෙයි ලංකාවෙන් ගෙනාපු ගෑනි කනවද, ඉන්නවද, නිදියගන්නවද, ඇඳුමක් ඇඳලා ඉන්නවද කියලා ඇහැක් ඇරලා බැලුවෙ. ඇති කරන්න සතෙක් ගෙනල්ලා දාම්මා වගේ ඇගේ. ඇගේ හැප්පුනාම අා ගාන සිංහල මිනිහෙක් වගේ ජපන් ජාතික මසායා සාන් හැසිරුණේ.

මිචිකො සාන්. එළවළු වෙළෙන්දි. රූපවාහිනිය ඇරුණු වෙන ආශ්‍රයක් නෑ. මසායා සාන් පුරුදු විදිහට වැඩ. එළවළු වෙළෙන්දි එළවළු විකුණලා ඒවා ජපන් තාලෙට උයන හැටි කියලා දීලා යන්නෙ ලෙන්ගතු මිතුරියක් වගේ. ඔයාට මේ වෙලා තියෙන දේට [illegible] කියලා කියනවා වෙනුවට එළවළු වෙළෙන්දි උදව් කළේ පවතින [illegible] අනුගත [illegible]. [illegible] සංස්කෘතික සහ භාෂා ගුරුවරිය වුණේ එළවළු වෙළෙන්දි.

'මම ඔයාට කතා කරන්නෙ ජපන් භාෂාවෙන් නුපා සාන්. මං ඉංග්‍රීසි දන්නෙත් නෑ. මං ලංකාවෙ භාෂාව දන්නෙත් නෑ. සංඥා භාෂාව කතා කරන්න ඔයා ගොළුවෙකුත් නෙවෙයි.'

මං දැනගෙන හිටිය එකම ජපන් වචනය සයොනාරා. 'Good bye' මගෙ ස්වාමිපුරුෂයාට මං දන්න එකම ජපන් වචනය කියලා සමුගෙන යන්න දසදහස්වාරයක් හිතුවත් යම් පසුබෑමකුත් නොතිබුණා නෙවෙයි. උත්සාහ කරලා බලමු. කියලා හිත ඇතුළෙ හිටපු නුපා කිව්වා.

O- genki desu ka?

Gen-Kee dess. Arigatho !
බොහොම හොඳයි, ස්තූතියි කියලා මං කිව්වා.

ඔහොම තමයි පටන් ගත්තෙ. බොහොම හොඳින් නොවන බව එළවළු වෙළෙන්දියි, නුපායි දෙන්නම දන්නවා වුණාට මට ඕන වුණේ භාෂාව ඉගෙන ගන්නනෙ. මගෙ ගුරුතුමී - මගේ භාෂා ගුරුතුමී ඒ විදිහට මට ඕන කරන දේ අරගෙන ගෙදරට ආවා හැම උදේකම. භාෂා පන්තිය පැවැත්වූණේ ගුරුතුමී ට්‍රැක්ටරේ උඩ ඉඳගෙන-ශිෂ්‍යාව ට්‍රැක්ටරේ පුක්කානම ළඟ බිම හිටගෙන.

ගෙදර ඉන්න ජපන් ජාතිකයා උදේ වැඩට යනවා ආපහු රාත්‍රියෙ ගෙදර එනවා. මේ ආගන්තුකයා ගොවියෙක් වුණා නම් අනික් සිංහල. පිලිපීන ගෑනු වගේ කුඹුරට ගිහින් වැඩ කරන්න තිබුණා. ගොවි පවුලකින් පැවත ආවාට මසායා සාන් ගොවියෙකුත් නොවෙයි. හැඟීම් දැනීම් තියෙන මිනිහෙකුත් නෙවෙයි. මේ ස්වාමිපුරුෂයාට ආලය කියන්නෙ හැඟීමක් නෙවෙයි [illegible]මක්. [illegible] ගෙනාගන්න වගේ ලංකාවට ගිහින් එන්න [illegible] කියන්න තිබුණා. ලංකාවේ නම් ගෑනියෙක් රවට්ටන මිනිහෙක් ළඟ හරි ආලතුරා හැඟීමක් තියෙනවා කියන කාරණාව ජයතාට වුණත් ඔප්පු කළා. මගෙ ස්වාමි පුරුෂයාට බිරිඳගෙ ශරීරයයි, බිරිඳගෙ හිතයි ගෙදර තියෙන පෙට්ටගම් දෙකක් වගේ. ඔහේ තියෙනවා. වටින බවත් දන්නවා. අල්ලන්නෙ එකාට මෙකාට කරන්න විතරයි.

මම ආවෙ ටියුලිප් මලුයි, උඩින් පායන සකුරා මලුයි පිපෙන කාලෙයෙ. ලංකාවේදි නම් හිතුවෙ සකුරා මල් පිපෙන රටට ආවම ජීවිතේම සකුරා මලක් වෙයි කියලා. සාය සකුරා පිපෙන්නෙ වසන්තෙ අන්තිමේදී. ඒ කියන්නෙ අප්‍රේල් මාසෙ අන්තිමේදී. දම්පාටට හුරු තද රෝස පාටින් ඒ ඇඳෙන්නෙ පුරාණ චිත්‍රයක්.

මසායා සාන් වැඩට ගිහිල්ලා. එළවළු වෙළෙන්දි එළවළු [illegible]

ස්වාමි පුරුෂයා විමතිය පළ කරලා ... වුණේ

විමතිය හරි සතුට හරි නෙවෙයි දුකක්වත් ප්‍රකාශ වුණේ නෑ. 'මගේ ගැනි සිංහල දන්නෙ නැති එක මට වාසනාවක්' කියලා කියපු, ජපන් ජාතික බිරිඳක් විවාහ කරගෙන හිටපු සිංහල ජාතික මහාචාර්යවරයෙක් ගැන දිස්නා මට කිව්වා. දිස්නාට කොහෙද්ද මහාචාර්යවරු එක්ක පයුරු පාසානයක් ඇති වෙන්නෙ? ජපන් ගැනි සිංහල ඉගෙන ගත්තොත් මහාචාර්යවරයාගෙ ඉතිහාසය සිංහල ප්‍රජාව දසමෙක අඩුවක් නැතුව වාර්තා කරයි කියලා මහාචාර්යවරයා හිතන්න ඇති. රූපවාහිනියෙ වචන අහගෙන ඉඳලම මම වචන එක දෙක අහුලගන්න පටන් ගත්තා.

'මං දැකලා තියෙනවා ඔයා පාන් කඩේට යනවා' කියලා මගෙ මහත්තයාගෙ වයසෙ තරමෙ ජපන් ජාතික කාන්තාවක් ඉක්මන් ගමනින් මා පසුපසින් ඇවිත් මා පසුකර ගිහින් නැවතුණා. සිනා මුහුණින්, හිස නමා මට ආචාර කරමින්. කුඩා ඇස!

'මම සෝරා. මම දැකලා තියෙනවා ඔයාව' කියලා කිව්වෙ පෙර හුරුවක් කරනවා වගේ.

සෝරා දිග කලිසමක් ඇඳලා කබායක් පොරවගෙන. හිස මුළුමනින්ම වැහෙන තොප්පියක්.

'මගෙ නම නූපා.'

'මසායා සාන්ගෙ බිරිඳ'

'ඔව්'

'නූපා සාන් මෙහාට අලුත් වගේ'

මම ලංකාවෙන් බව කිව්වාම ලංකාව ඉන්දියාවෙ පාමුල තියෙන කඳුළු බිංදුව නේද කියලා සෝරා සාන් ඇහුවා. මං කිව්වා නෑ මුතු ඇටය කියලා. සෝරා සාන් සමාව ඉල්ලන විලාසෙන් සිනාවුණා [illegible]

[illegible]

කර ගැනීම භාෂාව නොදන්නකම පිටම තියමින් කර ගත්තා. සෝරා සාන් කිව්වා තමුන් චිත්‍ර ශිල්පිනියක් බව. චිත්‍ර ශිල්පිනියක් නම් චිත්‍ර අඳින්න ඉගෙන ගන්න පුළුවන් වෙයි කියලා එක්වරම හිතට ආවා. දැන් මොකක් හරි ඉගෙන ගන්න ඕන. ඒ වුණාට හිතෙන හිතෙන දේ ඉගෙන ගන්නෙ කොහොමද? ඒවා පිහිටලා තියෙන්න ඕන. සෝරා සාන් මට දුරකතන නොම්මරය තියෙන පුංචි කාඩ්පතක් දුන්නා. 'හවස් වරුවක යමු සකුරා මල් එක යායට පිපිලා, විදුලි එළියෙ දිදුලන හැටි බලන්න. තකාඩා උද්‍යානයට ගිහින් ඔහේ ඇවිදගෙන යමු' සෝරා සාන් ආරාධනා කළේ අඩු ගානේ ජපානෙ ලස්සනවත් බලපන් කෙල්ලෙ කියන හැඟීමෙන් විය යුතුයි කියලා මම හිතුවා. කඩදාසි ලන්තෑරුම් එල්ලපු චෙරිගස් තුන්දාහක් විතර එක යායට තියෙන හැටි විස්තර කරපු සෝරා සාන් කිව්වා චෙරි මල් යාය චිත්‍ර ශිල්පිනියෙක් වුණාට තමුන්ටවත් ඒ විදිහට සුන්දරව අඳින්න බැහැ කියලා. ඒ සුන්දරකම අත් විඳින්න මුළු ජපානයේම විතරක් නෙවෙයි පිටරටවලිනුත් සංචාරකයෝ එනවා කියලා සෝරා සාන් චිත්‍රයක් [illegible] නිගතාවේ මං මොකක් කරනවද කියලා හිතුණා. එක්කො රටේ තොටේ ලස්සන බලන්න ඕන. චෙරි ගස්වල චෙරිමල් පිපිලා සුළඟට හෙළවෙන හැටියි, පාට පාට ලන්තෑරුම් චෙරි අතුවල එල්ලිලා පත්තුවෙන හැටියි, ඒ ඡායාවල්, අසබඩ නදියක පතිත වෙලා ඒ නදිය චෙරි උයනක් කරලා තියෙන හැටියි මං හිතින් මවාගෙන සන්තෝස වුණේ පුංචි ගෑනු ළමයෙක් වගේ. පෙම්බරා ඔයා අහලක පහළක ඉන්නවද?

මම මසායා සාන්ට සෝරා සාන් දීපු දුරකතන අංකය දුන්නා. එයත් එක්ක කතා කරන්න තියෙන වුවමනාව මොකද්ද කියලා ස්වාමිපුරුෂයා ඇහුවා.

'මුකුත් නෑ'

'එහෙනම් ආයෙ කතා කරන්න එපා'

'මං ජපනෙක් නෙවෙයි'

'ඒත් කසාදෙන් ජපනෙක්'

'කසාදෙන් ජපනෙක් වෙන්න බෑ'

ඒ කතාව දුරදිග නොගෙනියන්න වගබලාගත යුතු කියන හැඟීම හිතට ආවෙ විදුලි වේගයෙන්. මේ ජපනා වැඩිය කතාබහ කරන මිනිහෙකුත් නෙවෙයි. හිත යට මොන මො දේවල් තියෙනවද කියලා කොහොමද දන්නෙ? කොහොමවුණ ජපන්නුන්ගෙ මූහුණුවල ඉරියව් නෑ. ඉන්නෙ සතුටින්ද, දුකින් වෛරයෙන්ද, ක්‍රෝධයෙන්ද, ප්‍රේමයෙන්ද කියලා මූණ දි බලලා කියන්න බැහැ. ඉරියව් නැති මුස්පේන්තු මූණු! නීගත කොච්චර ලස්සන වුණත්, මගේ ස්වාමිපුරුෂයට නීගතාවෙ ලස්සන පේන්නෙත් නෑ. වෙන කෙනෙකුට ඒ ලස්සන පේනව කියලා දන්නෙත් නෑ. ජපානය විසිනුත් වැනි ශතවර්ෂයට [illegible] දියුණු වුණාට ගැහැනු සම්බන්ධයෙන් ජපන්නු තාම [illegible] දහසය වැනි ශතවර්ෂයේ ඉඳගෙන කියලා රෝසා කිව්වා. රෝ ජපානෙට ඇවිල්ලා තියෙන්නෙ අවුරුදු දාසයේදි. දැන් වය විසිනවයයි. ළමයි හතර දෙනයි. ජපන් බෝනික්කො හත දෙනයි. උන් දැන් බෝනික්කන්ට වැඩිය ලොකුයි. රෝසා කස බැඳලා ඉන්නෙ මිටි මහත ගොවියෙක්. නීගතාවට ප්‍රධා ආදායම් මාර්ගය ගොවිතැන. ගොවියන්ට හොඳ ආදායම් ලැබුණා. එළවළු වෙළෙන්දි නීගතාවට හරි ආදරෙයි. යසුනි කවබතා ගැන අහලා තියෙනවද කියලා එළවළු වෙළෙන් ඇහුවම මං නැහැ කිව්වා. නොබෙල් ත්‍යාගය ලබපු ජප සාහිත්‍යකරුවෙක් වන කවබතා ගැන මම නොදැන ඉදීම ගැ වෙළෙන්දි විස්මයට පත්වුණා. කවබතාගෙ පොත් කියවන් හොඳට භාෂාව ඉගෙන ගන්නවා කියලා ඇය මාව පොරොන් කරව ගත්තා. නොබෙල් තෑග්ග ගත්තත් අනුන්ගෙ හිත් කොපමණ විවරණය කළත් කවබතා 1972 [illegible]

වෙළෙ [illegible]

කවබතා සියදිවි [illegible] හිතුණත් එළවළු වෙළෙන්දි ඒ වෙනුවෙන් තව පැයක් ගත කරයි කියන බයට නාහා හිටියා.

රෝසා මගේ උදව්වට ආවේ අම්මගෙ අසනීපය දැනගත්ත වෙලාවෙ. අම්මගෙ අසනීපය ආරංචි වුණේ වාහන බිස්නස් කරන අමරජීව මාර්ගයෙන්.

'අම්මට අසනීපයි මං අම්මා බලන්න යන්න ඕන' කියලා මං මසායා සාන්ට කිව්වා.

'මොකටද?'

'අම්මා අසනීප හින්දා'

'ඕන නෑ'

'ඕන නැත්තෙ මොකද? අම්මා අසනීප නම් මං යන්න ඕන'

කවබතාට සියදිවිනසාගන්න සිද්ද වුණේ මොකද කියලා අහන්න තරම් මගේ ජපන් භාෂා වාග්කෝෂය දියුණු වෙලා තිබුණෙ නැහැ. ඒත් මෙහෙම ගියොත් දෙන්නගෙන් එක් කෙනෙකුට සියදිවි නසාගන්න සිද්ද වෙයි. ඒත් ඒක කරන්න ඕන ඔහේ මිසක මම නොවෙයි.

'රෝසා මෙයා එපා කිව්වට මම යනවා ලංකාවට' මම රෝසාට කතාකරලා කිව්වා. රෝසා ටික වේලාවක් කතා නොකර හිටියා. ගෙදර තියෙන නිශ්ශබ්දෙ උහුලලා, උහුලලා රෝසාට කතා කළහමත් ඒ නිශ්ශබ්දෙ ඉවසගෙන ඉන්න බැහැ.

'මම යනවා ලංකාවට' කියලා මම ගිරිය යටින් කෑගැහුවා.

'සල්ලි තියෙනවද?'

කොපමණ කල්ද ගිහිල්ලා?

'බෙරිහන් දුන්නට බැහැනෙ නූපා. ලංකාවට ගියයි කියල වෙන සෙතකුත් නැහැනෙ'

'ඒත් මං අම්මා බලන්න යන්න ඕන'

'ආපහු එන්නෙ නැද්ද?'

එන්නෙ නෑ කියන්නත් බෑ. එනවා කියන්නත් බෑ. ඇත ඉතින් නමට හරි ජපානෙනෙ. සකුරා මල් පිපෙන ජපානෙ. ජපන් බෝනික්කො ඉන්න ජපානෙ. ටොයොටා කාර් හදන ජපානෙ. විදුලි දුම්රිය ඇහිපිල්ලමක් ගහන්න කලින් පෙනී නොපෙනී යන ජපානෙ. කවදා හරි හැදෙනවා කියන බලාපොරොත්තුවකුත් යටිහිතේ උඩ පැන පැන ඉන්නවා.

'ලංකාවට ගිහින් එහේ හිටියත් අපිට හම්බවෙන්නෙ එක්කො නාකි මිනිහෙක්. නැත්තම් අබලන් වෙච්ච මිනිහෙක්. සැපකුත් නැතුව. එහෙමත් නැත්නම්, මිනිස්සු ගොඩක්. රෝසා මිටියකින් පපුවට තට්ටු කළා.

'මට මේ මිනිස්සුන්ගෙන් නම් වැඩක් නෑ. කාලා ඇඳල අම්මලාට කීයක් හරි අරින්න තියෙනවා නම් එච්චරයි'

මේ ප්‍රශ්නෙ ගේ ඇතුළෙ ඒ බිත්තියටයි මේ බිත්තියටයි ගහන ටෙනිස් බෝලයක් වගේ එහාට මෙහාට විසි වුණා. මසායා සාන් බලාගෙන හිටියෙ මෙච්චර සල්ලි වියදම් කරලා මං උඹව ගෙනාවෙ ආපහු යවන්නද කියන ප්‍රශ්නාර්ථය දෙබැමෙ තියාගෙන. රෝසාගෙ මැදිහත්වීම මසායා සාන්ට උහුලන්න බැරුව ගිය නිසා මසායා සාන් තමුන්ගෙ පාර්ශවයෙන් උදව්කාරයෙක් හෙව්වා. ඒ පෙට්ටගම්වල තිබ්බ්වි බඩු අරගෙන යන්න ආපු නංගි කෙනෙක්, මිච්කො සාන් මැදිහත් වුණා නම් මීට වැඩිය හොඳයි

ආපහු ජපානෙට [illegible] ලංකාවට යන්න මුදල් නැතිකම හින්දනෙ. ටිකට් එකට සල්ලි දෙන්න වෙන්නෙ මගෙ ස්වාමිපුරුෂයට. ස්වාමිපුරුෂයා නියම ජපනෙක් වගේ මූනිවත රකිනවා.

'මට ලංකාවට යන්න ඉඩ දෙන්න. පොරොන්දු වෙනවා ආපහු එනවා කියලා' වෙන මොන කටකින් ගොඩ එන්නද? ළිං කටින්ම මීසක?

මසායා සාන් හිස දෙපසට සොලවලා ඉවත බලාගත්තා.

කොහොම හරි අම්මා බලන්න ලංකාවට යනවා කියන අධිෂ්ඨානය තිබුණා. රෝසා හුඟාක් දේවල් කිව්වා. නීගතාවෙයි අවට ප්‍රාන්තවලයි ගොවියන්ව බඳින්න ජපන් ගෑනු කැමති නැති හින්දා විදේශිකයො බඳින්න ආණ්ඩුවත් ඉඩදීලා තියෙන බව රෝසා කිව්වෙ ඒකෙන් තමයි අපටත් චාන්ස් එක වැදුණෙ කියනවා වගේ. ජපන් ගෑනු නොවැටෙන වලේ අපියි, පිලිපීන ගෑනුයි වැටෙනවා. එක ගොවියෙක් කසාද බැඳගත්තොත් එක ජපනෙක්ව නළව නළවා ඉන්න පුළුවන්. එහෙම බැරි වුණොත් කැරොකේ වල වැඩ කරන්න වෙනවා. එතකොට පොහොසත් ගොවියන්ටයි. ඇඟ වෙහෙසවෙන රස්සාවල් කරන ජපනුන්වයි, හැංගිලා ඉන්න අනෙක් ආසියාතික පිරිමින්වයි, විදේශිකයන්වයි නළවන්න වෙනවා. ඔය ඔක්කොම එවුන් නළවනවට වැඩිය හොඳයි අප්‍රුලෙන් වුණත් එකෙත් නළවනවා.

'ටික කාලයක් මෙහෙ ඉඳලා සල්ලි ටිකක් එකතුකරලා ලංකාවෙන් ඉඩම් අඟලක් හරි ගන්නයි මගෙ කල්පනාව' කියලා රෝසා කිව්වා.

'අරගෙන?'

'අරගෙන ගෙයක් හදනවා.'

'ඒකෙ පැත්තක් කුලියට දීලා ජීවත් වෙනවා. ආයෙ ජපානෙ එන්නෙ නෑ'

දන්නවනෙ. ජපන් ළමය [illegible]
උන්ට උගන්නන්න ඕන. කන්න බොන්න දෙන්න ඕන. ලං
සකුරා මල් පිපෙනවයැ ලංකාවෙ?

අවසානයෙදි මසායා සාන් මට අම්මා බලන්න ලංකාවට
එන්න ඉඩ දුන්නා. මසායා සාන් බය වුණේ සල්ලි වියදම් වී
ගැන නෙවෙයි තමන්ගෙ බිරිඳ ආපහු නොඑයි කියලා. ලංකාව
ගිහිල්ලා කසාද බැඳගෙන ආපු බිරිඳ. රෝසා කියනවා ව
මොක නැතත් මූන් අපිව කසාද බැන්ද නෙ.

ජපානයේ ඇල්ප්ස් කියලා හඳුන්වන කඳුකර හිය
ප්‍රදේශයේ ඉඳලා ෂින්කාන්සෙන් විදුලි දුම්රියෙන් මාව තැව
නරිටා ගුවන්තොටුපලට කැඳවාගෙන ආවෙ මගෙ ස්වාමිපුරුෂයා
ෂින්කාන්සෙන් විදුලි දුම්රියෙ වේගයට මම ගොඩනැගිලි ඇක්
හතු පිපිලා තියෙනවා වගේ. මසායා සාන් බිම බලාගෙ
හිටියට ඔහු හිතින් මාව අල්ලගෙන හිටියා වගේ දැනුණා. මෙ
මිනිහෙක් හරි හිතින් ආකර්ශනීය වෙනකොට දැනෙන දේ ග
ආකර්ශනය වෙනකොට දැනෙනවට වැඩිය ඉහළයි. එතකො
පිරිමි ගෑනුන්ට ආකර්ශනය වෙන්නෙ හිතින්ද ගතින්ද කිය
අතුරු ප්‍රශ්නයක් පැන නැගෙනවා. මං දන්න එකම දෙය
තියෙනවා. පිරිමි ගෑනු වගේ හිතින් ආකර්ශනය වෙනවා අඩු
පිරිමින්ට වෙන්ව යාමේ වේදනාවක් නොදැනෙන්නෙ ඒ නි
වෙන්නැති. පිරිමියෙකුට පුළුවන් ගෑනියෙකුගෙ මූණ ඉඹින්
විතරයි. ගෑනියෙකුගෙ හිත ඉඹින්න පිරිමියෙකුට දැනෙන්
නැහැ. ඒහෙම වුවමනාවකුත් නැහැ. හැමදේටම මුල හිත
ඒහෙනම් ආදරයට මුලත් හිත නෙවෙයිද මසායා සාන්?

දවසකට හරි තුඹ මගේ ස්වාමි පුරුෂයා. මං ඒහෙ
ගිහින් එන්නම්.

4

පෙරහැරම කටුනායකට ඇවිත් හිටියා. චන්දනක්කා, ලතිල් දෙන්නා මුල්තැන අරගෙන හිටියෙ. සුජාතයි, ජිනදාසයි, තාත්තයි, රංගන මල්ලියි, රූබට් කියන නම හොඳටම ගැලපුනාට උප්පැන්නෙ සුනීත කියලා ලියව්වව් රූබට් අයියයි, සුදේව අයියයි. ලොකු ප්‍රේමගෙයි, පොඩි ප්‍රේමගෙයි ළමයි ඔක්කොම ඇවිත් හිටියා. ජපානෙන් මල්වෙඩි වරුසාවක් අරගෙන එයි කියලා බලාගෙන හිටියට මල්වෙඩි කොහෙද? ඔක්කෝම කටුනායක ආවෙ අම්මව තනියම ගෙදර අලද ජපානෙ ගිය හින්දද? ජපනෙක් කසාද බැඳපු හින්දද කොහෙද හැමෝගෙන්ම මහ ගරුසරුවක් ලැබෙමින් තිබුණා. සකුරා මල් ඔළුවෙ හිටන් පිපිලා ඇතියි කියලද උඹලා හැමෝම හිතන්නෙ?

හැමෝම ප්‍රශ්න අහන්න පටන් ගත්තෙ මම ජපානයේ ඉතිහාසයයි, සමාජ ආර්ථිකයයි හදාරන්න ජපන් සරසවියකට ගියා කියලා හිතාගෙන වගේ. එක අතකට සරසවියකුත් තමයි. අපේ කුඹුරෙ ගොයම් පැහෙනවා නම්, අපට රැට හොඳට නින්ද යනවා නම්, පාර්ලිමේන්තුවෙ මොනවා වුණත් කමක් නෑ කියන මනෝභාවයක සන්තෝසෙන් එල්ලිලා ඉන්න මිනිහෙකුගෙ බිරිඳ වීම සාමාන්‍ය පෙළ විභාගෙන් වැඩ ඔක්කොම අසමත් වුණා වගේ ප්‍රතිඵලයක් වුණාට ලෝකෙ ඉන්න හුඟක් සාර්ථක වෙච්ච මිනිස්සු අසාර්ථක අතීතයක හිමිකාරයො බව තාත්තගෙ පුතියන්කාරයො කියනවා ඇහිලා තිබුණා. මං ඔවිටෙත් ඕවිටට

ගන්නෙ ඒ ...

'උඹගෙ ස්වාමිපුරුෂයාට මේ පරම්පරා ගේ අයිති නෑ' මිච්කො සාන් හොර රහසෙ කිව්වා. ඒක තමයි කියන්න ඇත්තෙ. කොහොමටත් දැන් ටිකක් ටිකක් වැටහෙනවා බැ... නොවැටහුණත් මම ඒ අදහස උදුරගන්නවා.

'ඇයි'

'උගස් තියලා'

'කවුද?'

'මුත්තා'

'ඉතින්?'

'දැන් අලුත් අයිතිකාරයා ගේ ඉල්ලනවා. මසායා සාන් ක... අරන් ඉන්නෙ'

'හ්ම්'

'මසායා සාන් අර ඕව්ටේ ගෙයක් හදන්න හිත හි... ඉන්නෙ'

'හ්ම්....'

'හ්ම් කියන්නෙ? උඹට තරහ යන්නෙ නැද්ද?'

මසායා සාන් ඉංගිරිසි භාෂාව වැඩිය නොදන්නවා වුණ... හොඳට හසුරුවන්න පුළුවන් වචන හතරක් දැනගෙන හිටිය... ජපන් ස්වාමිපුරුෂයාගෙ දිවේ කොටලා තියෙන 'Good wif... wise mother' කියන ඒ වචන හතර මතුරනවට වැඩිය හො... අස්වැන්නක් නෙලා ගන්න තිබුණා. 'හත් මූදක් ඉරල... හොයාගෙන ...

ගැ... වයසක වෙන තරමට ආදරය, ආරක්ෂාව, කරුණාව ලැබෙනවා කිව්වට, වයසක මිනිහෙකුගෙ බිරිඳ වෙනවා කියන්නෙත් භාරදූර රස්සාවක්. අමිත්තතාපාට ආදරේට හරි, බයට හරි පූජක බමුණා ළමා මෙහෙකරුවෙක් ගේන්න වෙස්සන්තර රජ්ජුරුවන්ව හොයාගෙන ගියා. මේ කාලයෙ නීතියෙ හැටියට නම් වෙස්සන්තර රජ්ජුරුවන්ට වුණත් කැකිරාවෙන් හරි හඩුවක් වැටෙයි. හඩු වැටුණාට රජ්ජුරුවොනෙ.

'මේ කාලෙ සකුරා මල් පිපිලා ඇති හැමතැනම නේද?' කියලා චන්ද්‍රනක්කා ලනිල්ගෙ උරෙස්සට උඩින් බලලා ඇහුවා. පිපිලා. පිපිලා.

'අම්මට කොහොමද?'

'අම්මා කිව්වට අහන්නෙ නැතෙ නූපා. බොහෙත් ටික ඉවර වෙනකල් බොන්නෙ නෑ. යන්නම් නැගිට්ට ගමන් කෝප්පියක් බැඩ' චන්ද්‍රනක්කා විස්තර කරන කොට සුජාතක්කත් ඒ කතාව අනුමත කළා.

'පුංචි අම්මා කිව්වට අහන්නෙ නෑ නංගියෙ'

තාත්තා, වැන් රථයේ රියදුරත් එක්ක ලොකු කතාවක පැටලිලා. බඩු ගණන් යන හැටි ගැන. බඩු ගණන් යන්නෙ ඉතින් අපිට විතරක්ද කියලා රංගන ඇහුවා. තාත්තා ඉස්සර වගේම රංගන දිහා රවලා බැලීමෙන් රංගනව මෙල්ල කළා. පුරුෂයෙක් කියන්නෙ එහෙම මිනිහෙකුට. ප්‍රේමලා දෙන්නම කැමති වෙලා ඇත්තෙ ඔය පිරිමිකමට තමයි.

අම්මා නූපව පිළිගත්තෙ මහරජින ගෙදරට සම්ප්‍රාප්ත වුණා වගේ.

'ලෙඩෙන් භාගයක්ම සනීප වෙලා වගේ' තාත්තා හිනා වෙමින් කිව්වා. හැමෝම වෙනස් වෙලා. ලංකාවෙ හිටපු නූපාට

කවුද එනකොට?

අහල පහළ කීප දෙනෙක් ආවා ජපානෙට යන්න විසා හදාගන්න පුළුවන්ද අහන්න. පුටු පුටුවක (ත්‍රීවිලරයක) නැග්ගත් පුටුපුටු කාරයා අහන්නෙත් ජපානෙට යන්න විසා එක ගන්න විදිහ. ජපානෙට හිර දෙන්න පුළුවන් ක්‍රමය ගැන අහන්න. ඒක කියන්න තරකයි කියන කාරණාව එක පාරටම හිතට ආවා. හේතු දෙකක් හින්දා. එක හේතුවක් නම් බොහොම පුද්ගලිකයි. නූපා වයසක ජපන් මිනිහෙක්ව කසාද බැඳලා, වැලේවැල් නැතුව ජපානෙට වෙලා ඉන්නවා කියලා ගමේ ප්‍රසිද්ධ වීම වළකාගත යුතු දෙයක්. දෙවැනි හේතුව, තවත් ගැනියෙකුට හරි ගැණු ළමයෙකුට හරි මැජික් පෙන්නලා අහක බලාගන්න හරි, හිතෑ වෙන්න හරි පුළුවන්කමක් නැතිවීම.

හුළඟේ පාවෙන සරුංගලයක් වගේ හිත නැවත පාවෙන්න පටන් ගත්තා. 'යන්නෙ කවදද?' කියලා අහන කරුමෙ ඇරෙන්න හිත සන්තෝසෙන් පාවුණා. අම්මිට තමා වෙලාවකට ජපානෙයි යාපනෙයි පැටලුණා.

'ජපානෙ ගෑනුන්ටත් අපිට වගේ ගෙදර වැඩ තනියම කරන්න වෙනවද නංගි' කියලා චන්ද්‍රනක්කා කොට කොණ්ඩෙ පිහදමමින් ඇහුවා. මිචිකෝ සාන් අඳුන්නලා දුන්නු ඵලවළු වෙළෙන්දි මට මතක් වුණා. ඵලවළු වෙළෙන්දිගෙ නම අකිකො. ඈ කිව්වෙ ඵලවළු වෙළඳාම කරන්නෙ මුදලට නෙවෙයි මිනිස්සුත් එක්ක ගැවසෙන්න තියෙන ආසාව හින්දා කියලා. අකිකො සාන් ටෙනිස් සෙල්ලම් කරන බව කිව්වෙ මිචිකො සාන්ගෙ බාල දුව. අකිකො සාන්ලා මිචිකො සාන්ල එකට වාඩිවෙලා තේ බොන හැටි මිචිකො සාන් විස්තර කළේ චිත්‍රපටයක මනහර ජවනිකාවක් විස්තර කරනවා වගේ. නැගෙන දණගහලා ඉඳ ගෙන රවුම් තේ කෝප්පෙ දෑතින් අල්ලගෙන බොමින්

සාන්ගෙ ඇහැ යට ඉරිගණන දහයකට වැඩි වුණත් ඇස් දෙක දිදුලමින් තිබුණා.

'ජපානෙ ගෑනුත් අපි වගේම වැඩ කරනවා අක්කෙ. ඒත් මම දන්නෙ පිටිසර ගෑනු ගැන. නගරෙ ගෑනු ගැන තවම දන්නෙ නැහැ.'

'උන් කඩි වගේ වැඩ' චන්ද්‍රනක්කා ජපානයෙ ජාතික රූපවාහිනියෙ නිවේදිකාවක් වගේ කිව්වා. චන්ද්‍රනක්කා බලාපොරොත්තු වෙලා හිටියෙ මම සමනලට කොම්පියුටරයකුයි, සෙල්ලම් බඩු ගෝනියකුයි ගෙනෙයි කියලා. රූපවාහිනියෙන් ජපානෙ ගැන පෙන්වන විචිත්‍රණ බලලා එහෙම තීරණ ගත්තට නූපා ගිය ජපානෙයි, නූපා කසාද බැන්ද මිනිහයි, රූපවාහිනියෙ ජපානෙයි, ජපන්නුන්ටයි වැඩිය වෙනස් කියන එක තේරලා දෙන්නෙ කොහොමද? අම්මා කවදාවත් කොස්, දෙල් කාපු නැති අමුත්තෙකුට කොස්, දෙල් හදලා දෙනවා වගේ ගමේ කෑම හදහදා කන්න දෙන්න පටන් ගත්තෙ අසනීපයක් ජීවිතේට හැදිලා නැති ගාණට. එහෙ කොස් කොහෙන්ද, එහෙ ඉතින් දෙල් කොහෙන්ද, එහෙ කොහිල කොහෙන්ද අහ අහා බැරි බැරිගානෙ කෑම හදලා දීම හිරිහැරයක් තරමට දැනෙන්න වුණා.

යනවද - ඉන්නවද?

අපේ ගෙදර දැන් ජපානෙන් බැන්ද නූපලගෙ ගෙදර. ඊට ඉස්සර අපේ ගෙදර සතොසෙ වැඩ කරපු නන්දනරත්නලගෙ ගෙදර. රංගන මල්ලි දැපනෙක වැටිලා කියලා චන්ද්‍රනක්කා කිව්වෙ රහසෙන්. නිකන් ආවට ගියාට එකලමෙකල වෙලා අතැරෙන පාටක් නැති බවයි චන්ද්‍රනක්කාගෙ අදහස. බඹරු මල්වල පැණිබීලා යනවා මීසක මල් නෙලාගෙන යන රටක් තියෙනවද කියලා අහන්න තරම් දහිරියක් චන්ද්‍රනක්කට ලැබුණෙ කොහෙන්ද? පැණිබීලා යන්න හදපු බඹරෙත් ජේද ලනිල් කියලා අහන්න හිතුණත් නැහැ හිටියා.

කසාද ... යෝද්දයෙක්. ...

මිනිහෙකුගෙ ගෙදර කියන්නෙ ඒ යෝද්දයගෙ උයන. එතකො... කසාද ගැනියෙක් කියන්නෙත් එහෙමද? ඔය ප්‍රශ්නවලට ... එක්කෙනාගෙ උත්තර එක එක විදිහ වෙන්න පුළුවන්. නිවටයෙ... හිටපු ගමන් මහා පුරුෂයෙක් වෙන්න පටන් ගන්නවා. ලේ කැළැ... දකින්න නැති මූණක් ලෙයින්, මසින් පිරෙන්න පටන් ගන්නවා... මරු කඳක් තියාගෙන ඒ මිනිහා තොටුපලක බලන් ඉන්නවා... හදපායලා ඇවිත් ගංවතුර සිප ගන්නවා. රාත්‍රිය මෝහනය වෙලා... වගේ බලාගෙන ඉන්නවා. අමෝරාගෙන හිටපු කදුකිඬිසි ... දලා පටන් වෙන්න ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත් වෙන ... ඉකුරු වෙනවා.

ඉන්නත් පුළුවන්!

යන්නත් පුළුවන්!

මොකද කරන්නෙ? ඇඳියලක් කඩියක් අරගෙන ... ඇම්මා. නෝනද පොල්ලෙ? නෝනද යන්නද? නෝනා නම් ... පොල්ල නම් යන්න. නෝනා වැටුණා. කොළයක් අරගෙන ... ඇන්දා. ////////// ඔත්තෙ නම් ඉන්න. ඉරට්ටෙ නම් යන්න. ... දගකුනයි. තව සැරයක් ඇන්දා. ඉරි දහනවයයි. ඉරට්ටෙ ගානට ... වැටෙනකල් ඉරි ඇන්දා.

පව් අසරණයා. කොච්චර වියදම් කළාද? පුරුෂයෙ... භාෂාව හරියට ඉගෙන ගෙන අනුගත වීමක් මිසක ආපසු හැරී... වුවමනාවක් හිතට නැති බව දැනෙන්න වුණා. මව්පියන්ට... සහෝදරියන්ටයි, විශේෂයෙන්ම ජයනාථටයි පෙනි පෙනී ... විඳිනවට වැඩිය නොපෙනී දුක විඳීම වඩා හොඳ තෝරා ගැනීම... බව ඇතුළ හිත එහාට මෙහාට කිරා මැන බලමින් කිව්වා.

ලනිල් අයියයි, චන්ද්‍රනක්කයි, ජිනදාසයියයි, සුජාතක්ක... හරියට ...

බලාගන්නවා. ... සේවයේ යෙදෙනවා. උයනවා පිහනවා. වළං හෝදනවා. ගේ දොර අතුගානවා. වැරදි හොයනවා. රතු ඉරි අඳිනවා. රතු ඉරත් කලක් යනකොට රතුම නැහැ.

ලංකාවෙ ඉඳගෙන මොනවා කරන්නද? ජපානෙ ඉන්නකොට හිතුවෙ ලංකාවට ගිහින් පාරක් ගානෙ ගියාකැවත් සැපක් කියලා. මේ හැඟීම නිදහස හා සිරවීම අතර හැඟීමක්. ආලය සහ අයිතිය අතර ඇති හැඟීමක්. මම සොයමින් යන්නෙ නිදහසද? සිරවීමද? ආලයද? අයිතියද? සියලුම කිරා මැන බැලීම්වලට පස්සෙත් විවාහක පුරුෂයා කරා යාමේ තීරණය බරට දැනෙන්න වුණා. දුවෙක් දීග දුන්නම බැණා හරියෙක් වුණත් ආපහු හරියා ළඟටම පලයන් කියන සංස්කෘතියක චින්න බැහැලා හිටපු දෙමාපියොත් බැණා තනිවෙයි කියලා දුක්වෙමින් හිටියා. මේ මොක වුණත් නූපා යන්නෙ නූපාට ඕන හින්දා.

ජපානයෙ මහා සමුරායි කෙනෙකුගෙ බිරිඳ දිහා බලනවා වගේ අපේ ගෙදර අය මගේ දිහා බලන එක වහකදුරු වගේ හිතට දැනුණෙ. එනම ජපානෙත් ලංකාවේ මිනිස්සුන්ට මහ සමුරායි කෙනෙක් වුණාට අපේ මනුස්සයා මහා සමුරායි කෙනෙක් ගිය පාරක ගිහිල්ලවත් නැතිව ඇති.

තාත්තා කිව්වා වගේම අම්මගෙ අසනීපය තිබුණු ගාණක්වත් නැති තරමට මැකිලා ගියා. ඒත් ගෙදර ළඟටම ගෙන්නගත්තු කුලීරථයක නැග්ගගෙන පුද්ගලික රෝහලකට දෙතුන් පාරක් එක්ක ගියහම ආයෙ මම ලංකාවට එන දවසක් වෙනකල් සනීපෙන් සිටීමේ නිවාරණ එන්නතක් ලබාදුන්නා වගේ වුණා කියලා චන්ද්‍රනක්කා කිව්වෙ ලනිල්ගෙ පිගානට ලොකු මාළු කැල්ලක් බෙදන ගමන්. ලනිල් යටින් බලලා යන්තම් හිනාවුණා. මගේ හිත ඇතුළෙ පුංචි යුද්ධයක් සිදුවෙමින් තිබුණා. චන්ද්‍රනක්කගෙ ස්වාමිපුරුෂයට තියෙන්නෙ දවසින් දවස මුවහත් වෙන තරුණ කමක්. ලංකාවෙන් යන්න ඉස්සෙල්ලා ලනිල්ගෙ කඩවසම්කම ගැන මගේ හිතට හාංකවිස්සියක්වත් තිබුණෙ

කතාකරන ඇස් [illegible] නිහඬ [illegible]
නිහඬ වුණහම කතාකරන ජාතියෙ මහා ජවසම්පන්න තරු[illegible] පුරුෂයෙක් කියලා හිත ඇතුළෙ ඉන්න තරුණ නූපා කොහෙ[illegible] රහසිගත ස්වරයකින් කියන්න පටන් ගත්තා. හිත හරි [illegible] චන්දක්කා වරපුරුෂයෙකුගෙ ලක්ෂණ සියල්ල උපතින්ම [illegible] තිබෙන ස්ත්‍රියක්. අනික් අතට චන්දනක්කා සහෝදරී. [illegible] පුරුෂයාගෙ අයිතිය වෙනුවෙන් මිනිහෙකුත් මරලා, [illegible] පුරුෂයව ගහක බැඳලා මඩු වලිගෙන් තලන්නත් පුළුවන් [illegible] ගැනියෙක් චන්දනා කියන්නෙ. ඒත් මසායා සාන්ගෙ ඇස්දෙ[illegible] නැති අනුරාගයක් තවුසලමින් ලතිල්ගේ ඇස්දෙකෙන් [illegible] පියාඹනවා දැක්කම නූපාගෙ හිත පුංචි ගෑනු ළමයෙකුගෙ [illegible] වගේ දොපැත්තට වැනෙන්න ගත්තා. ලෝකෙ කොයි කො[illegible] වුණත් ඉන්න මිනිහෙක් කතා කරන පොදු භාෂාවකින් ල[illegible] දිගටම කතා කරන්න ගත්තා. චන්දනක්කා හිතුවෙ ඒ[illegible] බැංකුවකින් මට මල්ලක් පුරවලා සෙන් දෙන්න ඇති [illegible] ඉල්ලුවෙ නැති [illegible] සිටියා. [illegible] ගලායන ගංගා[illegible] විපාසය [illegible] නැතුවට ඉල්ලමින් හිටියා. ලතිල්ට දෙස් දෙවොල් තියන, ල[illegible] විවේචනය කරන නූපා කොහෙතුයි මොහොතකට හරි ඒ අනු[illegible] යට බැඳෙන්න සූදානම් නූපා කොහකුයි මසායා මහත්මියගෙ [illegible] ඇතුලෙ රණ්ඩුදබර කරමින් හිටියා.

පුංචි චමත්කාරයක් හිතේ නිවෙමින්, පත්තු වෙ[illegible] තිබුණා.

චන්දනක්කා උපකාරක පන්තියෙන් සමතලව ඒ[illegible] න කෙලින්ම අපේ ගෙදර එන හින්දා ලතිල් කෙටි නිවාඩු[illegible] දාලා අපේ ගෙදර ආවෙ මේ විදුලි බුබුල නිවෙමින් පත්තුවේ[illegible] තියෙද්දී. අම්මා කොහිල කොටුවට ගිහින්.

[illegible]

වැඩ. හරිගිය පිළිතුරු වැරදුණු පිළිතුරු. ළමා කාලයෙ පොත් පෙට්ටියෙ තිබුණු ළමා සුවඳ විඳිමින් ඉන්න වෙලාවකයි හිත ඇතුළටම එබෙන අමුතු සුවඳක් සාලයට ආවෙ. සුවඳ එක්කම හිනහව මතුවුණා. සුමිකාවා මහත්මිය වහාම හිඳගෙන හිටි තැනින් නැගිට්ටා. ලතිලුයි-සුමිකාවා මහත්මියයි ගන්න ඉස්ම එකිනෙකාගෙ මුහුණුවල දැවටෙන්න වැඩිවෙලාවක් ගියෙ නැහැ. සුමිකාවා මහත්මියගෙ හිත ගැහෙන්න පටන් ගත්තා. ලතිල් රහසින් වගේ නූපා කියනවා ඇහුණා. දිගින් දිගටම තිබුණු ගොළු සංවාදයක උච්ජතම අවස්ථාවට දෙදෙනාම එළඹෙමින් සිටියා. මම ඔයාව ඉඹින්නද කියලා ලතිල් ඇහුවෙ නැහැ. එකපාරටම වැළඳගත්තා. මුළු ලෝකෙම අමතක කරලා දාපු සුමිකාවා මහත්මිය ඒ මොහොතෙ උණුසුම් ආදරය සොයාගෙන චන්දනා ගමනක යන චන්දනා කාරියක වගේ නූපාට ගුලි වෙන්න ඉඩ දුන්නා.

'කවුරු හරි එයි' නූපා කම්මුල්වලටයි හිතටයි දැනෙන උණුසුම් [illegible] ලතිල්ගෙ [illegible]යෙන් මිදිලා පසෙකට වුණා.

'කොහෙ හරි යමුද?' ලතිල් ඇහුවෙ රහසින් වගේ.

'කොහෙද?'

'මං දන්න තැනක් තියෙනවා'

'බයයි'

'බය වෙන්න එපා'

එතකොටම අම්මා ගෙට එන අඩියබ්දය ඇහුණා. නූපා අවුල්වෙලා තිබුණු කෙහෙවැටිය හදාගෙන පොත් පෙට්ටිය ළඟ ඉඳගත්තා. ලතිල් පුටුවක ඉඳගෙන පත්තරය කියවන්න ගත්තා.

බයයි කිව්වෙ ඇයි බැහැයි නොකියා. නූපා නූපාගෙන්

ලනිල් වගේම සුමිකාවා මහත්මියත් හිටියෙ ගොළු වෙලා.

'ආ ලනිල් පුතා ආවද?'

'ඔව් අම්මෙ. චන්දනා, පුතත් එක් එනවා කිව්වා මෙලෙ කියලා ලනිල් නැවතත් පත්තරය දිහා බලාගත්තා.

'මොනවද ළමයො ඔය දූවිල්ල අදින්නෙ?' කියල අම්මා ඇහුවා. පපුව ගැහෙමින් තිබුණු හින්දා උත්තරයක් ගන්න බැරි වුණා. සුමිකාවා මහත්තයට ඊළඟ අවුරුදු විස්ස ස්වාමිපුරුෂයා වෙලා හිටියත් දෙන්න බැරි උණුසුමක් ලනි එක මොහොතකින් ලබා දුන්නෙ කොහොමද? චන්දනක්ක මාරාවේෂයෙන් එනවා. කඳුළු හොටු පෙරාගෙන අඬන ඉකිගගහ අඬනවා. මාරාවේෂයෙන් එන ගෑනිට බයයි. කඳු හොටු පෙරාගෙන අඬන ගෑනි ගැන දුක්යි. කසාද ගෑනියෙ කසාද පුරුෂයෙකුට සින්නක්කර ඉඩමක් කඩමක් තැ වටිනවා. සින්නක්කර ඉඩමක මායිම ළඟට එන්න පුළුවන්කම තිබුණත් කසාද පුරුෂයා කියන මායිමට ස් ස්ත්‍රියකට පැමිණීමට කිසිදු ඉඩක් දෙන්න කසාද ස්ත්‍රිය තැ වෙන්නෙ නැහැ. චන්දනක්කා ඉඩමක කඩමක අයිතිය වගේ කසාද පුරුෂයාගෙ අයිතිය වෙනුවෙනුත් කළ හැකි ඕනිදු දෙය වුණත් කරන එක ගැන සැකයක් නැහැ. ස්වාමිපුරුෂ සන්තකයේ තියාගැනීම සඳහා සහෝදරියගෙන් ගැලවී උපක්‍රමය සොයාගැනීම ගැන දෙපාරක් සිතීමට ඉවසීම චන්දක්කාට නැති බව නූපා තේරුම් ගත්තෙ ළමා කාලෙ ඉඳලා තිබෙන අවබෝධයෙන්. ලනිල් පත්තරයට උඩින් වරින් කොරගල් අඳුලමින් හිටියා.

'දන්න තැනක් තියෙනවා'

සුමිකාවා මහත්මිය [illegible]

ඉස්සෙල්ලා [illegible] පොරෙන් නවත්තගත්තා කියන එක විතරයි. රුබට් අයියා කියපු විදිහට නවත්තගත්තෙ පරයෙක්.

ඔය ලනිල් හදන්නෙ තව දළඹුවෙක් හදන්න. පාට පාට සමනලයෙක් උපදියි. එහෙම නැත්නම් ඒ දළඹුවා සමනලයා වෙන්න ඉස්සෙල්ලා, මහා දුකක් දීලා එළියට ඇදලා දායි.

ලනිල්!

පිරිමියෙකුගෙ උණුසුම කියන්නෙ ගෑනියෙකුට ඉතාම වැදගත් දෙයක් කියලා හඳුනගත්තු පිරිමියෙක්. එහෙම හඳුනගත්තු ඕනම පිරිමියෙක් වගේ, අවධානම කොතරම් බරපතල වුණත් අවධානම තුළ ආශ්වාදය උරගා බැලීමෙ සහජ පිරිමිකම ලනිල් තුළ ඉස්මතු වෙලා තිබුණා. මේ ආරම්භය පමණයි. මහා යුද්ධයකට සියල්ලම පෙළ ගැසෙමින් තිබෙන බව සුමිකාවා මහත්මියට දැනුණා.

පිරිමියෙකුට [illegible] දෙයක් ගැන දැනගැනීමට, හඳුනාගැනීමට තිබෙන [illegible] ලනිල්ට තරම් හොඳින් වෙනත් කිසි පිරිමියෙකුට පිහිටලා නැතිව ඇති. ඒ වෙලාවට ලනිල් විශේෂඥයෙක්. දුක් ගන්නා රාළ කෙනෙක්. අනුන්ගේ දුක වැටහෙන මහා පුරුෂයෙක්. අනේ! අම්මා නැවත කුස්සියට ගියා.

'අපි කොහේ හරි යමුද?'

'නැහැ'

'ඇයි'

'වරදක් කරන්නෙ කියලා තේරෙන්නෙ නැද්ද?'

'පණිවිඩ කතා නැතුව යමු නූපා. කෙටි උඹේ අතයට [illegible] [illegible] එන්න'

'සඳහට ළඟ තියාගන්න ආසයි'

'ගෑනු දෙන්නෙක්?'

'හෙට උදේ දහයට එනවද?'

'බැහැ'

කම්මුල්වල තවමත් දැනෙන උණුසුමක් තිබුණත් සුමිකා... මහත්මිය ආරාධනාව ප්‍රතික්ෂේප කළා. ලනිල් ඔය කැඳවාගෙන යන්න හදන්නෙ මාංශය උරාගෙන වළදින්න මිසක නූපා දෝ... පා ඉල්ලන හිතට දැනෙන ආදරයක් පුද කරන්න නෙවෙයි... නූපාගෙ මූණ සිප ගන්නට, නූපාගෙ හිත සිපගන්න ලනිල්ට බැහැ.

'පවුල කඩාගන්නද හදන්නෙ?'

'අපොයි නැහැ.'

'අක්කයි නංගියි දෙන්නාම රවට්ටවන්න හදන්න එපා.'

'මට ඔයාව ඕන'

'දෙන්නෙකුට ආදරේ කරන්න පුළුවන්ද?'

'පුළුවන්'

'ඔයා ලනිල් අයියෙ ඔය ගෑනු දෙන්නටම ආදරේ නැහැ'

සුමිකාවා මහත්මියට ඉක්මනින් තීගතාවට යාමේ අවශ්‍යතාව ඇති වුණා. එය හිත ඇතුළෙන්ම ආ බලකිරීමක්. මහ ගලක් පෙරලීගෙන, පෙරලීගෙන එන සද්දයක් ඇහෙනකොට... දැනෙනකොට ඒ ගලට හිස තියා ගන්නවද බේරෙන්න පැනලා දුවනවද කියලා සුමිකාවා මහත්මිය නූපාගෙන් ඇහුවා. සුමිකාවා මහත්මිය කියන්නෙ ... ජීවිතයේ ... සොයමින් ...

ඒ යන මඟ ... ඒ චන්දනා ගමනෙදි හොයන්නෙ තුරහල් පුස් පැටියෙකුට වගේ ආදරය දක්වන්න පුළුවන් හිතකුයි. ඇඟ සම්මස් ලේ නහරයි සමෝසමෙ තියෙන පිරිමියෙක්.

මගේ ගමන ඉක්මන් වුණා. මම මගේ ස්වාමිපුරුෂයා මං එනතුරු මග බලාගෙන ඉන්න තීගතාවට යා යුතුයි.

කම්මුලට මතකයක් තිබුණත් හිතට ඒ මතකය සුන්දර මතකයක් නෙවෙයි. ඒත් ගින්දරයි පුළුනුයි ඇවිලෙන්න ඔන්න මෙන්න තිබුණෙ. ඔන්න මෙන්න තියෙන කොච්චර දේවල් මකලා දාන්න පුළුවන්ද?.

ලනිල්-සමනලගෙ තාත්තා මිසක චන්දනාගෙ ස්වාමිපුරුෂයා මිසක සුමිකාවා මහත්මියගෙ මස්සිනා මිසක නූපාගෙ කවුරුවත් නොවෙයි.

අතුවල කොළ නැතුව මල් පිපිලා. සකුරා මල් පිපිලා. හැමදේම නැතත් එක රටක ඉපදිලා තව රටක ජීවත් වෙන්න ලැබීමයි. හිතුනු වෙලාවක ඉපදුණු රටට ගිහිල්ලා එන්න ලැබීමයි වුණත් මගේ හැටියට මහ දෙයක්. එක එක විදිහෙ සකුරා මල්. පොකුරු පිටින් පිපෙන සකුරා මල්. තනිතනියම පිපෙන මල්. ලොකුවට වැඩෙන ගස්. පඳුරු වගේ සකුරා. පාර දෙපැත්තෙ සකුරා මල් පිපිලා තියෙන කොට මුළු හිත පුරාම මුළු ඇඟ පුරාම මල් පිපිලා වගේ දැනෙනවා. මනමාලියෙකුගෙ අතේ තියෙන විශාල මල්පොකුරක් වගේ සකුරා මල් පොකුරක් නැළවෙනවා. මේ තරම් මල් පිපෙන රටක ඉඳලා ගිය මිනිහා නේද ප්ලාස්ටික් මලක් සාක්කුවෙ ගහගෙන පෝරුවට නැග්ගෙ? හැඩක් රුවක් නැති නමක් නැති මලකුත් නොවන අමුතුම මලක්. සුදුපාටයි රෝසපාටයි මුහුන් වෙච්ච මේ දෙමුහුන් සකුරා මල නිර්මාණය කරපු මේ මහපොළවෙ නිමැවුම්කරුවා අපූරු සුන්දර සත්ත්වයෙක් විය යුතුයි. අරාබියට තෙලුයි, ජපානයට මලුයි දුන්න මැවුම් කරුවා අරාබි මිනිසා කම්මැලියෙකුත්, ජපන් මිනිසා මහා ... මිනිහෙකුත් කරන්න හේතුව මොකද්ද? සකුරා මල් මහ

ඊ ගස්වලට ප්‍රා... ... මෙලන්න ...
දෙන්නෙ නැහැ.

වේල් එකක් වගේ එල්ලිලා වැටෙන සකුරා මල් යාය පහුකරගෙන යනකොට මම මසායා සාන්ගේ අතින් අල්ලගෙන සකුරා මල් යාය ළඟ හිටගෙන හිටියෙ හිනාවෙමින්. මසායා සාන් ලැජ්ජාවෙන් වගේ අත ගසලා දාලා යන්න ගියා. වයස ගිහින් තරුණ කාන්තාවක් කසාද බැඳගන්න හොඳයි. අතින් අල්ලන්න ලැජ්ජයි. මසායා සාන් අඩි දහයක දොළහක පරතරය තියාගෙන ගඟ ළඟට ඇවිද ගෙන ගියා.

ස්වභාව ධර්මයෙ ලස්සන බලන්න. රස විඳින්න ස්වාමිපුරුෂයෙක් ඕන නැහැ. (හිටියා නම් කොච්චර හොඳද) ගංගාව ළඟ තියෙන මහ සකුරා ගස්වල මල් පිපිලා. හැඩය වෙනස් එක එක විදිහෙ මල්. පුංචි පෙති ලොකු පෙති. ගහෙ මල් ගඟෙත් මල්. ඡායාව අපමණ ලස්සණයි. ගඟේ අනික් ඉවුර බෝඩියක් මලින් නැව්වා වගේ සකුරා මල් පඳුරක් මලින් පිරිල මුළු ගහම වසාගෙන මල්-මල්-මල්-මල්. වළාකුළු වගේ පාවෙන සකුරා මල්. කඩා හැලෙන ගැට රැක් අත්තන වගේ කඩා හැලෙන සකුරා මල්. කඳු කඩාගෙන හැලෙනවා වගේ ගලා හැලෙන මල්.

මසායා සාන් අර බලන්න සකුරා මල් පාර දිගේ කෝච්චිය මනමාලි වගේ එනවා. කෝච්චියෙ කවුළුවකින් පෙම්බරාගෙ හිනා දැස මතු වුණා. ඔය සකුරා මල් පොරවගෙන කොහෙද යන්නෙ? ඉක්මනට බහින්නකො. හිනාවෙවී ඇතින් ගිහිල්ලා කොහොමද ආලය ආදරය කියන හැඟීම හුවමාරු කරගන්නෙ ඔය දුම්රියෙන් බැහැලා එන්න. සුමිකාවා සාන් දකියි කියල කිව්වෙ? නැහැ සුමිකාවා සාන් මල් පිපෙනවා දකින්නෙ නැහැ කුරුල්ලො පියාඹනවා දකින්නෙ නැහැ, බලන්න මේ සකුරා මල්යාය ...

කියන්නෙ? ඉතින් ... පාවෙව එන්න. පෙම්බරා කීකරු පුංචි ළමයෙක් වෙලා ඇවිත් මගේ සුළඟිල්ලෙ එල්ලුණා. ඊළඟට එකපාරට කඩවසම් පුරුෂයා මතු වුණා. අහන්නද ප්‍රශ්නයක්? ඇත්තම කියනවද?

'හ්ම්'

'පෙම්බරා මට ආදරේද? මගේ හිතට?'

පෙම්බරා උත්තර දුන්නෙ වචන වලින් නෙවෙයි. මෙ සකුරාමල් වසන්තයෙ පෙම්බරා බලාගෙන ඉන්නෙ උමතු වෙසින්. පංචතූර්ය නාදයෙන් සකුරාමල් දමනය වෙලා. පෙම්බරා නුපාගෙ සිතයි ගතයි වැළඳගෙන ගායනා කරන්නෙ ප්‍රේමයේ අසිරිමත් ගීතය.

ඔය මලුයි, ඊට පායන හඳයි, පෙම්බරාගෙ මතකයයි මගෙ තනියට ඇති. මම කන්දක් පසුපසින් යනවා. සඳ නුඹත් යන්න ඒ කඳු පසුපසින්. හැමදෑයකම අප මුණගැහෙනවා කියලා ජපන් ජාතික කවියෙක් කියලා තියනවා කියලා එළවළු වෙළෙන්දි කිව්වා.

'තේ ටිකක් බොමුද?' කියලා අහන්න නොයෙක් වර හිතට ආවත් මසායා සාන් හැමතිස්සෙම අමුතු ඉරියව්වකින් බලාගෙන ඉන්න හැටි සිහියට ආවම, පිට කෙනෙකුට ගේ ඇතුළට ආරාධනා කිරීමෙ හිත පාලනය කර ගන්න සිද්ධ වුණා. මසායා සාන් රස්සාවට යනවා ගිහින් ඇවිත් බයිසිකල් පදින්න යනවා. කිසිම වෙනසක් නැතුව ගෙවිලා යන ජීවිතයක කොටස්කාරියක වීම ඉරණමෙ ලියලා තිබ්බච් දෙයක් නම් මගේ ජීවිතය එහෙම ගෙව්ච්චාවෙ කියලා ඉන්න වෙලාවකට හිතුනත්, ඉරණමට ඕන විදිහටම මගේ ජීවිතය ගෙවෙන්න අරින්නෙ මොකටද? ඉරණමට හැමදේම භාර දීලා, මසායා සාන්ට යාවජීව දාසියක් වෙනවද?

මේ වතාවෙ සූදානමක් තිබුණා. සිංහල පොත් හුඟක් ...

තියාගෙන ... දැන් ... පාලුවක් නැතුව ඉන්න කරගන්න තියෙන හොඳම දේ බඩගින්... වීම. එතකොට ගිනැගෙව් බෝනික්කා ඇස් නටවා බලා... කියමින් ජපන් බෝනික්කෙක් නළව නළව ඉන්න පුළුවන්.

'සමාවෙන්න' කියලා අත්දෙක එකතු කරලා, සිරියා... බිරිඳට වදින ස්වාමිපුරුෂයෙක් එක්ක ගැබ්බර වීමේ සිහින... ලෙසි පහසුවට එළිකර ගන්න බැරි බව මම දැනගෙන හිටි... Gomen! සමාවෙන්න.

'රස්සාවල් කරන මිනිස්සුන්ට රෑ වෙනකොට මොකද...' කියලා ස්වාමිපුරුෂයා කරුණු පැහැදිලි කිරීමක් කළා.

'එතකොට මේ රටේ අනික් ජපන් මිනිස්සු රස්සා... කරන්නෙ නැද්ද? මය ළමයි ළපටි ඉන්නෙ රස්සාවල් නැ... එවුන්ටද?'

ඒ ප්‍රශ්නය මම ... එකම ... කරන්න පුළුවන් එක දෙයයි. මසායා සාන් ඉතාම ගරු ... විදිහට තමුන්ගෙ රැකියාව කරනවා. මම ලංකාවෙ හිටියා ... මගේ සියලුම අඩුපාඩුකම් එක්ක මට බෞද්ධ ස්වාමිපුරුෂයෙකු... භාර්යාව වෙන්න ඉඩ තිබුණා. එහෙම වුණා නම්, සිරියා... කඩ මුල්ලක් නැගෙන්න පුළුවන්. කුටුම්බයට බඩ ගාගෙන ... ස්වාමිපුරුෂයෙකුගෙ දෙපා හෝදලා පෙරටගන්න යන ... හොඳ හා නරකුත් ලැබිලා ඊට පස්සෙ ලොකු සංග්‍රාමයකුත් ... වෙන්න පුළුවන්. සංග්‍රාමයක් තිබ්බට ඒක පාර්ශවීය සංග්‍රා... වෙන්නත් පුළුවන්. අනික් කට්ටිය එල්ල ගන්නු දරු ... එක්ක ඇඹුලුමෙ ඉස්පිරිතාලෙ පෝලිම්වල ඉන්න නූපා, ... කඳුළ පෙරාගත්තු නූපාගෙ දරුවෙක්, නැම රාත්‍රියකම ... වඩින තනිකුඩිය පිළිබඳ සුද්ධ සිංහල විවරණ සහිත ... ගෙවන ජීවිතයට වඩා මේ ජීවිතය නිස්කලංකයි. සිරි ...

ඉහටලා ... ගැනීමේ උත්සාහයක නූපා යෙදිලා හිටියා.

මම ඉන්නෙ නීගතා පලාතෙ වුණාට, මම ඉන්නෙ නීගතාවෙ වෙනත් නමක් තියෙන නගරයක බව හරියටම තේරුම් ගත්තෙ ලංකාවට ආපහු ගිහින් ආවටත් පස්සෙ. ෂිනානො ගඟ ගලාගෙන යන්නෙ අපේ ගෙදර තියෙන සන්ජෝ නගරයට ආසන්නයෙන්. සන්ජෝ නගරයෙ පාරක් ගානෙ ඇවිදින්න යාමේ ආසාව මැඩ පවත්ත ගන්න බැරි තරමට හිතෙන් එළියට පනින්න පටන් ගත්තා. මසායා සාන් ඇතා හරි නැතා හරි මං දැන් මේ නගරයෙ අතුමුළු ගැන දැනගන්න වුවමනායි.

'මසායා සාන් කඩේ යන්න ඕන නෑ. මං කඩේ යන්නම් බඩු ගේන්න' මං වචනවලිනුයි, අතපය තරඹයෙනුයි මගේ අදහස ප්‍රකාශයට පත්කළා.

'කඩේ ගිහින් බඩු ගන්න නූපා භාෂාව දන්නවැයි'

'එහෙම ... කොහෙරත් වගේ මංව තියා ගන්නද බලාපොරොත්තුව?'

මට හැකි උපරිම අභිනය පෙන්වමින් මම මසායා සාන්ගෙන් ඇහුවා. කිව්වෙ මොනවද කියලා හරියටම තේරුම් ගන්න බැරි වුණාට කියන්න ඇත්තෙ මොනවද කියලා මං මසායා සාන්ගෙ ඉරියව්වලින් තේරුම් ගත්තා. ගේ පිළිවෙළට තියාගන්නට, ගේ දොරකොඩ සපත්තු පිළිවෙළට තියා ගන්නට, රස්සාව භාර්යාව කරගෙන ජීවත් වුණාට, ගෙදර ඉන්න ගෑනු මනුස්සයා ගැන තැකීමක් මේ ස්වාමිපුරුෂයට නැතුවා නියත තීරණය පසුපෙන් එළියට ඇදලා දාන්න බැරි තරමට පැලපදියම් වෙමින් තිබුණා. මට තේරුණා හරි නොතේරුණා හරි මසායා සාන් විනාඩි දෙකතුනක් තරමක් උස්හඬින් කතා කළා.

මසායා සාන් වැඩට යන්න. මං සන්ජෝ නගරයට තනියම්

පාටට බැබළෙන හැටි මං බලාගෙන ඉන්නෙ ඉවසන්න බැරි හැඟීමකින්. නගරය අවසාන පින්සල් පාරත් ගහපු චිත්‍රයක් වගේ මම වෙල්යාය ළඟ බලාගෙන හිටියා. ඔහායො ගොසයිමස් (සුබ උදෑසනක්) කියමින් යන එන උදවිය හිස නමා ආචාර කරනකොට මට අපහසුවක් දැනුණා.

අවුරුදු ගාණක් බල්ලොයි බළල්ලුයි එක්ක අවුරුදු දෙකතුනක ළමයෙක්ව කාමරේකට දාලා හිටියොත්, ඒ දරුවා බුරනවා හරි ඤාව් ගානවා හරි මිසක කතා කරන්නෙ නැහැ. කතා නොකරන මිනිහෙක් එක්ක එක ගෙදරක වාසය කිරීමෙන් ඉබේම ගොළු බවට පත්වෙනවා. භාෂාව දන්නෙ නෑ කියලා අපි සැමියො දෙපැත්තකට වෙලා ඉන්නවා. දන්න එකම භාෂාවත් කතා කරන්නෙ නෑ. ඒ භාෂාව කතා කළා නම් මේ වෙනකොට කතාකරන භාෂාවත් සම් මස් නහරවලට කාවදින්න තිබුණා. සිරියහනෙදි අවශ්‍ය ආලිංගනයක් මිසක වැඳුම් පිඳුම් නෙවෙයි. තවත් සිරුරකින් දැනෙන උණුසුම මිසක අඟල් හය හතක් ගනකම ඇති බ්ලැන්කට්ටුවල උණුසුම නෙවෙයි. සිරුරකින් දැනෙන උණුසුම, සිරුරට පමණක් නොවෙයි හිතටත් දැනෙනවා. කොහොමටත් ජපන්නු ළඟ අමුතුම උණුසුමක් තියෙනවා. මට බැ තද සීතලක් දැනෙන වේලාවට මසායා සාන්ගෙ අත ඇල්ලුවාම මහා උණුසුමක් දැනෙනවා. ඒක ස්වභාව ධර්මයෙන් දීලා තියෙන උණුසුමක් වෙන්නැති. එළවළු වෙළෙන්දිගෙ සුළඟිල්ලක වුණත් ඒ උණුසුම තියෙනවා. වෙල්යාය දිහා බලාගෙන ඉදලා මං නගරය මැදින් හෙමින් හෙමින් ඇවිදගෙන යනවා. මල් කඩ, මාළු කඩ, මස්කඩ, එළවළු කඩ, පිහි සහ ඇණ කඩ තියන හැම එකකටම වගේ ගොඩවැදෙනවා. හැම තිස්සෙම අතුගාන ගම තියෙන පාරවල්වල ඇවිදගෙන යනවා. පිච්මල් නැඹිලි පාටට සි නැළවෙනවා. මේ පුංචි නගරය මහ පරණ ගමකින් එළිපෙනෙන වෙමින් තියෙන අලුත් නගරයක් වග මගේ ඉව මට කිව්වා එළවළු වෙළෙන්දිගෙ කටහඬයි අභිනයයි විසින් හිතට කාවදින

කාට වැඩක්ද? කරන්න දෙයක් නෑ මසායා සාන් අඩුතරමින් මම කතා කළ යුතුයි නේද? මම ජපානයට පිටුවහල් වුණා නොවෙයි. ජපානයෙ හිර ගෙදරක හිර දඬුවම් විඳින්න ආවා නෙවෙයි. මම ආවෙ නුඹෙ පතිනිය වෙන්නයි. ඒත් තවම බැරිවුණා මට නුඹෙ පතිනිය වෙන්න. මම බලාපොරොත්තුව අත් අරින්නෙ නැහැ.

ගෑනියෙකුට පුළුවන් ඕනම ආමරිකයෙක් හදාගන්න කියලා තාත්තා නිතරම කියනවා. ඉතින් ආමරිකයෙක් නොවන නුඹ හදාගන්න එක නුපාට් මහ වැඩක් වෙන එකක් නෑ.

'ඇයි මං නැතිවෙලාවට පාරෙ ඇවිදින්න යන්නෙ?' මසායා සාන් සුමානෙකට විතර පස්සෙ නාන කාමරය ළඟදි ඇහුවා.

'මම ඇති කරන සතෙක්ද ගෙදරම ඉන්න?' අපි දෙන්නම අහින භාෂාව බහුල වශයෙන් භාවිතා කළා. මේ අවස්ථාවෙ හැටියට භාෂාව නොදැන සිටීමත් එක විදිහක යහපතක්. මසායා සාන් විනාඩි දහයක් විතර දිගට කතා කළා. මට තේරුණු වචන කිහිපයක් තිබුණාට කියපු දේ මුළුමනින්ම තේරුම් ගන්න බැරි වුණා. ඒත් කෝපයත් ආවේගශීලී බවත් ඒ විනාඩි දහය තුළ පරිසරයට කාන්දු වෙච්ච බව මම දන්නවා. ජපන් භාෂාවෙන් ප්‍රතිඋත්තර දෙන්න බැරි නිසා මම මසායා සාන් කිව්වයි කියලා හිතන දේවලට සිංහලෙන් පිළිතුරු දෙනවා.

තේරුණාද මං සතෙක් නෙවෙයි. මං ලංකාවෙන් මෙහාට පිටුවහල් කරපු වහලෙකුත් නෙවෙයි. මොකක් හරි කරුමෙකට මට ඔහේව කසාද බඳින්න සිද්ධ වුණා. මං මේ ගේ ඇතුළෙ බැඳලා ඉන්න බලු කික්කියෙක්ද? මගේ වෛද්‍ය වාර්තාවක් ඉල්ලුවට කසාද බඳින්න ඉස්සෙල්ලා ඔහේ මට වෛද්‍ය වාර්තාවක් දුන්නද? ඔහේ වගේ මිනිහෙක් ඉන්න තැනක ඔහේට තව සහෝදරයෙක්වත් හිටියා නම් එකගෙයි කන්න තිබුණා. දන්නවද එකගෙයි කනවා කියන්නෙ මොකද්ද කියලා. තව මිනිහෙක් හිටියා නම් මේ ගේ ඇතුළෙ මං එකගෙයි කන්න දෙපාරක් හිතන්නෙ නෑ. මං ගෙදර ඇති කරන මාළු පැටියෙක්වත්, පූස් පැටියෙක්වත්, බලු

පාරට යනවා. මං නගරයට යනවා. මං සන්ජෝවල ඉන්නවා කියලා දැනෙන්න ජීවත් වෙන්න ඕන. තේරුණාද?

මේ කිසිදෙයක් මසායා සාන්ට නොතේරුණාට, මසායා සාන් මං බරපතල යමක් කිවූ බව තේරුම්ගත් බව පෙනුණා.

නුඹ දුර්වලයි. මාත් දුර්වලයි. නුඹ බලවත්, මාත් බලවත්.

මම සන්ජෝ නගරයෙ සැරිසරන්නිය වුණා. උඩින් පිච්මල් යටින් තුතුජ් මල්. මැදින් උඩිනුත් ගින්දර යටිනුත් ගින්දර මැදින් සවුන්දර! ඒ ඉස්සර අහපු කතාවක්. නූපගෙ කතාවෙ උඩිනුත් මල්, යටිනුත් මල් ඒත් මැදින් මල් නොපිපෙන කාන්තාරයක්!

ලංකාවෙදි හිතට කරදරයක් වෙච්ච වෙලාවක බෝකොළ සිලිසිලියයි සුදුවැලිතලාවයි, පොල්තෙල් පහන් වැටයි, හඳුන්කූරු සුවඳයි හිතට සැනසීමක් දුන්නා. දෙයක් සිද්ද වුණත් නොවුණත් හිතට දැනෙන සැනසීම හොඳටම ඇති. සන්ජෝ නගරයේ සැරිසරන්නිය නිගතාවෙ කුගමිමා පන්සලට ගියේ ඉබේම, ඉවකින් වගේ. මහා තොරණක් පහුකරගෙන පන්සලට ඇතුළු වුණා. තොරණෙ ගාම්භීරකම විසින් දෙපාවල සිට හිස මුදුනටම හැඟීමක් දැනීමක් එකතු කළා. පඩිපෙළ තැනිතලාවක පිහිටි පන්සලේ එහි වටාපිටාවත් අතර නතර වුණා. තැනිතලාව පසුකරගෙන ගිහින් තවත් පඩිපෙළක් නැගලා බුදුගෙයට පිවිසුණා. කාන්තාවන් කිහිපදෙනෙක් සහ වයසක පුරුෂයින් කිහිප දෙනෙක් බුදු පිළිමය ඉදිරිපිට. මම පන්සලට ගියේ පොද වැස්සක. බුද්ධ රූපය දෙපස දෙනමක් වැඩ ඉන්නවා. සැරියුත් මහරහතන් වහන්සේත්, මුගලන් මහරහතන් වහන්සේත් වෙන්න ඇති. බුදු හාමුදුරුවො කොයි රටේ පිළිම වහන්සේ කෙනෙක් ලෙස වැඩ වාසය කළත් දෙපස සිටින්නේ පුත්තේ ඒ පිළිම වහන්සේලා දෙදෙනායි. ඒත් මුගලන් මහරහතන් වහන්සේ හඳුනාගන්නා තිල්පැහැය දකින්නට ලැබුණෙ නැහැ.

මට පුරුදු ගරු ගාම්භීර විදිහටයි. මම බිම දණගසා ඉඳගෙන දොහොත් මුදුන් තබාගෙන බුදුන් වැන්දා. අනේ බුදුහාමුදුරුවනේ මගේ හිතට සැනසීම සොයා ගෙනයි ආවෙ. මේ මඟුල කරපු කපුවා මේ දුක පැහැදිලි කළේ නෑ හරියට. මන් කොළ වලට අපව විකුණලා. ඔබවහන්සෙට මේ දුක තේරෙනවා.

බුදුන්වහන්සෙ අයිති දඹදිවට නෙවෙයි මුළු ලෝකයටමයි. මුළු මහත් මනුෂ්‍ය වර්ගයාටමයි. සියල්ලටම මුල හිත බව දේශනා කළේ ඔබ වහන්සෙ. මගේ මේ අප්‍රමාණ දුක්ඛ දෝමනස්සයන්ට මුල වන්නේත් හිතද අපේ බුදුහාමුදුරුවනේ? ලෝකයේ කොතැනක වෙනස් වෙනස් මුහුණුවරින් ඔබ වහන්සේගේ පිළිම නිර්මාණය කරලා තිබුණත් ඔබ වහන්සෙ මගේ හිතේ වැඩ වාසය කරන්නෙ ගමේ පන්සලේ ඔබ වහන්සේ වැඩ වාසය කළ අප්‍රමාණ වූ අනුපමේය වූ ශාන්ත මහා කාරුණික විලාසයෙන්මයි. ජීවිතය නොදෙන දෙයක් හොයා යන මගේ හිත පව් රැස්කරගන්නවා. දහස් වාරයක් ස්වාමිපුරුෂයෙකුට වෛර කරනවා. මේ විවාහයට සම්මාදම් වූ සියලු දෙනාට වෛර කරනවා. තම දියණිය රැකබලා ගත නොහැකි වූ මවකට දොස් පවරනවා. බත්තරමුල්ලෙ ඡන්ද රැස්වීමක කතා කළ අගමැතිවරයෙකුට වෛර කරනවා. ඒ රැස්වීමෙදියි ජයනාථ හමුවුණේ. මගේ හිත මා දුකින් මුදවාගත යුතුයි. ජපන් ජාතික කාන්තාවන් පිං කැටේට කාසි කීපයක් දානවා. පොඩි පොඩි කාසි ඒ දැම්මෙ යෙන් දහයෙ කාසියක්. යෙන් දහයෙ කාසිය හරියට තඹ සතයක් වගේ. හිත එකඟ කර ගන්න මම බුද්ධ ප්‍රතිමාව දිහා නැවත බලාගෙන හිටියා. බුද්ධ ප්‍රතිමාවට උඩින් මොණරෙක්.

කළු ලෝගුවක් ඇඳගත්තු සාමාන්‍ය ජපන් ජාතිකයකුට වැඩිය උස මහත ඇති පුද්ගලයෙක් බුදු පිළිමය පසෙක තනම් පොළවෙ ඇතිරූ කොට්ටය මත හිඳගෙන යමක් කරමින් හිටියා. කකුල හිරිවැටෙන්නට අර අඳිමින් සිටිය නිසා පොළවට දෝත් තබා බුදුන් වහන්සේට වැඳ නමස්කාර කර මම නැඟී සිටියා.

නවත්තන්න හැදුවොත් මං මේ ගෙදරින් පැනලා යනවා. මං පාරට යනවා. මං නගරයට යනවා. මං සන්ජෝවල ඉන්නවා කියලා දැනෙන්න ජීවත් වෙන්න ඕන. තේරුණාද?

මේ කිසිදෙයක් මසායා සාන්ට නොතේරුණාට, මසායා සාන් මං බරපතල යමක් කිවූ බව තේරුම්ගත් බව පෙනුණා.

නුඹ දූර්වලයි. මාත් දූර්වලයි. නුඹ බලවත්, මාත් බලවත්.

මම සන්ජෝ නගරයෙ සැරිසරන්නිය වුණා. උඩින් පිච්මල් යටින් තුනුජ් මල්. මැදින් උඩිනුත් ගින්දර යටිනුත් ගින්දර මැදින් සවුන්දර! ඒ ඉස්සර අහපු කතාවක්. නූපගෙ කතාවෙ උඩිනුත් මල්, යටිනුත් මල් ඒත් මැදින් මල් නොපිපෙන කාන්තාරයක්!

ලංකාවෙදි හිතට කරදරයක් වෙච්ච වෙලාවක බෝකොළ සිලිසිලියයි සුදුවැලිතලාවයි, පොල්තෙල් පහන් වැටයි, හඳුන්කූරු සුවඳයි හිතට සැනසීමක් දුන්නා. දෙයක් සිද්ධ වුණත් නොවුණත් හිතට දැනෙන සැනසීම හොඳටම ඇති. සන්ජෝ නගරයේ සැරිසරන්නිය නිගතාවෙ කුශම්මා පන්සලට ගියේ ඉබේම, ඉවකින් වගේ. මහා තොරණක් පහුකරගෙන පන්සලට ඇතුළු වුණා. තොරණෙ ගාම්භීරකම විසින් දෙපාවල සිට හිස මුදුනටම හැඟීමක් දැනීමක් එකතු කළා. පඩිපෙළ තැනිතලාවක පිහිටි පන්සලත් එහි වටාපිටාවත් අතර නතර වුණා. තැනිතලාව පසුකරගෙන ගිහින් තවත් පඩිපෙළක් නැගලා බුදුගෙයට පිවිසුණා. කාන්තාවන් කිහිපදෙනෙක් සහ වයසක පුරුෂයින් කිහිප දෙනෙක් බුදු පිළිමය ඉදිරිපිට. මම පන්සලට ගියේ පොද වැස්සක. බුද්ධ රූපය දෙපස දෙනමක් වැඩ ඉන්නවා. සැරියුත් මහරහතන් වහන්සේත්, මුගලන් මහරහතන් වහන්සේත් වෙන්න ඇති. බුදු හාමුදුරුවො කොයි රටේ පිළිම වහන්සේ කෙනෙක් ලෙස වැඩ වාසය කළත් දෙපස සිටිය යුත්තේ ඒ පිළිම [illegible] මහරහතන් වහන්සේ [illegible]

මට පුරුදු ගරු ගාම්භීර විදිහටයි. මම බිම දණගසා ඉඳගෙන දොහොත් මුදුන් තබාගෙන බුදුන් වැන්දා. අනේ බුදුහාමුදුරුවනේ මගේ හිතට සැනසීම සොයා ගෙනයි ආවෙ. මේ මඟුල කරපු කපුවා මේ දුක පැහැදිලි කළේ නෑ හරියට. මන් කොළ වලට අපව විකුණලා. ඔබවහන්සෙට මේ දුක තේරෙනවා.

බුදුන්වහන්සෙ අයිති දඹදිවට නෙවෙයි මුළු ලෝකයටමයි. මුළු මහත් මනුෂ්‍ය වර්ගයාටමයි. සියල්ලටම මූල හිත බව දේශනා කළේ ඔබ වහන්සෙ. මගේ මේ අප්‍රමාණ දුක්ඛ දෝමනස්සයන්ට මූල වන්නේත් හිතද අපේ බුදුහාමුදුරුවනේ? ලෝකයේ කොතැනක වෙනස් වෙනස් මුහුණුවරින් ඔබ වහන්සේගේ පිළිම නිර්මාණය කරලා තිබුණත් ඔබ වහන්සෙ මගේ හිතේ වැඩ වාසය කරන්නෙ ගමේ පන්සලේ ඔබ වහන්සේ වැඩ වාසය කළ අප්‍රමාණ වූ අනුපමේය වූ ශාන්ත මහා කාරුණික විලාසයෙන්මයි. ජීවිතය නොදෙන දෙයක් හොයා යන මගේ හිත පව් රැස්කරගන්නවා. දැගස් වාරයක් ස්වාමිපුරුෂයෙකුට වෛර කරනවා. මේ විවාහයට සම්මාදම් වූ සියලු දෙනාට වෛර කරනවා. තම දියණිය රැකබලා ගත නොහැකි වූ මවකට දොස් පවරනවා. බත්තරමුල්ලෙ ඡන්ද රැස්වීමක කතා කළ අගමැතිවරයෙකුට වෛර කරනවා. ඒ රැස්වීමෙදියි ජයනාථ හමුවුණේ. මගේ හිත මා දුකින් මුදවාගත යුතුයි. ජපන් ජාතික කාන්තාවන් පිං කැටේට කාසි කීපයක් දානවා. පොඩි පොඩි කාසි ඒ දැම්මෙ යෙන් දහයෙ කාසියක්, යෙන් දහයෙ කාසිය හරියට නඹ සතයක් වගේ. හිත එකඟ කර ගන්න මම බුද්ධ ප්‍රතිමාව දිහා නැවත බලාගෙන හිටියා. බුද්ධ ප්‍රතිමාවට උඩින් මොණරෙක්.

කළු ලෝගුවක් ඇඳගත්තු සාමාන්‍ය ජපන් ජාතිකයකුට වැඩිය උස මහත ඇති පුද්ගලයෙක් බුදු පිළිමය පසෙක තතමි පොළවෙ ඇතිරූ කොට්ටය මත හිඳගෙන යමක් කරමින් හිටියා. කකුල [illegible] වැටෙන්නට අර අදිමින් සිටිය නිසා පොළවට දෝත් [illegible]

'ඔහායෝ ගොසයිමස්' මම සුබ උදෑසනක් ප්‍රාර්ථනා කළේ ජපන් ජාතිකයා කතාවට අල්ලා ගැනීමටයි. කවුද දන්නෙ ඉංග්‍රීසි වචන කීපයක් හරි කතා කරනවා නම්?

'ඔහායො ගොසයිමස්' කියලා ජපන් ජාතිකයාත් ආචාර කළා. බුද්ධ පූජාව ඇතින්ම අල්ලගෙන යන්නමට නැගුණු සිනාවකින් ඔහු බලාගෙන හිටියා. හොඳ උසමහත තරුණයා.

'මම ලංකාවෙන්' මම ඉංග්‍රිසි බසින් කිව්වා. මට ඉංග්‍රීසි හොඳට බැරි වුණත් ජපන් ජාතිකයො අතර මාත් ඉංග්‍රිසි දන්න කෙනෙක්.

'සංචාරකයෙක්ද? ඉගෙන ගන්න ඇවිල්ලද?' වාසනාවට ඔහු ඉංග්‍රිසි බසින් කතා කරනවා.

'මං මේ පන්සලේ පොඩි හාමුදුරුවො. ලොකු හාමුදුරුවො ටෝකියෝ නුවරට ගිහින් පන්සලේ වැඩකට.' මගේ කුතුහලයට ඔහු පිළිතුරු දුන්නා.

'මම මේ බුද්ධ පූජාව පූජා කරලා එනකම් ඉන්න' කියලා උන්වහන්සෙ ඉල්ලීමක් කළා. මොන භාෂාවෙන් හරි කතා කරන්න කෙනෙක් ලැබීමේ සතුට මට දැනුණෙ ගොළුවෙලා කාලෙකට පස්සෙ කතා කරන්න ලැබුණු පළවැනි අවස්ථාවේ ලබන සතුටට සමාන හැඟීමක්.

තරුණ හාමුදුරුවො කළු ලෝගුව සකස් කරමින් නැවත මා සිටි තැනට පැමිතෙන විට මම හිටියෙ බුදු පිළිමය ඉදිරිපිට තියෙන රන්වන් පාට මල් ගස දිහා බලාගෙන. මලුයි, කොළයි පොහොට්ටුයි සියල්ලම රන්වන් පාටයි.

'ඔය මල් හදලා තියෙන්නෙ තඹවලින්. ඒ උඩින් තමයි රන් [illegible] තියෙන්නෙ

'මෙහෙ මොකද කරන්නෙ?' හාමුදුරුවො රන් කතාවට පිළිතුරක් නොදී ඇහුවා.

'මම විවාහ වෙලා ඉන්නෙ ජපන් ජාතිකයෙක් එක්ක'

'ශ්‍රී ලංකාවෙ හුගක් කාන්තාවන් මෙහෙ ගොවියන් එක්ක විවාහ වෙලා ඉන්නවා'

'මමත් එයින් එක්කෙනෙක්' මම සිනාසෙමින් කිව්වා.

පොඩි හාමුදුරුවො පන්සලේ ඉතිහාසයයි, පන්සල අවට පරිසරයයි ගැන විස්තර කතා කරන්න පටන් ගත්තා. කළු ලෝගුවක් ඇඳගෙන ඉන්න මේ කඩවසම් තරුණ පුරුෂයා ශ්‍රී ලංකාව ගැන කතා කළාට ශ්‍රී ලංකාව තියෙන්නෙ ලෝකෙ සිතියමේ කොතැනද කියලා දැනගෙන හිටියෙ නෑ. මං ලංකාව තියෙන තැන පැහැදිලි කරන කොට විශ්වයේ නොදන්නම දෙයක් ගැන අහන තරම් උනන්දුවකින් උන්වහන්සේ අහගෙන හිටියෙ.

'මේ තියෙන්නෙ එම්මා දයියෝ (යමරජ්ජුරුවන්ගෙ) ප්‍රතිමාව. එතන තියෙන්නෙ අපාය. මම වසා තිබුණු වීදුරු කවුළුව අතරින් එම්මාදයියෝ දිහා බැලුවා.

'වැරදි කරන අයට එම්මා දයියෝ දඬුවම් කරනවා. අර බලන්න' පන්සලට එපිටින් තියෙන ගල් කුළු දෙකක් පෙන්වමින් උන්වහන්සේ මා දිහා විපරමින් බැලුවා.

'ඒ ගල්කුළු දෙක අස්සෙන් අපායෙ තුළඟ එනවා. මං කියන්නෙ පුරා වෘත්ත. මේක අවුරුදු 1300 ක් පරණ පන්සලක්.'

'අපායෙ හුළඟ!'

'ඔව් එතනම තියෙන පුංචි බුදු පිළිම දෙක පේනවා නේද?

'සමාව? ... බව මං අහලා නැහැනෙ'

'සමාව දෙන්න හැකි තැන සමාව දෙන එක හොඳනේ තරුණ හාමුදුරුවො 'එහෙම නේද උපාසකම්මෙ' කියලා නැහුවට උපාසකම්මා 'එහෙමයි' කිව්වා.

'අපාය විතරද තියෙන්නෙ? දිව්‍ය ලෝකයක් නැද්ද?'

'තියෙනවා හොතොකෙසමා. සක් දෙවියො. යමු බලන්න'

සක් දෙවියන්ගෙ ප්‍රතිමාව බැලුවෙත් වීදුරු කවුළුවක් අතරින්.

'හොඳ අය එන්නෙ මෙතෙන්ට.'

'මෙහෙ මිනිස්සු හැමදාම පන්සල් එනවද?'

'මිනිස්සු පන්සල් එනවා ඒත් හැමදාම නෙවෙයි. උත්සව වෙලාවට හුග දෙනෙක් එනවා.'

මම කුගාමියාමා පන්සලෙන් පිට වුණේ සැනසිල්ලක් මෙහොතකට හරි ලැබුණා කියන හැඟීමෙන්. උන්වහන්සෙ මට තේ කෝප්පයකුත් පිළිගැන්නුවා. උන්වහන්සෙ බිම දණගසාගෙන, තේ කෝප්පය හදන සුරුවම දිහා මම බලාගෙන හිටියෙ මහ පුදුමෙකින්. පන්සලේ හාමුදුරුවන්ට දායකයා ගිලන්පස දෙනවා මිසක, දායකයන්ට හාමුදුරුවො ගිලන්පස දීමේ සිරිතක් දැකලා තිබුණෙ නැහැ. අවුරුදු එක්දහස් තුන්සියක් පරණ පන්සලේ පඩිපෙළවල ඇති ගල් රවුම් වුණාට මුලදී ඒවා තිබුණේ හතරැස් හැඩේට කියලා හාමුදුරුවො තේ හදමින් කිව්වා. ඉලන්දාරිකම පිරිච්චි ඇස්දෙකයි, කෝල හිනාවයි, තර ලෝගුවයි හාමුදුරුවොයි - තරුණයකුයි මැදි කරලා ඉරක් ඇන්ද... හතරැ... [illegible]

'ඒ අපි සංඝයා වහන්සේලාට ගරු කරන විදිහ'

'අරිගතෝ ගොසයිමස්'

'කෝ හාමුදුරුවනේ සුවපත් වේවා?'

කැලෑව, කැලෑවටම ගිහින්. පන්සල අවට තිබිච්ච කැලෑවෙ තිබුණෙ මහ උස මහත සූගී ගස්. පන්සල පහළට බැහැගෙන එනකොට ළමා ඇඳුම් පොඩි එල්ලලා තියෙන තැනක තරුණ කාන්තාවක් දණගහගෙන අඬනවා. තරුණ පුරුෂයෙක් මහත් දුකින් ඒ දෙස බලාගෙන ඉන්නවා. පිළිම ගණනාවක් තිබුණත් ඒවා බුදුපිළිම නෙවෙයි. පොඩි දරුවන්ගෙ ප්‍රතිමා. පන්සල පහළ කඩ මණ්ඩිය. වාහන පේලියක් නවත්තලා තිබුණත් ගැමිකමේ කිසිම අඩුවක් පෙනුණෙ නැහැ. මිනිස්සු, ගෑණු, ළමයි කඩ මණ්ඩියෙ මිටි බංකුවල ඉඳගෙන කනවා. හාමුදුරුවරු තරම සංයමයකින්. හැමෝම තමුන්ගෙ පාඩුවෙ. මම යෙන් දෙසීයක් දීලා ඔනිගිරි (බත් ගුලි) දෙකක් ගත්තා. කැලෑවයි, නගරයයි, ගමයි එක තැනක පිහිටලා තියෙන හැටි ඇස්පනා පිට දැක දැක හිටියා. නූපාගෙ ලැබීමක් තිබුණා. චන්දනක්කයි, සුජාතක්කයි ළමයි හදාගෙන කුටුම්බ පෝෂණය කරමින් ඉන්න එකයි, නූපා දේශ දේශාන්තරවල ඇවිදින එකයි තරාදියෙ දෙපැත්තට දාලා කිරන්න හැදුවට තරාදිය ගැන විශ්වාසයක් නැහැ. දේශ දේශාන්තර කිව්වට තීගතාවෙ. සන්ජෝ නගරය, නගරයක් වෙලා තියෙන්නෙ ළඟදී. ඉස්සර ගංවතුරෙන් කරවටක් ගිලිච්චි නගරයක්.

'කොහෙද ගියේ?'

'කොහෙද ගියා'

මසායා සාන් දේශනාව පටන් ගත්තා. ජපන් භාෂාව හරියට ඉගෙන ගත්තු දවසක නිසි පිළිතුරු දෙන්නම් කියන මුරණ්ඩු හැඟීම මගේ මූණෙ තියෙන්න ඇති. එළවළු වෙළෙන්දිගෙ භාෂා පාඩම

පුළුවන් මිනිහෙකුත් නෙවෙයි. සුමමාසෙන් (සමාවෙන්න) ගෝමෙන් නසායි (කනගාටුයි) වතාසිවා නමාමෙය වා නූපා (මගේ නම නූපා) වගේ භාෂාවෙන් මේ වගේ බරපතල කාරණා ගැන මේ ස්වාමිපුරුෂයා එක්ක කතා කරන්න බැහැ.

දවසක ඔය හැම දේකටම උත්තර දෙන්න පුළුවන් වෙයි. එතකල් දේශනාව පැවැත්තුවට මට මොකද? මම නීගතාව රස විඳිනවා, සන්ජෝ නගරය රස විඳිනවා. කන්දෙන් එහා පැත්තෙ මහ මුහුද. ඉස්කෝලෙදී ලෝක සිතියමේ ලකුණු කරපු ජපන් මුහුද. දැන් ඇහැටම දකිනවා. පන්තියෙ හිටපු අනික් ළමයින්ට ජපන් මුහුද හීනයක් විතරනෙ. හවස හතරට ඉර බැහැලා යනවා. අට නමය වෙනකල් ඉර පායනවා. මම හොයන්නෙ, විඳින්නෙ සොබාදහම. මම මගෙ මිනිහත් එක්ක දබර කරගන්න පුළුවන් දවස උදාවෙනකම් සොබාදහම විඳිනවා.

ඇස් අරින්නෙත් නැති මිනිහාට ඇස් අරින මිනිහාට වඩා ජේනවා. මසායා සාන් ඇස් වහගෙන නේද ඉන්නෙ ? එහෙනම් මේ හැමදේම හොඳට ජේනවා, වැටහෙනවා නේද ? වයස්ගත නුඹ මට දෛවයෙන් නියම වෙච්ච ස්වාමිපුරුෂයා බව ඇත්ත. දෛවයෙන් නියම වෙච්ච ස්වාමිපුරුෂයට අවනත වෙලා ඉන්න ඕන කියලා හිතනවා නම් එතැනයි වැරදීම. සෝරා සාන් එහෙම අවනත වෙලා ඉන්නවා. ඒත් ඒ අවනත වීම තුළ සාපකිරීම් කොපමණ තියෙනවද ? එහෙම සාප කර ගැනීමකට නුඹ කැමතිද ?

එහෙම කිව්වෙ, බියගුළු කමක් ජේනවද මගේ චිත්‍රවල නූපා සාන් ? සාප කරන ගැහැනියකගේ කෝපයෙන් රතු වෙච්ච හිත ජේනවද මගේ චිත්‍රවල ? මම හිතුවා විවාහය කියන්නේ ඇලීමක් බැඳීමක් කියලා. විවාහය මිනිහෙකුට ගැනියෙක්ව, ගැනියෙක්ට මිනිහෙක්ව එපා කරවන නෛතික බැඳීමක් ද ? නෑ එහෙම නෑ ... [illegible]

මසායා සාන් මහ අමුතු මිනිහෙක් නේද ? සුමිකාවා පවුලෙ ඉතිහාසය මම හෙමින් කියන්නම්. මට විදේශිකයෙකුගේ චිත්‍රයක් අඳින්න ආසාවක් තියෙනවා. ඒත් ඔයාගෙ නොවෙයි. ජපානයට පැමිණීමෙන් ඇති වුණේ මොනවද නැතිවුණේ මොනවද කියලා මම අහන්නෙ නැහැ. ඔය ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු නැහැ නූපා සාන්.

මාත් ඉන්නෙ මේ සන්ජෝ නගරයෙම තමයි. පටු පාරක.

ඇයි ඇස් වහගෙන ඉන්නෙ කියලද අහන්නේ ? මේ බාග තොප්පිය මාව ලෝකෙන් වෙන් කරලා දෙනවා. යමූ අර කුඹුර දිහාටම. ජේනවා නේද ගොයමෙ ලස්සන ? මසායා සාන් වගේ නෙවෙයි හරාදා සාන්. රස්සාවත් එක්කම ගොවිතැනක් කරනවා. හරාදා සාන් නියම ජපන් ජාතික ස්වාමිපුරුෂයගෙන් ටිකක් එහාට ගිය නැනැත්තෙක්.

'හරාදා සාන් ඔයාගෙ ස්වාමිපුරුෂයද ? '

'ඔව් එහෙම තමයි කියන්නෙ '

නූපා සාන්, ඔයාගේ ස්වාමිපුරුෂයා මහ බියකින් ජීවත් වෙනවා ඇති. මෙච්චර හැඩරුව තියෙන බිරිඳක් ඉන්න මහළු ස්වාමිපුරුෂයෙක් කොහොමත් බයකින් තමයි ජීවත් වෙන්නෙ. නෑ මම බොරු කියනවා නොවෙයි. මසායා සාන් ගැන නූපා සාන් මොනවද හිතන්නෙ? පිළිතුරු දුන්නත් නොදුන්නත් වෙනසක් නැහැ. ස්වාමිපුරුෂයා කියන්නෙ කොහොමටත් පිට මිනිහෙක්. මම අහනවා ඔයාගෙන් ජපානයට පැමිණීමෙන් ඇතිවුණේ මොනවද නැතිවුණේ මොනවද කියලා. ඔයාගෙ උත්තරය මොකක්ද ? නැතිවෙච්ච දෙයක් මිස ඇති වෙච්ච දෙයක් නෑ කියන එකද ? ප්‍රශ්නෙකට එක නිශ්චිත පිළිතුරක් දෙන්න පුළුවන් නම් ඒක ගණිත ප්‍රශ්න... [illegible] ම මේ අහන්නේ ගණිත ප්‍රශ්නයක් නෙවෙයි නූපා

'ඇයි විජාතිකයෙක් කියන්නේ ? මං විවාහයෙන් ජපන් ජාතිකයෙක් නේ!'

නැහැ ඔයාට විවාහයෙන් ජපන් ජාතිකයෙක් වෙන්න බැහැ. එහෙම වෙන්න පුළුවන් නම් ඔයා මේ සන්ජෝ නගරයෙ සැරිසරමින් ඔයාව අමතක කරන්න හදන්නේ නැහැ.

'මම මාව අමතක කරන්නෙ නැහැ'

'අර බලන්න කුඹුරු යාය. ඔයා සකෙ බොනවද ?'

'නැහැ'

'රට සකෙ ටිකක් බොන්න. සකෙ හදන්නෙ මේ කුඹුරුවලින් ගන්න හාල්වලින්. ඇඟයි, හිතයි දෙකම උණුසුම් කරනවා.'

නූපා සාන්, මේ සන්ජෝ නගරයේ ඔනෑ සකුරා ගහක් දන්නවා ඇති මගේ ස්වාමිපුරුෂයා ගැන. සකුරා මල් පිපෙන කාලෙට එයා හරියට උණුසුම් වෙනවා. ඇඟිලි සලකුණු වගේම, හැම ගෑනියෙකුගෙම ශරීරය තවත් ගෑනියෙකුගෙ ශරීරයට වඩා වෙනස් බව හරාදා සාන් කියනවා. මූණ, තොල්, කට, නාබිය, ගෙල, ඇස, නැහැය, දෙපා යනාදී සියල්ලම වෙනස් ආකාරයකට පිහිටා තිබෙන බව හරාදා සාන්, මගේ ස්වාමිපුරුෂයා කියනවා. නෑ පර්යේෂණයක් කරලා නෑ. ඇතීමෙන් අවබෝධයෙන්, පළ පුරුද්දෙන් කියන දෙයක්.

'තරහ යන්නෙ නැද්ද?'

මහ පරයෙක්නෙ.

'නැහැ නූපා සාන්. පිරිමියෙක් වෙන්න දඟලන මිනිහෙකුට මං පිරිමියෙක් [illegible] හොඳම මිත්‍රයා [illegible]

ඇත්ත - අනුන්ගේ ගෑනුන් සමග යහන් ගතවීම වගකීමෙන් තොරයි. ආරක්ෂා කිරීමේ හෝ ප්‍රවේසම් කිරීමේ අවශ්‍යතාවක් පැන නගින්නෙ නැහැ. ලෙඩට දුකට බැලීමේ හෝ නඩත්තු කිරීමේ අවශ්‍යතාවක් නැහැ නූපා. ලෙඩකින් මැරුණත් 'අ' කියලා අමතක කරලා දාන්න පුළුවන්. අනුන් සතු දේ පරිහරණය කිරීම වඩා පහසුයි කියලා හරාදා සාන් උදේට යාළුවන්ට කියනවා ඇහෙනවා.

'පිට ගෑනු පස්සෙ යන්නෙ මොන අඩුපාඩුවකට ද?' විඳවගන්න බැරි කටු 'හිතේ ඇමිණෙන කොට, මං හරාදා සාන්ගෙන් ඇහුවා. ඒ හුඟක් ඉස්සර.

'මදි පාඩුවකට නෙවෙයි. ලෝකය විවිධයි, විචිත්‍රයි. අන්න ඒක අත් විඳීමේ ආසාවට' හරාදා සාන් පිළිතුරු දුන්නෙ එහෙමයි. කට ගලකින් තලන්න ශක්තියක් තිබුණා නම්!

'මගේ හිතට දැනෙන දුක දැනෙන්නෙත් නැද්ද ? ලැජ්ජාව තේරුම් ගන්න බැරිද ? '

'ඔයා පලවැනියනෙ. පපුව ඉස්සරහට දාගෙන ආඩම්බරෙන් ඉන්න'

ගෙදර ඉන්න ස්ත්‍රියද, ගෙදරින් පිට ඉන්න ස්ත්‍රියද කියන එක නොවෙයි ප්‍රශ්නය. වෙනස්වෙන ඇඟිලි සලකුණු වගේ ගෑනුන්ගේ වෙනස උරගා බලන්න යාමෙන් ගේ ඇතුළෙ අපායක් නිර්මාණය වීමයි ප්‍රශ්නය. ගෙදරින් පිට ඉන්න ගෑනුන්ව අපහරණයට ලක්වීම ගැන හිතට අමාරුයි. කසාද ගෑනිට වගේම කසාදෙට අයිති නැති ගෑනියෙකුටත් හිතක් පපුවක් තියෙන බව මම දන්නවා. කසාදෙ නෙවෙයි ගෑනුකම තීරණය කරන්නෙ.

හරාදා මහත්මිය පියාඹන්න උත්සාහ කළා. පියාඹලා ආපහු

නොහෙට්ටුවත් අඩුයි. නූපා සාන් බලන්න මං මේ වලාකුළු අතරෙ ඉන්නෙ කොහොමද කියලා. මෙහෙම ඉන්න පුරුදු වුණහම දුකක් නෑ.

'මොකද දුකක් නැත්තෙ ?

'හිතට පියාඹන්න දෙන්න. ගව් ගණන්. හති වැටෙන කල්'

'මගේ හිත පියාඹනවා. ඒකට අමුතුවෙන් හිතන්න දෙයක් නෑ.

මම ඒක දන්නවා. මේ සන්ජෝ නගරයෙ ඉන්න ජපන් ගැනුන්ගේ හිත්වලට තටු නැහැ. ඒ ගොල්ලො ඉන්නෙ රාමු කරපු පින්තූර ඇතුළෙ. මේ නීගතාවෙ, ෂිනානො ගඟ හරවන්න, කන් කපපු පස් සැතපුම් ගණන් ඇදපු ගැනි හැම ගැනියෙක් තුළම ඉන්නවා. 'හ්ම්' නොකියා පස් ඇදපු ගැනු. වීදුරු බෝල ඇස් තියෙන බොනික්කො වගේ. පිරිමි බෝනික්කො ඇකලා තියෙනවද නූපා සාන් ? කොහෙ දකින්නද? බෝනික්කො නම් ගැනු.

හරාදා සාන් රෑ මැදියමේ යහන් ගතවෙන්න උත්සාහ කරන දවස් තියෙනවා තමයි. ගෙදරට පය ගහපු මොහොතෙ ඉඳලා සකෙ බෝතල් හිස් කරන, තමන්ගෙ පහස ලබන ස්ත්‍රීන්ගේ අඟපසඟ වර්ණනා කරන මිනිහෙක් හිතටවත්, ගතටවත් ළං කරගන්න අමාරුයි නූපා සාන්. 'අතන මෙතන උලලා උලලා මෙතනටත් එනවා.' කියනවා වෙනුවට 'ඔයා මහන්සි වෙලානෙ ඉන්නෙ. බීලත් වැඩියිනෙ. දැන් නිදාගන්න' කියලා මගේ ස්වාමිපුරුෂයව නළවන්න සිද්ද වීම අපරාධයට ගොදුරු වූ තැනැත්තා අපරාධකාරයගෙන් සමාව ඉල්ලනවා වගේ නිවට නොගැලපෙන වැඩක්.

'ගෑණු කියන්නෙ නත්තල් කේක් එකක් වගේ. විසිපහට පස්සෙ වැඩක් නෑ' කියලා. හරාදා සාන් අනික් පැත්ත හැරෙනවා නූපා සාන්. ජපානයේ මිනිස්සු හරි ලැජ්ජා කාරයෝ මම මෙ[illegible]

හඳන්නෙ ගැනු වගේ වුනාට ගැනු කියන්නෙ බෝනික්කො නෙවෙයිනේ.

'අපි ටිකක් ඉඳගෙන කතා කරමුද ? ඉස්සර වගේ නෙවෙයි මට ඇවිදින කොට මහන්සියක් දැනෙනවා.'

'මසායා සාන්ට මං එන්න කලින් සමාගමයක් එහෙම තිබුණද?'

මම ඒක දන්නෙ නෑ. ඔය වයසක මනුස්සයගෙ අතීතය හොයන්න එපා.

'මං චිත්‍ර අඳින්න කැලේ යනකොට නූපා සාන් මාත් එක්ක එන්න'

'කසාදෙ කොහොම වුණත් වීසා එක රැක ගන්න ඕන ෂෝරා සාන්.' මං උත්තර දුන්නෙ මගේ හිතේ තියෙන ප්‍රශ්නෙකට.

'එතකොට ඔයාගෙයි, මසායා සාන්ගෙයි බන්ධනය වීසා එක විතරද?'

'ස්වාමිපුරුෂයා ඊට වැඩිය සම්බන්ධයක් පවත්තන්නෙ නැහැනෙ. ඒක හින්දා මට නම් මේ කසාදෙ වීසා එකක් විතරයි'

මේ තරුණ කාන්තාවට මම කියන්නෙ මොනවාද ? නූපා සාන් වයසක මිනිහෙකුගෙන් ඔය තරම් උණුසුම් දෙවල් ඉල්ලන්න එපා. ඒ බලාපොරොත්තු අත අරින්න තිබුණෙ කසාද බඳින්න තීරණය කරපු වෙලාවෙමයි. ඒක තේරුම් ගන්න බැරි දේකුත් නෙවෙයිනෙ.

'අරිගතෝ ගොසයිමස්'

මුහුදක් තරණය කරලා ආවෙ සැප විඳින්න. ජපානය සුර පුර කියලා නේද හිතුවෙ ? ජපානයෙ සිතු පැතු සම්පත් තියෙනවා කියලා නේද හිතුවෙ ? කුමාරිකාවක් වගේ ඉඳගෙන සම්පත් භුක්ති විඳින්න නේද හිතුවෙ ? එහෙම සම්පත් මෙහෙ නෑ. නූපා සා මිනිස්සු මහන්සි වෙලා වැඩ කරන්න ඕන. අපි දියුණු වෙලා ඉවර නෑ. තව දුරක් යන්න තියෙනවා. අපිට සම්පත් කියලා තියෙන්නෙ මිනිස් සම්පත්. අපි මැරීගෙන වැඩ කරන්නෙ ඒකයි. ඔයා හිතන්නෙ ඔයාට හැමදේම නැතිවුණා කියලා නේද ? මිනිහෙකුයි ගෑනියෙකුයි කසාද බැඳපු දවසට එච්චර කාලයක් තමන් සතුව තිබ්බච වටිනා දේ නැති වෙනවා. ඒ තමයි නිදහස.

5

'සෝරා සාන්ව ආශ්‍රය කරන්න එපා'

'ඇයි ?'

'එපා'

'ඔන්නෙ හැමදේටම එපා කියන්න විතරයි'

මට කියන්න ඕන කරන හැමදේම මම තව හාරපස් මාසෙකින් කියන්නම්. ඔහේට ඒ ටික සහසුද්දෙන් කියන්න තමයි මං භාෂාව ඉගෙන ගන්නෙ. මම යනවා ටෝකියෝ නගරයට. රෝසා කිව්වා වගේ ටෝකියෝ නගරයට ගිහින් හොඳ කෙනෙක් සොයා ගන්නවා. භාෂාව හරියට ඉගෙන ගත්තට පස්සෙ මම යන්නම්. මං ජපානයට ආවෙ මොකද කියලා ඔහේ දන්නවද? ඔහේව කසාද බැන්දේ මොකද කියලා දන්නවද? ජපන් ස්වාමිපුරුෂයෙකුගෙ උදව්වෙන් ලංකාවෙ දුක්විඳින පවුලක් ගොඩගන්න. මගේ සහෝදරයව යහපත් මාර්ගයකට ගන්න. මට පුළුවන් හැටියකට අර වයසක දෙන්නට සැපක් දෙන්න.

'කසාදෙ රස්සාවක් කියලද හිතුවෙ ?'

'මේ කසාදෙ ගිනි පොලී ණයක්'

'... ඔහේට කරන්න තියෙන්නෙ මේ ගේ දොර

අඩු ... ගන්නවට, ...
අඩුරු වැසිකිළිය හෝදනවට, ඔහේ පරම්පරාවෙන් ඉතිරිකරගෙන
පෙට්ටගමුයි, ලට්ටලොට්ටයි, බුදු මැදුරයි පිළිවෙළකට
තියාගන්නවට මට පඩියක් නඩියක් ගෙවීම සුදුසු නැද්ද ?

කලිසම් ඇන්දට කකුල්වල කොරපොතු. ඇත් ...
කොරහයි රංගන ගෙනාපු කොරහයි කොරොස් දෙකක් ...
මතකද අම්මා අපිට පාන්ගෙඩිය මන්තෙන් හතරට කපල
දුන්නා. දැන් මාජරීන් කාලක් හංගලා තියාගෙන, සුරුවමට ...
කපලා මේසෙටත් අරිනවා. විගඩම් ! වැඩක් කරන්නෙ නෑ. ...
කකුල් වගේ තමයි තියපොතු කුණු පාටයි. විදුරුමස් සුදු පාටයි
හිනාවෙනකොට මට නම් පේන්නෙ දත්වල සුද නොවෙයි
විදුරුමහේ සුද. කලිසම් අඳින්නෙ හැට්ට කොටක් එක්ක. උන්දැ...
හැට්ට කැලිවලටද මන්දා ලනිලුත් නිතර එහේ යන්න කැමැත්ත
තියෙන බව පේනවා. මම මගේ පවුල රැකගන්න ඕන නැ...
සමනලට කොම්පියුටරයක් අරන් ඉල්ලනවා නංගි. කොහොමද
අරන් දෙන්නෙ ? ලනිල්ගේ පඩිය විතරනෙ. තාත්තා කොහොම
කරනවද මන්දා. මල්ලිගේ පඩියෙන් බාගයක් යන්නෙ මගේ ...
අරයගෙ කලිසන්වලටයි, හැට්ට කැලිවලටයි. නංගි, ඔය ජපානෙ
එක කාලෙකට කොම්පියුටර්, ෆ්‍රිජ් වගේ ඒවා පාරට විසිකරනවා
නේද ?

බලහත්කාරෙන් යට ඔබාගෙන ඉන්න චේතනාවක් ...
මතුවුණා. මතුවෙන, මතුවෙන පාරට දැතින්ම දිය යට ඔබා ගෙන
ඉන්න බෝලය. මහ දෙන්නා ජපානයට දීග ගිය දුව ගැන ආඩම්බර
කතා කියනවා ඇති. රංගනගෙ අලුත ගෙනා මනමාලි වාසනා
රංගන, වාසනාත් එක්ක ජපානෙට එන කල්පනාවක ඉන්න බව...
ලනිල් වාහන බිස්නස් එකක් කිරීමේ ආසාවෙන් ඉන්න බව...
ලියලා යටින් ඉරකුත් ඇඳලා තිබුණා. කාටත් පොදු ආසාව ඇ...
ජපානයට පැමිණීම.

මසායා සාන්, පුළුවන්ද මට පඩියක් දෙන්න. මාසෙකට ...
දහදාහක් ...
මන් එක ...

අපේ බත්තරමුල්ලෙ ගෙදර කුස්සියෙ දොර ළඟින්
දුවගෙන ඇවිත් කෙළින්ම ඉස්සරහ දොරින් එළියට බැහැලා
දුවගෙන යනකොට දොරක් ඇරෙනවා. ඒ මාළිගාවකට. මං ඒ
දවස්වල ඒ මාලිගාවට දුවනවා. අතේ කරවල ගඳ ගවුමෙ පිහ දම
දමා දුවලා යනවා මාළිගාවට. මාළිගාවෙ කාමරයක් කාමරයක්
ගානෙ ඇවිදිනවා. කුමාරයෙක් ඉන්නවද ගෙම්බෙක් වෙලා ඉන්න.
කොයි කාමරේද ඒ ගෙම්බා ඉන්නෙ? මං තුරුල් කර ගත්තොත්
ඒ ගෙම්බා කුමාරයෙක් වෙයිද? අම්මටයි තාත්තටයි හොරෙන්
ඒ මාළිගාවට කොච්චරවත් දිව්වා. කුමාරයෙක්වත්, ගෙම්බෙක්වත්
හිටියේ නැහැ. තවමත් ආසයි ඒ මාළිගාවට දුවන්න. ඒ මාළිගාවෙ
කොහේහරි හැංගිලා ඉන්න රාස්සයෙකුට වුණත් කුමාරයෙක්
වෙන්න පුළුවන්.

පෙම්බරා. වෙනස් නොවෙන එකම දේ මරණය කියලා,
කිව්වට මගේ හිතේ ඇති වෙනස් නොවන එකම දේ ආදරය.
පේනවද මගේ හිත නටන හැටි ... ... ඉඳගන්න. මගේ
උකුල හිස තියා ගන්න. ගීතයෙ වචන නොතේරුණත් සංගීතය
තේරුම කියලා දෙනවා. ඉඳහිටවත් ඇවිත් යන්න එන්න. එතකොට
මේ සන්ජෝ නගරයෙ පිපෙන සකුරා මල් වියන යටින් විතරක්
නෙවෙයි, යත්තම් බිම් කරුවල වැටෙන වෙලාවට අත් අල්ලගෙන
දියවන්නා ඔය ළඟින් පාර්ලිමේන්තුව පැත්තට තියෙන නාගස්
පෙළ යටින් ඇවිදගෙන යන්නත් පුළුවනි. නෑ නෑ ව්‍යායාම
කරන්න නොවෙයි. මට ආදරේද කියලා අහන්න. හඳ පායාගෙන
එන්නෙ කොයි ඉසව්වෙ ඉඳලද කියලා අහන්න. ඒ නාගස්
සෙවනෙ දවසක ඇවිදිමු අපි දෙන්නගෙ දරුවත් කුස දරගෙන.
එතකොට ඇවිදින්නෙ හෙමින් හෙමින්. මම මඟුල්දාට පහුවදා
මැරෙන පෙම්වතියක් නොවෙයි පෙම්බරා. ජීවත්ව ඉන්න තුරා
පෙම්වතිය. ප්‍රේමය කියන්නෙ සමනළයෙක් වගේ සැහැල්ලුවෙන්
පියාඹන ගමනකට කියන නම. එන්න අපි පියාඹමු. අපි ඇවිදිමු.
අපි නටමු. අපි අඬමු. පෙම්බරා, මං වෙනුවෙන් අඬනවද ?

ටෝකියෝ කියන්නෙ ජපානෙ අගනුවරනෙ. සන්ජෝ දුම්රිය පොළෙන් විදුලිය දුම්රියට නැග්ගම පැය දෙකක් යන්න කලින් ටෝකියෝ නගරයට යන්න පුළුවනි. මට ප්‍රවේශ පත්‍රය අරන් දෙන්න.

'සෝරා සාන්, ඉතින් ඔහොම වෙව්ලන්න එපා.

'ටෝකියෝ කියන්නෙ විශාල නගරයක්'

'මම ටෝකියෝ නගරයට ගිහින් ගෙයිෂා කෙනෙක් වෙනවා'

නූපා, ගෙයිෂා කෙනෙක් වෙන්න බැහැ එක රැයකින්. ගෙයිෂා කියන්නෙ පුරුදු පුහුණු වෙච්ච කලාකාරියකට. එයා ලිංගික කටයුතුවල යෙදෙන්නෙ නැහැ නූපා. මම මේ කියන්නෙ අපේ රටේ වෙසඟනුන් නෑ කියලා නෙවෙයි. ගෙයිෂා කෙනෙක් වෙන්න පුංචි කාලෙ ඉඳලා ඉගෙන ගන්න ඕන. ඒක කලාවක්. අපේ සංස්කෘතිය වැඩියට තේරුම් ගන්න එපා. ඔයාට පුළුවන්ද බටනලාව පිඹින්න. සමිසෙන් වාදනය? බෙර වාදනය? ඔයා දන්නවද ජපානයෙ පාරම්පරික ගීත ගායනා කරන්න? ජපානයෙ තේ පැන් උත්සවය මුල ඉඳලා අගට පවත්වන්න? නර්තනය? ගෙයිෂා කියන්නෙ වෙසඟනක් නෙවෙයි නූපා සාන්.

'එහෙනම් මට ගෙයිෂා කෙනෙක් වෙලා වැඩක් නෑ'

'ඔයාට වෙසඟනක් වෙලා වැඩකුත් නෑ'

ඇයි නැත්තෙ? මන් කොළ කීපයක් හරි ලැබෙයි. වෙසඟනක් වෙන්න ගන්න තීරණය එච්චර ලේසියි කියලා හිතන්න එපා. ඒක දුවගෙන දුවගෙන ගිහින් කන්දකින් පහළට පනිනවා වගේ වැඩක්. ජයනාථ මට ඔහේව කවදාවත් අමතක වෙන්නෙ නැහැ. මාව ටෝකියෝ නගරයට යවන්නෙ ඔහේ.

රහස් රකින්න පුළුවන්, හිත නළවන්න පුළුවන්, සංස්කෘතිය රකින්න පුළුවන් ගැනියෙකුට. ගෙයිෂා කෙනෙකුගෙ මූණෙ පින්තාරුව පවා කෙරෙන්නෙ කලාවකට.

මම ජපානයෙ කලාව ගැන ඉගෙන ගන්න ආවෙ නැහැ සෝරා සාන්. මගේ ස්ත්‍රී භාවයට දණ නමස්කාර කරන්න කෙනෙකුත් නැහැ. කොහොමත් ස්ත්‍රී භාවය කියන්නෙ නිග්‍රහයට මුලනෙ. දණ නමස්කාරය ලැබෙන්නෙ පුරුෂ භාවයටනෙ. ඒක අපි දෙන්නම දන්නවනෙ.

'මට ලේසියෙන්ම හොයන්න පුළුවන් රස්සාව ටෝකියෝවලදී හම්බ වෙයි කියලා හිතනවා. මට ටිකට් එක විතරක් අරන් දෙන්න'

සෝරා සාන්ගෙ පපුව වේගයෙන් ඉහළ පහළ යනවා. සෝරා සාන් සමාව ඉල්ල ඉල්ල කඳුළු පිහ දමනවා. ඔය කඳුළු මගෙ ඇස්වල නෑ. මට මං ගැන අඬන්න තියෙන කාරණාවලට මං අඬන්නෙ නෑ.

පූස් පැටියා වගේ ඇවිදලා ඇවිදලා හවස හය වෙන කොට ගෙදර ඇවිත් හිටියොත් මදෑ කියන හැඟීමෙන් මගෙ ස්වාමිපුරුෂයා නිර්වින්දනය වෙලා. එහෙම නිර්වින්දනය වීම දෙන්නගෙම යහපතට හේතු වෙනවා කියලා මසායා සාන් හිතන්න ඇති. ගෙදර තියෙන ශීතකරණයෙ පිරිලා තියෙන කෑම කකා පූස්පැටියා හීලෑ වෙලා ඉඳියි කියලා මසායා සාන් හිතුවට මගේ හිතවත් බඩවත් ඒ කෑමබීමවලින් පිරෙන්නෙ නැහැ. තාරක ඇතුගලගෙ ගෙදර පූස් පැටව් විසි දෙනෙක් විතර හිටියා. සෝරා සාන් එයත් චිත්‍ර ශිල්පියෙක්. කළු හීන්දෑරි මනුස්සයා. හිනාවෙන කොට දත් ටික සුදට සුදේ බැබළෙනවා. කොළඹ නගරයේ හිටවලා ඉන්න ප්‍රතිමාවක හිසට කාක් බෙටි වැටිලා වගේ තාරක ඇතුගලගෙ කොණ්ඩෙ තැනින් තැන සුදු වෙලා.

මිත්තිවල සර් ඇඳපු චිත්‍ර එල්ලලා. වැඩිහරියක් තාරි රූප … ඇත. සදෙව් ලෝක චාතුර්මහාරාජිකයෙ දෙවියෙක් … පිළිවෙළගෙන පුළුල් හිර රූපවාහිනියක් තරමින් … දිගා හොරෙන් බල බලා තැමෙම හිනා වෙනවා. තාරක … උණ්ඩෙයන් පසළට කලිසමක් ඇඳලා පොඩි කොල්ලො … කැති කමයක් ඇඳගෙන සාලෙ මැද්දෙන් යනකොට … ලුලාංවි … පඳුපස දුවනවා වගේ පුරතල් … තාගින් මතු පසුපසින් යනවා. තාරක සර් තනියම … ඇති දිගා බලනවා.

'මං මේ කට්ටියට සාත්ත දීලා එන්නම්'

'මිට්ටි, ළමයිනුත් ලංකාවේ නැ' කියලා පුතා … හිතාවුණා. 'පවි පුතෙක් සර්ද?' කුස්සියෙන් බයක් … පේනවා. පුස්සැවවි කුස්සියෙ මෙහෙට තියින්නෙ කෙඩ්ඩ …

'පුතා …'

පිටින් ඇස … චාරිකාවත් තමයි. අර්ථයයි … කරනවා. මං නැගිටලා ගිහින් කුස්සියේ දොරකඩ හිටගත්තා.

'පුතන්ටයි මටයි උයාගන්න ඕන. පුරවන්ද මට … වීතක් කාලා දෙන්න තරන නැතුව.'

මෙහෙට සවිකරලා තියෙන හිරමණෙන් පොල්ගෙඩියක් … එන වැඩක්ද? සර් පොල්ගෙඩිය බිඳලා දුන්නා. බර බරස් … බරාස්. සර් සාලයා පුද්ද කරනවා. පුතෙ ඉවරයක් … සාව ගාන සද්දෙයි මම පොල් ගාන සද්දෙයි පුංචි කුස්සිය … මහ ගෙරෙවක් ඇති කළා. මාළු බිළි කඩ කවා හිටියට … ඇස්දෙක පිඹුණෙ මගෙ ඇඟපත දිහාවෙ කියලා පොල්දල් … දෙකක් ගානකොට මට දැනුණා. අපි බිව්වෙත් මව් කිරිනෙ …

… සර් 'මට හිතෙනවා පුතාව අඳින්න' කියලා කිව්වෙ. පුස් … සර් … දෑ … සුපුරුදු චිත්‍ර සිත්තිකියක් කරන බවට … පුණ්‍ය. චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වන්න කලාගාරය … වීලනට මාව තබන … කරගෙන සර් මගේ මූණ ඉම්මෙ … තියෙන … ලෙව තාතවා වගේ.

ඒ අතරෙට්ට. තාරක ඇතුලාල මාව චිත්‍ර … ඉන්ට … උඩිස්ට දැම්මා. … ළමයින් … දොරෙන … පුරතල් කරන්න වගේ … ඉම්මා. … පුතාගෙ … මාමා මූණ ඉඹින්නෙ පුරතල් … අම්මා … ඒ ඉඹිල්ල වෙනස් කියලා …

ඇහැරුද සර් … ඇඟ ඉවත් කිරීමේ … මලතකොට මමත් වැරදිච්ච ඇඟයක්. … ඇඟ දෙක නිලධාරියා වගේ එකම විදිහෙ … කැදි පොයනවා. ඇතුට වගෙම මගේ ඇඟිලි තුඩුවලටත් ඇඟ … වැරදිද කියලා හරියටම … රස්සාව … සෝරා සාන්. මාසෙකට … විසිදාහත් අම්මලට … තුවත් තමයි මගේ ආත්ම ශක්තිය ඒකට … මිලක් … මට රස්සාව දෙනවා කිව්වම සෝරා සාන් … දණහිස්වලට අත්දෙක තියාගෙන … තුති කළා.

'ඇයි සෝරා සාන් පුගාතෝ සාන්ට එර තරම් … ඇතුවා. සෝරා සාන් වාහනය නවත්තලා දොර … වැස්සා. මේ මිනිස්සයා ගැන …

පිරිමින්ට වෛර කරන ගැහැණියකුගේ කාරුණාවට ලක්වෙන එ[illegible] ඒ තරම් හොඳ නිමිත්තකුත් නොවෙයි කියලා හිත කියනවා. පිරිමි පාටක් නැති වුණාට පිරිමියෙකුගෙ ගති ලක්ෂණ නැත්තෙම නැහැ. මගේ හිත මහ විකාර හිතක්!

'බහින්න' කියලා සෝරා සාන් දොර ඇරියා. සෝරා සාන් මගේට බැහැ. මාව අප යෝජනාය කරන්න තේරුණාද? යන්ත් මුණ ගැහිලා වගේ දෙන්නට දෙන්නා මූණු දිහා බලාගෙන හිටියා. මගේ හිතේ තියෙන දේ තුමා දන්නෙ නෑ - තුමේ හිතේ තියෙන දේ මම දන්නෙ නෑ.

'මූණෙ කවදී හිනාවක් නැතුව. මට්ට පහත් කරලා කතා කරන්නෙ නැතුව ජපානෙ ඉන්න අමාරු වෙයි'

'මට කවදාවත් හිනාවෙන මූණෙත් නෑ සෝරා සාන්'

'ඒක ඇති කරගන්න වෙයි'

'මට ඒවගේ [illegible] බැහැ.'

'ඒක හරු කිරීමක් මිසක බොරුද කැවිල්ලත් නෙවෙයි'

ඒවින් අනුසාදය පළ කළත්. මම හිත යටින් ඒ දෙයක් පිළිගත්තා. හොඳයි සෝරා සාන් බොරුද නැමීමයි. කටපුරා හිනාවීමයි. ස්තුති කිරීමයි පුරුද්දක් හැටියට කරන්නම්. මගේ ජෙට්ටිග්‍රිත තෝටිකිකාගාර හිමියා මට කන්න අඳින්න දෙනවා ස්තුතියි. ජීවිතේ නොසිටිමින්. මේ මහපොළොව පනෙකල් විදලා දෙන නිසාදයි මෙච්චර හොඳ ආහාර වේලක් මට ලැබෙන්නෙ කියලා තුමේ පිහාන දිහා බලාගෙන වඳින. ස්තුති කරන මිසායා සාන් මහට ස්තුතියි. බොරුද නමාගෙන ස්තුතියි [illegible] ස්තුතියි ස්තුතියි. බහින්න, වඩින්න, දොස් කියන්න, මහ දෙයක් - ඒ හැමදේටම ස්තුතියි.

වරදින වැරදෙන හැමදේටම ස්තුතියි.

දුන්නට වගේම නුදුන්නාටත් ස්තුතියි.

ලැබෙන දේ ලොකුයි.

නොලැබෙන දේ කුඩායි.

මට දුවෙකුයි පුතෙකුයි දුන්නට හරාදා සාන්ට ස්තුතියි.

ඒ වගේ ලොකු දේවල් ජීවිතේට ලැබුණාම, නොලැබුණු පුංචි දේවල් ගැන හිතන්න එපා නුපා සාන්. මට හම්බවෙච්ච ලොකු තෑග්ග මගේ කුස තුළ වැඩිලා, පෝෂණය වෙලා මටම මද්ද වෙලා ඉඳලා, මහ දුකක් විඳගෙන අඩාගෙන එළියට ආපු මගේ දරුවන් දෙන්නා. ඒ බීජය පැළ කළේ හරාදා සාන්. ස්තුතියි ස්තුතියි.

සෝරා සාන් [illegible] මරියකුමියට වගේ මිසක වෙන විදිහකට මට ඒ වගේ ලොකු තෑග්ගක් ලැබෙන්න විදිහක් නෑ. සෝරා සාන් මගේ කියනවා වගේ සම්පූර්ණ සාත්තුවරියක් වෙන්න ගැනියෙකුට බැහැ. හිත කියන්නෙ ගලා හැලෙන ගඟක්. අතුණු පුපුරන අහසක්. පිනියම් වෙච්ච ලෝදිය කන්දක්. මම හිතෙන් මිනී මරනවා. මම හිතෙන් හොරකම් කරනවා. මම කාමයෙහි වරදවා හැසිරෙනවා. මම දහසක් දෙනාගේ හිස් කවුළුකින් ගසා දමනවා. සතුරන් කඩුත් නැතුව කුරුදුකන් කරනවා. සම්පූර්ණ සාත්තුවරියක් වගේ ජීවත් වෙන්න අමාරුයි. මම රජිනක් වෙනවා. මම රජිනක් වෙන්නෙ තේමිකරා තුමේ රාජධානියෙ. නැත්නම් කරන්න බැහැ. මගේ දෙකතින් මහා ගංගාවක් ඇද හැලෙයි. කිමිර සාගරය ගලා බසියි. තේමිකරා ඒ තුමේ බිළිඳුන්ගෙ කුස පුරවන්න. සෝරා සාන්. මගේ තේමිකරා ඉන්නෙ වලාකුළු අතරේ. නැතයි. වලාකුළුයි බැද හද

ඇණය හරියටම හරිද? පරිගණකය කියනවා නම් හරි. මගේ ඇඟිලි තුඩුවලට දැනෙනවා, මගේ හිතට දැනෙනවා නිවැරදි ඇණය හා වැරදි ඇණය! ජපානයට වීසා ගැනීමේ අමාරුව බැලුවම මං ලබපු ලොකුම ජයග්‍රහණය වීසාව. මට මං වෙනුවෙන් කරන්න දෙයක් නෑ. මට මං වෙනුවෙන් මතකයක් නෑ.

පළවැනි දවසෙ නිවැරදි ඇණ හත්සීයක්.

දෙවැනි දවසෙ නිවැරදි ඇණ අටසීයක්.

තුන්වැනි දවසෙ නිවැරදි ඇණ දාහයි. ඊළඟට දිගටම පැය හයකට නිවරදි ඇණ එක්දහස් දෙසීයක්.

පඞ් දවසේ යෙන් නව දාහයි.

'ඔයාට යෙන් දහදාහක්වත් නැහැනෙ නූපා සාන්'

මට මේ වතුර බිංදුව මහා ගංගාවක්. ඒක සාපේක්ෂයි.

'මත් එකක්වත් (යෙන් දහදාහක්) ලැබුණෙ නැහැනෙ'

'මට යෙන් එකක්වත් නැතුවනෙ හිටියෙ සෝරා සාන්'

ගල් ඉබ්බා පන්සලක පොකුණෙ ඉන්න ඉබ්බෙක් වගේ හිස යාන්තමට එළියට දැම්මා.

'මට හොරෙන් ඇයි රස්සාවකට ගියේ?'

'කිව්වා නම් යන්න දෙනවද?'

'කවුද රස්සාව හොයලා දුන්නෙ?'

'සෝරා සාන්'

[illegible]

'මෙතන පවුලක් නෑ කැඩෙන්න' ඉස්සරට වැඩිය අපි දෙන්නා කියන වචන වෙන වෙනම හරි තේරුම් ගන්න පුළුවන්කම දෙන්නටම තියෙනවා. නැතත් මං මට ඕන දේ කියනවා. මසායා සාන්, මසායා සාන්ට ඕන දේ කියනවා. රූපවාහිනිය නුඹටයි. විවේකය නුඹටයි. මහන්සිය නුඹටයි. රහස් නුඹටයි. ඒත් මගේ හිත මටයි. මගේ හිත ගමන් කිරීම නැවැත්වීමට නුඹ ගෙන යන වැඩ සටහන අසාර්ථක වෙනවා මසායා සාන්. මගේ උපන් වේලාව බොහොම බලවත්. ලග්නය අධිපතියා ගුරු ඉන්නෙ හතරෙ. වේලාවක් එයි. දුරකතනය කෙළවරක් නැතුව නාදවෙනවා.

'කවුද ඔය කතා කරන්නෙ මසායා සාන්ගෙ හඬේ තිබුණෙ සන්සුන් කමක් වුණාට, මූණෙ තිබුණෙ නොසන්සුන් කමක්.

'මොන විදිහෙ වුවමනාවක්ද තියෙන්නෙ?'

පිළිතුර පිළිබඳ ඉඟියක් ලබාගන්න අමාරුයි.

'මොන විදිහෙ වුවමනාවක්වත් නැහැ නේද? ආයෙම කතා කරන්න එපා. මං පැමිණිලි කරනවා අදාළ ආයතනවලට'

'කවුද ඒ?'

මසායා සාන් කතා නොකරම රූපවාහිනිය ඉදිරියට ගියා.

මම එහෙම කතා කරන්නෙ මොකද කියලා නූපා සාන් දන්නවද? මම මහ තෝන්ජල් මිනිහෙක් කියලද ඔහේ හිතන්නෙ? අත්වලටයි, මූණටයි පාට ගාපු ගෙයිෂා කෙනෙකුයි, ඔහේයි අතර මට වෙනසක් තියෙනවා. අපි පිරිමි. වේදිකාවෙ ගෙයිෂලා නටන හැටි බලාගෙන ඉන්න තරම් මහ පෝසත් මිනිහෙක් නොවුණට මම ඒ ඒ දේවල් ඒ ඒ කාලෙදි භුක්ති විඳලා තියෙනවා. ගෙයිෂා කෙනෙකුගේ කලාවයි, ඇතිමයි ඔහේට පිහිටලා නැති බව මම දන්නවා. ගීෂා කෙනෙකුයි ගෙයිෂා කෙනෙකුයි වෙනස්. ඔහේට ගෙයිෂා කෙනෙක් වෙන්න බෑ. ගීෂා [illegible] මම දන්නෙත් නෑ. [illegible] ඒත්

වගේ යාළු මිත්‍රයො ඕනත් නැහැ. මේ පවුලයි රැකෙන්න ඕන. සෝරා සාන් මේ සන්ජෝ නගරයෙ නම්බුකාර පවුලකට පැහුණ එක [illegible] ආඩම්බර වෙනවා හොඳයි. පන්සලෙන් අහන්න අපි [illegible] හාමුදුරුවො කියලා දෙයි. අපේ මළවුන්ට ලැබෙන්නෙ වටිනා නම් ගම්. බොහොම ඉහළ පරම්පරාවක්. අපේ පවුලේ උදවිය සන්ජෝ නගරය හොල්ලගෙන හිටියෙ පදවි තානාන්තරයි. මුල් හදලුයි හින්දා.

නූපා අසරණ මිනිහෙකුට අනුකම්පා කරන හැඟීමකින් මසායා සාන් දිහා බලලා හිනා වුණා.

මම මේ භාෂාව ඉගෙන ගන්න වෙලාව. නිතරම ඇහෙන වචන මතක තියාගන්න වෙලාව. වැරදි ඇණ කීපයක් එහා කරන කොට හරි ඇණ ටිකක් තෝරා ගන්නවා. ජපනුන්ගෙ ලෙන්ගතු කමක් හිතේ ඇති වෙන වෙලාව.

'අපි ජපානෙට ගැලපෙන මූණක් හදාගමු [illegible] සාන් කියනකොට මම හිතුවෙ මගෙ මූණ ලංකාවටයි, ජපානෙටයි දෙකටම එකයි කියලා. ජපානෙට ගැලපෙන මූණ මොකද්ද? දකින දකින මිනිහට හිනාවෙන එකද? අරිගතො ගොසයිමස් කිය කියා දණහිස දක්වා හිස නමන එකද?

ඔයාගෙ මූණෙ මස් පිඩු ගල් වෙලා ඒවාට ටිකක් බුරුල් දෙන්න ඕන. සෝරා සාන් මාව සම්පූර්ණයෙන් අඳින්න හදන්නෙ මැටි පිඩක් අතට අහුවුණා වගේ.

මම එහෙම කියන්නෙ නූපා සාන් විදේශිකයෙකුට හිනාවක් නැති මූණ ගැන ජපනුන් අතර කතාබහක් ඇති වෙලා තිබුණු හින්දා. ජපන්නු කතාබහ කරන්නෙ නෑ කියලා, හිතන්න ඇස් බිමට නැමුරු කරගෙන හිටියට කන් ලෝකෙට ඇරලා [illegible]

නද මූණක් තියෙනකොට නපුරුයි කියලා හිතෙයි. ජපානෙට ගැලපෙන මූණක් හදාගමු නූපා සාන්.

හිතේ නැති හිනාවක් මූණට ගත්තම ඒක ජපානෙට ගැලපෙන හිනාවයි. ජපානෙට ගැලපෙන මූණයි. හිතෙන් අඬන්න, ඇස් දෙකෙන් හිනාවෙන්න. එතකොට උරහිස්වලටයි, වස්පිඩුවලටයි බුරුලක් දැනෙයි.

ඔහායො ගොසයිමස්. අරිගතෝ ගොසයිමස්. මේ අඬන්න හිතට ඉඩදීලා ඇස්දෙකෙන් හිනාවෙන නූපා. නූපා සාන්.

හැන්දෑ කළුවරේ සකුරා මල් පිපිච්ච වියන යටින් විදුලි වේගයෙන් එන දුම්රියක ආපු කාන්තාවක් හුරුබුහුටි විදිහට ඇවිදගෙන පඩිපෙළියක් නැගලා යනවා. ඒ පඩිපෙළිය දිගේ තුන්වැනි තට්ටුවට නගිනවා. තුන්වැනි තට්ටුවෙ වම් කෙළවරේ ගේ කාමර දෙකේ ගෙයක්. සායො සාන් ඒ ගෙදරට ආවා ගියා. [illegible] [illegible] අරගෙන හිටියෙ සායො සාන් ගෙන්න ගත්තද?

'සායො සාන් දැන් කෝ?

'එයා දැන් වයසට ගිහින් ඇති'

'එතකොට මසායා සාන්ගෙම වයසෙ?'

'ඊට ටිකක් බාල ඇති'

'ඇතැට කණට පෙනුණා ඒ කාලෙ'

සායො සාන් ගෙදරට ආවා ගියා නම්? ආවෙ ගේ දොර [illegible] ගාලා ඇඳුම් ටික හෝදලා දීලා යන්න. හරි ඉතින් ජපන් ගෑනු ලෙන්ගතුකම පෙන්නන්නෙ එහෙම තමයි. ඊට මොකද? [illegible] මිනිහාගෙ අතීතය හොයලා වැඩකුත් නෑ.

'මම නූපා සන්ට බොරු කියලා තියෙනවද?'

'සායො සාන් මසායා සාන්ගෙ ගෙදර ආවෙ හිමෙ ඇවි' මිනිහා නාකිවුණත් ස්වාභාවික ඊර්ෂ්‍යාවක් මතු වෙනවනෙ.

පිරිමියෙකුගෙ ඉතිහාසය හොයන්න එපා නූපා සාන්. ඉතිහාසයක පැල්ලමක් නැති පිරිමියෙක් හොයාගන්න හිතන තරම් පහසු නැහැ. ගෑනුන්ට සංස්කෘතිය හරස් වුණාට පිරිමින්ට සංස්කෘතිය හරස් වෙන්නෙ නැහැ. මසායා සාන් තරුණ කාලෙ කිසිම ගැනියෙක් දිහා නොබලා භාවනා කළා නම් ඒක රෝග යක් වෙන්න ඕන නූපා සාන්. වැඩිපුර කතාබහ නොකළා කියලා පිරිමියෙකුගෙ හැඟීම් දැනීම් අඩුවෙන්නෙ නැහැ. මසායා සාන්ට හොඳට සමිෂෙන් වාදනය කරන්න පුළුවනි. මම මේ පේ ළඟින් යනකොට නැවතිලා අහගෙන ඉඳලා තියෙනවා. ඔය මිනිහගෙ හිත කුද්දගන්න. හරි සුන්දරයි. සමිෂෙන් වාදනය කරන හඬ ඇහෙනකොට ඒ දවස්වල මට හිතුණා නූපා සාන් මසායා සාන්ගේ අත්දෙක ඉඹින්න. ඒත් වුණෙ [illegible] මිනිහෙකුගෙ අත් දෙක ඉඹින්නෙ කොහොමද? මම අන්න අර පිච් ගහ යට නැවතිලා මසායා සාන්ගෙ සමිෂෙන් වාදනය අහලා තියෙනවා. එතකොට පිච් මල් පිපිලා. මං හිටියෙ පිච් මල් වියනක් යට. හීන් හුළගෙ සුවඳ ඇවිටිලා තිබුණා.

'සායො සාන් මේ ගෙදරටත් ආවා ගියාද?'

නැහැ. නූපා සාන් මේ ගෙදර පිරිසක් හිටියනෙ. මසායා සාන් තට්ටු නිවාසෙ පදිංචියට ගියේ ඒ පිරිසෙන් වෙන් වෙලා ඉන්න කියලා මම හිතුවා. සායො සාන් ආවෙ ගියේ ගේදොර අස්පස් කරලා දෙන්න. ඔය හැටි හිතන්න එපා ඒ ගැන. මම ඉන්න විදිහ බලන්න. මම ඉන්නෙ බලාපොරොත්තුවකින්. හැම මාසෙකම මට බලාපොරොත්තුවක් තියෙනවා. නූපා සාන් මං අවුරුද්ද බෙදා ගන්නවා සන්තෝස වෙන්න. මං සකුරා මල් පිපෙයි [illegible] මල්

පුළුවන් අත්විඳින්න. ෆීජ් මල් පිපෙන කොට මගේ තව බලාපොරොත්තුවක් ඉෂ්ට වෙනවා. ෆීජි මල් වැල් මල්පොකුරු පුරවාගෙන දම්පාටිනුයි, සුදුපාටිනුයි බැබළෙන කොට මට තව ළමයෙක් කුසේ ඉඳලා එළියට ආවා වගේ දැනෙනවා. අට වැනි මාසේ මළවුන්ගේ අවුරුද්ද. පිපිච්ච තුතුප් මල් වැටවල් දැකලා තියෙනවා නේද? මිනිස්සු ගැන බලාපොරොත්තු කඩවෙන කොට සත්තුයි, ගහකොළයි, මගේ ළමයිනුයි, මට බලාපොරොත්තු දුන්නා. අර බලන්න අර කන්දෙන් එහා පැත්ත. මේ මුළු නීගතාවම වටවෙලා තියෙන්නෙ කඳු වළල්ලකින්. අපි ඉන්නෙ ඒ කඳු වළල්ල මැද්දෙ. හැමදේම වෙනස් වෙනවා නූපා සාන්. දවල් එක දෙක වෙනකොට ඉර බස්නාහිරට ගිහින් තව පැයකින් දෙකකින් අඳුරක් ඉතුරු කරලා යනවා දැකලා තියෙනවා නේද? ඒත් හෙට ඉර ආපහු එනවා ආලෝකය සම්පූර්ණයෙන් ම අරගෙන. අඳුරු වළාකළු මැද්දේ වුණත් ඉර පායනවා. ඔය අහස හැටි ඔහොම තමයි.

වැඳිච්ච ඇණියක් මගේ පැත්තකට විසි වෙලා ඉන්න මට බැහැ සෝරා සාන්. හිතයි, ගතයි කොතනක හරි අසම්පූර්ණයි.

'වාසනාට ළමයෙක් හම්බ වෙන්න ඉන්නවා. එනකොටම බඩ අරන් ආවෙ'

චන්දනක්කා ලියලා එවපු ලියුමෙ යටින් ඉරි ඇඳපු වගන්තියට පණ ආවා. වාසනා බඩ ගෙඩියක් උස්සගෙන හිනාකටත් පුරවගෙන ඉස්සරහට එනවා. බඩේ හිටපු ළමයා එකපාරටම බඩෙන් එළියට පැනලා මා දිහාට දුවගෙන එනවා. ඔහොම හිටපන් ළමයො වැටෙයි. උපන් ගමන් දුවන්නෙපා. කෝ මෙහෙ එන්න වඩාගන්න. අන්න උඹලගෙ අම්මා පස්සෙන් දුවනවා. පුතේ උඹට එරුණ කිරි බීම ඉතිරෙනවා. පස්සෙන් දුවන්න එපා වාසනා. අපි පිට ඇයොද? වාසනා දරුවාව අල්ලගත්තා. තරවටු කළා. දරුවා ආපහු වාසනාගෙ

වාසනා කුසයනත. මටත් මිත්‍රයෙක් මුණ ගැහෙයි. ඒ මිත්‍රයා මගේ කුස ගහනට වඩියි. මං එක්ක යන එන, කතාබහ කරන සතුටු සාමිචියෙ යෙදෙන, ළමැදට තුරුළු වෙලා සිනාපාමින් සිදි උරා බොන කුරුළු පැටියෙක් මටත් ලැබෙයි. ඒ දවස මං ලඟ කරගන්නවා.

මගේ හිතෙත් ඒ මහ ලෝබකම තියෙනවා නූපා සාන්! අපේ පරම්පරාව ගැන සන්ජෝ නගරයෙ ඕන කෙනෙක් සාක්ෂි කියයි. මගේ පියා නීගතාවෙ නගර සභිකයෙක් බව දන්නවනෙ. මගේ පියාගෙ පියා මේ නීගතාවෙ ඉතිහාසයෙ බල කණුවක්. නූපා සාන් සකුරා මලේ හැඩේට වහලය හදලා තියෙන, ෂිනානො ගඟ තියෙන ගොඩනැගිල්ල දැකලා තියෙනවද? ෂිනානො ගඟේ ඉතිහාසෙට අපේ පරම්පරාවේ ලොකු සම්බන්ධයක් තියෙනවා.

ඒ ප්‍රශ්නය අහන්න ලැජ්ජා හිතෙන්නෙ නැද්ද මසායා සාන් නීගතාවලින් පටන් ගන්න ෂිනානො ගඟ බලන්න මම සෝරා සාන් එක්ක ගියා. ඔහු මාව කූඩුවක දාලා ඇතිකරන්න හැදුවා මං පියාඹලා ගියා ෂිනානො ගඟ බලන්න. මසායා සාන්ට ඕන කරලා තියෙන්නෙ ඒ පරම්පරාවෙ පුරාජේරුව කියන්න. තමුන්ගෙ පරම්පරාව ඉදිරියට ගෙනයන්නද අවශ්‍ය? එකක් කියනකොට දහසක් කාරණා තේරුම් ගන්න කියලා ජපන් කතාවක් තියෙනවා නේද මසායා සන්? මට ඕන කරන්නෙ දරුවෙක් මිසක ඔහේගෙ පරම්පරාව පැල කරන බීජයක් නෙවෙයි. ඇන්ද ඔහේ මට ෂිනානො ගඟ ගැන කතා කරන්නෙ?

සෝරා සාන් මට ෂිනානො ගඟ පෙන්නුවා. කන්ද කපපු තැන පෙන්නුවා. මේ නීගතාව යටකරගෙන ගලපු ගඟ, මුහුදටයි ගඟටයි හරස් වෙලා හිටපු කන්ද.

'නූපා සාන් අර තියෙන්නෙ ජපන් මුහුද. ජපන් මුහුද ඇව ඇක නීගතාව ගංවතුරට යට වුණා.'

ගොයම් සිටෙච්චට කපන්න රන්වන් කරල් නෑ. දන්නවද නූපා සාන් අපේ මුතුන් මිත්තො ජීවත් වුණේ අට්ටාලවල. ෂිනානො ගඟ හරවන්න කොච්චර මිනිස්සු වැඩ කළා ද? මිනිස්සු මිලියන දහයක්. ජීවිතය දණගගා ඇවිත්. පියවි ලෙසින් වගේම රහසින් ඉල්ලා සිටින්නෙ කුමක්ද?

නිදියහනකට නොවැඩිය රන් සමතලයෙක් මහා ආයාසයකින් කුස යහනට ගෙන එන්නට මසායා සාන් වෙහෙසුණේ බරපතල වැඩ ඇතිව හිරගත වෙච්ච හිරකරුවෙක් වගේ. සමහර වෙලාවට බඳා ගන්න දේවල් තව සමහර වේලාවකට අත අරින්න සිද්ද වෙනවා. ඇතට විසි කරන්න සිද්ද වෙනවා වඩා වටිනා දෙයක් වෙනුවෙන්. කලලයක් හොයහොයා ගිහින් වැකිපුම් කරලා දාපු දොස්තර කෙනෙක් ළඟට ගියෙත් අම්මා කෙනෙක්. කලලයක් ඉල්ල ඉල්ල දොස්තර කෙනෙක් ළඟට යන්නෙත් අම්මා කෙනෙක්.

මුණ ගැහෙමු මසායා සාන්!

පහන් තිරය පිච්චෙන සුවඳ මට දැනෙනවා. ආලෝකය දෑතට එකතු කරගෙන සිප ගන්න හිතෙනවා. වරිච්චි මැටිපිඩක් බිත්තියකින් ගලවගෙන ඉඹින්න හිතෙනවා. පැඟිරිතෙල් මුළු ශරීරයෙම තවරගන්න හිතෙනවා. ශරීරයට දැනෙන්නෙ බරක් නෙවෙයි සැහැල්ලුවක්. හිතට හරි සැහැල්ලුවක්. ජයනාථ එක ඇසිල්ලකින් දුන්නු දරු සම්පත බාර නොගෙන අත ඇරියෙ දරුවා සුජාත නොවෙච්ච හන්දා. සුජාත කියන්නෙ කසාදෙ. ජයනාථ පියා නෙවෙයි. ඒත් බීජය ඔහුගෙයි. ජයනාථ පියා නොවෙන්නෙ කසාදය නැති නිසා. කසාදය නැති වුණාට නූපා මව තමයි. කසාදය තිබුණත් නූපා මව -නොතිබුණත් නූපා මව. සමාජගත නියමය!.

මිනිස්සු කිව්වම ගෑනු පිරිමි දෙගොල්ලොම. ෂිනානො ගඟ හරවලා දැන් අවුරුදු අසූවක් වෙනවා. අර අතන තියෙන කඳු

පස් කැපුවෙ පිරිමි.

මඩ ඇද්දෙ ගෑනු.

පිටේ පස්ගෝනි තියාගෙන එක පෙළට ගිය ගෑනු මට නම් චිත්‍රයකින් වගේ පේනවා. ඒ වගේ චිත්‍රයක් අඳින්නවත් මං කැමති නෑ නූපා සාන්. කන්ද කපපු පස් සැතපුම් එකහමාරක් ඈතට, කොන්ද නමාගෙන ගෙනිච්චෙ ගෑනු.

නීගතාවල වතුර හරි රසයි. නීගතාවෙ හාල හරි රසයි. නීගතාවෙ කඳුයි, කුඹුරුයි සිපගෙන එන සුළඟ හරි සිසිලයි. වගේම සුවදායකයි. කන්ද කපන්න ඉස්සර වෙලා ගොයම් හිටෙව්වෙයි, කැපුවෙයි මරුපාරුවල ගිහින් දණක් වතුරෙ බැහැලා. නූපා සාන් මේ ලස්සන නීගතාව හදන්න ලොකු මිලක් ගෙව්වෙ නීගතාවේ ගෑනු. නීගතාවෙ ගෑනු ටෝකියෝවලට පැනලා යන්නෙ ඒ ඉතිහාසය මතක තියෙන හින්දා. නීගතාවෙ පිරිමියෙක් කසාද බඳින්න කැමති ජපන් තරුණියක් සොයා ගැනීම ඒකත් අමාරු දෙයක්. ඔයා වගේ විදේශිකයෝ නීගතාවට ඇවිත් පුරුෂයින් හොයාගෙන එන්නෙ ඒ අඩුව පිරිමහන්න.

සකුරා මල් යාය දිගේ සෙමින් සෙමින් සක්මන් කරමින් සෝරා සාන් මට ෂිනානො ගඟෙ ඉතිහාසය කියලා දුන්න මසායා සාන්.

වාසනාට වගේම මටත් දරුවෙක් ඕන.

මටත් දරුවෙක් ඉන්නවා නම්?

අපි දෙන්නටම දරුවෙක් ඉන්නවා නම්!

මේ පරම්පරා ගෙදර මම ඉන්න බව කාටවත් ඇනිලා නැති බව මම දන්නවා. පරම්පරා ගෙයක් ඉරි තලමින්, නගරෙ මැද්දෙ හිටගෙන ඉන්නවා. මගේ පරම්පරා ගෙදරයි, මමයි දෙන්නම මැදි...

විවාහ කරගත්තු, මැදි වයසත් පැනපු, ලෙඩරෝග බහුල ශරීරයක් ඇති ජපනෙක්. සන්ජෝ නගරයෙ මසායා සාන් නොවෙයි, ලංකාවෙන් මනමාලියෙක් අරගෙන ආපු මසායා සාන්. ලෝකය වෙනස් වෙලානෙ. නූපා සාන් කියනවා වගේ ඒ වෙනස් වෙච්ච ලෝකෙ කිසියම් තැනක් හොයාගෙන යමු. එතැනදී මූණ ගැහෙයි. සරු දවස් හොයාගෙන යමු. එහෙම දවසක මූණ ගැහෙයි. සරු බිමක් හොයාගෙන යමු. එතැනදී මූණ ගැහෙයි.

එහෙමයි. මසායා සාන් ගල් ඉබ්බෙක් වුණාට දරුවා වඩම්මාගෙන මහ පෙරහැරක යන්න සියලුම සූදානම්කම් තියෙනවා. මසායා සාන්ගෙ පවුලෙ ගෞරවයටත් දරුවා හේතු වෙනවා. ගෞරවයට වඩා ඉහළයි දරුවෙකුට මව් වීමේ ආසාව. ඒකටයි වයසක ස්වාමිපුරුෂයව ඇදගෙන රෝහලට ගියේ. සරු දවස් හොයාගන්න. ලංකාවෙ මිනිස්සු දැක්කා නම් අහයි ලෝකෙ රටේ ඉලන්දාරියෙක් ඇකලමේ නැද්ද කියලා. ජපානෙ වුණත් අහන්න ඉඩ තියෙන්නෙ ඔය ප්‍රශ්නෙමයි. ජපන් ගෑනු, පිරිමින්ගේ මූණුවල ඉරියව් වෙනස් නොවෙන හින්දා හිතන්නෙ මොනවද කියලා කාටවත් කියන්න බැහැ. හිතයි - මූණයි කියන්නෙ දෙකක් මිස එකක් නොවෙයි. මසායා සාන්ට පියෙක් වෙන්න බැරි වුණත්, පුළුවන් වුණත් මසායා සාන් පියෙක් නොවී වෙන කෙනෙක් පියෙකු වීම හිතට වදයක්. උපදින්න ඉස්සෙල්ලා කළලයක් එහෙම පිටින්ම ඇදලා ඇම්මෙ පියෙකුගෙ රැකවරණය නොලැබෙන හින්දා. බීජයයි, රැකවරණයයි දෙකම ලබාදීමේ පුහුකම තියෙන්නේ කසාදයෙ රබර් මුද්‍රාවට.

මමත් බලනකොට මේ රබර් මුද්‍රාවෙම එල්ලෙනවනෙ.

හැඟීමක්, ඇනීමක් නැති මිනිහෙකුගෙන් ලිලී මලක් ඉල්ලලා ඇඬුව පුංචි ගෑනු ළමයා මම. සරු දවස් හොයලා දුන්නා ගේ ළඟ රෝහලෙන්. හරි මිනිහෙක් හිටියා නම් අපිට නම් හැම දවසම ... එහෙම සරු දවස් ...

'තව කල් අරින්න එපා' කියලා හෙදිය මගේ ස්වාමිපුරුෂයාට නැහෙන්න සිනාමුසු මුහුණින් කිව්වා. ඇත්තටම කියන්න ඇත්තෙ දැන්ම බබෙක් හම්බ නූනොත්, ඔයාගෙ අනාගත බබා තාත්තාට සීයා කියයි කියලා වෙන්නැති.

ජයනාථට ඇසිල්ලකින් ජීවිතය වෙනස් කරන්න පුළුවන් වුණා. ඒත් මසායා සාන්ට එහෙම අමාරුයි.

'මේ වැඩේ හරියන්නෙ නැහැ.' මසායා සාන්ගේ හරි නොයන කතා හැම කාරණාවකටම එකවගේ අදාලයි. මම මහාමායා දේවිය නෙවෙයි, කන්‍ය මරියතුමියත් නෙවෙයි. ළමයෙක් නිකම්ම කුසයහනට වඩින්නෙ නෑ. මේ වැඩේ හරි නොයනවා නම් වෙන වැඩක් හරි හොයන්න වෙයි. ඔය කනාටු ගස්වලත් සකුරා මල් පිපෙන්නෙ. ගහක් නැර තුතුජ් මල් පිපෙන්නෙ. ඔය තළ බබාල හැදෙන්නෙ.

'මට නිවාඩු නෑ දිව්ව'

'නිවාඩු නැත්නම් රස්සාවෙන් අස්වෙලා හරි මට ලිදි මලක් හදලා දෙන්න.'

මසායා සාන් කතා නොකළට හීනවල එල්ලිලා ඉන්න හපන්.

'මේ ගෙදර ළමයි රොත්තක් ඉන්නවා දකින්න මං ආසයි'

මසායා සාන් හැබෑ නොවන හීනවල එල්ලීලා ඉන්නවා. ඒක ලෙඩක් තරමට දුර දිග ගිය එකක්. එක හීනෙකින් තව හීනෙකට මාරුවෙවී මුළු දවසම හීනවලට බෙදාගෙන ජීවත් වෙනවා. ලංකාවට ගිහින් තරුණ ගෑනියෙක් කසාද බැඳගෙන එන්න ධෛර්යයක් තිබුණු මිනිහට තමන්ගෙම දරුවෙක් හදාගන්න ධෛර්යයක් නැත්තෙ ඇයි ?

ඔය තල බබා හදාගන්න බෑ. නූපා සාන්ටයි මටයි දෙන්නටම රස්සාවෙන් අස්වෙන්න සිද්ද වෙනවා. ඕන ඕන වෙලාවට නිවාඩු ගන්න බැරි හින්දා. ඉතුරු කරගත්තු යමක් තියෙනවා තමයි. එහෙම කළා කියමු. එච්චර මිලක් ගෙවලත් බැරි වුණොත් ?

කසුමි අඬ ගහලා, අඬ ගහලා, අඬලා අඬලා වදෙන් පොරෙන් කුසයහනට වඩම්ම ගත්තු මගේ දුව. මගේ දෝනි. කසුමි සුමිකාවා.

ජපන් බෝනික්කි මගේ දෝතට ආවා. ධාතු කරඬුවක් පරිස්සම් කරනවා වගේ පරිස්සම් කළා. කෑවේ, බිව්වේ, ඇඳිද්දෙ මේ ප්‍රාණියා බදාගෙන, තුරුළු කරගෙන. කසුමි සුමිකාවා. බැඳී සිටින්න කෙනෙක් දෝතට දුන්නට. ඒ වෙනුවෙන් හැම්දෙම කැප කළාට මසායා සාන්ට ගොඩක් ස්තුතියි. අරිගතෝ ගොසයිමස් !

'අම්මටයි, තාත්තටයි කතාකරලා කියමු.

පියෙකු වීමේ ප්‍රීති ප්‍රමෝදයෙන් ඉපිලෙමින් හිටිය මසායා සාන්ට මම යෝජනා කළා. මිණිබිරියෙක් උපන්නා කියමු.

'පස්සෙ කියමු.'

'ළමයා හම්බ වුණු ගමන්මනේ කියන්න ඕන'

'තවම ඔයාට සනීප මදි'

'මට අසනීපයක් නෑ'

'මම කියන්නම් පස්සෙ'

'ඔයා නෙවෙයි මට මගේ කටින් කියන්න ඕන කසුමි ගැන'

මසායා සාන් නිශ්ශබ්ද වෙලා පැත්තකට වුණා. ගල් ඉබ්බෝ

මව් මහ ගෙදරට යනවා. මුණුබුරෙක් මිනිබිරියෙක් ලැබෙනවා කියන්නෙ මහ ප්‍රීතියක්නෙ. ඒ ප්‍රීතිය ඒ දෙන්නට දෙන්න ඕන උණු උණුවෙමයි. මේ ප්‍රීති ප්‍රමෝදෙය දුරකතනය දිගේ බෙදාගන්න ගනිමු. ගල් ඉබ්බට ඕන කරන්නේ ඒ ප්‍රීතිය තනියම විඳින්න. කසුමි අයිති අපිට විතරක් නෙවෙයි. කසුමිට මව්පසේ ඥාතීන් ඉන්නවා ලංකාවෙ. කසුමි මාව අම්මා කෙනෙක් කළා කියන්න, කසුමි මට ජීවත්වෙන්න බලාපොරොත්තුවක් දුන්නා කියන්න, කසුමි මට ජපන් බෝනික්කෙකුගෙ සිහිනය සැබෑ කරලා දුන්නා කියන්න අපි ගෙදරට කතා කරමු මසායා සාන්.

ගෙදරට කතාකරලා අම්මටයි තාත්තටයි සුබ ආරංචිය කියන්න අම්මයි තාත්තයි ජීවතුන් අතර නැහැ නූපා සාන්. මං නූපා සාන්ට පස්සෙ දවසක කියන්නම්. පහුගිය මාස නවයට සිද්ද වෙච්ච දේවලින් අතලොස්සක් විතරයි නූපා සාන් දන්නෙ. මට පරම්පරා ගෙදර අහිමි වුණා. සුමිකාවා පරම්පාරාවෙ මළවුන් දුක්වෙන්න ඇති. ඒත් ඒක මගෙ වරද නෙවෙයි. ඉඩම උගස් කළේ මම නෙවෙයි. ඉඩම උගසට ගත්තු මිනිහා ඉදිරියේ මේ පරම්පරාව වෙනුවෙන් බැගෑපත් වුණා. සන්ජෝ නගරය මැද්දෙ, සන්ජෝ දුම්රිය පොළ ආසන්නයෙ මහපාරට මුහුණලා තියෙන ඉඩමක් කඩමක් ගෙයක් දොරක් සින්න කරගැනීමේ ආසාවෙන් මිදිලා මනුස්සකමක හැටි සොබාව පෙන්නන්න තරම් පරිනත කමක් උගස් හිමියාට තිබුණෙ නැහැ නූපා සාන්. මම හිටියෙ කසුමි එනකල් තමයි. කසුමි බඩේ ඉන්නකොට මේ හැමදේම ඔයාට කියලා හිත එහා මෙහා වෙන්න ඉඩ දෙන්න පුළුවන් කමක් තිබුණෙ නැහැ. ඒ දණ්ඩ දිගේ වැසිකිළියට යන්න ඔයා කැමති නෑ නේද? මට ඔයාගේ සිතැඟි දැනෙනවා. මම පිරිමියෙක් නෙවෙයි කියලා හිතුවට මම පිරිමියෙක් තමයි. කසුමි එනකල් අපි මගබලාගෙන හිටියා. මම සන්ජෝ නගරයෙ නිකමෙක් නොවී සන්ජෝ නගරයෙ ඉන්න වගකිව යුතු තාත්තා කෙනෙක් කළේ ඔයානෙ. අඩු තරමේ මට තව වයස අවුරුදු දහයක් අඩු වුණා නම් මගේ ගෙදරට සායො සාන් ආපු කාලෙ වගේ වෙන්න තිබුණා. ඒ කා[illegible] සායො සාන් හෙමින් හෙමින් ඇවිදගෙන [illegible]

ඇඳගෙන එනවට මං කැමති බව සායො සාන් දැනගෙන හිටියා. කොණ්ඩ තිබුණා උරහිසට දිගට. කිමෝනෝවට ගැලපෙන විදිහට ඒ කොණ්ඩෙ බැඳගෙන ආවෙ. ඇස් දෙක හැමතිස්සේම අඩන්න සූදානමින්. එයා අඩිය තිබ්බෙ බයෙන් බයෙන්. එයා පඩිපෙළ නැගගෙන එනකොට ඒ එන්නෙ සායො සාන් කියලා හරියටම කියන්න මට පුළුවන් කම තිබුණා. නියම ජපන් ගෑනි. දෙයක් බලාපොරොත්තු වෙන්නෙ සියලුම ආවතේව කරලා. රණ්ඩු දබර වෙන්න තුන්හිතකවත් කැමැත්තක් තිබුණේ නෑ කියලා මට දිවුරලා කියන්න පුළුවන්. කතා කළේ බොහොම හෙමින්. රහස් කතා කරනවා වගේ. ඇවිද්දෙ කුරා කුඹියෙක් පෑගෙයි කියලා බයෙන් වගේ. ඒ දවස්වල මං සමිෂෙන් වාදනය කරනවා. සායො සාන් කිසි හැලහොල්මනක් නැතිව දණ ගහගෙන ළඟ ඉඳගෙන ඉන්නවා. සායො සාන්ගේ ඇඟිලි හරි පුංචි දිගැටි ඇඟිලි. සමිෂෙන් වාදනය කරනවා නම් බොහොම ලස්සනක් මැවිලා පෙනෙයි කියලා මට නිතරම හිතුණා. මම සායො සාන්ගෙ පැමිණීමට ගෙවීමක් කළා. ගේ අතුපතු ගෑවෙ නැත්නම්, ගෙදර සුද්ද පවිත්‍ර කළේ, කෑම ටික සූදානම් කළේ මගේ ඇඳුම් හේදුවෙ, වැසිකිළිය පිරිසිදු කළේ සායො සාන්. හරි පිළිවෙළට වැඩ කළේ.

හිතට සන්තෝසයක් අරගෙන ආවෙත් සායො සාන්.

තොරතෝංචියක් නැතුව ආදරය කරනවද කියලා ඇහුවෙ නැතුවට මං එයාට ආදරය කරන බව එයා දැනගෙන හිටියා.

'මසායා සාන් දවසම සමිෂෙන් වාදනය කරන්න' කියලා මා ළඟ දණගහගෙන කරන ඉල්ලීම මේ දැනුත් මට ඇහෙනවා. දවසක් එයා බටනලාවක් අරගෙන ආවා. ඔක්කොම වැඩ ඉවරවෙලා ඇවිත් එයා මා ඉදිරියේ ඉඳගත්තා. දෑත පිටුපස සඟවගෙන හිටිය බටනලාව ඉදිරියට ගත්තෙ පුංචි ළමයෙක් මුතු හංගගෙන ඉඳලා අත දිග ඇරලා පෙන්නනවා වගේ.

'[illegible]ද ?'

'පුළුවන්ද පිඹින්න?'

'තමත් නැද්ද පිඹබට'

ගොරහැඩි හඬක් අහන්න මම දෙසවන් සූදානම් කරගත්තා. ඇය බටනළාව පිඹින්න ගත්තා. ඒ හඬ මාව ගෙනගියේ ගිනිහුලින් එළිය වෙන අඳුරු රාත්‍රියකට. එහෙම වාදනයක්. පළමුවැනි වතාවට මට ඇව සිපගන්න ලොකු ඕනකමක් ඇති වුණේ එදා තමයි. ඒත් වාදනය ඉවර වෙන තුරු මං ඉවසගෙන හිටියා. ඒ වාදනයෙ තිබුණේ මහා දුකක්. දුක් ගැනවිල්ලක්. ඒ දුක් ගැනවිල්ල මගේ හද පතුලටම කිඳා බැස්සා. වාදනය නවත්වලා සායො සාන් මා දිහා බලාගෙන හිටියා. ඇය ගෙයිෂා ස්ත්‍රියක් නෙවෙයි. ඒත් හුරුබුහුටි ගෙයිෂා ස්ත්‍රියක් තරමට ඇගේ වාදන විලාසයෙ අපූරු බවක් තිබුණා. ඒ බටනළා වාදනය තවමත් මගේ මුළු ශරීරයේම රැඳිලා තියෙනවා. මම ඇය ඉදිරියේ දණ නමලා ඇයට අචාර කළා. ඇය පෙරළා ආචාර කළේ අඬමින්ද, සිනාසෙමින්ද කියන කාරණාව මට තේරුම් ගන්න අමාරු වුණා. මම ඇගේ [illegible] ඇත තබා ගත්තා. ඇය පිළිමයක් වගේ හිටියත් [illegible] බලාගෙන ඉන්න බැරි තරමට මම ඇතුළතින් උණුසුම් වෙමින් හිටියා.

මම එදා වැඳලා සමාව ඉල්ලුවේ නැහැ නූපා සාන්.

'ඔයා හරි ශක්තිමත්, ආදරණීය පුරුෂයෙක්' කියලා මගේ උකුලෙ හිස තබාගෙන සායො සාන් කිව්වෙ හුරතල් වෙවී. ඒ හුරතලය පුංචි දරුවෙකුගෙ වගේ හුරතලයක්. සායො සාන් එදා ඉඳලා මට ආවතේව කළා වගේම මට ප්‍රීතිමත් ජීවිතයක් ලබා දුන්නා. සායො සාන්ව දකිනකොට හිත ඇතුළෙයි ශරීරයෙයි ගින්නක් ඇවිලෙන්න ගත්තා.

'මසායා සාන් සමිසෙන් වාදනය කරන්න. මට පුළුවන් ඕනතරම් වෙලා මෙතන ඉඳගෙන ඉන්න. උදේ හවා මෙතන

එයා එහෙම කියලා මා දිහා [illegible]
කරගන්න කියනවා වගේ ඉරියව් මුළු සිරුරෙන්ම දරාගෙන. මම හිටියෙ තනි වෙච්ච මිනිහෙක් වගේ. මම දැනගෙන හිටියෙ නැහැ ඇයි මම තනිවුණේ කියලා. මට හැමෝගෙන්ම ඈත් වෙලා ඉන්න පෙළඹවීමක් තිබුණා. ඇත්තම කියනවා නම් මම ගෑනියක් දිහා බැලුවෙ වුණත් සැඟවිලා ඉඳගෙන. සායො සාන් දිහා මම බැලුවෙත් එහෙමයි. දුම්රියෙන් බැහැලා සකුරා මල් වැස්ස යටින් සායො සාන් මගේ තට්ටු නිවාසය පැත්තට එනකොට මම තවුළුවෙ හිදැසකින් ඇය එන දිහා බලාගෙන හිටියෙ ඇවිදින චිත්‍රයක් දිහා බලාගෙන ඉන්නවා වගේ. කිමෝනෝව ඇඳලා තරුණ කාන්තාවක් කොරවක්කෙක් එනවා වගේ එනකොට මගේ හිත දඟකාරයෙක් වගේ හැසිරෙන්න පටන් ගත්තා. ඒත් මම ඇය ඇතුළට එන්න ඉස්සර තනම් පැදුරෙ ඉඳගෙන බොහොම තැන්පත් විදිහට බිම බලාගෙන හිටියා. සායො සාන් හිසමුදුනේ ඉඳලා මාපටැඟිල්ල දක්වා ගැහැනුකම තිබිච්චි අපූරු ගෑනියෙක් කියලා මං ඉස්සෙල්ලා කිව්වද [illegible]? කිව්වෙ නැත්නම් ඒක එහෙම තමයි. සායො සාන් මගේ [illegible] හිටියා. ඒක මහ අමුතු [illegible] හැඟීමක්. මගේ [illegible] ඇල්ලගෙන හිටියෙ මට අයිති වාදන භාණ්ඩයක් වගේ. පුංචි කාලෙ කියවපු පොතක හිටිය අරුම පුදුම කුමාරිකාවක් වගේ. මම හැමතිස්සෙම හීන දකිමින් හිටියා. සායො සාන් ඇවිදින් කොණ්ඩ කිරිල්ලියක් වගේ මගේ උරහිසේ වහලා ඉන්නවා මම හීනෙන් වගේම හීනෙයි නැබෑවයි අතර මැදදිත් දැක්කා. මං ජීවත් වුණේම ඒ හීනෙයි නැබෑවයි අතරමැද. සායො සාන් ගෙතුළට අරගෙන ආපු හැමදේම මාව ප්‍රීතිමත් කළා.

සුවඳ. පියකරු කම. ගෑනු කම. තැන්පතකම. බටනළාවෙ හඬ. සමිසෙන් වාදනය අහගෙන ඉන්න අපූරුව සමස්තයම ආකර්ශනයක්.

මේ ඔක්කොම තියෙන ගෑනි මට විවාහ යෝජනාවක් ඉදිරිපත් කරපු දවසෙ තමයි මගෙයි. ඇගෙයි ජීවිත වෙනස් කළේ.

මාව අත්පත් කර ගැනීමේ වංචනික ප්‍රයෝගයක් හැටියටයි මට එදා දැනුණෙ. මම කවදාවත් සායො සාන්ව විවාහ කරගැනීමෙ පොරොන්දුවක් දීලා තිබුණේ නැහැ. අපේ සම්බන්ධය ප්‍රේම සම්බන්ධයකුත් නොවෙයි. ලිංගික මිත්‍රත්වයක් තිබුණු බව නම් හැබෑව ! සිතට දැනුණු ආදරණීය හැඟීමකුත් තිබුණු බව දැනගෙන හිටියනෙ. ඒක නැහැ කියන්න බැහැ. විවාහය කියන්නෙ අනවශ්‍ය බැඳීමක්. සායො සාන් ඒ අනවශ්‍ය බැඳීමෙන් මාව වෙලාගන්න හදන්නෙ මේ ප්‍රීතිමත් බැඳීමේ කෙළවරක් දකින්නද ?

'මම හිතුවෙ මසායා සාන් මාව විවාහ කර ගනියි කියලා.' සායො සාන් දණ ගසාගෙන මට තේ කෝප්පයක් පිළිගන්වමින් කිව්වා. ඇගේ අතේ වෙව්ලිල්ලට තේ කෝප්පය පිරිසියේ වැදිලා කට කට ශබ්දයක් නැගුණා.

'නැහැ'

'කමක් නැහැ'

'මම සායො සාන් එක්ක විවාහයක් ගැන කතා කළේ නැහැනේ.'

සායො සාන් මම බීලා ඉවර කරපු තේ කෝප්පය අරගෙන මුළු තැන්ගෙයට ගියා. ඊට පස්සේ මට ඇය අස්පස්කරන ශබ්දය ඇහුණා. ඇය උයන පිහන ශබ්දයත් ඇහුණා. මම සමිසෙන් වාදනය පටන් ගත්තා. ඇය හැමදේම නතර කරලා ඇවිත් සමිසෙන් වාදනය අහගෙන හිටියා. ඒත් ඇය වෙනදා වගේ බටනළාව වාදනය කළේ නැහැ. ඇය බොහොම සන්සුන්ව ඉඳගෙන හිටියා. සමිසෙන් වාදනයට අනුගතව ඇගේ හිස යාන්තමට නැළවෙනවා වගේ මට පෙනුණා. වාදනයෙන් පස්සේ පුරුදු විදිහට ඇය සිප ගන්නත්, ඇය සුරතල් කරන්නවත් මගේ හිත ඉඩදුන්නෙ නැහැ.

'මට සමාවෙන්න' බරපතල වරදක් කරපු දරුවෙක් වගේ ඇය [illegible]

තුපා සාන්, ඊට පස්සෙ කවදාවත් සායො සාන් ආවෙ නැහැ. සායො සාන් පැමිණියේ කොහේ සිටද කියා කියලා මං දැනගෙන හිටියෙ නැහැ. කිමෝනෝවක් ඇඳගත්තු ඒවගෙ ගැනු ළමයින් පස්සෙන් ඇවිදිමින් මංමාවත්වල දුම්රියවල, බස්රථවල ගමන් කරමින් මම ඇයව සෙව්වා. මං ළඟට ඇය එවූ තැනැත්තියට මං කතා කළා. ඒත් මට කිසිම ආරංචියක් හොයා ගන්න බැරි වුණා.

මම ඇය බැස එන දුම්රිය වේදිකාවට ගොස් සති ගණන් බලාගෙන හිටියා. හදිසියේවත් ඇය දුම්රියෙන් බැස සකුරා ගස් යටින් ඇවිද යනු ඇද්ද ? මා වගේම ඇය මා ගැන සොයන්නට මගේ තට්ටු නිවාසය අසලට එනු ඇද්ද ? එහෙත් යළි මුණ ගැසෙන්නට හැකි කිසිදු සලකුණක් ඉතිරි නොකරමින් ඇය මගේ ජීවිතයෙන් පලා ගියා.

කවදා, කොතැනකදී හෝ ඇය හමු වී මා ඇය විවාහ කරගන්නට කැමති බවත්, මා ඇයට ප්‍රේම කරන බවත් දිවුරා කියන්නට මට ඕනෑ වී තිබුණා. [illegible]යෙන්ම එය හුදු කායික සබඳතාවක් නොව සිත අභ්‍යන්තරයෙන්ම පැන නැගුණු ප්‍රේමණීය හැඟීමක් බව කියන්නට මට තදබල වුවමනාවක් ඇතිවුණා. ඇය නැවත හමු වුණා නම් විවාහ යෝජනාව ඉදිරිපත් කරන්නේ මමයි. ඇයට ප්‍රේම කරන බව කියන්නේ මමයි. සිරුරද, ආධ්‍යාත්මයද, සිර කර ගන්නා ආලිංගනයකින් ඇය ඇඩිව වැළඳගන්නේත් මමයි.

එහෙත් ඉන්පසු කවර දිනකවත් ඇය මට මුණ ගැහුණේ නැහැ.

ඇය කිසිවකු හා විවාහ වී ඇතැයි සිතන විට මගේ සිත, ගන ගින්නකින් ඇවි යන්නාක් මෙන් දැනෙනවා.

සායෝගෙන් වෙන් වූ මගේ තරුණ සිතද ගතද මහළු වූයේ සායෝගේ මතකයද සමගයි. කිමෝනෝවක් ඇඳගත් ජපන් ජාතික යුවතියක දකින හැම විටම ඇය පසුපස ගොස් සමාව ඉල්ලන්නටත්, [illegible]

දුම්රියෙන් බැස සකුරා මල් යාය දිගේ හෙමින් පියමන් කරන ආදරණීය සායෝ වෙනුවෙන්, ඇය සොයා ගමනියම් කරයමින්, ඇය කැමති සංගීත වාදනයෙහි යෙදෙමින් මා ගත කළ තරුණ ජීවිතය අර්ථ විරහිත යැයි හිතන්නට එපා නූපා සාන්. මගේ ජීවිතය සිහිනයෙහිම ගැලී ගෙවී ගියා. සායෝ හැර අන් ජපන් ජාතික බිරියක් ලැබීමේ කැමැත්තක් මට තිබුණේ නැත. වුවමනාවක් මට තිබුණේ නැහැ.

මැදිවියද ඉක්මවමින් සිටි ජපන් ජාතිකයෙකුගේ බිරිඳ වී නුඹ මා වෙත ආවේ ඒ හිස්තැන පුරවන්නටයි.

නුඹ සහමුලින්ම ඇයට වඩා වෙනස්.

හැම අතින්ම.

6

'ගෑනු හරි දුර්වලයි කියලා පිරිමි කියනවනෙ නූපා සාන්. ඒත් අම්මලා හරි ශක්තිමත්.

මම නූපා සාන්ට කිව්වෙ, නූපා සාන් හැම දේ ගැනම හිතට වද දී ගන්නම උත්සාහ කරන හින්දයි. අපේ සංස්කෘතියෙ ගැහැනිය කියන්නෙ බොහෝ වෙලාවට දුර්වල කෙනෙක්. ඒක මෙන් අත්විඳිනවනේ. මසායා සාන්, නූපා සාන්ගෙ අම්මයි තාත්තයි මිස් යාම් ඔයාගෙන් සඟවගෙන හිටියෙ ඔයා බඩ ගැබ්බරව හිටිය හින්දා. අම්මගෙ මරණයේ ශෝකයෙන් තාත්තා මරණයට පත්වුණා කියලයි මසායා සාන්ට ලංකාවෙ ඉන්න ඔයාගෙ නෑයෝ කියලා තියෙන්නෙ. මළගමටවත් යන්න බැරි වුණානෙ කියලා අඬා වැළපෙනවට වැඩිය හොඳ නැද්ද ඔයා අවසාන වශයෙන් දැකපු ප්‍රීතිමත් මවකගෙයි, පියෙකුගෙයි සිහිවටනය. අම්මෙකුයි, දුවෙකුයි අතර තියෙන්නෙ පිටාර ගලන ආදරයක්. මායි මගේ දුවයි අතර තියෙන්නෙ ඒ වගේ පිටාර ගලන ආදරයක්. නූපා සාන් ඔයයි ඔයාගෙ දුවයි දෙන්නත් ඒ වගේ පිටාර ගලන ආදරයකින් බන්ධනය වෙයි. ඒත් ඒ හැම බන්ධනයක්ම තාවකාලිකයි. සංසාරෙකින් සංසාරෙකට අරගෙන යයි තමයි, අමතක කරන්න බැරිවෙයි තමයි. හැමදේටම කාලයක් තියෙනවා. අම්මා කියන්නෙ සදහටම ජීවත්වෙන සත්වයෙක් නොවෙයි. සදහටම ජීවත් වෙයි. - ඒ හිතේ. හිත් පතුලෙ. මකන්න ඕන වුණත් මකන්න බැරි වෙයි. ඕනම දුවෙකුගෙ හිතේ අම්මට නියමිත ස්ථානයක් ඇති. ඒ ස්ථානයේ අම්මා තියෙන මහා ස්ත්‍රියට ඉන්න ඉඩ අරින්න. ඒත් නූපා මතක

අපිට අත අරින්න බැරි අම්මට නොවෙයි. අම්මා කෙනෙක් දෙන ආදරය. තමන්ට කියලා කිසිම දෙයක් වෙන් කරගන්නෙ නැතුව, බඳුන පිටින්ම දරුවන්ට පූජා කරන ආදරය. ඒ ආදරය නේද අමතක කරන්න බැරි ?

මසායා සාන් කළේ වරදක් කියලා හිතමින් තැවෙන්නයි, කෝප වෙන්නයි එපා. දරුවට මව්කිරි දෙන්න ඕන සතුටින්. අඬ අඬා මව්කිරි දෙන්න එපා. අම්මලා හැම හැමතිස්සෙම සමාව දෙනවා. මලගමට නාවා කියලා අම්මලා කවදාවත් දරුවො එක්ක තරහ වෙන්නෙ නෑ. සමහරවිට ඔය ගන්ධබ්බ දෙපල ඔයාවයි, ඔයාගේ දරුවවයි දකින්න සන්ජෝ නගරයට එන්නත් ඇති.

මසායා සාන්, හැම ආවතේවයක්ම කරනවනෙ.

ගැනියෙක් වගේ අඬන්න. ඔහොම තද කරගෙන ඉන්න එපා. මම ඒ දවස්වල හිතුවා ඔයාගෙ චිත්‍රයක් අඳින්න. ඇස රටක ඉඳලා දිග ඇවිල්ලා අසරණ වෙලා ඉන්න කාන්තාවකට මොනවා හිතෙනවා ඇද්ද ? ඒවා චිත්‍රයකට ගොනු කරන්න බැහැ. පින්සලකට හරි, පැන්සලකට හරි බෑ. ඇතුළට හරි දුක හරි නියම බරට ප්‍රති නිර්මාණය කරන්න. බොහොම ස්වල්පයක් ජපන් භාෂාවයි, බොහොම ස්වල්පයක් ඉංග්‍රීසි භාෂාවයි, අංග චලන භාෂාවයි එක්ක මායි, නූපා සානුයි ගොඩනගාගත්තු සම්බන්ධතම ඇතුළෙ අම්මෙකුගෙයි දුවෙකුගෙයි ඡායාවක් මට පේනවා නූපා සාන්. අපි කතා කළේ හදවතින් නේද? අපි අඬා වැටුණෙ, අපි හිනා වුණේ මුළු හිතින්මයි. ඉදිරියටත් මගේ හදවත ඔයා වෙනුවෙන් විවෘතයි.

උණුසුම් රටක පිපුණ මලක් සීතල රටක හිම ගොඩක එබුවම මැරෙනවනෙ. ඉස්සෙල්ලම ඒ සීතලෙන් මිදෙන්න අවශ්‍යයි නූපා සාන්. ඒ සීතලට ඔරොත්තු දෙමු.

'මේ ඇඳුම් ඔයාටයි. මගේ දූලා මේ ඇඳුම් අඳින්නේ නෑ'

මසායා සාන්ට හොරෙන් මං ඔයාට ඇඳුම් ගෙනත් දුන්නෙ ඔයාගේ ...

ගෙන. සතුට කවුරුවත් ගෙනත් දෙන්නෙ නෑ නූපා සාන් අපි සතුට හොයාගන්න ඕන. මට මගේ ස්වාමිපුරුෂයා සතුට දුන්නෙ නැහැ.

'මම දන්නවා. සෝරා සාන් ගෙනත් දුන්න ඇඳුම් දූවලාගේ නොවන බව. ඒවා ඔයා අලුතින්ම මිලදී ගත්තු ඇඳුම්. මහ උණුසුම් රටක මලක් හිම ගොඩක ඔබලා මැරෙන්න දෙන්න බෑ කියලා ඔයා මං වෙනුවෙන් රහසිගතව කළ දේවල්. මං රහසිගතව ඉවසාගෙන සිටියා.

යන්න ඕන තාරුකාව ළඟට නම්, මොන විදියෙන් හරි තාරුකාව ළඟට යමු කියලා සෝරා සාන් කිව්වනේ.

නූපා අම්මගෙයි - තාත්තගෙයි මළගෙදරට ආවෙ නෑ කියලා ගමේ මිනිස්සු හරියට දොස් කියනවා කියලා චන්දනක්කා ලියලා එවලා තිබුණා.

කමක් නෑ සෝරා සාන්.

නුවර පළාතෙ පත්‍රයක ලියලා තිබුණු වගන්තියක් ඇස් ඉස්සරහ සිතුවම් වුණා. අනගාරික ධර්මපාල තුමාගේ වගන්තියක් හැටියටයි ඒක ලියලා තිබුණේ. සිංහල මිනිස්සුන්ට සේවය කළත් බනිනවා. සේවය නොකළත් බනිනවා. සේවය කරනවා වැඩිවෙන කොට හොඳටම බනිනවා. ඉතින් සේවය කරන කෙනෙක් ඒ ඇනුම්බැනුම් ඉවසන්න පුරුදු වෙන්න ඕන කියලා. ගමේ මිනිස්සු මොනවද දන්නෙ කියලා කාගෙන් අහන්නද ? මම චන්දනක්කට පිළිතුරු ඇරියෙ නැහැ. චන්දනක්කටත් බැරියැ ගමේ මිනිස්සුත් එක්ක එකතු වෙලා මට දෝෂාරෝපණය කරන්න. පරිගණක පළිබෝධවටත් එක්කම. දුනු, ඊ තල, පිහි, කඩු බෝම්බ ආදී සියලු දේවල් මට විරුද්ධව සන්නතකයෙ ඇති. වාසනාට තවත් පුතෙක් හම්බ වුණා කියලා ඒ ලියුමෙ තැනක පුංචියට ලියලා තිබුණා. ඒ කතාවෙත් ලොකුවට ලියන්න තිබුණෙ.

මට ලැබිලා තියන්නෙ මොන තරම් සම්පතක්ද ? අමතක ...

වැඩෙන හැටි බලන්න. ජපන් බෝනික්කා. ජපන් මිණිබිරි. මේ දරුවා උපදිනකල්වත් පණ ගැටගහලා තියාගන්න බැරිවුණා නේද? පණ ඉතින් අපිට ඕන විදියට ආරක්ෂා කරලා තියාගන්න පුළුවන් දෙයක් ද? දුන්නා වගේම අරගන්නවා. දෙන වේලාව තීරණය කරන්නවත් නැහැ. ගන්න වේලාව ඊටත් වඩා අවිනිශ්චිතයි. දැන් අම්මා වෙනුවට මට ඉන්නවා දුව. කසුමි උපදින කොට මම ආඩම්බර වුණේ නැහැ. දරුවට මගේ හැඬුම ඇහෙන්න හොඳ නැහැ කියලා මං හිතුවෙ. කසුමි එන්න ඕන හිනාවෙන් පිරුණු ලෝකෙකටයි. ඒ ලෝකය හදන්නේ මමයි. කසුමි, තුඹ දුවෙක් නිසා තුඹ කිරි උරා බොන කාලයෙ ඉඳලම ආරක්ෂා කරගන්නට අවශ්‍යයි. මට අවුරුදු තුනේදීත් මම ලිංගික මෙවලමක් වුණා කසුමි. අවුරුදු තුනක ළමයෙකුට ඒකත් එක විදිහක සෙල්ලමක්. ඒත් හරි අමාරු සෙල්ලමක්. සෙල්ලමට ලැබෙන තෑග්ග පාට පාට ලොසින්ජර අහුරක්. ප්‍රණීතකාර තෑග්ගයි. ළමයින්ට අපමණ ආදරය කළ අම්මයි ලොසින්ජර අහුරකට කරන්න පුළුවන් දේවල් දැනගෙන හිටියේ නැහැ. ඒ වගේ පාට පාට ලොසින්ජර වලින් ඔයාව බේරා ගැනීමේ වගකීම [illegible] [illegible] කසුමි. [illegible] !

තුඹේ පියාට පිය පදවිය ලැබුණෙ අවුරුදු පහක් තිස්සේ. මසායා සාන් හැමදේටම බෑ බෑ කියන එරෙවෙක් තමයි. ඒත් කසුමි පිළිසිඳුව ගත්තට පස්සෙ මසායා සාන් වෙනස් වෙන්න ගත්තා.

'මම රස්සාවෙන් අස්වුණා.'

'ඇයි ?' මගේ හිතේ ප්‍රශ්න ගොඩ නැගෙන්න ගත්තා එකපිට එක. රස්සාවක් නැතුව අම්මවෙත් දරුවෙත් රැකගන්නේ කොහොමද ?

'තනියම දාලා යන්න බැහැ. දරුවා ලැබෙන තුරු මං නුසා සාන්ව පරිස්සම් කරන්න ඕන. ගබ්සා වුණොත් එහෙම.'

මිනිස්සු හිනාවෙන [illegible] මසායා සාන්. දරුවා ගබ්සා [illegible]

[illegible] ගල් ඉබ්බා මුරණ්ඩු කමට ගෙදර නතර වුණා. මසායා සාන් මගේ හැම ඉරියව්වක්ම කෙරෙහි පරීක්ෂාවෙන් හිටියෙ. ජීවත් වෙන්නෙ කොහොමද?

ඉතින් ජීවත් වෙන්නෙ කොහොමද?

මම විශ්‍රාම ගන්නවා. අපිට විශ්‍රාම වැටුප ඇති නුසා සාන්. පුම්බා ගණනක් තර්ක කළත් ගල්ඉබ්බා ගල් මතයෙම හිටියා.

මසායා සාන් මං එං වුණේ කසුමි හම්බ වුණාට පස්සේ. මං එං ගිරියට වැඩිය අවුරුදු දහයකින් තරුණ වුණා. සත්ගේ නගරයේ කාගෙවත් මතකෙට නොඑන මිනිහෙක් කාගෙත් මතකෙට එන මිනිහෙක් බවට පත්වුණා.

නුසා සාන්ගෙ මහත්තයා! අර ලංකාවෙන් ආව නුසා සාන්ගෙ මහත්තයා. මසායා සාන්. සත්ගේ නගරය මං එං ව එහෙම ලියාපදිංචි කළා.

කසුමිව [illegible] කසුමිට අත්තම්මලා [illegible] මසායා සාන්. සත්ගේ නගරේ අත්තම්මලා හැමෝම කසුමිගෙ සුරතල් බලන්න ආවා. නුසා සාන්ට එපන්ම ජපන් බෝනික්කෙක් හම්බ වෙලා. [illegible] දැනිය නම් සෝරා සාන්.

'ඔයා සත්ගේ නගරෙ රූප සුන්දරී' සෝරා සාන් කියන්නෙ පදරෙ ඉතාලම මාතෘවෙන්. මං එං ළඟට වෙලා බලන් ඉන්නෙ [illegible] කසුමි බබාට වතුර පෙවෙයි. කසුමි බබාට [illegible] යයි. කසුමි බබාට අසනීප වෙයි.

'මසායා සාන් මං දරුවො දෙන්නෙක් හදලා වඩලා අම්මා කෙනෙක්' මං එංගෙ හිතේ නොසන්සුන්කම තේරුම් ගත්ත සෝරා සාන් කියනකොට මං එං අහක බලා ගන්නවා.

'සෝරා සාන්ම නාවන්න ඕනද කසුමිව? ඇයි නුසා සාන්ට ඒක තනියම කරගන්න බැරිද?' සෝරා සාන් [illegible]

'සෝරා සාන්ට ඒ කටයුතු කරන්න හොඳ පේරුමක් තියෙනවා. දරු දෙන්නෙක් හදපු කෙනෙක්නෙ. අනික මං ඔය ජපන් ක්‍රම දන්න එකක්යැ ?'

'ලංකාවේ නැලවිලි ගී කියන්නෙ. ඒ විදිහටම නාවන එකක් කළා නම් මොකද ?'

'මං දන්න නැලවිලි ගී තමයි කියන්නේ. මං වං ජපන් ගී කියලා නළවන එකනෙ ඇත්තෙ.'

'මං ඔය සෝරා සාන්ට කැමතිම නෑ'

'රහස් එළිවෙයි කියලද '

'මොන රහස් ද ?'

'ඔය එක එක රහස් ඇතිනෙ. එළිවෙයි කියලා සැක හිතෙන ඒවා'

'මට රහසක් නෑ'

ඒ වුණාට නුඹේ රහස මං දන්නවා. නුඹ ඉදිරියෙ ඉඳගෙන සම්සෙන් වාදනය අහගෙන හිටපු සායො සාන්ට නුඹ තවමත් කැමතියි. නුඹේ සම්සෙන් මං වෙනුවෙන් වාදනය වෙන්නෙ නැහැ. නුඹ තවමත් වාදනය කරන්නෙ සායො සාන් වෙනුවෙන්. ඒත් දැන් විවාහයකින් විතරක් නෙවෙයි දරු බැම්මකිනුත් අපි බැඳිලා. නුඹට බැරිද මං වෙනුවෙන් සම්සෙන් වාදනය කරන්න ? දැන් ඔය තරුණ පාටකුත් ඇවිල්ලා තියෙන්නෙ. වාදනය කරනවා නම් අපිට අහගෙන ඉන්නත් පුළුවන්.

අපි කසුමිව හදමු. කසුමිට ලස්සන ළමා කාලයක් දෙමු. අපි දෙන්නා එකතුවෙලා කසුමිගෙ දෑතින් අල්ලාගෙන ළදරු පාසලට එක්කගෙන යමු. අම්මෙකුයි දුවෙකුයි අතර ඇතිවෙන මහා බන්ධනය පසුපස ඉන්න මහා වෘක්ෂය ඔයා වෙන්න මං වං. ඔයා මට නුදුන්නෙ දෙන්න බැරි දේ. ගන්න පුළුවන් ඉහළම දේ මං [illegible] තියෙනවා. ස්තූතියි.

පරම්පරා ගේ බේරගන්න මං වං මට හොරෙන් කළ මෙහෙයුම සම්පූර්ණයෙන්ම බිඳ වැටුණට පස්සෙ මං වං පාපොච්චාරණයක් කළා.

'මම ගේ බේරගන්න හැදුවා. මේ කාරණාවට මට මළවුන් සමාව දෙන්නෙ නැහැ. ඒත් මළවුන් අතරෙ ඉන්නවා. වැරැද්ද කරපු කෙනා.'

'දැන් මළවුන්ට දොස් කියන්නෙ මොකටද?'

'මම මේ ගේ බාර දෙන්න ඕන තුපා සාන්'

මීට ඉස්සෙල්ලා නම්, මං වං මේ දේවල් හැමදේම කතා කළේ එයාගේ සහෝදරියොත් එක්ක හොර රහසේ. පරාජය විතරක් මට හෙළිදරව් කරන්නෙ ඇයි ? ඒකත් හොඳ වැඩේ. පැරදුනානම් දණගහන්න මං ඉදිරියෙ.

කසුමි නම්බවුණාට පස්සෙ මං වං අමුතු වෙලා. පරම්පරා ගේය අභිමානත් එක්ක ලොකු [illegible] බිඳ වැටෙන්න හිටිය මං වං එහෙම බිඳ නොවැටුණේ කසුමි නිසා තමයි. ඔවිටෙ ගේ හදාගන්න තීරණය කළේ දහ අතේ හිතලා බලලා. හිතලා නොබැලුවත් දැන් තියෙන්නෙ ඔවිට විතරනෙ.

ඔවිටිවල ජීවත්වීම මගේ උරුමයක්. උරුමෙ ඒක නම් මං ඒක බාර ගන්නවා. හැබැයි දෙන විදිහට නොවෙයි. මටත් එහා මෙහා කරගන්න ඉඩකඩක් ඕන කරනවා. මං කවදාවත් උරුමෙ ඒ හැටියටම බාර ගන්න කැමැත්තක් නෑ. ජපානෙ ඉපදිච්ච මං වං පරම්පරා ගෙයක් අතෑරලා ඔවිටක පදිංචියට යනවා නම්, ඒකට හිත හදාගන්නවා නම්, වෙන රටක ඉඳලා ආපු මට හිත හදාගන්න බැරි මොකද? බත්තරමුල්ලෙන් සන්ජෝ නගරෙට ආවා නම්, බත්තරමුල්ල අත ඇරලා ආවා නම්, සන්ජෝ නගරෙ කොතන හිටියත් එකනෙ. ගමයැ? රටයැ? ඉපදිච්ච දා ඉඳලා හිටපු ගෙදරින් යන මිනිහට තියෙන දුක්ඛ දෝමනස්ස මට ඇති වෙන්න [illegible]

කරගන්නයැ කිසි දෙයක්. අගෝස්තු දහතුන්වැනිදාට ඇවිත් දහසය වැනිදාට යනවා. වැඳුම් පිදුම් ලබනවා. මළවුන්ට ගේ බාර දීලා ජීවත් වෙන උදවිය බැහැර වෙනවා. අවුරුද්දක් තිස්සෙ මළගිය උදවිය ආපහු ගෙදර එන්න අවුරුදු එනකල් බලාගෙන හිටියට අත්තලා, මුත්තලා, කිත්තලා, කිරි කිත්තලා, කිරි කැ මුත්තලා ඇදි කිසිම කෙනෙක් මේ මහ ගෙදර ආරක්ෂා කරගන්න උත්සාහයක් ගත්තද ? ඔය මළවුන්ට වැඳලා වැඩක් ඇද් ද ? ජපන් නෑයෝ ටික ගෙදරට ඇවිත් මළවුන්ට වැඳ වැඳ ඉඳලා රහසෙන් කතා කරන එකනේ කරන්නෙ. මොනවද නෑයො ඔය හැටි රහස් කතා කරන්නෙ ? ලංකාවෙන් ආපු ගෑනිගෙ වගතුග. දිග පලල. චාරිත්‍ර වාරිත්‍ර නොදන්නකම. මූනිච්චාවට නම් හිනාවෙලා ඔයාගෙ හමේ පාටට මං හරි ආසයි කියයි. ඒත් හැරුණු ගමන් හිනාවෙන්නෙ අතින් කට වහගෙන. උඹ ඇඳ ගනින් කියනවා වගේ.

'මං ලංකාවෙ කෑමක් හදලා තියෙනවා. වෙනස් කෑමක්නෙ. රස බලන්න කැමති ද ?' කියලා මං ආරාධනා කළා මුල් දවසක මං එංගෙ සහෝදරී කිව්වා දැන් බඩගිනි නෑ කියලා. සහෝදරයා කසාද බැන්දටද තරහ එහෙම. නැත්නම් ලංකාවෙ ගෑනියක් කසාද බැන්දට ද ? ලංකාව කියන්නෙ හොඳ සංස්කෘතියක්, ඉතිහාසයක් තියෙන රටක්. ඔළුගෙඩි උදුම්මගත්තු ජපන් ඥාතිවරියට මේ විදේශික විවාහයෙන් නැති වෙච්ච දේ ගැන හිතන්නෙ රටක රාජ්‍යයක ස්වාධිපත්‍යය නැති වුණා වගේ. මේ ලෝකෙ ඉන්න මිනිස්සුයි ගෑනුයි එකම අච්චුවෙනෙ. වෙනස තියෙන්නෙ හමේ පාටෙයි, කතා කරන භාෂාවෙයි, නාස් පොල්ලෙයි විතරනෙ. සමහර උදවියට මුක්කං නාස් පොල්ලක් උරුම වෙනකොට තව සමහරුන්ට දිග නාස් පොලු උරුම වෙනවා. ඇස්වලත් වෙනස්කම් තියෙනවා. හැඟීම්වලයි, මූලික වශයෙන් ශරීරයෙ පිහිටීමෙයි, අවශ්‍යතාවලයි වෙනසක් නැහැනෙ.

'තංගිලා කියන විදිහටයි ඔවිටෙ ජලෑන අඳින්නෙ. ඒ ගොල්ලො කාරණා දන්නවනෙ' කියලා බැරැරුම් තාලෙට මං එං කිව්වෙ ජපානෙ ...

මම කසුමිව පසුවෙ එල්ලගෙන කසුමිත් එක්ක කතා කර කර නගරයට ගියා. කසුමි ඔය ඔවිටෙ හදන ගෙදර ඉන්නෙ අපි දෙන්න නම් අපි දෙන්නට ඕන විදිහට ගේ හැදෙන්න ඕන. මළවුන්ගෙ අවුරුද්දටයි, පෙට්ටගම්වල තියෙන ඒවා හාරලා ගෙනියන්නයි එන නෑදෑයින් ඔය ගේ සැලසුම් කරනවට ඔයා කැමති නැහැ නේද ? ඔයත් ජපන් ජාතිකයෙක් තමයි. ඒත් සාධාරණය කියලා දෙයක් තියෙනවනෙ. ඔයා තනිකර ජපනුත් නෙවෙයි. ජපනුයි සිංහලයි. සීගිරිය වගේ සුන්දර මාලිගාවක් හැදුවෙ ලංකාවෙ මිනිස්සුනෙ. කැටපත් පවුරෙ කවි සින්දු ලිව්වෙ ලංකාවෙ මිනිස්සු. සීගිරි ගල මුදුනෙ මහ මාලිගාවක් හදලා හොඳ වාරිමාර්ග පද්ධතියක් හැදුවෙත් ලංකාවෙ මිනිස්සු. ඔය පෙට්ටගම් අස්සෙ අත දදා පරම්පරාවෙ ශේෂ පත්‍ර ලියන්න හදන උදවියට වැඩිය මගෙ ගෙදරක, මට ඕන කරන දේ මම දන්නවා. නසාදයක් තියෙනවනෙ. ඉඩකඩම් හා දේපල වෙළඳාම් ආයතන කීපෙක තියෙන නොම්ලෙයේ දෙන ගෘහ නිර්මාණ සැලසුම් මම එකතුකර ගත්තා. මටා ගැලපෙන්නයි, ජපානෙට ගැලපෙන්නයි, මං එං කෝප නොවෙන්නයි ගෙයි සැලසුම ඉදිරිපත් කරන්න ඕන. මං එං මගේ සැලසුම පැත්තකට විසි කළා. මූණ පරුසු වෙච්ච දෙහි ගෙඩියක් වගේ. විසි කළාට හදන්න වෙන්නෙ ඔය සැලැස්මට තමයි. වැසිකිළියට ඒ දඬු දිගේ යන්නයි, මේ හැටි සීතලේ වෙව්ලන්නයි බැහැ. උණුසුම් රටක පිපිච්ච මලක් හිම රටකට ගෙනත් හිම ගොඩක ඔබන්නද හදන්නේ ?

ගෑනු මෝඩයි කිව්වා. එයාගෙ සම්භෙන් වාදනය අතීතයේ පෙම්වතියකට විතරයි. කෙට්ටු හූනු පැටියෙක් වගේ මම බලාගෙන ඉන්නෙ නැහැ. මං එං ගේ හදනවා නම් මගේ ජලෑනට හදලා. ඇත් යම් සීමාවකට දබර කරගන්න භාෂාව දන්නවා. වචන ටික වුණාට, ඒ අවශ්‍යම වචන. මට ඒ ඇති හොඳටම. සෝරා සාන් කිව්වේ දබර වීම නවත්තන්න කියලා. සෝරා සාන්ට ගරු කරනවා මුළු හිතින්ම. මාලිගාවක්, හරි පැල්පතක් හරි හැදෙන්න ඕන දෙන්නටම ඕන හැටියට. සාකච්ඡා මාර්ගයෙන් බැරිනම් මට

අවසානයේදී ජ්ලෑන සාකච්ඡා කරන්න තතමි පැදුරේ කොට මේසය ළඟ ඉඳගන්න මට අවස්ථාව ලැබුණා.

'මගේ භාර්යාවටත් අදහස් තියෙනවා ගේ හදන සැලැස්ම ගැන' කාන්තාවක්, සැලැස්මක් ගැන කතා කිරීම, සැලැස්ම අඳින තැනැත්තාට කරන මහ මදිපුංචිකමක් වුණත් මං චං සැලසුම් ශිල්පියාට අදහස ඉදිරිපත් කළේ. සැලසුම් ශිල්පියා 'මදිපුංචිකමක් තෝන්නම්. කවුද, මේ විජාතික ගෑනි?' කියන බැල්මෙන්ම බිම බලාගෙන හිටියා.

'මගේ භාර්යාවගෙ යෝජනාවලට මගෙත් කැමැත්තක් තියෙනවා.' කියලා මං චං කියනකොට මං කසුමිව වැටෙයි කියලා අල්ලගත්තා. කසුමි හා හෝ ගගා සෙල්ලම් කතා කියමින් මගේ පපුවට තුරුළු වෙලා හිටියා. සැලසුම් ශිල්පියා කතා නැතුව බලාගෙන හිටියෙ මමනෙ සැලසුම අඳින්නෙ. මම අඳින සැලසුම බාර නොගන්න හේතුව මොකද්ද කියලා අහනවා වගේ.

'මේ තේ හුඟක් රසයි. බොන්න. ලංකාවෙන් ගෙනාපුවා' මං චං පෙරැත්ත කළා.

'වැඩිහරියක් ගෙදර ඉන්නෙ ගෑනු උදවියනෙ. ඒ ගොල්ලන්ට ගැලපෙන්න ගේ හදාගන්න එක හොඳයි' කියලා මං චං අවස්ථාවට පැලැස්තරයක් අලවන්න උත්සාහ කළා. සැලසුම් ශිල්පියා මං චං දිහා බැලුවෙ විජාතික තරුණ ගෑනියෙකුට ඔහේ හොඳටම බයවෙලා නේද කියලා අහනවා වගේ.

කසාද බඳින්නෙ කාවද කියලා නොදැන, ජපනෙක්ව කසාද බැඳීමෙන් හත්මුතු පරම්පරාවටම නිවන් සම්පත්තිය ලැබෙයි කියලා හිතාගෙන ආවා වගේ ජපානෙට ආවට එහෙම නොවෙච්ච හින්දා දැන් වෙනස්කර ගැනීමක් අවශ්‍යමයි. දැන් හැම දෙයක්ම වෙනස්කර ගන්න කාලෙ හරි. සෝරා සාන් පුරුදු කරවපු ඉවසීමයි, චර්යාවයි බෑග් මළු අස්සේ දාලා හංගලා එන්න ඕන කරන වෙලාවට, හැබෑ ගෑනිට එළියට ඇවිත් තමුන් වෙනුවෙන් කොම්බු...

'ගෙයි ඉන්නෙ අපිනෙ. අපිට ඕන විදිහට අඳිමු. කියලා මං කිව්වම මං චං ගැස්සිලා ගියේ සැලසුම් කරලා කරපු මිනිමැරුමක වගකුග ආරංචි වුණා වගේ. ආකල්ප වෙනස් වෙන්නෙ නෑ කියලා සෝරා සාන් කිව්වෙ මේ කතාව අහගෙන ඉඳලා. ඒක හරි පරස්පරයක්. සෝරා සාන් කරෝකෙ එකට යන්නෙ එන්නෙ තිල් පාට ඩෙනිම් කලිසමකුයි, තිල්පාට උඩු කබායකුයි ඇඳගෙන ලොකු තොප්පියකින් හිස විතරක් නෙවෙයි මූණත් භාගයක් වහගෙන. කරන්නෙ වැරදි වැඩක් කියන ආකල්පය හිතට ඇවිත් වගේ සෝරා සාන් ඇඳීම පැළඳීම කළේ. සෝරා සාන්ගෙ කරෝකෙ එකට එන්නෙ මැදිවයසෙ ඉන්න ටිකක් ක්ලැසික් උදවිය. බිව්වා, නැටුවා, ඇගලුවා, සින්දු කිව්වා වුණාට සාහිත්‍යයයි, සිනමාවයි ගැන ඇල්මක් තියෙන බව සෝරා සාන් කිව්වා. උදව්වට හිටියා තව ගෑනු දෙතුන් දෙනෙක්. දවසක් දෙකක් සේවිකාවො නැතිවෙලාවට උදව් කරන්න කියලා මගෙන් ඉල්ලීමක් කළාට ගල් ඉබ්බා අවසර දුන්නෙ නැහැ. ඒ හින්දා දවල් කාලෙ හිහිල්ලා අස්පස් කරන්න උදව් කළා. ගල් ඉබ්බා බඩගගා ඇවිදිමින් වැරදි හොයන්න.

මගේ හිතේ මහ ප්‍රීතිමත් හැඟීමක් ඇති වෙනවා කරෝකෙ එකේ ඉන්නකොට. හැමෝම දුක අමතක කරලා ප්‍රීතියෙන් ඉන්නකොට ඒ අහල පහළ ඉන්න උදවියගෙ හිතුත් ප්‍රීතිමත් වෙනවනෙ. මගෙ මහත්තයා ගෑනු සමාගමයේ ප්‍රීති වෙනකොට මම පිරිමි සමාගමයෙ ප්‍රීතිවෙනවා. හැබැයි සමාගමයෙ ස්වභාවය වෙනස්. සෝරා සාන් ග්‍රීන් ටී පැකට්ටුවක් තේ කෝප්පයට දාලා තැම්බෙන්න ඇරලා කිව්වා. මම ග්‍රීන් ටී බොන්න පුරුදු වුණෙත් සෝරා සාන්ගෙන්. සෝරා සාන් වගේ ඉවසිල්ලෙ තේ කෝප්පය බොන්න පුරුද්දක් මට තිබුණෙ නැහැ.

ගෙදර පිරිමියා ඇර අන් හැම පිරිමියෙක්ම හොඳයි කියලා හිතන මහ ඇඩි මානසික තත්ත්වෙකට සෝරා සාන් වැටිලා හිටියා. එතකොට ඔය මිනිහගෙ හොඳක් ඇත්තෙම නැද්ද ? එකම හොඳේ ...

'ඔයා දන්නවද සෝරා මං ළඟ දැන් කවුද ඉන්නෙ කියලා. සකේ බෝතලයක් ඔට්ටුයි ඔයාට කියන්න බෑ. මෙයාගෙ කිමෝනෝව අර ඔයාගේ දම්පාට සකුරා මල් එක්ක තියෙන කිමෝනෝව වගේ. ගානට් මාලෙකුත් පැළඳගෙන ඉන්නෙ.'

'ඔයා බීලා රත්තරන්'

'නෑ මං බීලා නෑ. මං සීයෙ ඉඳලා එකට ගනින්නද? එතකොට තේරෙයි මං බීලා නෑ කියලා. මේ කෙල්ල ළඟ තියෙන්නෙ මල් පොකුරක සුවඳ. එක ජාතියක නෙවෙයි එක එක ජාතියෙ. ළඟින් හෙලවෙන්න හිතෙන්නෙ නෑ සෝරා'

'ඔයා කරන විහිළුවලට සමහර වෙලාවට මට තරහ යනවා.'

සෝරා සාන්. එහෙම කියන්නෙ ස්වාමිපුරුෂයා කරන්නෙ විහිළුවක් නොවන බව දැනගෙනමයි.

කරෝකෙ එකේ ගීත ගායනා කරන්නයි, ළත වෙවී බීබී ඉන්නයි එන මැදිවයසෙ පිරිමියෙකුට ළං වෙලා ඒ පිරිමියා ඇඳගෙන ඉන්න වස්ත්‍ර ගැනයි, මූණෙ තියෙන රැවුල් කොට ගැනයි කතාකරන්න වගේ එකට එක කිරීමකුත් සෝරා සාන්ගේ හිතට ආවා. ඒත් කරෝකෙ එකේ ගීත ගායනාව හිතට උමතුවක් දුන්නා. තමන්ටම ආදරේ කරන්න හැඟීමක් දුන්නා. ඉස්සෙල්ලා තමන් තමන්ටනෙ ආදරය කළ යුත්තෙ. තමුන් තමුන්ට ආදරය කරන ප්‍රමාණයට වෙන කිසිකෙනෙක් තමුන්ට ආදරය කරන්නෙ නෑ කියන එක ගැන හැම දෙනාටම අවබෝධයක් තිබිය යුතුයිනෙ. ඒ අවබෝධය මට තියෙනවා කියලයි මං හිතන්නෙ නූපා සාන්. අම්මා විතරක් ව්‍යතිරේඛයක් වෙන්න පුළුවන්. වෙන කවුරුවත් නැහැ. හිනාවෙන, ගීත ගයන, නටන මිනිස්සු ගොඩක් මැද්දෙ ප්‍රීතිමත් සමාගමයෙ සැනසීමක් ලැබීම හරියට පැය කීපෙකට වේදනාවෙන් තොරව සිටීමට ගනන නිර්වින්දනයක් වගේ.

ගෑනියෙකුට තියෙන එකම ප්‍රශ්නෙ විවාහයයි, ස්වාමිපුරුෂයයි විතරද කියලා අයිසාවා මගෙන් ඇහුවා. කරෝකෙ එකට නටන්නයි, බොන්නයි එන අයිසාවාත් මැදි වියේ. මැදි වයසත් බලනකොට හරි විනෝදජනකයි. පිරිමියෙක් නම් කරන්නෙ බිරිඳගෙ නියපොත්ත තැලුණත් තමන්ට රිදෙනවා වගේ ඇලීමකින් බැඳීමකින් පෙනී හිටලා එළියට බැහැපු වෙලාවෙ ඉඳලා පංචේන්ද්‍රිය පිනවන්න අරමුණු හොයාගෙන යන එක. මට ඇහෙනවනෙ කරෝකෙ එකේ මැදිවියේ උදවිය කන බොන ගමන් කියන පුරාජේරු කතන්දර. කොයි කාන්තාවද ඒ උදවියගෙ පස්සෙන් නොඑන්නෙ?

මගේ ආකල්ප ගැන නූපා සාන් හිතන විදිහ වැරදියි. මගේ ආකල්ප සාපේක්ෂයි. මගේ ස්වාමිපුරුෂයා සම්බන්ධයෙන් ආකල්පයට වැඩිය වෙනස් මගේ දරුවන්ගෙ පියා සම්බන්ධ ආකල්පය. සමස්ත පිරිමි සංහතියම මනින්න බෑ මගේ ස්වාමි පුරුෂයා දිහා බලලා. හැබැයි පිරිමින්ගෙ තියෙනවා පොදු ලක්ෂණ. ඒ පොදු ලක්ෂණ වැඩියෙන් තියෙන මිනිහෙක් මගේ ස්වාමිපුරුෂයා. එයා තනම් හතක් එළපු කාමරේකට ආලා වහන්න ඕන මිනිහෙක්. නූපා, තනම් හතක් එළන්නෙ හරාකිරි ක්‍රමයට බඩ කපාගන්න කාමරේටයි. ඒවගෙ කාමරේක ඉඳගෙන මොහොතකට දෙකකට හරි ජීවිතය මෙනෙහි කරන්න හරාදා සාන්ට අවස්ථාවක් ලබා දෙනවා නම් තනම් පැදුරටත් තවදුරටත් වටිනාකමක් ලැබෙනවා. ඒත් හරාදා කියන්නෙ හරාකිරි ක්‍රමයට හරි, වෙනත් ක්‍රමයකට හරි ජීවිතය අතෑරලා යන මිනිහෙක් කියලා මොහොතකටවත් හිතන්න එපා. අනික ඉතින් මොන ආකාරයට හරි ළමයින්ට තාත්තෙක් ඉන්න එකත් හොඳනෙ. හැංගිලා බය වෙන්න හරි. අපේ තාත්තගෙ විගඩම් කියලා හිනාවෙන්න හරි.

ගෙදර ප්ලෑන ඔයාට ඕන විදිහටම ඇඳගත්තා නේද නූපා. ඔයා මසායා සාන් මැට්පිඩක් කරගනියි කියලා මට කීප වතාවක් හිතුණා. මසායා සාන් හීලෑ කරගන්න. ඒකෙ වරදක් නෑ. ඒත් මසායා සාන් කියන්නෙ අවදි කරගන්න ඕන මිනිහෙක්, මිනා

නිරාමිස ප්‍රීතියකුයි එකතුවෙන සන්ධිස්ථානයකට අපි අරගෙන යන්න පුළුවන් විදිහට සම්ෂෙන් වාදනය කරන තවත් කෙනෙක් මේ සන්ජෝ නගරයෙ නෙවෙයි නීගතාවෙවත් නැතුව ඇති. ඒ දවස්වල තට්ටු නිවාසය ළඟින් යනකොට සම්ෂෙන් වාදනය එක්කම බටනළා හඬකුත් ඇහෙනවා. සම්ෂෙන් එකයි, බටනළාවයි ආදරෙන් ඇඬුවා. අන්න ඒ සුන්දර පුරුෂයා හොයාගන්න. මසායා සාන්ට, නූපා සාන් නැතුව බැහැ. හැමදේටම එපා එපා කියන්නෙ වෙන විදිහකට ආරක්ෂා කරන්න නොදන්න හින්දා. ගේ ඇතුළෙ හිරකරගෙන ඉන්න හදන්නෙ විදේශිකයෙක් හැමෝගෙම ඇහැ ගැටෙන හින්දා. කිමෝනෝවක් අන්දලා ගේ අස්සෙ තියාගන්න උත්සාහ කළේ නැද්ද? පය පටලවලා බිම වට්ටන්න උත්සාහ කළේ නැද්ද? කරෝකෙ එකේදි මං මිනිස්සුන්ගෙ, ගෑනුන්ගෙ අපමණ ප්‍රේමකතා අහනවා. සමහර ඒවා අහන්න පිළිකුල්. සමහර කතා ප්‍රේමය වැහිච්ච කතා. එක වයසක මහත්තයෙක් ඉන්නවා ඇවිල්ලා ඉඳගන්නත් ඉස්සෙල්ලා මං ළඟට ඇවිත් මගෙ මූණ ඉඹලා යනවා. එක් එක් මිනිහට එක එක් ලෙඩ. ඒත් ඇත්තම කියනවා නම් ඒ මිනිහා මගේ මූණ නොඉඹ ගිහින් ඉඳගත්තොත් මගේ කම්මුලටයි හිතටයි වේදනාව දැනුණා.

සෝරා සාන්ගෙ මූණ ඉඹින වයසක මිනිහා මං දැකලා තියෙනවා. ඇයි සෝරා සාන්මනේ මට පෙන්නුවේ. මං චං ගෙ වයසෙ විතර ඇති නේද? මං චං මූණ ඉඹින්නෙ බයවෙලා වගේ. සම්ෂෙන් එක හැමදාම පිහදානවා. තත් හඬවලා බලනවා විතරයි. වාදනය කරන්නෙ නැහැ. සම්ෂෙන් වාදනය කරන්නවත්, මූණ ඉඹින්නවත් නිස්කලංක හිතක් මං චංට නැහැ. ඒත් මං චං දැන් බොහොම අල්පයක වෙනසක් පෙන්නනවා. තාත්තෙක් වෙච්ච ප්‍රීතියට තනියම හිනාවෙනවා.

'ඔයාගෙ උපන් දිනේට මං කිරිබත් හදන්නද මං චං? තෑග්ගක් ගන්න නම් සල්ලි නැහැ' මං චං ගෙ උපන්දිනය දා මං ඇහුවා.

මං චං කිව්වා. මං චං ජීවත් වෙන්නෙ වෙනදා හිතට නොදැනුණු තරමේ මහ ලොකු ආසාවකින් කියලා කිව්වා.

'මං අවුරුදු එකසිය විස්සම ජීවත් වෙනවා. කසුමි දාලා යන්න බැහැ මළවුන්ගෙ ලෝකෙට'

'මම නම් මැරිලා යන්න කැමතියි.'

ඒ කතාවට මං චං මුළු දවසම රණ්ඩු වුණා. මං චං, මං මැරෙනවට බයද? එතකොට කසුමි බලන්න කෙනෙක් හොයා ගන්න බැරිවෙයි කියලද? මං දන්නවා ඔයා මැරෙනවට බයයි. දූව බඩේ ඉන්න කොට ඔයාගෙ බඩේ දූව ඉන්නවා වගේනෙ මාව පරිස්සම් කළේ.

'මට මදුරු කොයිල් පිච්චෙන සුවඳ කන්න ආසයි.'

'මෝඩයා සුවඳ කියන්නෙ කන්න පුළුවන් දෙයක්ද?'

පරිස්සම් කළේ මාවද? මගේ කුස ඇතුළෙ හැදෙන වැඩෙන කලලයද? තමන්ගෙ දේ පරිස්සම් කරනවනෙ නේද?

'දත් මැදලා හොඳට කට හෝදන්න' නානකාමරය ළඟ හිටගෙන මංචං උපදෙස් දුන්නා.

'දත් මැදලා කට හෝදගන්න එක මගේ වැඩක්නෙ'

'හොඳට හෝදන්න ඕවයෙ වස විස. බබාට හොඳ නැහැ'

'බබා විතරද පරිස්සම් කරන්නෙ?'

'හොඳට කට හෝදගන්න.'

කටේ දත් බෙහෙත් සුවඳ රැඳිලා තියෙනවද කියලා ඉඹලා බලන තරමට මං චං කලලය ගැන පරිස්සම් වුණා. මිනිස්සු

ඔව්වෙ ගේ හැදුවේ තට්ටු දෙකට. මගේම ඇස් ඉස්සරහ මිට මං වෙනුවෙන් තවත් ඕව්ටක ගෙයක් හැදෙන හැටි මං කසුමිත් එක්ක බලා හිටියා. මං චං ගෙය හැදීම වෙනුවෙන්, ඉතුරු කරපු හැම සතයක්ම වියදම් කළා. මං චං කිසිම දේකට වියදම් වෙන ගණන් තියන්නෙ නැහැ. මාව ලංකාවෙන් ගත්තෙත් සල්ලිවලට බව මම දන්නවා.

'මං චං කීයකටද මාව ලංකාවෙන් ගත්තෙ?'

'ගණන් ඕන නැහැනෙ.''

'ගත්තු ගාන වටිනවද?'

මං චං හිනාවුණා. ගත්තු ගණන නොවටින්නෙ මොකද? ආලයකුත් නැතුව, බඳින දවසට කලින් දැකලත් නැතුව ජපානයෙ ඉඳලා ආපු වයසක මනමාලයට ක්ෂණික නූඩ්ල්ස් එකක් වගේ බිරිඳ වීමට කැමති වීමේ මෝඩකමට වටිනාකමක් මුදලින් කියන්න බැහැනෙ. එකම හොඳ කාරණාවකට තියෙන්නෙ ලංකාවෙ මිනිස්සු වගේ නෑදෑයොත් එක්ක එකතු වෙලා ඇඳ රෙදි පරීක්ෂා කරන්න සූදානම් නොවීම විතරයි.

මිටි, තරබාරු, තරුණ සැලසුම් ශිල්පියා ගේ හදන වැඩවලදී නිතර ආවා ගියා. ජපානෙ පන්සලක තියෙන වහලයක් දාගන්න ඕනකම මට තිබුණත් ඒ අදහසට ස්වාමිපුරුෂයයි, සැලසුම් ශිල්පියයි දෙන්නම විරෝධය පළ කළා. දෙන්නම සලකා බැලුවෙ වියදම. ගෙවල් දෙකක් හදන්න වෙන්නෙ නැහැනෙ මං ආසයි පන්සල් වහලයක් ගහගන්න පුළුවන්කම තිබුණා නම්. ඒත් ඉතින් මුළු සැලසුම වෙනස් කරගෙන මට ඕන හැටියට ගේ සැලසුම් කරපු එකේ වහලය හරි ඒ දෙන්නා කැමති විදිහට කරපුවාවෙ කියලා හිතුවා. කවදා හරි දවසක එහෙම වහළයක් ගහන්න පුළුවන් වෙයි.

පොලොවෙ අලුත් සුවඳත් එක්ක පොලොවෙන් උඩට මතු වෙමින්

සල්ලි නැති බවයි. කොහොමහරි සල්ලි හොයාන්න වෙහෙසෙන බවයි පෙනෙන්න තිබුණා.

මහ වියදමක්නෙ. ගේ මහ ලොකු නැහැ. පහළ නානකාමරයයි, වැසිකිළියයි, සාලයයි, කුස්සියයි, පොඩි බරාදයයි, උඩ නිදන කාමර තුනයි. පරම්පරා ගෙදරක් එක්ක බලනකොට නම් සෙල්ලම් ගෙයක් වගේ. හැමදේම අලුත්. ගේ පසුපසට වෙන්න ලොකු ඔව්ට. ගේ ළඟම පීච් ගහක්. ගෙවත්ත වටේටම සකුරාගස් පෙළක් ඉන්දවන්න කියලා මං, මං චංට කිව්වා. උඩුමහලෙ ඉඳලා බලනකොට සකුරා මල් පිපිලා තියෙන හැටි පෙනෙයි. පරණ ප්ලම් ගහේ මල් පිපිලා තියෙනවා. ඔව්වෙ වගාවක් කරගන්නත් පුළුවන්. මං චංට පුළුවන්නේ මොනවාහරි වගා කරන්න. මටත් පුළුවනි කසුමිව කරේ එල්ලගෙන උදව් කරන්න.

උණුසුම් රටකින් ආව මලකට සීතලට ඔරොත්තු දෙන්න පුළුවන් වෙන්නයි මං ගේ හැදුවෙ කියලා මං චං ගෙට ගොඩවැදෙන දවසේ හිනාවෙමින් කිව්වා.

ඇත්ත! ගෙදර උණුසුම හොඳටම තිබුණා.

සෝරා සාන්, හරාදා සාන් එක්කම ඇවිත්. ලොකු චිත්‍රයක් තෑග්ගට අරගෙන. හරාදා සාන්ගෙ කම්මුල් උඩට ඉස්සිලා තිබුණෙ පැව් ජම්බෝල ගෙඩි දෙකක් වගේ. මම රෝසිටත් ආරාධනා කළා. රෝසි පුදුම වුණේ සෝරා සාන් වෙන මහන්සිය දැකලා. නෑදෑයෙක්වත් ඒ විදිහට මහන්සි වීම බලාපොරොත්තු වෙන්න බැහැ කියලා රෝසි, සෝරා සාන්ව කතාවට අල්ලගන්න කුරුමානම් අල්ලමින් හිටියා. රෝසි සාන් කියලා කියන්න දිව නැමෙන්නෙ නැති වුණත් මම රෝසිට කතා කළේ රෝසි සාන් කියලා. රෝසි ඒ ඇමතීම සැලකුවෙ ගරු නාම්බුවක් හැටියට. බලනකොට ගරු නාම්බුවකුත් තමයි. පහළ ඉඳලා ඉහළටම වෙනසක් නැතුව දෙන ගෞරව නාමය සාන්.

සහෝදරියො දෙන්නයි, විවාහක පුරුෂයො දෙන්නයි, දරුවොයි ඇවිත් කාමරවල දිග පළල මනිමින් හිටියා. 'මං ආසම තැන බුදුගෙය' කියලා සාලෙ මැද්දෙ තතමි පැදුරෙ ඉඳගෙන මං වං කාටත් ඇහෙන්න කිව්වා. වෙන තැනකට ඔහේ ආස වෙන්නෙ කොහොමද කියන නෝක්කඩු හිතිවිල්ල හිත අස්සෙ පුපුරු ගහන්න වුණා. රෝසි සාන් මා ළඟට ඇවිත් රහසෙන් වගේ සරදමක් කළා. ඒක ක්‍රට කැඩිච්ච කතාවක්. කසුමි, තතමි පොළවෙ වැටි වැටි දුවනවා. 'කසුමි බබා හරි හපනා දවසට කොළඹට යනවා' කියලා රෝසි සාන් කිව්වම මං කිව්වා දවසින් පුළුවන් වෙයි තමයි කියලා. ගුවන්යානය පුරුදු පරිදි පමා නොවුණොත් පුළුවන් තමයි. රෝසි සාන්ගෙ ජපන් ජාතික මහත්තයා රෝසි සාන් දිහා බලාගෙන ඉන්නෙ කවුරුහරි ඇල්පෙනෙත්තකින් ඇනලා හුළං අරියි කියලා බයෙන් වගේ. හරාදා සාන් බුදු ගෙය ළඟ දණගහගෙන එහි විසිතුරු නරඹමින් හිටියා.

'සෝරා සාන් ගෙ චිත්‍රය මෙතන එල්ලනවා' කියලා මං හැමෝම ඉස්සරහ මං වං ට කිව්වා.

'ඒක පස්සෙ තීරණය කරන්න' කියලා සෝරා සාන් මැදිහත්කරුවකු වීමෙ උත්සාහයක යෙදුණා. පෙම්වතියක් වෙනුවෙන් මුළු ජීවිත කාලෙම සම්සෙන් වාදනය කරන මිනිහට මේ චිත්‍රය විනිවිද දකින්න බැරිද ? හරාදා සාන් ආපහු හැරිලා බලනවා. හොඳටම සොබාවිකයි නේද ? බිරිඳගෙ චිත්‍රයක්. මීට ඉස්සර ඇකලා තියෙනවද ? හරාදා සාන්ගේ මූණෙ සතුටක ලකුණු මතු වුණා. සතුටුද ? සතුටු මොනවටද ? චිත්‍රයට ? හරාදා සාන් නැගිටලා ආවා. මං වං අනේ මගේ අලුත් ගෙයි බිත්ති කැත කරනවා නේද කියලා කෑ නොගැහුවට එහෙම අහනවා වගේ බලාගෙන හිටියා.

නූපා සාන් මට හිත ඇතුළෙන් අඬන්න හිතෙනවා. ඒවගේම මහ හඬින් හිනාවෙන්න හිතෙනවා. මගෙ චිත්‍රය ඔයාට වටිනවාද? ඔසායා සාන් කෝප ගස්සන්න එපා. මම වනාන්තරයෙ ඇඳිලගෙන ගියා. ක...

තමයි ඔය ගේ තිබුණෙ. ගේ බොහොම අබලන් පාටයි නේද ? වහළ පත්සලක වහළ වගේ. ඔය වහළෙට ඔයා කැමති බව මම දන්නවා. බලන්න ඔය දොරකොඩ තියෙන පීච් ගහේ මල් පිපිලා තියෙන හැටි. ඔය පිටිපස්සෙ තියෙන්නෙ ඇපල් ගස් දෙකක්. හරි හැඩයි නේද ඇපල් මල් ? බිත්ති, වරිච්චි බිත්ති වගේ. ගේ ඇතුළ මහ පාළු පාටයි. ඔය චිත්‍රයට මම දාපු නම 'වනාන්තරය'. ඇපල් ගස්වලට පිටිපස්සෙන් තියෙන්නෙ සූගී ගස්. හරියට කේතු වගේ නේද ? ඔය ගස් අස්සෙන් පිපිලා තියෙන්නෙ යාමා සකුරා. යාමා සකුරා කියන්නෙ කඳුවල පිපෙන සකුරාවලට. යාමා කියන්නෙ කන්දට. නූපා සාන් දන්නවනෙ පූජියාමා - පූජියාමා කියන්නෙ පූජ් ගිනිකන්ද. ඔය ඉස්සරහා ඇඳලා තියෙන්නෙ ෆූකී පැළෑටිය. ඔයා නෙළුම් කියලා රැවටුණාද ? කොළේ නම් නෙළුම් කොළය වගේ තමයි. ඕක හරි අමුතු මලකුයි පැළෑටියකුයි. ඉස්සෙල්ලම හැදෙන්නෙ මල් පොහොට්ටුව. කන කෙනෙකුට පොහොට්ටුව කාලෙම කන්නත් පුළුවන්. මල පිපෙන්නෙ ඊට පස්සෙ. ඔය මල්රේණුවලින් රස අච්චාරුවක් හදනවා. පැළෑටියෙ දළු දාලා කොළ එන්නෙ මල් පිපුණට පස්සෙ. බලන්න ඔය ගේ වටේ තියෙන ගස්වලට ජීවත් වෙන්න ලොකු ආසාවක් තියෙන බව පේනවා නේද ? ඔය ගේ ළඟ මම නැවතිලා බලාගෙන හිටියා නූපා සාන්. ඒ ගෙදර හිටපු මිනිස්සු තවමත් අවට සැරිසරනවා ඇති. මගේ පසුපසින් ඒ ගෙදර උදවිය එනවා. මිනිස් කටහඬක් නැතිවුණාට මිනිස්සු හුස්ම ගන්න හඬවල් ඇහෙනවා. කුරුල්ලන්ගේ ගායනාවල තියෙන්නෙ දුකක්, පාළුවක්. ඒත් ඒ දුකෙයි, පාළුවෙයි, සුන්දරකමක් වෙලිලා තියෙනවා. ඔය චිත්‍රය ඇතුළෙනුත් ඇහෙනවා නේද හුස්ම ඉහළ පහළ යන එන හඬ. හොඳ සද්දෙට ඇහෙනවා. මිනිස්සු මැරුණට මැරෙන්නෙ නැහැ. ජීවත් වුණාට ජීවත් වෙන්නෙත් නැහැ. මගේ ඇස්වලට පෙනුණෙ නැති වුණාට මගේ හිතට පෙනුණා. මිනිස්සු ජීවත් වෙනවා. ඒ මිනිස්සු හුගක් දුකින් ජීවත් වෙන්න ඇති. ඒ වගේ දුක්බර පින්තූරයක් ඔයා අලුත් ගෙදරට ගොඩවැදෙන දවසෙ ගෙනාව එක ගැන සමාවෙන්න නූපා සාන්.

මිත්තිය එළිය වුණා නේද? හොඳ මිත්තියක් උඩ [illegible] මිත්තියක්. කතා කරන මිනිස්සු ළඟ කතා නොකරන මිනිස්සු [illegible] ඇවිදින කසුම් ගිහින් මසායා සාන්ගෙ [illegible] එල්ලුණා නේද? කසුමිත් පොඩි චිත්‍රයක් වගේ. ඇවිදින චිත්‍රයක් හිනාවෙන චිත්‍රයක්. අඬන චිත්‍රයක්. කතා කරන චිත්‍රයක්.

'අද මිනිහා [illegible] සාටයි.' කියලා රෝසි සාන් කිව්වා. හරාදා සාන් දිහා බලලා රෝසි සාන් සිංහල කතා කරන්නෙ [illegible] වගේ. ඉතින් කතා කරන්නෙ පුංචිවින් වගේ. [illegible] සොලවගෙන [illegible]

රෝසි සාන්. මං එං ගෙ සහෝදරයා එන්න කතාවට [illegible] මිච්කො සාන්. එළුවළු වෙළෙන්දින් එන්න ගෙට [illegible] එතකොටයි. සහෝදරයෝ දෙන්නා. මිච්කො සාන් දැකලා [illegible] වුණා. මිච්කො සාන් හැම දෙනාටම හිස නමා ආචාර කළා. ඒ ආචාර කිරීමෙන් පස්සෙ මිච්කො සාන් අවසරයක් [illegible] මුළු ගේ පුරාම [illegible]

'ඔහේ හැම එකාම [illegible] කිය කියා මෙහෙම [illegible] හදාගන්නෙ කොහොමද? ඔහේට බෑ තමයි මේ ලංකාවෙ කෙල්ල නොහිටින්න' තමා පසුපස්සෙන් වැටිලා දේ පෙන්නාන්න ආපු මසායා සාන්ට මිච්කො සාන් කිව්වා. එළුවළු වෙළෙන්දී යාන්තමට හිනාවෙමින් පසෙකට වුණා. කසුම් බඩගිනි වෙලා අඬන්න පටන් ගත්තා. කසුම්ට බඩ පිරෙන්නෙ තනේ එල්ලිලා හිටියොත් විතරයි. අයිතිය තමුන්ගෙ කියන පූර්ණ විශ්වාසයකින් යුතුව තමුන්ට ඕන කරන සම්පූර්ණ වෙලාව අරගෙන තමුන්ම හුරතල් වෙච්චි සොඳුරු සුරතල් අභිනය පාමින් කිරි උරා බොන්න කසුම් පුරුදු වුණෙ ඉපදිලා දවසට දෙකට.

'අද මේ හොඳ දවසෙත් උඹට බැරිද මගේ ඇඳ ඇඳ නොහොයා ඉන්න?' කියලා මං එං රහස් හඬකින් ඇහුවා. මිච්කො සාන් යුගල ඇඳ දිහා බලලා හිනාවුණා.

[illegible] හිටියා මිච්කො සාන් කට [illegible] කතා කියන [illegible] මිච්කො සාන් කියන කතාවලට [illegible] යන්න [illegible] මසායා සාන් පුරුදුවෙලා හිටියා. [illegible] කියලා [illegible] ගෞරවයක් මිච්කො සාන් [illegible] තිබුණා.

'[illegible] නම් මෙච්චර [illegible]' කියලා මිච්කො සාන්. එළුවළු වෙළෙන්දීගෙ [illegible] යන්න වගේ එළුවළු වෙළෙන්දී දිහා බැලුවා. [illegible] නැහැ.

'අපේ තාත්තා [illegible] කියලා මසායා සාන් වෙළෙන්දී දිහාවි. මං දිහාවි මාරුවෙන් මාරුවට බැලුවා. මිච්කො සාන් [illegible] හැම දෙයක්ම [illegible] බලා කියා ගත්තා. ඇත්තටම මං එං [illegible] බලන්නෙ අවුරුද්දට කවදාහරි මේ ගේ ඇතුළට එන්න මිච්කොට පුළුවන්ද? උත්තරේ පස්සෙ කියමු.

ලංකාවේ කෑම හරි රසයි කියන උදවියයි. අපේ අච්චාරු කෑම නොකෑවොත් දිවට රසක් දැනෙන්නෙ නැහැ කියලා එළිපිටම කියන උදවියයි යන දෙගොල්ලොම ගෙට ගෙවැදීමේ ප්‍රීතිය භුක්ති වින්දා. හරාදා සාන් කන බොන අතරේ මිච්කෝ සාන්ට අභිනය මතක් කරමින් සරදම් කළා. මිච්කො සාන්. හරාදා සාන්ට නොයෙකුත් අවකැපෙන කතා කිව්වා. ඒ දෙන්නා කතාබහ කළේ එක කාලෙක, එක ඉස්කෝලෙක එක පන්තියෙ ඉගෙන ගත්තා වගෙයි. රෝසි සාන්, "හරාදා සාන්ට පෙරැත්ත කර කර ලංකාවේ කෑම කන්න කිව්වා. සෝරා සාන් හැමෝගෙම අඩුපාඩු බලමින් කෑම මෙසයෙන් අඩු පාඩු බලමින් කුස්සියෙන් සාලයටයි.

ගෙට ගෙවැදීමෙ නියම ප්‍රීතිය භුක්ති වින්දේ හැමෝම ආපහු ගියාට පස්සෙ. මං චං ගෙ සහෝදරියො දෙන්නා පිටවෙලා ගියේ මළුවන්ගෙ අවුරුදු දාට එන්නය කියලා කියාගෙන.

මං චං පැත්තකට වෙලා මහන්සි අරින්න පටන් ගත්තා. මං කසුමිව බලා කියා ගැනීමේ වගකීම මං චං ට පවරලා මගේ අස්පස් කළා. හුණ්ඩුවක් තමයි. ඒත් පිළිවෙළයි. මෙතනින් වහාම පිටවෙන්න කියලා දැන්වීම් එවන්න කෙනෙකුත් නැහැ.

'මං චං දැන් ගිහින් හෝද ගන්න' කියලා මං කසුමිව අතට ගත්තා. මං චං බොහොම සතුටින් නැගිටලා ගිහින් උණුවතුර බෙසමේ බැහැලා හිටියා. ඔය වයසට උණුවතුර බෙසමේ බැහැලා හිටියම හරි සනීපයක් දැනෙනවා නේද ?

මම කසුමිව නිදි කරවලා ඇඳේ මැද්දෙන් තිබ්බා.

'දොයියන්නෙ පුතේ මේ අපේ ගෙදර. මට පස්සෙ සීතල නෑ. උණුසුම්. කැමතියි නේද ඒ උණුසුමට.

මං චං ඇඳට වැටුණු හැටියෙ නින්දට ගියා. කොච්චර මහන්සිය තිබුණත් අපි අලුත් ගෙදර ගැන අද දවසේ කතා කරන්න ඕන නේද? පායන හඳේ එළිය නිදන කාමරයට ගෙනල්ල දෙන්න සැලසුම් ශිල්පියා උත්සාහ කළත් කවුරු එක්කද සඳ එළියෙ නැහැවෙන්නෙ?

පෙම්බරා ඒ හිස්තැන එහෙමමයි. හෙමිහිට වඩින්න සඳ එළිය යහන් ගැබට වඩින මේ රාත්‍රියෙ. මට හරි වෙහෙසයි තමයි. ඒත් ඒ වෙහෙස මැඩගෙන සතුටක් බෙදා හදා ගැනීමේ වුවමනාවක් ඇතිවෙනවා. ඒකෙ වැරැද්දක් නැහැ නේද ? මේ නිවහන හැදුවෙ ස්වාමිපුරුෂයා. ඒත් මේ රාත්‍රිය අයිති ඔබටයි. මටයි. මගේ හිතේ තියෙන සියලුම බලාපොරොත්තුයි, අලංකාරෝක්තියි මිශ්‍ර කරලා නිර්මා...

කියන්නෙ සුරතල් වීමෙ ඉඳලා, නැලවිල්ලෙ ඉඳලා, අදහස් හුවමාරු කර ගැනීමේ ඉඳලා මහා ගැඹුරු අන්‍යෝන්‍ය අවබෝධයක පිහිටලා මවුනොවුන් සොයා යාමේ අභ්‍යාසයකට නේද ? ඉතින් වඩින්න මේ නිදියහනෙ කොනකට. නැත්තම් අපි යමු හෘදයෙන් නිර්මාණය කරගත්තු සිහිනයේ නිදි යහනට. සැතපෙන්න නෙවෙයි අවදියෙන් ඉන්න. මට වුවමනා කරන්නෙ අවදිව ඉන්න ප්‍රේමයක්. බලන්න කසුමිගෙ මූහුණෙ තියෙන ශාන්ත, ළමා ඉරියව්. සමනළ ඉරියව්. ඒ සමනළ ඉරියව්, ඒ සමනළ සිතුවිලි කවදාවත් මම භුක්ති විඳින්න නැතුව ඇති. මම ආසා ඒ සමනළ සිතුවිලි ඇති වෙච්ච ගැහැණු දරුවෙකුගෙ ප්‍රාර්ථනා බෙදාහදාගන්න. පෙම්බරා, හඳ එළිය නිදි යහනෙ නැවතිලා.

මගෙ ස්වාමිපුරුෂයා ගොරවන සද්දෙ ඇහෙනවද ?

7

කුසුම් හිතට ප්‍රීතිය දෙමින් වැඩෙනවා. අම්මටයි - තාත්තටයි දරුවෙක් ලබා දෙන ප්‍රීතිය විස්තර කරන්න ශබ්ද කෝෂයක වචන තියෙන්න බෑ. හැමදාම ගායනා කරන කොහොක් වගේ. කුහු කුහු ගානවා. වැස්සට තෙමුණු රාත්‍රියක් වගේ හිතට සනීපයක් දෙනවා. හැමදාම පායන පුන්සඳක් වගේ එළියක් දෙනවා. කසුම්ගේ මුහුණෙයි, ඉරියව්වලයි, සුතරල් කතාවෙයි තිබුණෙ පුළු අත හැර නොයන සුවඳක්. ඒ ආදරයට, ඒ සෙනෙහසට පුද කරන්න කවුරුවත් නෑ. මං මුළු ලෝකෙටම ආදරය කරනවා. මට සන්තෝසෙන් ඉන්න පුළුවන්. එක අතකට සැප වගේම දුකත් සදාකාලික නැහැ. දුක වගේම සැපත් සදාකාලික නැහැ. කසුම් ඔයා සිරුරෙ දැවටෙන කොට, පුංචි පූස් පැටියෙක් වගේ ඇගේ වෙලිලා ඉන්නකොට ලෝකෙම අමතකයි තමයි. පුංචි වුණාට ඔයත් දන්නවා නේද තරහවෙලා ඉන්න. තරහ වෙන්න එපා පැටියෝ. මට තියෙන්නයි, දැනෙන්නෙයි, විඳින්න පුළුවන් වෙන්නෙයි. වැටකොටු බැමි, සීමාවල් නැති, උස්මිටිකම්, නැතිබැරිකම් නැති ඔයාගේ ආදරය විතරයි. ඔයා මාව ඔයාගෙ අම්මා හැටියට තෝරගත්තට ස්තුතියි පැටියො.

කසුමියි, අලුත් ගේයි මං වං ව වෙනස් කරලා. දරුවෙක් දැක්කට නිකමටවත් බලන්නෙ නැති මං වං ව වෙනස් කරලා. දරුවෙක් ...

'කුසුම් වගේ දරුවොනේ' තමුන්ට වගකීමක් තියෙනවා' කියලා මං වං හැමතිස්සේම කියන්න පටන් ගත්තා.

'වගකීමක් තියෙනවා තමයි' දරුවා වෙනුවෙන් [illegible] වෙනුවෙන්!

කල්පනා ශක්තියෙ පිරිහීමක්ද, එහෙම නැත්නම් දියුණුවක්ද, මං වං අලුත් පුරුද්දක් පටන් ගත්තා. ලියුං නැලී ලියන්න. එතාට මේසට ඒ ලියුං තැපැල් කරන්න පටන් ගත්තා.

'කාටද මච්චර ලියුම් ?'

'මට සමාජය වෙනුවෙන් වගකීමක් තියෙනවා.'

මං වං කිව්වෙ එහෙමයි. ළමයින්ට දෙමව්පියන්ගෙ සැලකිල්ලක් නෑ කියලා ඒ සමාජමය ප්‍රශ්නයට ගැලපෙන පියවර යෝජනා කරලා මං වං රජයේ කාර්යාලයට ලියුම් ලියන්න පටන් ගත්තා.

'එතකොට මං ගැන සැලකිල්ලක් නැති එකට පැමිණිලි කරන්නෙයි, යෝජනා ඉදිරිපත් කරන්නෙයි කොහොමද?' කියලා මං ඇහුවා. මං වං ඒවා නෑහුණා වගේ කටයුතු කළේ. මං වං උඩුමහලෙ කාමර තුනෙන් එකක් කාර්යාල කාමරයක් කරගෙන දිගටම පෙත්සම් ලිවීම කරගෙන ගියා. අලුත්කඩේට මේ පෙත්සම්කාරයව අරින්න තිබුණෙ.

'මට වෙලාවකට මේ මිනිහව මරන්න හිතෙනවා'

'කාවද නූපා සාන්?'

'මං වං ව'

'ඇයි?'

'ඒක ඉතින් ඔයා දන්නවනෙ නූපා සාන් කසාද බැඳලා එනකොටම'

මේ ගැනිත් ජපන් ගැනියෙක්ම තමයි. බැල මෙහෙවර කරගෙන ඉන්නවා. දරුවො හදනවා. උදේ ඊ නැතුව වෙහෙසෙනවා. කසාද බැඳලා එනකොටම කොහොමද මම දන්නෙ මේ මිනිහා හිතයි. කයයි දෙකම නැති මිනිහෙක් කියලා.

'ළමයා වෙනුවෙන්.'

'ළමයෙක් හිටියා කියලා තරුණ ශරීරයකුයි, තරුණ හිතකුයි වයස්ගත වෙන්නෙ නැහැ. දැන් මුළු ඊම කරන්නෙ ලියුම් ලියන එක!'

ඕවා හිත හිතා ඉන්නෙ ඇයි නූපා සාන්. මං වගේ චිත්‍රයක් අඳින්න, මල් හිටවන්න, කැලෑවේ ඇවිදින්න යන්න. දන්නවද හරාදා සාන් දැනුත් ගෑනු එක්ක මාසෙකට සැරයක් විතර විනෝද වෙන්න ඇවිදිනවනෙ. දැන් නම් මං ඒකට කැමතියි. මං ඒ විනෝද ගමන් යන්න කාමරේ හදලා දෙනවා. මේ චිත්‍ර අඳින්න කැලෑවට යනවා. කැලෑව මට ජීවිතය දෙනවා. ඔයාගෙ ගෙදර බිත්තියෙ එල්ලෙන්නෙ මගේ හිත. මගේ දුක. මගේ සතුට. මගේ බලාපොරොත්තුව.

හරාදා සාන් සූදුවටත් ගියා. ස්ත්‍රී සමාගමය හොයාගෙනත් ගියා. ස්ත්‍රියක් ළඟට යනවට වැඩිය සූදුවට යන එක හොඳයි කියල ඒ කාලෙ මම හිතුවා.

'සෝරා සාන්ට තිබුණෙ පයින් ගහල එළවන්න'

'මට එච්චර හයියක් නෑ'

'හයියක් ඇති කරගන්න ඕන. සූදුව ගෑනු සමාගමයට වඩා හොඳ වෙන්නෙ කොහොමද ?'

මට වර්ණනා කරනවා. හරියට ශෘංගාර කවි ලියන කවියෙක් වගේ.

ඒ කතාව කියපු සෝරා සානුත් හිනාවුණා. අහපු මාත් හිනාවුණා. මේ වගේ අන්දැකීම් බෙදාහදාගන්නකොට අපි දෙන්නට වයස් පරතරයක් තිබුණෙම නැති තරම්. සෝරා සාන්, කපුම්ට පුංචි පුංචි ඇඳුම් පොඩි ගෙනත් අන්දවලා ලස්සන බලන කොට නපුම් මෝස්තර නිරූපිකාවක් වගේ ඇවිදින්නෙ පොඩි කමට.

ළමයා ගබසා වෙයි කියා බයටයි, ඊට පස්සෙ ළඟ ඉඳගෙන ගේ හදාන්නයි කියලා හිතුවක්කාර කමට රස්සාව අතෑරලා දැම්මට පස්සේ මං චං ට රස්සාවක් හොයාගැනීම අමාරු වුණා. මෝටර් රථයත් විකුණලා දාපු හින්දා මං චං ඊ තිස්සෙ ලියපු ලියුම් අරගෙන තැපැල් කරන්න ගියේ බයිසිකලයෙන්. ඒක රෝස පාට ගෑනු බයිසිකලයක්.

'ඔක් මානසික රෝගයක්'

'මොකක්ද'

'මය ලියුම් ලියන්න එක'

'ඒක මගේ වගකීම. මේ රටේ තියෙන ප්‍රශ්න විසඳන්න ඕන. මං ආණ්ඩුවටයි, බලධාරී ආයතනවලටයි ලියන්නෙ ඒ ප්‍රශ්න විසඳගන්න. දන්නවද අල්ලපු ගෙදර අපරාධයක් සිද්ධ වෙනවා. මං ඉන්නෙ අවදියෙන්.'

'මං චං දන්නෙ කොහොමද? '

'මගේ හයවැනි ඉන්ද්‍රිය එහෙම කියනවා.'

'තියෙන පහෙන්වත් වැඩක් නොගෙන හය වැනි එකකුත් හොයාගන්නෙ මොන එහෙකටද ? '

ඇල්ලපු ගෙදර ළමයෙක් කරුවල කාමරේක හිරකරගෙන ඉන්නවා කියලා පොලිසියට දන්වලා මං චං ලියුමක් ඇරියා. පොලිසිය ඇවිත් ගේ පරීක්ෂා කරනකොට මං චං උඩුමහලෙ ඉඳගෙන හොරෙන් බලාගෙන හිටියා.

'හොරෙන් බලාගෙන ඉන්නෙ ? ඉස්සරහට ගිහින් කියන එකනෙ ඇත්තෙ'

'මම කරන්නෙ සේවයක්. මේ සමාජය සුද්ද පවිත්‍ර කිරීමේ වගකීම මට තියෙනවා.'

'මුද්දරවලට සල්ලි වියදම් කරන්න එපා. මං චං මගෙ පෙන්ෂන් එක ජීවත්වෙන්න මදි කියලා දන්නවනෙ'

හයවැනි ඉන්ද්‍රිය කොහේ තියෙන එකක්ද කියලා මං දන්නෙ නෑ. ඒත් මං චං ඇන් කරන්නෙ හයවැනි ඉන්ද්‍රිය කියන දේවල් ලියුම් මිටි අරගෙන නගරය සැරිසරනවා. අතේ ගෙනිහින් බෙදාහැරීමත් කළා. සැපැල් කිරීමත් කළා. මං මානසික රෝගියෙක් නේද මං චං. චිට මං චං ගැන දුකයි. මට මං ගැනත් දුකයි. එක්කොටම වැඩිය කසුම් ගැන දුකයි. මම විජාතිකයෙක් තමයි. ඒත් මම සමාජයට බද්ධ වෙනවා මං චං ට වැඩිය හොඳින්. ඔයාට තියෙන්නෙ මානසික රෝගයක්. අහල පහල මිනිස්සුන්ට විරුද්ධව පෙත්සම් ගහලා පොලිසියෙන් විභාග කරන්න ආවම ඔයාට සතුටක්ද දැනෙන්නෙ ? අපි ඒ රෝගය සුව කර ගනිමු.

ඔයාට දිග උණුසුම් නින්දක් අවශ්‍යයි මං චං. නින්දත් නොනින්දත් අතරෙ ඉඳගෙන ඔය බලන බියකරු හීන ගැන මට දුකයි. මානසිකව රෝගී වුණු ස්වාමිපුරුෂයාට මම ප්‍රේම කරනවා කියලා මං සෝරා සාන්ට කියා හිටියා. සෝරා සාන් මට උදව් කරන්නම් කිව්වා. සමාජයෙ වගකීමක් තට්ට තනියම ඔලුවට අරගෙන හදාගන්න පුළුවන් පිස්සුව විතරයි කියලා මං චං ට මම පැහැදිලි කළා.

'මට ...

සතුටකින්. කසුම්ට ඔන ගමන් යන්න. පාරෙ විසිතුරු බලන්න. දුවන්න පනින්න නටන්න. මගේ පුංචි ලිලී මල.

මං රෝහලට යන්න ඉස්සෙල්ලා සෝරා සාන් රෝහලට ගිහින් පැහැදිලි කළා සැබෑ රෝගියා කවුද කියන එක. සෝරා සාන් මුණ ගැහුණු දොස්තර ළඟටයි මම ගියේ.

දොස්තර මාව පරීක්ෂා කළා. ඔළුව කැක්කුමත් තමයි. ඒකටත් බෙහෙතක් දුන්නට වරදක් නෑ. විටමින් පෙවෙයි බෙහෙතක්ම දෙන්න. තලල දෙපැත්තෙ ටික් ටික් ගාලා ගැහෙනවට, ඇහි බැම උඩ රිදෙනවට. ඔලුවෙ පැත්තක් ගලකින් තලලා වගේ රිදුම් දෙනවට. ඒක සදාකාලික හිසරදයක් දොස්තර මහත්තයා.

'මගේ භාර්යාව මැරෙයිද ?' මං චං වෛද්‍යවරයාගෙන් ඇහුවා ? කාමරයෙ බෙහෙත් ගඳ හිසරදය වැඩි කළා.

'අපොයි නෑ. භාර්යාව ඇත්මම මැරෙන්නෙ නෑ. වයසට ගිහින් පුස්මෙස අවසක මැරෙයි. දැන්ම නෑ.'

'හදිස්සියෙ අනතුරක් වුණොත්'

'අනතුරක් නොවෙන්න පරිස්සම් කරගන්න.'

'මං එයාව පරිස්සම් කරනවා'

ඒ කතාව අතරින්ම වෛද්‍යවරයා මං චං ව පරීක්ෂා කරන්න අවස්ථාවක් උදා කර ගත්තා.

'මට කිසිම රෝගයක් නැහැ. මම අවුරුදු එකසිය විස්සම ජීවත්වෙනවා.'

එකසිය විස්සට දෙසිය විස්සක් ආ වඩා! ඒත් අනේ මට විඳවන්න බෑ.

... හොඳයි. ඒ ...

'මේ රටේ අපරාධ නවත්තන්න පියවර ගන්න. මේ ලියුම් කියවන්න. මිනිස්සු දුකෙන් ඉන්නෙ. අපරාධ වැඩිවී බන්ධනාගාර පිරිලා.' මං වං නිලධාරියාට චෝදනා කළා.

නිලධාරියා ගොනුවට අත තිබ්බෙ නැහැ. තමුන්ට මොන බලයක්ද තියෙන්නෙ කියලා අහනවා වගේ ළත වෙවී හිටියා. කසුම් නිලධාරියාගෙ මේසෙ උඩ තිබුණු විසිතුරු පැනක් අතට ගත්තා. නිලධාරියා කසුම් දිහා බැලුවෙ දරුවෙක් දිහා බලන සිනාමුසු මුහුණකින් නොවෙයි. මහ රළුකමක් ඒ බැල්මෙ තිබුණා.

'මේ රට තව දියුණු කරන්න පුළුවන්. අපි දියුණුයි කිව්වට දියුණු නැහැ. මේ රටේ නරක සිද්ද කරන්නෙ පරිගණකයකින් ලොකු පරිගණකයක්. මිනිස්සුන්ගෙ මොළ විපරීත කරනවා' මං වං බොහොම බරපතල විදිහට චෝදනා කරන්න පටන් ගත්තා. නිලධාරියා ලොකු උද්යෝගයකින් වගේ මා දිහා බැලුවා. ඒ බැල්මට උත්තර දෙන්නත් අමතක කළේ නැහැ මං වං.

'මගේ භාර්යාව. පුතා සහ ශ්‍රී ලංකාවෙන් කසුම් අපේ දුව.' නිලධාරියා මේසය මත තිබුණු ලිපි ගොනු පිළිවෙළකට තබන්න උත්සාහ කළා. වම්පසින් තිබුණු පරිගණක පුවරුවෙන් ශබ්දයක් නැගුණා. මං වං ගෙ ඇඟිලි තුඩු වෙව්ලනවා මම දැක්කා.

මෙහෙම ගියොත් අපේ ජීවිත විනාශ වෙනවනෙ. ආණ්ඩුවට දියුණු වෙන්න ආසාවක් නැද්ද? කෙලින් උත්තරයක් දෙන්න බැරිද? අර පරිගණකය මේ රට විනාශ කරනවා. මං මේකට විරුද්ධව වැඩ කරන බව දන්න හින්දා මගේ පිටිපස්සෙන් කවුරුහරි පන්නනවා. මගේ භාර්යාව බය වෙයි කියලා මං ඇටවත් කිව්වේ නැහැ.

'ඉතින් කොහේද ඔය පරිගණකය තියෙන්නෙ' නිලධාරියා ඇහුවෙ මහ කුතුහලයකින්.

'[illegible]

හොයාහුරු පෙන්නලා දෙන එක විතරයි සමාජ වගකීමක් හැටියට. මේ ලියුමට මටයි, මගේ භාර්යාවටයි, මගේ දෝණියන්දෑටයි තුන් දෙනාටම අත්සන් කරන්න පුළුවනි.'

නිලධාරියා මුලදී පෙන්නුවට වැඩිය බුරුලක් අග වෙන කොට පෙන්නුවා. ඔහුට මා සමග කතා කිරීමේ ඕනකමක් තිබුණා වුණත් මං වං ඉදිරියේ වෙනම කතා කිරීමේ බැරිකමකුත් තිබුණා.

'ඔය පරිගණකයෙ ස්විච් එක ක්‍රියාවිරහිත කළොත් හැම ප්‍රශ්නයක්ම විසඳෙනවා නම් මං එහෙම කරන්නම්' කියලා නිලධාරියා මං වංට පොරොන්දුවක් දුන්නා.

'අපේ මොළ විකාර කෙරෙන එකක් නැතිවෙයි එතකොට. අරිගතෝ ගොසයිමස්'

'මේ ප්‍රශ්නෙ විසඳුණොත් ඔක්කොම ප්‍රශ්න ඉවර වෙයිද?'

නිලධාරියා ප්‍රශ්න අහන්න පටන් ගත්තා. මං ඇගෙන් සංඥා කළා ප්‍රශ්න අහන්න එපා කියලා. ප්‍රශ්න අහන්න අහන්න පැටලෙන මොළයක්. අපි එහෙම කරන එක හොඳ නැහැ.

'මේ ගැන මං හිතන විදිහට ගැඹුරින් හිතන්න.' නීතිය නොසලකන මිනිස්සු ඉන්නවා. ඒක මුළු සමාජයටම අවදානමක්. රජයක් හැටියට ඒකට විරුද්ධ වෙන්න ඕන.

'හොඳයි'

මං වං මාපටැඟිල්ලෙ නියපොත්ත කටින් කඩලා ඇම්මා. කසුම් කටවල් දිහා බලන්නයි, කාමරේ විසිතුරු දිහා බලන්නයි කාලය මිඩංගු කළා. ඔය චූටි ලස්සන ඇස්වලට මේ ලෝකෙ දුක පෙනෙන්නෙ නෑ පුතේ.

මං [illegible] ආපහු ආවෙ ලොකු බරක් සැහැල්ලු වුණා වගේ.

මගේ හිතේ අනුකම්පාව යට වෙමින් කෝපයක් මතු වෙන්න ගත්තා. මං ලංකාවෙන් ආවෙ පිස්සෙක් ආම්බාන් කරගන්නද? මං චංගෙ විශ්‍රාම වැටුපෙන් ජීවත්වීම එක අතකින් අසීරු දෙයක් වෙමින් තිබුණා. හැමදේකම මිල ඉහළ යනවා. සෝරා සාන් සුමානෙකට වතාවක් දෙකක් එනවා. කසුමිට පලතුරු, පැණිරස, ඇඳුම් පොත් අරගෙන එන්නෙ අත්තම්මා, මිණිබිරී බලන්න එනවා වගේ. සෝරා සාන් කිව්වෙ ආපහු රස්සාවට ගිහින් මගේ අත ශක්තිමත් කරගන්න කියලා. සල්ලි ලැබුණම අත විතරක් නෙවෙයි හිතත් ශක්තිමත් වෙනවා.

'මං චං කසුමිව බලා ගනියිනෙ. නූපා සාන් ගිහින් රස්සාව කරන්න ආපහු' සෝරා සාන් යෝජනා කළේ කසුමිගේ දිග කෙස්වැටිය පීරමින්. කසුමි, සෝරා සාන්ගෙ ඇඟේ ඇවටෙන්නෙ අත්තම්මා කෙනෙකුගේ සිරුරෙ ඇවටෙන මිණිබිරි වගේ.

'කසුමි හුගක් ආදරේ මට නේද?' සෝරා සාන් කසුමිට හාද්දක් දෙමින් ඇහුවා. කසුමි කිසිම පමාවක් නැතුව උත්තර දුන්නා,

'මං ගොඩක් ආදරේ පපාට.'

'එතකොට මමා?'

'මමාටත් ආදරේයි'

කසුමි ජපන් බෝනික්කෙක්ම තමයි. හැබැයි ඇගේ හමේ තිබුණෙ ජපන් වර්ණය නෙවෙයි. ජපන් කහපාටයි, සිංහල තළෙළු පාටයි මිශ්‍ර වෙච්ච අමුතු ලස්සන පාටක්. එහෙම ලස්සන පාටක් ලැබෙන්නෙ මිශ්‍ර විවාහයකින්ම පමණයි කියලා සෝරා සාන් කිව්වා.

නගර සභාවෙ ඉඳලා ඇවිත් මං චං උඩුමහලට ගියා. කසුමි හිටියෙ නිදිමතෙන්. උඩුමහලෙ කවුළුවෙන් මං චං පිටත බලාගෙන [illegible]

[illegible]

'දැන් ටිකක් නිදාගන්න'

මං චං හැරිලා මා දිහා බැලුවේ සිනාමුසු මුහුණකින්.

'ආණ්ඩුවෙ නිලධාරියෙකුට තේරුම් ගියා මං කියන්නෙ ඇත්ත කියලා. මට තව කාරණා ටිකක් ලියන්න තියෙනවා.'

'දැන් නිදාගෙන හෙට ලියන්න.'

'බැහැ අද වැඩේ අදම කරන්න ඕන'

පිස්සෙකුට බිරිඳ වීමේ දුක සුළු පටු නැහැ. මං චං ආයෙම ලියන කාමරයට ගියා. මම මේ කාරණය පැහැදිලි කරලා දෙන්න ඕන. අවුරුදු එකසිය විස්සක් ජීවත් වෙන එකේ මගේ සමාජ වගකීම ඉෂ්ට කරන්න ඕන කියලා මං චං කිව්වා. මට මං චං ගැන නෙවෙයි මං ගැන අනුකම්පාවක් ඇති වෙනවා. ඒක මහා අසරණ හැඟීමක්. දුර්වල හැඟීමක්. මගේ හිත කියන්න පටන් ගත්තා මේ ඔක්කොම හදිස්සියට වෙච්ච වැඩ කියලා. ගෑනියෙකුට කසාදයක් ඕනමද? ජයනාථගෙන් බඩට ආව ළමයා හදාගෙන ලංකාවෙ හිටියා නම්, වයසක පිස්සු මිනිහෙක් සිරියහනෙ ගොරවන සද්දෙට මුළු රෑම නින්ද නැතුව ඉන්න සිද්ද වෙන්නෙ නැහැ. ඔය මෙහෙ ඉන්නෙ තාත්තා නැතුව ළමයි හදන අම්මලා. ලංකාවෙත් ඉන්නවනෙ. සමාජය අවමන් කරනවා තමයි. ජයනාථ තවම විදුලියක් වගේ හිතට යනවා එනවා. එක අතකට මට තිබුණෙ පස්සෙත් පන්නලා කසාද බැඳ ගන්න. කොච්චර ගෑනු එහෙම කර ගන්නවද? හත්මාසෙ බඩවලුත් එක්ක පෝරු වාරිත්‍රත් කරන්නෙ. එහෙම කළා නම් ළමයත් ඉන්නවා - තරුණ පුරුෂයෙකුත් ඉන්නවා. රැවටිල්ලකුත් නැහැ. එක අතකට දෙපැත්තෙම තිබුණෙ රැවටිල්ලනෙ. ජයනාථ නූපාව රවට්ටගෙන ගිහින් නූපාගෙ කය අවුස්ස ගත්තා. ගෑනු ළමයෙකුට උපන්දා ඉඳලා තමුන්ව පරිස්සම් කරගන්න සිද්ද වෙනවා. පරිස්සම් කර [illegible] නැති වෙන දේවලයි, ඇතිවෙන දේවලුයි ශේෂ [illegible]

වෙන්නෙ ආරක්ෂාව. හරියට වටකරලා කම්බි ගැහුව පොල් ඉඩමක කම්බි ගැලෙව්වා වගේ. ඇති වෙන්නෙ කලලයක්. කලලය හංගගෙන ඉන්න බැහැ. මෝරනවා. ලෝකෙ තියෙන බරපතලම වරද කරලා තියෙන්නෙ කලලය දරාගෙන ඉන්න කාන්තාව. ලැජ්ජා බය ආරක්ෂා කරගන්න බැරි වෙච්ච වරදට ගල්මුල් ඇවිස් වදින්නෙ කලලය දරාගෙන ඉන්න තැනැත්තිට විතරක් නෙවෙයි. ශේෂ පත්‍රය හැදෙන්නෙ එහෙමයි. ඒක හැදුනට පස්සෙ ඒ පවුලෙ ගෑනු කෙනෙකුට පාරෙ බැහැලා යන්න බැරි තත්ත්වයක් උදා වෙනවා. හූ කියන්නෙ පවුලටමයි.

මං චං ආයෙම ලියනවා. ලියන්න. ලියන්න. ලියන්න පුළුවන්ද මගේ දුක ලියන්න. ලියලා නගර සභාවට හරි කොහාට හරි දන්නන්න. අභ්‍යන්තර ලේ වහනයක් සිද්ද වෙනවා කියලා ලියන්න. නගරසභාව මොනවා හරි කරයිද? කසුම් ඇඳට වැටිච්ච ගමන් නිදි. මගෙ පපුවෙ පිපුණු සුදු රෝස මල. දොයියන්න මගෙ මැණික. ඔයා දන්නවද කසුම් මගෙ හැම හුස්මක්ම වැදෙන්නෙ ඔයාටත් එක්ක. තිත්තෙදි වුණත් ඔයාගෙ මූලෙ තියෙන්නෙ සැහැල්ලුවක්ද - ප්‍රීතියක්ද නේද? මම ඒ සැහැල්ලුවයි, ප්‍රීතියයි ඔයාට දෙනවා. ජීවිතේටම. කිසිම දෙයක් වරද්දගන්න එපා පුතේ. වැරදුණොත් හදන්න හරි අමාරුයි. ඔයා ඉන්න වටපිටාව අඳුර ගන්න අවශ්‍යයි පුතේ. කුඹියෙක් එන්නෙ කොහාතින්ද කියලා දැන ගත්තොත් ඔයාගෙ පුංචි කකුල් කුඹින්ට කන්න ඉඩ ලැබෙන්නෙ නෑ පුතේ. ඉලක්කමකින්, අකුරකින් අදහස් කරන දේ මොකද්ද කියලා මං ඔය පුංචි හිතට තේරෙන විදිහට කියලා දෙන්නම්. මං ඔයා වෙනුවෙන් කඩදාසි කුරුල්ලන් හදන්න ඉගෙන ගන්නවා. මං ඔයා වෙනුවෙන් කිමෝනෝව අඳින්න ඉගෙන ගන්නවා. මං ඔයාට කියලා දෙන්නම් මලකට පාට ලැබෙන්නෙ කොහොමද කියලා ඔයාට හුඟක් දුක හිතෙයි. මිනාමෙතා ගඟේ කතාව ඇහුවොත් මං ඔයාව එක්කරගෙන යන්නම් මිනාමෙතා ගඟ මුහුදට වැටෙන හැටි බලන්න. මිනාමෙතා ගඟට මුහුදට ගලා බහින්න කන්ද කපපු තැන බලන්න. කන්දක් කපන එක ලේසි නැහැ පුතේ. ඔයාට

මවා ගන්න. පුංචි කාලෙදී සතුට දෝර ගලන්න ඕන. ඔයාට මං ඒ දෝර ගලන සතුට දෙන්නම්. කසුම් මගේ පුංචි ලිලී මල දොයියන්න ඔයාගෙ තාත්තා ලියුම් ලියනවා. සමාජ වගකීමක් ඉටු කරන්න. හෙටත් යයි තව නගර සභාවකට හරි, ආණ්ඩුවෙ තන්තෝරුවකට හරි. ඒක නවත්තන්න බැරි ගමනක්. තාත්තගේ හිත කියන දේ. තාත්තාට ඒක අසනීපයක් නොවුණට බාහිර ලෝකයට ඒක අසනීපයක් පුතේ. මගේ දුව මට සමාවෙන්න මං ඔයාට පුතේ කියනවට.

දුරකතනය නාද වුණා. අනේ මේ දරුවා ඇහැරෙයි. ඔච්චර සද්දයක් මොකටද? මං චං මේ දුරකතනය ශබ්දය අඩු කරන්න බැරිද?

'හලෝ

කතා කරන්නෙ චන්ද්‍රනක්කා.

'නංගි'

'චන්ද්‍රනක්කෙ'

'චන්ද්‍රනක්කා දුරකතනය හරහා ඉකිගහන්න ගත්තා.

'ඇයි අක්කෙ ඇයි?'

'රංගන අන්තරා වුණා.'

'මොකක්?'

'අර බැල්ලි අපේ මල්ලිව මරාගත්තා නංගි. ඊනියෙම සාරියකින් එල්ලිලා මැරිලා. ඔයා එනකල් මිනිය තියා ගන්නම්.'

'ඒ ලට මං එනකල් සහෝදරයා තියාගන්න බැරි

චන්ද්‍රනක්කා කිසිදෙයක් කතා නොකර රිසීවරය තියන ශබ්දය මට ඇහුණා. මම තතම් පොලවේ ඉඳගෙන කෑගැහුවා. මං චං උඹ තමයි මාව මෙහාට එක්කගෙන ආවෙ. කසුම් ඇඳෙන් නැගිටලා දුවගෙන ආවා. මං චං කාමරෙන් එළියට පැන්නා.

'මට සමාවෙන්න. ඇයි මේ කෑගහන්නෙ?' කියලා මං චං, මං ළග ඉඳගත්තා. මම මං චංගෙ බෙල්ලෙ එල්ලිලා ඇඩුවා. කසුම් කෑ ගහලා ඇඩුවෙ නැහැ. මූණ බෙරිකරගෙන හිටියා. කඳුළු කම්මුල් දිගේ කඩා හැලෙනවා දැක්කා. මං චං වෙව්ලනවා බය වෙලා.

'ඇයි මොකද මේ?'

'රංගන බෙල්ලෙ වැල දාගෙන මැරිලා'

මං චං ගැස්සිලා අහකට පැන්නා. සමාජ වගකීම කියලා තොල් මැතිරුවා. රංගන මගෙ පුංචි මල්ලි. අපි මල්ලියෙ ඇකුළු ගහනවට බයේ කුස්සියෙ තුරුළු වෙලා හිටියා මතකද? මං හයියෙන් ගොරවනවා මතකද? ජනේලෙන් පෙනුණෙ අහස ඉරිතලනවා. අහස පැලිලා ගෙරවිල්ලක් එනවා. අපි බයේ ඇස් පියාගත්තා මතකද ඒ එළිය එනකොට. එළියද ඉස්සරවෙලා එන්නෙ ගෙරවිල්ලද? එළියටද අපි බය ගෙරවිල්ලටද? උඹයි මමයි තුරුල් වුණේ ඒ දෙකටම බය වෙලාද?

'මං චං මට මළගමට යන්න ඕන'

මං චං බයවෙලා වගේ පස්සට වුණා. මොකවත් කිව්වෙ නෑ. මං චං හයියෙන් ඇස්පිල්ලන් ගහනවා. කම්මුල් ඇට දෙක හෙලවෙයි ඔය ඇස්පිල්ලන් ගැහිල්ලට. හම ඉරිතලලා යයි. මට කලන්තෙයි. උඹේ උරහිස මට අවශ්‍යයි මං චං. මගේ පපුවට උඹේ පපුව ගෑවෙන්න ඕන වේලාවක් මේක. මගේ දුක බෙදා ගන්න බැරිද? ජීවිතේ අතෑරලා දාලා මගේ පුංචි මල්ලි. රංගන.

තිබුණනෙ මල්ලියෙ. ගෑනියෙකුයි ළමයි දෙන්නෙකුයි අතෑරලා දාලා යන්න තරම් හිත ඇඩි කරගත්තද? මචිල් ඔක්කොම හැලිච්ච බල්ලෙක් වුණත් ජීවත්වෙන්න පොරකනවා. උඹ යස තරුණයෙක්නෙ. ඇයි මැරෙන්න හිතුවෙ?

'මට මළගමට යන්න ඕන'

'මළගමට නොගියට මොකද?' කොහොමත් වළ දාන එකනේ'

'කොහොමත් වළදානවා තමයි. මං ගියාට පණ එන්නෙත් නැහැ. ඒත් මං රංගනට අවසාන ගෞරවය දක්වන්න ඕන'

'ආණ්ඩුවට ලියලා ඉල්ලන්න වෙයි. මං කොහොමද සල්ලි දෙන්නෙ. සල්ලි නැහැ.'

මගේ හිතේ යක්ෂයා මතුවුණා. ඒ යක්ෂයාව පස්සට තල්ලු කළේ මගේ හිතේ ඉන්න සාධාරණ සත්වයා. සාධාරණ සත්වයා මහ අසරණ තාලෙට, වියපත් ස්වාමිපුරුෂයා දිහා බලාගෙන හිටියා.

මං චං මගේ සහෝදරයාගේ මරණය ගැන ලියුමක් ලිව්වා. රජයට සියදිවි නසාගැනීම ගැන විස්තරයකුත් ලිව්වා. ඔකිගහාරා වනාන්තරය ගැනත් ලිව්වා.

මගේ භාර්යාවගේ සහෝදරයා සියදිවි නසාගෙන. ගෙලවැල ලාගෙන. පූජි කන්දේ ඔකිගහාරා වනාන්තරයේදී එහෙම නෙවෙයි. ලංකාවේදී. පූජි කන්දෙ ඔකිගහාරාවලදී ගෙලවැල දාගත්තා නම් මම තමුන්නාන්සේලාට මේ ලියුම ලියන්නෙ නැහැ. සමාජය වගේම රජයත් පූජි කන්දේ ඔකිගහාරා වනාන්තරයෙ සිද්ද වෙන සියදිවි නසාගැනීම් වළක්වන්න පියවර ගත යුතුයි. මම රජයට බලකරනවා. රස්සාවෙන් එළියට ඇදලා අපු තාරෝ සාන්

තියෙනවද මිනිහෙක්ව රස්සාවෙන් එළියට ඇදලා දාන්න? හොඳයි මගේ ප්‍රශ්නෙ මේකයි. මට මගේ භාර්යාව, ඇගේ සහෝදරයගේ මළගමට යවන්න ඕන. භාර්යාවට දරුවා හම්බවෙන්න ඉන්න කොට අපි දෙන්නටම රස්සාවෙන් අස්වෙන්න සිද්ධ වුණා. එහෙම නොවුණා නම් ගැබ විනාශ වෙනවා. දැන් රස්සාව නෑ. දරුවත් ලොකුයි. පැන්ෂන් එකෙන් පිරිමහගෙන ජීවත් වෙන්නෙ. මට භාර්යාව මළගමට යවන්න ඕන. ඒක මගේ වගකීම. ඒ වගකීමට රජයක් වශයෙන් තමුන්නාන්සේලත් බැඳිලා ඉන්නවා. වහාම කොළඹට ගිහින් එන්න ටිකට් පතක් අවශ්‍යයි. මා ටිකට්පත ගත යුත්තේ ජපන් ගුවන් සේවයෙන් නොවේද? හෙට උදේ නවයට මම එතනට එනවා. අරිගතෝ ගොසයිමස්.

මං චං ලියුම අරගෙන එළියට ගියා. මං සෝරා සාන්ට දුරකතන ඇමතුමක් දුන්නා. මේ පිස්සු මිනිහා ලියුමකුත් අරන් පිටවෙච්ච කතාවයි, මගේ සහෝදරයා රංගන සියදිවි නසාගත්ත කතාවයි මං සෝරා සාන්ට ඉතාම කෙටියෙන් විස්තර කළා. මගෙ ස්වාමිපුරුෂයා හෙට උදේ නවයට ජපන් ගුවන් සේවයේ කාර්යාලය ඉදිරිපිටට ගිහින් ලියුමට උත්තර හැටියට ලංකාවට යන්න ටිකට්පතක් බලාපොරොත්තු වීමේ කතාව කිව්වම සෝරා සාන් ටික වේලාවක් නිශ්ශබ්දව හිටියා.

'මම එන්නම්' කියලා සෝරාසාන් රිසිවරය තිබ්බා. කසුමි බයවෙලා බලාගෙන ඉන්න බව තේරුම් ගියත් ඒ නොතේරෙන බයක්නෙ.

'ඔයාට තේරෙනවද පැටියො'

ඔයාගෙ අම්මගේ මල්ලි මැරිලා. මම කසුමිට විස්තර කළා. මැරිලා කියන තත්ත්වය කසුමිට තේරෙනවද කසුමි? ආයෙ නෑ. කවදාවත් මුණගැහෙන්නෙ නෑ. ගෙදර තියාගන්න බෑ. ලොකු දිග වළක් හාරලා ඒ වළට ආලා උඩින් පස් දානවා. නැත්නම් දර ගොඩක් උඩ මාමාව තියලා පුච්චනවා. නෑ උයියා වෙන්නෙ නෑ
[illegible]

ඉස්සෙල්ලම ගඳ ගහන්න පටන් ගන්නවා. ඊට තියාගත්තොත් ඉස්සෙල්ලම ගඳ ගහන්න පටන් ගන්නවා. පොඩි පොඩි පණුවො නහයෙන් කටෙන් පස්සෙ ඔජස් ගලනවා. හැමෝටම එහෙම තමයි වෙන්නෙ. ලෝකෙ එන්න ගන්නවා. හැමෝටම එහෙම තමයි. අපි ඔක්කොම මැරෙනවා. පපා මැරෙනවා, හැටි එහෙම තමයි. සෝරා නැන්දා මැරෙනවා. ඒ හැමෝම කුණු මමා මැරෙනවා. ඊට ඉස්සර වළ දානවා. පස්වලින් වහනවා. ඒ පස්කන්ද වෙනවා. උඩ ලස්සන සුවඳ මල් පැළයක් හිටවනවා. මල්වල සුවඳ එකතු වෙනවා ආත්මයේ සුවඳට. ඔයා මේවා පස්සෙ තේරුම් ගන්න.

'මමා අඬන්න එපා' කසුමි මගේ මූණ අතගෑවා.

'අඬන්නෙ නෑ' මං කසුමිව ඉඹලා පොරොන්දු වුණා.

සෝරා සාන් ආවා. සෝරා සාන් සපත්තු ගැලෙව්වෙ මහ හදිසියකින්. කසුමි ගිහින් සෝරා සාන්ගෙ තොප්පිය අතට ගත්තා. කසුමි තොප්පිය ඔළුවේ දාගත්තා. සෝරා සාන් ගෙට ආවෙ කසුමිගෙ අතින් අල්ලගෙන. මං තතාමි පොළවෙ ඉඳගත්තා.

මේ දැන් අඬන්නෙ නෑ කියලා කසුමිට පොරොන්දු වුණානෙ. මට ඇඬුම් ආවත් මං අඬන්නෙ නෑ. අඬන්නෙ මගේ ලේ. මගේ හම. මගෙ ඇට මිදුළු. සෝරා සාන් තතමි පොළවෙ මා ඉදිරියෙ ඉඳගත්තා. අම්මා මැරිලා. තාත්තා මැරිලා. දැන් මල්ලි මැරිලා. අම්මයි තාත්තයි මැරුණු බව දැනගෙන හිටියෙ නැහැ. අම්මගෙ වත්, තාත්තාගෙවත්, මල්ලිගෙවත් අවසාන දවස් ගැන හැඟීමක් දැනීමක් මට නැහැ. බොහොම අමාරුවෙන් හුස්ම පොද පිට කරන්න උත්සාහ කරන්න ඇති. ඇස් යට ගිලිලා තියෙන්න ඇති. අසරණ විදිහට බලාගෙන ඉන්න ඇති. මරණයෙ හෙවනැල්ල ළගට ඇවිත් අනාතුරු අඟවනකොට අම්මා හොඳටම බය වෙන්න ඇති සෝරා සාන්. මම අම්මගෙයි, තාත්තගෙයි මළගම් දැනගෙන හිටියෙ නැහැ. ඒත් මම දැන් දන්නවා රංගන ජීවිතය එයාම අතඇරලා ගිහිල්ලා. පොළවෙ පස්වෙන්න ඉස්සෙල්ලා උඹේ දේහ[illegible] ගෞරව දක්වන්න හිත අඬනවා මල්ලෝ.

හෙට උදේම ටිකට් එක ගේන පුළුවන් වෙයි කියලා හිතේ'

'නූපා සාන්ගෙ හිත මේ බරෙන් නිදහස් කරන්න ඕන. එයාට වගකීම කියන්නෙ ලොකු බරක්.'

'මං වං ට සල්ලි නෑ සෝරා සාන්. මං වං ට සල්ලි නෑ'

සෝරා සාන් විදුලි සැරයක් ඇඟට විසිවුණා වගේ ඇවිලා ගියා. හරියට නූපාව වැලලුවෙ තමුන් වගෙයි සෝරා සාන්ට දැනුණෙ. නූපා මේ එල්ලෙන්න හදන්නෙ ඒ අම්මගෙ සිරුරේ මූණ බලා ගන්න හදන්නෙ ඒ අම්මගෙ ළමැදෙ. එක වෙලාවකට ඇයි තමුන්ට නූපා වැලුවා වගේ දැනෙන්නෙ? අත අරින්න බැරි බන්ධනයකින් ඇලිලා ඉන්නෙ? කසුමි නුරතල් කතා උගුරෙ හිරවෙලා වගෙ බලාගෙන ඉන්නවා. කසුමිගෙ කට බාගෙට ඇරිලා.

සෝරා සාන් කුඩා පරිගණකය අරගෙන ඇවිත් හිටියෙ.

'අපි ඉන්ටනෙට් එකෙ [illegible] කොළඹට [illegible]' කියලා සෝරා සාන් මද වෙලාවකින් අන්තර්ජාලයේ වෙබ් අඩවියකට පිවිසුණා. කසුමි, සෝරා සාන්ගෙ සිරුරේ ගැවී නොගැවී ඉඳගෙන හිටියා. කසුමිට පරිගණක සෙල්ලමක් කරන්න දෙන්නම් කියලා සෝරා සාන් කසුමිගෙ හිස පිරිමැද්දා. කසුමිගෙ දෙතොල්වල යන්තම් සිනාවක් මතු වුණා.

'දැන් නූපා සාන්ට යන්න වෙන්නෙ කෙලින්ම කොළඹට නේද? බැංකොක් ගිහිල්ලා යන එක පරක්කුයි'

'කොහොමද ඉතින් මම යන්නෙ? මට තිබුණෙ රස්සාව දිගටම කරන්න'

සෝරා සාන් කිසිවක් කතා කළේ නැහැ. ගමන් බලපත්‍රය ඉල්ලුවා විතරයි. සෝරා සාන්ගෙ ක්‍රෙඩිට් කාඩ් එකෙන් අන්තර්ජාලයෙන් [illegible]

'හෙට උදේම යන්න පුළුවන්' සෝරා සාන් කිව්වා. එක හිතුණෙ කොච්චර ඉක්මනටද? ලියුම් කැපල් කරන්න ඕන මං. මං ළඟට එන්නත් ඉස්සර.

දණ ගහලා වඳින්න හිතෙනවා කියලා මං කිව්වා. සෝරා සාන් හිනාවුණා.

'වඳින්න දෙයක් මං කළේ නෑ. මට ටික ටික ගෙවන්න පුළුවනි. මං කවදාවත් මෙච්චර ලොකු ගණනක් පාවිච්චි කරලත් නෑ.'

'මං කොහොමද ඉතින් ණය ගෙවන්නෙ?'

'ආපහු ආවම රස්සාවට යන්න. මං කතා කරලා දෙන්නම්. මට ටික ටික ගෙවන්න.'

මම හිස නමා ස්තුතිය පළ කළා. අරිගතෝ ගොසයිමස්. [illegible] මුදලින් ගෙවන්න[illegible] එත් සෝරා සාන් මේ ණය කවදාවත් මට ගෙවලා ඉවර කරන්න බැහැ. මම සෝරා සාන්ගෙ සියුමැලි දෑත් මත මගේ නළල තබාගත්තා. කොයි ආත්මයක හරි නුඹ මගේ මව වෙන්න ඇති කියලා බොරු කතාවක් කියන්නෙ නැහැ. එන ආත්මයෙ මගේ මව වෙලා උපදින්න කියන්නෙත් නෑ. දස මාසයක් මාව කුසේ තියාගෙන වදපු දුප්පත් අම්මාට පිටුපාන්න බැහැ. කසුමි, සෝරා සාන්ගෙ පරිගණකයෙ සෙල්ලමකට වැටිලා.

මං වං වැස්සෙ තෙමි තෙමී ගෙදර ආවා. ආවෙ සිනා මුසු මුහුණකින්. මගදි යාළුවෙක් මුණ ගැහුණු බවක් කිව්වා. මං වංට එච්චර යාළු මිත්‍රයෝ නැතිහින්දා යාළුවෙක් මුණ ගැසීමත් පුවෘත්තියක් තමයි.

'මං රජයට දැනුම් දුන්නා මරණය ගැන. රජයට වගකීමක් තියෙනවනෙ' මං වං, සෝරා සාන්ට පැහැදිලි කළා.

හිටියෙ අපි ටිකට් වැඩේ ඉවරයක් කරගත්තා කියන්න බයකින් වගේ. පවුල කඩන්න හදනවා කියන චෝදනාවෙන් කොයිවෙලාවෙ දමලා ගහයිද කියලා කියන්න බැරි කමක් තිබුණානෙ. නූපා බලාගෙන හිටියෙ මේ දෙන්නා අතරෙ කොයි මොහොතෙ පාලමක් හදා ගන්නද කියලා. දැන් හෙට උදේ යන්න සූදානම් වෙලා ඉවරයි. රජයට කියන කතාව මුලාවක් බව මං චං මත් දන්නවා ඇතිනෙ. ඉතින් ඒ කතාවට ඇත්ත ප්‍රතිචාරයක් ලැබුණාම දරාගන්න අමාරු වෙන්න බැරිත් නැහැ. හෙට උදේ යනවා කිව්වම උහුලන්න බැරි වෙන්න පුළුවන්. අනික කසුමි තියලා යන්නත් බැහැනෙ. කසුමිව බලාගන්න හයියක් කොහෙන්ද මංචං ට?

'මසායා සාන්ට මේ වෙලාවේ අමාරු හින්දා මං නූපා සාන්ට ණයට ටිකට් අරන් දුන්නා'

හෙණයක් පතිත වුණා වගෙයි මං චං සෝරා සාන් දිහා බැලුවේ. ඒක වෙන්න බෑ කියන සැක සහිත ඉරියව්වකින් කහපාට මූණ එක පාරට දුඹුරු ගැහුණා. මද වෙලාවක් නිහඬව හිටියා. විසිත්ත කාමරයෙ එහාටත් මෙහාටත් ඇවිද්දා. සෝරා සාන් දෑහිස් දෙක උඩ අත් තබාගෙන බිම බලාගෙන හිටියා. මසායා සාන් මද වෙලාවකට පස්සෙ සෝරා සාන් ඉදිරියෙ ඉඳගත්තා. හිස නමා ආචාර කළා.

'අරිගතෝ ගොසයිමස්. රජය මේ කාරණාව ඉෂ්ට කරලා නොදුන්නා නම් මටත් සිද්ද වෙන්නෙ ඔකිගහාරා වනාන්තරයට යන්න. එයා, එයාගේ සහෝදරයගෙ මළගමට යන්නම ඕන.'

සෝරා සාන්ගෙ ඇසේ කඳුළු පිරුණා. මං චං ගෙ මුහුණෙ සතුටක ලකුණු ඇඳුනෙ විද්‍යුත් පින්සලකින් වගේ. දුඹුරු පාට ආයෙම අමුතු පාටකට පරිවර්තනය වුණා. මසායා සාන් නැගිට්ටා කුස්සියට ගියා. කිසිම කතාබහක් නැතුව වීදුරු සමග වයින් බෝතලයක් [illegible] පැණිරස බීම එකක් [illegible]

'මං මිනිහෙක් නෙවෙයි කියන්න එපා, මං මිනිහෙක් තමයි. මං කිව්වෙ පිරිමියෙක් තමයි. ආ - මේ වයින් සෞඛ්‍යයටත් බොහොම හොඳයි. ටිකක් පැණිරසත් තියෙනවා. නූපා සාන් කැමති පැණිරස තිබුණොත් විතරයි.'

මං චං කියවන්න පටන් ගත්තා. ඒ ටිකට් ගත්තට තාම ඉතුරු වැඩ පිළිවෙළක් වෙලා නැහැ. වියදමට සල්ලි, ඇඳුම් පැළඳුම් කසුමිවත් අරන් යන්න ඕන. මේ මනුස්සයා අසනීපෙන් හින්දා වැඩිදවසක් ඉන්න බැහැ. ඒත් හත්දවසේ දානෙට නොඉඳත් බැහැ. දරුවත් අරගෙන යන එකේ අතේ මිලක් මුදලක් නැතුවත් බැහැ. සෝරා සාන් අතේ වියදමට කියලා මත් දෙකක් දුන්නා. රුපියල් විසිදාහක් විතර.

'රජයෙන් ගෙවීමක් කරන්න හැදුවොත් ටිකට් අවශ්‍ය නැහැ කියනවා. වියදමට මුදලක් ඉල්ලමු'

රෝසිට මරණය දැනගන්න ලැබිලා ඒ මැද්දෙම ආවා. හරි [illegible] හැමදාම පිළිවෙළට තිබුණු ඇහිබැම හරිගස්සලා තිබ්බෙයත් නැහැ. නෙත් අඳුන් ගාලා හිටියෙත් නෑ. රෝසි මගේ මූණ ඉබ්බේ නූපා මේ විදේශිකයො අතරෙ උඹට උඹෙම කෙනෙක් ඉන්නවා දුක බෙදා හදාගන්න කියනවා වගේ. ඒක මට දැනුණා රෝසි. රෝසි මරණයෙ වගතුග මට වැඩිය හොඳට දැනගෙන හිටිය බව පෙනුණත් ඒ ගැන වැඩිදුර කතා කළේ නැහැ. ඒ වෙනුවට රෝසි කළේ ලංකාවෙ දේශගුණයට ගැලපෙන ඇඳුම් කසුමිට අරගෙන යන්න කියනවා වගේ අවවාද දීමයි. ලංකාවෙ හොඳටම වහිනවා වුණත් කසුමිට දැඩි රස්නයක් දැනෙයි කිව්වා. ග්‍රීෂ්ම කාලයේ ඇඳුම් කීපයක් අරගෙන යන්න කියලා කියන ගමන් රෝසි මත් එකක් මගේ අතේ තැබුවෙ හොර රහසෙන් යමක් කරනවා වගේ.

'ලංකාවට ගියාම මළගමකට ගියත් මිනිස්සු නොයෙක් දේවල් බලාපොරොත්තු වෙනවා නූපා සාන්. ඒවට හිත [illegible] කරගන්න එපා.' රෝසිගෙ අවවාද මගේ පපුවට

ගල්බෝර කැලි වගේ. රෝසි සන්ජෝ නගරෙයි, නීගතා ප්‍රාන්තෙයි ඔපදූප ටිකක් කියවන්න අමතක කළෙත් නැහැ. අලුතෙන් ආපු සිංහල කොල්ලො හතරදෙනෙක් චමරියක ඉන්නවා කිව්වා.

'එකෙකුටවත් වීසා නැහැ. මං දවස් දෙකතුනක් උන්ට කෑම ගිහින් දුන්නා. අපේ කොල්ලොනෙ. මගෙ මාළු කිරිහොද්ද කාලා මැරෙන්න හැදුවා පව් අනේ!'

රෝසි ගියේ බඩු පාර්සලයකුත් මගෙ අතට දීලා. රෝසිගේ සහෝදරී ඇවිත් ඒ පාර්සලය ගනීවි කියලා රෝසි කිව්වා. 'කමක් නැද්ද' කියලත් ඇහුවා. කමක් තියෙනවා කියන්නයැ. අනික ගෙනිච්චට මොකද? මම වැඩිපුර මුකුත් ගෙනියන එකක්යැ.

මං චං කැමති වුණේ නෑ පාර්සලය දිග නොහැර ගෙනියනවට. සැකයෙන් බයෙන් ගේ පුරා එහාට මෙහාට ඇවිදින්න පටන් ගත්තා.

'රෝසි දුන්න මත් එකයි; පාර්සලෙයි මං ආපහු ගිහින් දීලා එන්නම්. කෝ දෙන්න'

එක පාරට මං චං මහ බලවත් මිනිහෙක් වෙලා පාර්සලය ගැලෙව්වා. පාර්සලයේ සැක කටයුතු දේවල් තිබුණෙ නැහැ. චොකලට්, විටමින් වර්ග, ජපානයේ කඩ පොළවල් ඉදිරිපිට නොමිලයේ දෙන, වෙළඳ ලකුණු සහිත අවාන් සහ ඔරලෝසු කිහිපයක් තිබුණා. බය වුණේ ඕකටනෙ. දැන් ඉතින් තිබ්බ විදිහටම පාර්සල් කරන්න.

සෝරා සාන් විදුලි දුම්රියට (ෂින්කාන්සෙන්) මං චං ව නග්ග ගත්තේ පොඩි දරුවෙක්ව නග්ග ගන්නවා වගේ. කසුමි අඬනවද, හිනාවෙනවද කියන එක තීරණය කළේ මගේ මූණ දිහා බලලා. ඊත් විදුලි දුම්රියේ ගමන ගැන එයා හිටියේ ප්‍රීතියකින්. මරණය කියන දේ කියලා දුන්නට තේරුම් ගන්න පුළුවන් වෙන්න තරම් වයස...

...

නියතම දේ මරණයනෙ මගෙ පුතේ. විදුලි දුම්රිය නීගතාවෙ නැවතුමේ පහු කළේ ඇසිපිය හෙළන්නත් කලින්. කසුමි එහෙම පහුවෙන ගොඩනැගිලිලක් ඇස්වලින් අල්ලගැනීමේ උත්සාහයක යෙදෙමින් හිටියා. රංගනාගෙ මරණය දැනගෙන ශෝක වෙනවා වගේ මුළු දුම්රියම නිශ්ශබ්දතාව රකිනවා වගෙයි. හැමෝම හිස බිමට නැඹුරු කරගෙන. සෝරා සාන් විතරක් ඉඳ හිට කතා කළා.

'මං චං ගැන බලන්න සෝරා සාන්'

ඒ වෙලාවෙ මං චං හිටියෙ අඩ නින්දෙ වගේ. මමත් නැතිවෙලාවෙ ලියුම් මිටි උස්සගෙන හැමතැනම ඇවිදියි. එක එක තැන්වලට ගිහින් ගර්හාවට ලක්වෙයි. බඩගින්නෙ ඇවිදියි. සමාජ වගකීම ගැන කතා කරන්න ගිහිල්ලා නාහෙට නාහන දඩබ්බර ඉලන්දාරි රැළකට අහුවුණොත් සරදමට ලක්වෙයි. එක්කො එකට එක කතා කරන්නයි, දේශන පවත්තන්නයි ගිහින් ගුටිකයි. මං චං මහ සියුමැලි මිනිහෙක්නෙ. මං ම නේද දවසක් කිව්වේ මහ ඇඩ් හිතක් තියෙන මිනිහෙක් කියලා. හැමදේම සාපේක්ෂයි. අලඟෙන අවස්ථාව අනුව. මං චං ගැන බලන්න කිව්වාම සෝරා සාන් 'උඹ වෙනුවෙන් මං ඔනම දෙයක් කරනවා' කියන බැල්මකුයි හෙලුවෙ. මං චං එයාගෙ කෑම ටික හදාගන්න දන්නවා.

නරිටා ගුවන් තොටුපළෙන් වෙන්වෙලා එනකොට කසුමිට වෙන්වීමේ දුකක් දැනුණා වගේ. කසුමි මං චං ගෙ සිරුරෙ ඇවටෙන්න වුණා. සෝරා සාන් කසුමිගේ මූණ සිපගත්තා. කසුමිගේ කට ඇරුණා. 'පපා' කියලා කසුමි මං චං ගෙ සිරුරට බාරු වුණා.

'මගේ වස්තුව ගිහින් එන්න.' කියපු මං චං වෙව්ලන්න පටන් ගත්තා. ඔයා තව දුර්වල වෙන්න ඉස්සෙල්ලා අපි යනවා.

සෝරා සාන් ගිහින් එන්නම්. මං චං ගිහින් එන්නම්. යන්නෙත් නොයා බැරි හින්දා. ආපහු එන්නෙත් නැවිත් බැරි හින්දා.

8

රංගනගෙ මිනිය ළඟ වාසනා ඉඳගෙන හිටියා. හැමෝම මිනියට එබිකන් කරන්න ගත්තා. ජපානෙ ඉඳලා ආපු සහෝදරිට ගමේ නාලෙට කෑ ගහලා ඇඬීමේ නිදහස ලැබුණා. කසුම් මගේ මූණ දිහා බලාගෙන ඉහිල්ලුවා. විසඳගන්න බැරි අවුලක් උඹට තිබුණද මල්ලියෙ? සුජාතක්කා ඇවිත් මාව කාමරේට එක්කරන් යනකල් මම මල්ලිව බදාගෙන හිටියා. වාසනා හුන් තැනින් නැගිටලා පැත්තකට වුණේ 'මම නොවෙයි අක්කෙ රංගනව මරා ගත්තෙ' කියනවා වගේ. වාසනාගෙ ළමයි දෙන්නත් වාසනාගෙ ඇඟේ එල්ලීගෙන හිටියා. වාසනාගෙ විතරක් නෙවෙයිනෙ මල්ලිගෙත් ළමයිනෙ. මිනිහෙකුට පුළුවන්ද මොන කාරණේට වුණත් දරුවොයි ගෑනියි අවදානමේ දාලා තමුන් විතරක් දූක මග ඇරලා යන්න. ඔය කරගත්තෙ දූකින් මිදීමක් නොවෙයි මල්ලියෙ. පලා යාමක්. චන්දනක්කට වැඩිය මං ළං වුණේ ඔයාටනෙ. චන්දනක්කා හැමදාම ටිකක් ඈත් වෙලානෙ හිටියෙ. එයාට තිබුණෙ උඹලා ඔක්කොටම වැඩිය මම වෙනස් කියන සුපිරි හැඟීමක්. සමනලත් ඉලන්දාරියෙක් තරමට ලොකු මහත් වෙලා බව අහම්බෙන් වගේ දැක්කා. ඉලන්දාරියෙකුට තරම් වයසක් නම් නැහැ මගේ හිතේ. සුජාතක්කා ඉඟිබිඟි භාෂාවෙන් කසුම්ව යාළු කර ගැනීමේ උත්සාහයක යෙදුණා. චන්දනක්කා ඒ යාළු මිත්‍රකමට වැඩි කැමැත්තක් දැක්කුවෙ නැහැ. චන්දනක්කා, සුජාතක්කා ළඟින්ම ඉඳගත්තා. මොකද වුණේ කියලා අහන්න මට බය හිතුණා. මළ ගෙදර සද්ද බද්ද කාමරෙන් පිටත ඇහෙනවා. සෙනඟ යන එනවා. මල්ලිට හරි [illegible] කෝ

රූබට අයියා? සුදෙව [illegible] කලාසයක් කරන්න ගිහිල්ලා. හැමදේම හොයලා බලන්න ඉන්නෙ ඒ දෙන්නා විතරනෙ. සුජාතක්කා, ලොකු ප්‍රේමගෙ හැඩරුව ගනිමින් හිටියා. තලත්තැනි පෙනුම තිබුණට ළමා ළපටි හිනාවක් තිබුණා. ඒ හිනාව හරි අසරණයි කියලා හිතට දැනුණා.

'මෙකිගෙම සාරියකින් එල්ලිලා ඉඳලා තියෙන්නෙ. ගෑනිගෙ වරදක් නැත්තන් මිනිහෙක් එල්ලිලා මැරෙනවාද නංගියේ' චන්දනක්කා ප්‍රශ්න කළා. ඒවා අපි හරියට දන්නෙ නැහැනෙ.

'දැන් ඉන්නවා පත්තිනි අම්මා වගෙ මිනිය රකින්න. මං ඔකි ආව දවසෙමයි හිතුවෙ අපේ මෝඩයා මහ නස්පැත්තියක් කරගෙන තියෙන්නෙ කියලා. අංගපුලාවෙ වුණත් තියෙන්නෙ මහ වේස පෙනුමක්නෙ.'

සුජාතක්කා නැගිටලා එළියට ගියා. මට ගමනෙ මහන්සිය හරියට. කසුම්ටත් හොඳටම මහන්සියි. කසුම්ට පරිසරයෙ වෙනසකුත් තදින් දැනෙන බව පෙනුණා. ජපානෙ ගේ නෙවෙයි පුතේ මේ අම්මාගෙ ගේ. අපි ඉතින් මේ විදිහට නිදාගමු කියලා මං කසුම්ව හෝදගෙන ආවා. කාමරේ ඇඳේ ළමයි දෙන්නෙක් නිදාගෙන හිටියා. කාගෙද කියලා අහන්නත් බැරි වුණා. ඇඳේ එක පැත්තක් ගසලා මං කසුම්ව නිදගන්න දැම්මා. චන්දනක්කා පොරෝනයක් හොයලා ගෙනත් දුන්නා.

'බඩගිනි ඇති. ඇයි දරුවව නිදි කෙරෙව්වෙ එකපාරටම'

'නෑ බඩගින්නක් නෑ. flight එකේදි කෑවා.' ලනිල් කාමරේට එබිලා බැලුවා. මාව දැකපු ලනිල් මහ ගින්නකට පිච්චුණා වගේ පස්සට පැන්නා. චන්දනක්කා කාමරෙන් එළියට ගියා. සුජාතක්කා කසුම්ගෙ මූණ දිහා ආසාවෙන් බලාගෙන ඉන්නවා.

'හරි හුරතල් පාටයි' එහෙම කියලා සුජාතක්කා කසුම්ගෙ දෙපා පිරිමැද්දා. ඊළඟට සුජාතක්කා රහස් ස්වරයකින් ඇහුවා

රංගන ගැන. රංගනගෙ මරණය ගැන. මට මොනවා හිතෙන්නද? සල්ලිය බාගෙ මදි පාඩුවක්ද? සුදුවට ඇබ්බැහි වෙලා හිටියද? නැහැ සල්ලිය බාගෙ නැතිකමයි, සුදුවට ඇබ්බැහිවීමයි රංගනට මැරෙන්න කාරණයක්යැ? ඉතින් මැරෙන්න තරම් හිත පෑරිච්ච කාරණාව දන්නවද? කාමරේ ඇතුළට නොයෙක් විට බාධා ආවත් සුජාතක්කා කතාව කඩින් කඩ කිව්වා.

මේක රහසක්. අගමුල දනගෙන ඉන්න ඕන හින්දා කියන්නෙ. ඔහොම මැරෙන්න තිබුණෙ එකෙක්. ඒත් මැරුණෙ තව එකෙක්. අනේ සුජාතක්කෙ පින්සිද්ද වෙයි මොකද්ද වුණේ කියන්න. ලනිල් ගෙට රිංගනවා රංගනගෙ අතටම අහුවෙලා. ලනිල් පැනලා ගිහින්. රංගන එතනම ඉඳගෙන ඉකිගහලා අඬලා. හැමෝම එපා කියද්දිනෙ රංගන, වාසනාව ගෙදෙට්ට ගෙනාවෙ. එතකොටත් ළමයා බඩේ. දුප්පත්කම නෙවෙයි ප්‍රශ්නෙ. අපිත් දුප්පත්නෙ නංගි. සුමානයක් කතාබහ නොකර ඉඳලා තියෙනවා. ඊට පස්සෙ දෙන්නා [illegible]ලා මොනවා කතාබහ කරගත්තද කියලා අපි දන්නෙ නැහැ. වාසනා [illegible] ගිය [illegible] වැල දාගෙන තියෙන්නෙ. [illegible] හරිද, [illegible] වැරදිද දන්නෙ නැහැ. ඔන්න ඕකයි කතාව. කතාවක්ද නැත්නම් සිද්ද වෙච්ච දෙයක්ද? සිද්ද වෙච්ච දෙයක්.

'චන්දනක්කා දන්නවද?'

'අපි කිව්වෙ නෑ. දන්නෙ නෑ වගේ පේන්නෙ. පිට කවුරුවත් මේ කතාව දන්නෙ නෑ. චන්දනා දන්නවා නම් ලනිල් යහතින් තියන එකකුත් නෑ.'

පවුලෙ හැමෝම එකතු වෙලා රහසක් රකිනවා. මාත් ඒ රහස රකින්න බැඳිලා ඉන්නවා. ලනිල් ගෑනුන්ගෙ සිතයි-කයයි අඩුස්සන්න දන්න මිනිහෙක්. ඒක සුජාතක්කට විස්තර කරන්න පුළුවන් කමක් මට නැහැනෙ. ලනිල් ගෙට රිංගුවෙ නැමැත්ත ඇතුවද [illegible]

'මොකටද ඉතින් ලනිල් මෙතෙන්ට වැද්ද ගත්තෙ?'

'ලනිල්ව මෙතනින් පැන්නුවොත් ගමම දැනගනියි. දැන නොගත්තත් කතාවෙ අගමුල පුරුද්ද ගනියි.'

'ගමමූ දන්නවා ඇති නොදන්නවා වගේ හිටියට. ඕවා හංගන්න බෑ.'

මං හිතන්නෙ නෑ. දන්නවා නම් තිකත් ඉද්ද ගමමූ? රංගනත් ලියුමක්වත් ලියලා නෑ. මැරෙන්න ඉස්සෙල්ලා ළමයි දෙන්නට කිව්වලු පුළුවන් නම් නැන්දා ළගට පලයල්ලා මං දුර ගමනක් යනවා කියලා. ඔය ඉතින් ගිය දුර ගමන තමයි. ඒ කතාවට මගේ ඇඟ සීතල වෙලා ගියා. මල්ලියෙ මට කසාද බඳින්න මහ ය ගිහින් සාරිමාල එහෙම කුලියට අරගෙන ආවෙ උඹනෙ. ඊට කලින් ජයනාථලත් එක්ක විනෝද ගමනක් යන්න ලැස්ති වෙලා අන්තිම මොහොතෙ නැවිත් හිටියෙත් උඹනෙ. [illegible] එක්කොම වුණේ. අද වගේ [illegible] නම් එද වෙච්ච [illegible] [illegible] අදයි වෙනස්. ඊට නෙවෙයි මම. පුංචි සන්දියෙ අපි දෙන්නා රණ්ඩු වුණේම නෑ. රණ්ඩු වුණේ චන්දනක්කා එක්කනෙ. ඒ දවස්වල ලනිල්ගෙයි චන්දනක්කාගෙයි සම්බන්ධෙ තාත්තට අල්ලලා දෙමූ කියලා කිව්වෙත් උඹ. අල්ලලා දෙන්න තිබුණෙ. කෝ අර කෙට්ටු හුනා? ඌ දන් මැරිලා ගිහින් ඇති. ඌ මහ දුර්වලයෙක්. ගොදුරක් අල්ලගන්නම බැරිද? බත් ඇටයක් හොයා ගන්නවත් බැරිද? මතකද අපි දෙන්නා ඒ සාගත හුනාට ඉරටුවක ගහලා බත් ඇට දුන්නා. උඹ මහ දුර්වල මිනිහෙක් මල්ලියෙ. උඹේ හිත කොයි වෙලාවකවත් එහෙ මෙහෙ වෙලා නැද්ද? එහෙම එකා මෙහා වෙනවනෙ. ලනිල් කරපු දේ හරි කියලා කියනවා නෙවෙයි. ඒත් අපි කවුරුත් මනුස්සයොනෙ. පවුලෙ පවුල් කන්න බැහැ තමයි. ඇතු පන්සිති අම්මලා නෙවෙයි කියයි. ඒ වගේම තමයි පිරිමි කියන්නෙ අනගාරිකලත් නෙවෙයි. මහ ය දෙගොඩ [illegible] [illegible] මිනිහෙක් ඇතිව කියන්නෙ මිනිහා [illegible]

නොමැරී ඉන්න තිබුණා. දැන් වෙලා තියෙන්නෙ අපිට සහෝදරයා නැති වුණා. දරුවන්ට තාත්තා නැති වුණා. ගෑනිට මිනිහා නැති වුණා. ලනිල්ට කිසිදෙයක් නැති වුණේ නැහැනෙ. මල්ලි වුණාට උඹ මගේ පුංචි කාලෙ වීරයා. දැන් ඒ වීරයා මරලා දාලා නේද? ඒ මිනීමැරුම කළේ උඹමයි. එතකොට උඹ අපරාදකාරයෙක් වෙනවා. පොල්තෙල් පහන් තිරයක් පිච්චෙන සුවඳ එනවා. දැන් උඹේ භාර්යාව හිරකාරියක් වෙලා. පවුලෙ තවත් කෙනෙකුගෙ ආරක්ෂාවට කාරණාව රහසක්ව තියාගත්තට අනික් හැමෝම එකතුවෙලා උඹේ භාර්යාව කූරුසෙ තියලා ඇණ ගහයි. පුටු එහා මෙහා අදින සද්දයක් ඇහෙනවා. මේ කොහේ ඉන්න සෙනගක්ද? එනවා, එනවා වැලනොකැඩී එනවා. උඹ සම්පූර්ණයෙන්ම ජීවත් වෙච්ච මිනිහෙක් නේද? නැහැ එක්කො ඔය සාමාන්‍ය මිනිහගෙ කුතුහලය. හේතුවක් එළියට නොදී එල්ලිලා මැරිච්ච මිනිහා බලන්න එන කුතුහලයෙන් පිරිච්ච මිනිස්සු ගැනු. හොයාගෙන යන්න එන්නෙ. ගෑනියෙකුට මෙහෙම කළ එක වැරදියි. ගෑනිව විත්ති කූඩුවක තියලා උඹ පැනලා ගියා.

වාසනා මං එක්ක කතා කරන්න උත්සාහ කරනවා පෙනුණා. කතා කරන්න එපා මම දන්නවා. වෙන්න පුළුවන් විධි ගණනාවක් මම දන්නවා. ලංකාවෙ හිටියා නම් ඔය දේ මට වෙන්න තිබුණා. ගිය පාර ලංකාවට ආපු වෙලාවෙ මං ඉක්මණට ගියේ ඔය කාරණාව හින්දා.

කසුමි පුදුම වෙලා හිටියෙ. නෑයො මහගොඩක් එකපාරට මුණ ගැහිලා. හැමෝම කසුමි දිහා බලන්නෙ ඇස් නළලට අරගෙන නූපාට ජපන් ළමයෙක් හම්බ වෙලා. ජපන් මිනිහෙක්නෙ මිනිහා එතකොට ඉතින් ළමයා ජපන්නෙ. මේක අටවැනි ලෝක පුදුමය වෙලානෙ.

'ගෙදර යන්නෙ කවදද?' කසුමි හැමතිස්සෙම ජපන් බසින් ඇහුවා. මම ඒ ප්‍රශ්නවලට ජපන් බසින් පිළිතුරු දෙනකොට නෑදෑයො කටවල් [illegible] ජපන් කතා කරන්නත් [illegible]

'මරණයෙ කටයුතුවලින් පස්සෙ මෙකිව මෙහෙන් පන්නන්න ඕන' චන්දනක්කා කිව්වෙ කාමරේට ඇවිත් ඇඳුම් මාරු කරන ගමන්.

'කොහේ එළවන්නද?'

'යන්නෙ නැතෑ හොර මිනිහෙක් ඉන්නවා නම් ඒකත් එක්කම'

මං නැගිටලා චන්දනක්කා ළගට ගියා. චන්දනක්කා මගේ දෙවුරින් අල්ලාගත්තා. පච්කාරයට ගල්ගහන්නද හදන්නෙ?

'දරුවො දෙන්නා අපිට බලා ගන්න පුළුවන්නෙ. හැබැයි උන් දෙන්නත් අම්මා වගේ මිස අප්පා වගේ නොවෙයි නංගි'

හැමෝම රකින රහස අරන් මූණට දමලා ගහන්න හිතයි. ඒත් මං ඉවසනවා. අපි ඔක්කොම ඉවසන්නෙ ඔය සමතළ පවුල වෙනුවෙන්. රංගන අපේ සහෝදරයා - ඕයා අපේ සහෝදරී.

'වාසනා එළවන්න ලෑස්ති වෙන්න එපා'

චන්දනක්කා මගේ දෙවුර මත තිබුණු ඇගේ අත්දෙක හෙමින් පහළට ගත්තා. මූණේ තිබුණෙ උඹට මේ මක්වෙලාද අහන ප්‍රශ්නාර්ථය. උඹට කොහෙත්ම කතාකරලා කියන්න බැරි රහසක් අපේ ජීවිතවලට බලපාලා තියෙනවා. අපේ මල්ලිට. අපේ නැනාට. අපේ මල්ලිගෙ ළමයින්ට. සුජාතක්කාට, රුබට්ලට අපි හැමෝටම. අපි සම්මුතියකට ඇවිත් තියෙනවා.

'දැන් ඉතින් මල්ලි වෙනුවෙන් අපි වාසනාව බලාගන්න ඕන.'

චන්දනක්කගෙ ඇස්දෙකේ දල්වුණේ ගින්නක්. ඒ ගින්නෙන් මගේ මූණට විසි වුණා ගිනි පුපුරු. උඹ ඉස්සෙක්. ඔක්කොම අගුවි තියෙන්නෙ [illegible] උඹ ළඟ. ඒත් ඉතින් උඹේ ස්වාමිපුරුෂයා කළ වරදට [illegible]

හිරියට රංගනගෙ දුප්පත් සිරියහන් ගැබට කඩාවැදිලා ඒක විනාශ කරලා දම්මෙ උඹේ ස්වාමිපුරුෂයා තමයි.

'බලාගනිල්ලා. බලාගනිල්ලා. හොඳට බලාගනිල්ලා' කියලා චන්ද්‍රකාන්තා කාමරෙන් එළියට ආවෙ කතුලක් කැඩිච්ච අස්සයෙක් වගේ. කසුම්ට මේ කිසි දෙයක් වටහගන්න බැහැ. වටහගන්න බැරි එක හොඳයි පුතේ. ලංකාවෙ මළගමකදී මිනිස්සු මෙච්චර රණ්ඩුවෙන්නේ මොකද කියලා කවද හරි මගෙන් අහන්න එපා. ළතිල් ලොකු කල්පනාවකින් ලොකු හදිස්සියකින් බයිසිකලේ එහෙ මෙහෙ ආවා ගියා. සුජාතක්කා කසුම්ට කෑම ටිකක් හදාගෙන ආවා ගෙදර ගිහින්. මම චොප්ස්ටික්ස් දෙක දුන්නම කසුම්. සුජාතාක්කා ගෙනාපු අලයි, මාළුයි, බතුයි කිසිදු දුක්ක කිරීමක් නැතුව කෑවා. බඩගිනි වෙලා හොඳටම. ඇඳේ හිටිය ළමයි දෙන්නා ඊට පස්සේ පේන්න හිටියෙ නැහැ. ඒක සිත්ත කසුම් තනියම ඇඳ අස්පත් කරගෙන හිටියා. මම ආවෙ රංගනගෙ මළගෙදර පමණක් නොවෙයි. අම්මගෙ, තාත්තාගෙ මළගෙ මම ආවෙ මළගම් පුතාත. [illegible] කවුද මේ [illegible] ඉන්නෙ?

රූබට් මහා පුරුෂයෙක්. දන් තාත්තගෙ තැන අරගෙන. ළඟ කරනවා. උපදෙස් දෙනවා. සුදු සරමක් ඇඳගෙන. අත්තෙට් කමිසයකුත් එක්ක. ජීනදසයියත් උපදෙස් ගන්නෙ රූබට්ගෙන්. සුජාතක්කා රූබට් අයියාට රහසේ මොනවාද කියනවා පෙනුණා.

'හුජා නංගි. මේ වැඩ ටික එකලාසයක් කරගන්න එපායි මෙතාට දුවන සින්ද කතා කරන්නවත් බැරි වුණා හරියට' කියලා රූබට් අයියා පිටි අල්ලෙන් තලල පිහිදා ගත්තා. දාඩිය බේරෙනවා. ලොකුදේමයි, පොඩිදේමයි තාන්දකරන්නයි නුත්දෙනාම නොගිනපු සමයි සමාදානෙකින්ද මේ බැඳිලා ඉන්නේ.

[illegible]

වෙන්නෙ නෑ නංගි. එදට මිනිස්සු ගල්ගහන්නෙත, මිටං හංගන්න හොරගල් අහුලලා දුන්නු අපි උඹලට'

රූබට් අයියා චෝදනා කළේ ළතිල්ටයි, වාසනාටයි. වාසනා කිසිදෙයක් සිද්ධ වුණේ නෑ වගේ මළගෙදරට එන අය පිළිගන්නවා. ඇඳුම් මුහුණින්. මූණ ඉදිමිලා. රංගන මට කියපිච්චින් පාරක් ගහලා නෑ, මටයි, ළමයින්ටයි පණ වගේ ආදරේ. දන් ඉතින් අපට කාගෙ පිහිටක්ද? චන්ද්‍රකාන්තා ඒකට කිව්වෙ බොරු රඟපෑම් කියලා. මිනිට අඩන්න ග්ලිසරින් ඕනෑ නෑ. හොඳට දන්නවා රඟපෑම. මෙයාගෙ චරිතෙ එතනොටම බිල්වෙලා තිබුණෙ. පුරුද්ද අත අරින්න බෑ.

'මය ගැනිට දෙස් කියලා වැඩක් නැහෙ දන්. මැරුණා නොවෙයිනෙ. තමුන් පණ නාති කර ගත්තනෙ.'

'කවුද එතෙන්ට වැඩ සිද්ද කළේ? අපේ එකා ගෙට හොඳයා වගේ ඒකිට [illegible] කරකර හිටියෙ. යට ඇඳුම් පවා [illegible] දුන්නා. [illegible] දාලා තියෙනවා.'

චන්ද්‍රකාන්තා බොරු සාක්කි හදනවා. ඒත් චන්ද්‍රකාන්තා සාක්කි හදන්නෙ තමුන්ගෙ ස්වාමිපුරුෂයෙත් විත්තිකාරයා වෙච්ච නඩුවකට කියලා නොදන්න හැටි. තමුන්ගෙ ස්වාමිපුරුෂයා ගැන දන්නෙ අපි.

'අපි හැමෝම එකතු කරලා පෙට්ටිය ගත්තෙ. අම්මගෙයි තාත්තගෙයි මළගම් කළෙත් ණය වෙලා. ඒ මළගම් දෙක එකපිට එක ආවෙනෙ. එකක් කරලා හුස්ම ගන්න හම්බ වුණේ නැහැ ඉතින. රංගන සත පහක් ඉතුරු කරපු මිනිහෙක්යැ. තරිකට බෝන් කරකර හිටියා මිසක'

ඒ සිතිගෙල වැදුණේ පසුවටමයි. මළ ගෙදරට පස ගහපු වෙලාවේ ඉඳලා මගේ අවලංගුකම මට දැනුණා. [illegible]

කිහිලිකරු දෙකකින් ඇවිද ඇවිද හිඟමන් යදින හිඟන්නෙක් බවට පත්වෙලා. තමුන්ගේ පුරුෂයා හින්ද තමුන්ගෙ සහෝදරයා සියදිවි නසාගත්තාය කියන කාරණාව ගැන හාංකවිසියක් නොදන මළ ගෙමි කටයුතුවල මහරජින වගේ නිරතවෙලා ඉන්න චන්ද්‍රනක්කාට මොන විදිහටවත් මේක තේරුම් කරලා දෙන්න බෑ.

'මම ණයට ටිකට් අරගෙන ආවෙ'යි කියා ඈ කුපිත කරවන්නට මට නොසිතෙයි. චන්ද්‍රනක්කා මාධ්‍ය ප්‍රකාශිකාවයි. එය මුළු පවුලේම අදහස විය යුතුය. මට රෝසි කී කතාවත් ඇගේ උපදෙසුත් සිහිවෙයි. හිත නරක් කරගන්නට එපා යැයි ඇය කීවාය. මා අත ඇත්තේ රුපියල් තිස්දහසක පමණ මුදලකි. මා යටි සිතින් සිතා සිටින්නේ එයින් රුපියල් දසදහසක් හෝ වාසනාගේ වියදමට දිය යුතුය කියාය. වාසනා කුමක් කළත්, ඇයට දරු දෙදෙනාගේ වගකීම කරට ගන්නට සිදුවෙයි. ඒ දරුවන් වෙනුවෙන් අපටද වගකීමක් ඇත. රුපියල් දසදහසකින් ඒ වගකීම ඉටුකළ නොහැකිය. මා ආපසු ජපානයට යන දවස වනතුරුම මගේ අතේ [illegible] තිබිය යුතු මුදලක් තිබිය යුතුය. [illegible] අසනීපයක් සිදුවුවහොත් ප්‍රතිකාර ගන්නට මුදලක් මට නැත.

මම සුජාතක්කාට මගේ සිතැඟි කීවෙමි. මගේ ගුවන් ප්‍රවේශ පත්‍රය ලබාගත් ආකාරයද, අපගේ දුක්කරදර බිඳක්ද ඇයට කීවෙමි. සුජාතක්කා අසා සිටියේ අපේ අම්මා මෙන් ඉවසීමකිනි. ඇය මුළු කතාව තුළදීම හිස දෙපසට සෙලවුවා මිස කතා නොකළාය. අවසානයේදී ඇය යාන්තමට සිනාසී මගේ උරහිසට තට්ටු කළාය.

'අපි ඔක්කොම බලා ගන්නවනෙ නංගි. ඔයා ආපු එකම මදෑ එච්චර කරදර තොඩක් තියාගෙන. මාත් හිතන්නෙ අපි හැමෝම වාසනාට අනුකම්පා කරන්න ඕන කියල තමයි. හැම ගැනිටම බැහැනෙ සමහර දේවල් ඉවසගෙන ඉන්න. එහෙම ඉවසගෙන ඉන්න බැරිවෙච්ච වෙලාවක සිද්ද වෙච්ච දෙයක් වෙන්නැති. දැන් මොනවා කරන්නද?' [illegible]

අපි කනත්තෙහි බොහෝ වෙලාවක් [illegible] මල්ලීගෙ අතීතය කනත්තට ඉහළ අහසෙහි සිත්තම් වෙනු මම දුටුවෙමි. ළමයින් හුරතල් කරන පවුල් පසුබිමක අප නොසිටි තමුදු මල්ලී පවුලෙහි සුරතලා වූයේය. තාත්තා කෙසේවුවත් අම්මා මල්ලීව සුරතල් කළාය. ඔහු හොඳින් ඉගෙන ගත්තේ නැත. එහෙත් ඔහු සමාජයෙන් හොඳ උගැන්මක් ලබනු ඇතැයි මම සිතා සිටියෙමි. ඔහු සමාජයෙන්ද හොඳ උගැන්මක් ලබා නැතැයි අවසානයේදී අපට නිගමනය කරන්නට සිදුවෙයි. මල්ලීගේත්, මගේත් ජීවිත එක සමාන තැනක තබා සසඳා බැලිය නොහැකිය. එහෙත් අප දෙදෙනාගේ ළමා කාලය එසේ සසඳා බැලිය හැකිය. එහෙත් මම දැන් එසේ නොකරන්නෙමි. ඒ මට එයින් වේදනාව පමණක් එකතු වන බැවිනි. පිරිමියෙකු ලෙස භාර්යාවගේ සම්පූර්ණ පිරිසිදු සන්තකය අපේක්ෂා කිරීම මල්ලීට වැරදුණ තැන යයි මම සිතමි. මල්ලිට එබන්දක් බලාපොරොත්තු වෙන්නට සුදුසුකමක් නොතිබුණු බවද දනිමි.

රංගනගේ ප්‍රේමයක් පිළිබඳව මට කරුණු කීවේ සුජාතක්කාය. එය සැබෑවක්දැයි නොදන්නා බවද ඇය කීවාය.

කනත්තේ සිටින සියලුම දෙනා රංගනට සමුදෙන්නට සූදානම් වෙති. එහෙත් කිසි දිනෙක මට රංගනගෙන් සමුගත නොහැකිය. ඔහු මගේ ජීවිතයට සමීප වූ ඉතා ලෙන්ගතු පුරුෂයා වූයේය. වියපත් ජපනකු හා විවාහ වීමට මා කැමැත්ත පළ කළ අවස්ථාවේ ඔහු නොකා නොබී සිටියේය. ජැන්ඩියට හැදපැළඳ ගෙන මංගල උත්සවයට සහභාගී වූ නමුත් රංගන මුළු දවසම හැඬූ බව පසු දවසක සුජාතක්කා කීවාය. දැන් ඔහු මගෙන් යමක් බලාපොරොත්තු වෙයි. ඔහුගේ දරු දෙදෙනා මගේ භාරයට පැවරීමට ඔහු අවසාන කැමැත්ත පළ කර ඇත. එය අවසාන කැමැත්ත නොව අවසාන ඉල්ලීමය. නුඹේ මළගම මේ අහස්කුස [illegible] තරඹන්නේ නම්, මගේ හිතෙහි දැවෙන දුක නුඹ තේරුම් [illegible]

නුඹේ දෙණට පස්මිටක් අත හරින්නට මට මගේ සිත ඉඩ නොදෙයි. නුඹේ බිරිඳ හඬා වැලපෙන හැටි බලා සිටින්න. දරු දෙදෙනා වැලපෙන හැටි බලා සිටින්න. කළ දේ හරිද කියා නුඹේ හෘද සාක්ෂියෙන් විමසා බලන්න. මේ වැළපින්නියක සේ හඬන්නේ පරපුරුෂයෙකු වෙත ආශක්ත වූ නුඹේ බිරිඳයි. පරපුරුෂයෙකු වෙත ආශක්ත වූ පමණින්ම බිරිඳකගේත්, සැමියෙකුගේත් බන්ධනය ගිලිහී නොයන බවද ඇය මේ වැළපුමෙන් කියා සිටින්නේ? නුඹගේ බිරිඳගේ පරපුරුෂයා කිසිවක් සිදු නොවූවාක් මෙන් ඔහුගේ බිරිඳ වත්තන් කොටගෙන සිටින හැටි බලන්න.

අපි ඉතින් යනවා මල්ලියෙ. එහෙම තමයි සදහටම වෙලා තියෙන්නෙ. පණ නැති වුණාම අත අරිනවා. නියමය එහෙමයි. ඊට පස්සේ හිත හැදෙනවා. අමතක වෙනවා. හත්දවසේ, තුන්මාසේ, අවුරුද්දේ, දෑවුරුද්දේ දාන දෙනවා. ඊට පස්සේ නිකම්ම මැකිලා යනවා. හිත හිතා කරනවා නෙවෙයි, ඉබේම සිද්ද වෙනවා.

අපි යනවා මල්ලියෙ.

මහ සෙනගක් ආවනේ. ඒ මුළු මහ සෙනගම ආපහු යනවා. අක්කලා, අයියලා ඔක්කොම ආපසු යනවා.

දැන් නුඹ සිටින්නේ මළවුන් සමග. ආපහු එනවද මළවුන්ගෙ අවුරුදු දාට. ජපානෙට. අපේ ගෙදරට එනවා මං වං ගෙ තෑදෑයෝ එදාට. මල්ලිත් එන්න. අපි එහෙන් තමකුත් ඉල්ල ගනිමු. මළවුන්ගෙ තමක්.

මළවුන්ගේ අවුරුදු දාට ඇවිත් යන්න එන්න. අම්මටි තාත්තයි එක්කරන් එන්න.

වාසනා ඇඳේ වැතිරිලා හිටියා. හත් දවසෙ දානෙ ඉවර වෙලා [illegible]
ඉන්නෙ [illegible]

[illegible] මල්ලිව වහලෙක් කරගත්තා. දස වද දුන්නා. අන්තිමේදී මරා [illegible]න්නා. වාසනා අඬන්නේ ස්වාමි පුරුෂයා මැරුණටද? නැත්නම් [illegible]මේ අවලාද ඉවසගෙන ඉන්න බැරුවද කියලා කවුරුවත් දන්නේ නෑ. දෙකටම වෙන්න ඇති.

'ඔය ගැනිට ඉන්න දීපල්ලා'

රූබට් කිව්වේ ආඥාවක විලාසයෙන්. රූබට් අයියගෙ ඉවසීමේ සීමාව ඉක්මවා ගියොත්, චන්දනක්කාගේ පවුලත් කැඩිලා [illegible]යි කියලා හැමෝම බයකින් හිටියා. දානෙ උයන්න උදව් වෙන්න ආපු අහල පහළ උදවියයි, ලතිල්ගෙ ගෙදර උදවියයි, [illegible]හොර හොරෙන් වාසනා කරපු දේ ගැන දොස් පැවරුවේ වාසනා ජීවිතේ පළවැනි වතාවට එයාකාර වරදක් කරපු ගෑනි කියලා [illegible]තාගෙන වගේ. මේ ගෑනි අනාචාරයේ හැසිරුණා නම් ඒ අනාචාරයට තව මිනිහෙක් ඉන්නවනෙ. ඇයි ඒ මිනිහට දඬුවමක් නැත්තෙ? ඒ මිනිහා රංගනගෙ මළගමේ කටයුතු කරන්නේ එක [illegible] ආපු [illegible] වගේ. උඹ හිතන්නේ අපි [illegible]වත් [illegible]ම දන්නෙ නැති [illegible] කියලද?

'වාසනා - මං ඔයාට මගේ නැතිබැරිකම් කියන්න කැමති නැහැ. මට පුළුවන් මේ වෙලාවෙ මෙච්චරයි' කියලා මං රුපියල් දාහක් වාසනාට දුන්නා. වාසනාගේ අත් දෙක වෙව්ලුවා. කිසි දෙයක් කතා කළේ නැහැ.

'ඔය හිතලා බලන්න මොනවද කරන්නෙ කියලා. ඉදිරියට ලතිල්ගෙන් පරිස්සම් වෙන්න. පුළුවන් තමන් තියෙනවා නම් ළමයිනුත් එක්ක අම්මලා ළඟට යන්න.'

අපි දෙන්නම ඇඬුවේ නැහැ. මොකද්ද බන්ධනයකින් බැඳුණා වගේ එකිනෙකා දිහා බලාගෙන හිටියා.

මම ඇයගේ සුබ සිද්ධිය පතමි. ඇය තරුණ ගැහැනියකි. [illegible] දරු දෙදෙනෙකුගේ මවද වෙයි. ස්වාමි පුරුෂයාගේ පියදිවි [illegible] ඇයට දුකක්ද, පාඩුවක්ද පරාජයක්ද වෙයි. එය [illegible]

ඉදිරියට යා යුත්තේ තමා අවට සිටින ජනිජනයා ඒ කළුපැල්ලම දෙසම බලන බව දැනගෙනය. ඇය වරදක් කරන්නටද, ඇත. නොකරන්නට ද ඇත. අනෙක් අතට එය වරදක් යැයි තීරණය කරන මිනුම් දණ්ඩ කුමක්ද?

මල්ලිගේ පොඩිවුන් දෙදෙනා වෙත්ව යන නැයිත් දෙස බලා සිටිති. කසුමි තනම් පැදුරෙහි ඉඳගෙන සිටින්නාක් මෙන් බිම දිගහැර තිබෙන පැදුරක ඉඳගෙන සිටියි. මම වාසනා සමග තවත් කිසිවක් කතා නොකොට කසුමි සමීපයට පැමිණියෙමි. ඇගේ සිතෙහි තදබල දුකක් ඇති වෙයි. කුඩා වුවද කසුමි සියල්ල ඉවසා සිටීමට පුරුදු පුහුණුව ඇත්තේ කොයිබින්ද? එය ජපන් ජාතික උරුමයද? ඉතා ශාන්ත දාන්තව පැදුරෙහි ඉඳගෙන සිටින කසුමි දකින මට මහත් දුකක් සිතෙයි. මේ සමාජය තුළ, ඇයගේ මවගේ ඥාතීන් අතුරෙහි ඇය හුදකලා වී සිටින්නීද? සුජාතක්කා මා සමීපයට පැමිණියේ මා පැදුරෙහි හිඳගෙන කසුමි තුරුළු කරගත් මොහොතෙහිය. කසුමි සුජාතක්කා දෙස බලා සුරතල් සිනාවක් පෑවාය.

'දානෙට හදපු අච්චාරු ටිකක් එහෙම අරගෙන යන්න' ඇය කීවාය.

ඒ ඇයට දෙන්නට හැකි දෙයයි. මම කිසිවක් නොකීවෙමි.

'ලහිල් මේ ගැනිට හිරිහැර කරයි ද?' මම ඇසුවෙමි.

'මෙයා අකමැති නම්නෙ හිරිහැරයක් වෙන්නේ. අපි අගක් මුලක් දන්නෙ නෑ. ඒත් අපිට ඕවට ඇඟිලි ගහන්ඩ බෑ.'

චන්දනක්කා එතැනට පැමිණීමෙන් කතාව නවත්තන්නට සිදුවිය. ඇය කෘත්‍රිම ලෙස පුළුල් සිනාවක් පා පැදුරෙහි ඉඳගත්තාය.

හිස පිරිමදිමිනි. සුජාතක්කා කසුමිගෙන් කිසිවක් අසනු පෙනිණි. ඒ ඒ සංඥා බස කසුමි තේරුම් ගනියි.

'දැන් මළගමක් කරනවා කියන්නෙ මඟුලක් ගන්නවා වගේ මහ වියදම් වැඩක්' ඇය කීවාය.

සුජාතක්කාට නැගිට යන්නට හොඳටම වුවමනා වුණත් ඇය හිටියේ නැගිටගන්න බැරි තරමට කකුල් හිරිවැටුණා වගෙයි.

'කසුමිට සිංහල උගන්නන්න තූපා. අපිට ජපන් ඉගෙන ගන්න බැහැනෙ.' කියමින් චන්දනක්කා කසුමිගෙ මූණ අතගෑවා. කතාබහ කරන භාෂාව නොතේරුණාට, කතා කරන දේ තේරුණා වගේ කසුමි කට ඇරගෙන බලාගෙන හිටියා. චන්දනක්කයි, සුජාතක්කයි අතර තිබුණු වෙනස කසුමිට තේරුණාද?

'ලහිල් කන්තෝරුවෙන් ණයක් ගත්තා මළගමට. අපිට නව බිලක් එකතු වුණා'

යුතුකමටනේ.

සුජාතක්කා මගේ මූණ බැලුවා. යුතුකමක් තියෙනවා නේන්නම්. සුජාතක්කා වචනයක්වත් කතා නොකර බිම බලාගෙන හිටියා. එක අතකට චන්දනක්කා අපි හැමෝටම වැඩිය අසරණයි නේද කියන හැඟීම හිතට ආවා. රංගනගේ බෙල්ලෙ වැල දා ගත්ත තොණ්ඩුව හදලා දුන්නෙ ලහිල් කියන එක නොදන්නෙ චන්දනා විතරනෙ. රහස් පරීක්ෂකයෙක් වගේ අසල්වැසි ගෙවලුත් පාලනය කරන චන්දනක්කට තමන්ගෙ ගෙදර ඉන්න මිනිහා ගැන ඉවක් නැතිවීම පුදුමයක්.

'ටිකට් එකටත් ලොකු ගාණක් යන්න ඇතිනෙ තූපා නංගිට. ඔය රටවල්වල හරි වියදම් ඇතිනෙ' කියලා සුජාතක්කා, චන්දනක්කා... මෙල්ල කරගන්න උත්සාහ කළා. උත්සාහය පරාජය

'එක මඩවැල කඩාගෙන ආවෙ මමද - එයාද?'

චන්ද්‍රනත්තා ඇහුවා. උත්තරය එච්චර ගුණ නැති උත්තරයක් බව දන්න හින්දා මං කතාවට ගියෙ නෑ. ටිකක් වෙලා නැගෙන්න උත්සාහ කර කර ඉඳලා චන්ද්‍රනාත්තා කසුම්ගෙ පිටට එකක් ගහගෙන නැගිට්ටා. කසුම් ඒ පහරෙන් වැළකෙන්න උත්සාහ කළා. මගේ හිසේ නිරන්තරයෙන් තිබෙන තද කැක්කුම ඉවසගෙන ඉන්නවා වගේ චන්ද්‍රනාත්තාගෙ කෙනෙහිලි. චන්ද්‍රනත්තා වෙනුවෙන් ඉවසිය යුතුයි කියලා යටිහිත දනගෙන හිටියා.

'මින්කොම අය ආපසු යනවා මමා. අපි කවදද යන්නේ?' කසුම් පැදුර දිහා බලාගෙනම ඇහුවා. කසුම්ට ජීවිතේ දුනෙන්නෙ මෙහෙ නෙවෙයිනෙ. වචනයක්වත් කතා නොකළට කසුම්ට ඇගේ පියා සිහිවෙනවා ඇති. තතමි පැදුර සිහිවෙනවා ඇති. අම්මයි-තාත්තයි මැදට වෙලා නිදාගන්න ඇඳ සිහිවෙනවා ඇති. සෝරා සාන්ගෙ [illegible] සිහිවෙනවා ඇති.

අම්මායි - [illegible] කියලා සුජාතක්කා කිව්වත් මට ඒකට හිතක් නෑ. රංගනගේ අවසාන කටයුතු කළාට රංගන මිය ගියේ නැහැ. අම්මයි - තාත්තයි කියන්නෙ මලගිය ඇත්තොත් නෙවෙයි. නොමැරුණු දෙන්නෙකුට මිනීවළවල් නැහැ.

මොහොතක් පාසා මැරෙන්නෙ ජීවත්ව ඉන්න උදවිය.

9

ආයෙම මල් පිපිලා. ගේ වටේ තිබෙන පුංචි සකුරා ගස් පේළියෙ මල් පිපිලා. ඊච් ගහෙත් මල් පිපිලා. මුළු සන්ජෝ නගරයෙම මල් පිපිලා. කුරුල්ලොත් නොනවත්වා ගායනා කරනවා. සන්ජෝ නගරය චිත්‍රයක් නම්, කුරුල්ලොයි, ගහ කොළ මල්වැලුයි ඒ චිත්‍රයට දර්ශනීය ජීවයක් දෙනවා. මේ දර්ශනීය ජීය හිත උමතු කරවනවා. ඔය අහසෙ පාවෙවී ඉන්නේ නැතුව පොළවට බහින්න පෙම්බරා. දුර වැඩියි. [illegible] පපුවට තද කරගෙන ඉන්න බැහැ. [illegible] ඔබේ කය මටා [illegible] මං. මම මට [illegible] වර්ණයක් ඔබට දෙනවා. මට මිහ උසක් ඔබට දෙනවා. මට රුචි හඬක් ඔබට දෙනවා. ඉතින් ඔය චාතුර්මහාරාජිකයෙ ඉඳගෙන විශ්වයටම ඇහෙන්න ගිටාරය වාදනය කරන්න. ඒ විශ්වයේ ගිටාරය. සකුරා මල් පිපිලා තියෙන මේ සන්ජෝ නගරයෙ අහසෙ දේදුන්නක් වගේ පායලා ඉන්න. මං යනවා පාවෙවී පාවෙවී ෂිනානො ගඟ මුහුදට වැටෙන තැනට. කන්ද කඳු දෙකක් වෙච්ච තැනට. ඔය ගලන්නෙ ගඟ හරි අපූරුවට. අහසෙයි පොළවෙයි ඉඳගෙන විඳින ප්‍රේමය, විඳින ආදරය, විඳින උණුසුම හැබෑවටම විඳින්න පොළවට බහින්න පෙම්බරා. පොළවට පායන දේදුන්නක් වෙන්න පුළුවන්ද? ෂිනානො ගඟ අසබඩ කඳු දෙක වගේ අපි දෙපැත්තකට වෙලා ඉන්නෙ ඇයි. මේ වසන්ත කාලෙ හැමෝම නටනවනෙ. සන්ජෝ දුම්රියපොළ ඉස්සරහ වේදිකාවෙ නැටුම් සංදර්ශනය බලන්න පෙම්බරා එනවනෙ. එකම ගීතයට නටන එකම නැටුම. ඉතින් මේ රස [illegible]වට වඩින්න පෙම්බරා! එකම ඇඳුම - එකම නැටුම.

මේ ජිවිතේ කසුම්ව තුරුල් කරගෙන. මං චං නිතරමේකිට බලාගෙන හිටියා. සන්ජෝ නගරයෙ ලොකුම මල් කාවේ සිතිහි මං චං ගෙ පන්තියෙ ඉගෙන ගත්තු. මං චංගෙ කොඳුම යාළුවා නිරෝෂා සාන්. නිරෝෂා සාන්, මං චං ගෙ පන්තියේ වුණත් මං චං ට වඩා තරුණ පාට වුණේ කොහොමද? පාට සාරියක් පැටින් මං චංට ආචාර කළා. සන්ජෝ නගරයෙ ප්‍රධාන විදියක සැලොන් එක අයිති මිට් මහත ආධ්‍යක්ෂකාරියා. කැපැල් ස්ථානාධිපතිත් එක ඉස්කෝලෙ. මං චං ඒ තැමෝට්ටම වැඩිය වයසට ගියේ කොහොමද? ප්‍රශ්න කල් තනිකඩව හිටියොත් එහෙම වයසට යනවද? එකපාරටම හිතට කෝපයක් දනෙන්න වුණා. සායා සාන් තරුණකම අරගෙනද යන්න ගියේ. කම රැළි වැටෙනතුරු හිටියොත් ලංකාවට ඇවිත් කසාදයක් බැඳගන්න. වයසක මිනිස්සු වුණත් කොච්චර ප්‍රේමයෙන් පසු වෙනවද? හිත වයසට නොයා ඉන්න බැරිද? ප්‍රේමයක් ගැන අහලවත් නැති, මනුස්සයෙකුගෙ හැඟීම් දැනීම් නොදනෙන, හා බා, කියාගන්නු ගමන් ඉන්න එරුවෙකුට භාර්යාව වීම බත්තරමුල්ලෙ අපේ [illegible] හිතනවා වගේ [illegible] විතරද?

වසන්ත උත්සව [illegible] විදුලි බුබුළුවලිනුයි, රාජකීය කරත්තවලිනුයි විචිත්‍රවත් වෙලා තිබුණා. කසුම් නම් කළේ උඩ පනින එක, හිනාවෙන එක, දුවන එක. කසුම් නැතිවුණොත් කියන බයෙන් මං චං හිටියේ කසුම් දිහා ඇහැ ගහගෙන. ඒක හින්දා මං චං ට වසන්ත උත්සවයෙ නියම ශ්‍රිය බලන්න ලැබුණෙ නැහැ.

එකපාරටම තදබදයක් ඇති වුණා. කලවෙනුත් උඩට කෙටි පිම්බෙන සායවල් ඇඳගෙන හිටපු අවුරුදු දහතේ දහ අටේ තරුණ ගැණු ළමයි පෙළක් ලනාවකට ඇවිදගෙන ගියා. ඔවුන්ගෙ මූණු පාට කරලා. මගේ හිතට නැගුණෙ ඕවා හෝදන්න කොච්චර කාලයක් ගතවෙනවා ඇතිද - නැත්නම් හම කොච්චර නාස්ති වෙන්න ඕනද කියන ප්‍රශ්නයි.

හිනාවත් මතු වුණා විදි ඉරක් වගේ. ජපනයේ උසම පිරිමියෙක් [illegible]
ලංකාවෙ [illegible]

[illegible] ඔහු කසුම්ව අල්ලාගත්තා. කසුම් එයා මෙතන [illegible] හිත එකග කරගන්න බැහැ. සකුරා සියවස්ගත [illegible] මිත්තුර තෝරුම් ගන්න ප්‍රථමයක් වගේ. සකුරා ගස්වල [illegible] නැමෙනවා වගේ දනුණා. මලින් බර වෙලා තිබුණු [illegible] යහතට නැමිලා. සකුරා මල් පහතට නැමි නැමී ඔය [illegible] ගහන්නෙ විදුලිය් මල් යායද? විදි ඉර පෙනීන් පෙනීන් [illegible] ආවා.

[illegible]"

කතාකළ පළමුවැනි වචනයෙන්ම දේශයේ ප්‍රශ්නය විසඳලා [illegible]. එහෙනම් උපන් රටේ ඥාතියෙක්!

'වසන්තය හරි ලස්සනයි.' ඔහු කතා කළේ ගාම්භීර පිරිමි [illegible]. මුහුණෙ තිබුණු අර අපූරු හිනාව ස්ථාවර වක්කමක් [illegible]. සියුමැලි ගැහැනු පෙනුමක් නැති නියම පිරිමියෙක් [illegible] එකපාරටම හිතට ආවේ මිටර් සිය තත්පර දහයට [illegible]. [illegible] නැත්නම් අපි අත්ත [illegible]. ස්ත්‍රී පුරුෂ ලිංගික භාවය පිළිබඳ හැඟීමකින් නෙවෙයි තමන්ගෙකම පිළිබඳ හැඟීමකින් මහ බන්ධනයක් [illegible] වර්ණවත් මල්ගොන්නයි, මේ මහ උත්සවශ්‍රීයයි අතරේ පොළොවෙන් මතුවෙන මහගහක දෙපෙත්තක් වගේ මතු වෙනවා [illegible] පෙනුණා. වටාපිටාවේ ස්වාමිපුරුෂයා ඉන්න බව අමතක [illegible] තරමට ආකර්ෂනය දැඩි වුණා.

'මගෙ නම සුමල්. සුමල් අබේසිරිවිය.'

අපි ආයුබෝවන් කිව්වෙ නැහැ. ජපන් ක්‍රමයට ආචාර කරන්නෙත් නැහැ. ඉංග්‍රීසි ක්‍රමයට අතට අත දුන්නෙත් නැහැ. ඇස්වලින් ඒ සියලුම ආචාර සමාචාර කරගත්තා. මං චං කසුම්ව කර උඩ තියාගත්තා.

'මගෙ නම නූපා. නූපා සුමිකාවා. අර මගේ මහත්තයා [illegible] සුමිකාවා, මහත්තයාගෙ කර උඩ ඉන්නෙ මගෙ

අක්කත් බැඳලා ඉන්නෙ නාකි ජපනෙක්නෙ කියලා කිව්වෙ නැතිවුණාට ඒ හැඟීම සුමල්ගෙ බැල්මෙ තිබුණා.

'මල්ලී මොනවද මෙහෙ කරන්නෙ? ඉගෙන ගන්නවද නීගතා විශ්ව විද්‍යාලෙ?'

ඒ ප්‍රශ්නෙට සුමල් හයියෙන් හිනා වුණා. වටපිට නටමින් හිටිය ජපනෙකුටත් ඒ හිනාවෙ සද්දෙ ඇහිලා හැරිලා බැලුවා. මදක් ඈතින් හිටපු මං චංටත් ඒ හිනාව ඇහිච්ච බව අමුතු බැල්මෙන් පෙනුණා. එතකොට හිනාවෙන්න ප්‍රශ්නයක්ද මං ඇහුවෙ? නෑ. සුමල් වටපිට බලන්නෙ හොරකමක් කරන්න ඇවිත් අහුවෙලා වගේ. මහ ජවයක්නෙ. නීගතාවෙ ඉගෙන ගන්නෙ නැත්නම් මොනවද ඉතින් කරන්නෙ. නොදන්නවා නෙවෙයි. ලංකාවෙ ගැනු ජපානෙට ඇවිත් වයසක පිරිමින්ව කසාද බඳිනවා. ලංකාවෙ පිරිමි කොහෙන් හරි ජපානෙට ඇවිත් වීසා ඇතුව හරි නැතුව හරි හුඟාක් වෙලාවට වීසා නැතුව, කුලී වැඩ කරනවා. ඊ අවල නැතුව. නිදාගන්නෙ වාර ක්‍රමයට බෙදාගෙන කියලා පන්සලේදි මුණගැහිච්ච කුමාර කිව්වා. කුමාර පන්සලේ ආවාසෙ කරගෙන ලංකාවෙ පළපුරුද්ද අනුව නීගතාවට ඕපාදූප බෙදාහරිමින් ධර්මකර්ම වැඩවල නිරතවෙලා ඉන්නවා. ලංකාවෙ පන්සලේ ටෙලිනාට්‍ය බෙද හැරීමේ කටයුත්ත කරන්නෙත් කුමාර. සුමල් ඇදලා ඉන්නෙ නම් නීගතා සරසවියෙ ඉගෙන ගන්නව වගේ තමයි. ඉතින් ඉගෙන ගන්නෙ නැත්තන් මොකද කරන්නෙ? වාර ක්‍රමයට නිදා ගනිමින් රස්සාවල් කීපයක් කරනවද? ජපන් බිරින්දෑ කෙනෙක් හොයාගන්න තරම් කඩවසම්කමක් සුමල්ට තියෙනවනෙ. එහෙම කළොත් වීසා ප්‍රශ්නෙ විසඳෙනවනෙ.

'නීගතා සරසවියෙ හරි කුලී වැඩක් හම්බවෙනවා නම් කරනවා.' සුමල් හිනාවෙමින් කිව්වා.

'මල්ලිට එච්චර අමාරු පාටක් පේන්නෙ නෑ'

මං එහෙම කිව්වෙ ... සුමල් නෝක්කාඩු කිව්වා.

'අමාරුව තියෙන්නෙ හිතටනෙ.' සුමල් කිව්වෙ බොහොම කාලයක් දන්න ඇඳිනගෙන ඉන්න කෙනෙක් එක්ක කතා කරනවා වගේ. උසමහත වගේම, මේ කටහඬ මහ බර කටහඬක්නෙ. මගේ උස තිබුණෙ සුමල්ගෙ ඉණෙන් ටිකක් උඩට විතර. ඇස් දෙක ලා නිල් පාටක් තිබුණා. කොහෙන් ආපු එකක්ද? නිල් ඇස්?

'ලංකාවේ කොහෙද මල්ලි ඔයා?'

'මං නුවර'

'අඟනුවරද මහනුවරද?'

සුමල් ආයෙත් හයියෙන් හිනාවුණා.

'මහනුවර. අක්කට එහෙ ඇඩ්‍රස් එකත් ඕනද?'

මහනුවර නම් එකත් එකටම පරම්පරාව සුද්දන්ට මිශ්‍ර වෙලා ඇති කියලා හිතුණා ඇස් දෙකේ නිල දැක්කම. ඇගේ පනෙයි මූණේ කටයි සුදු දැක්කම. සුමල් ඉක්මනට දුරකතන අංකය දුන්නා. වසන්ත උත්සවේ තව හුඟාක් වෙලා තියෙන්න නියමිත වුණත් මං චං ගෙදර යන්න හදිස්සියක් පටන් ගත්තා. යමු - යමු- යමු. හොඳයි යමු. ඒත් අඳුනගන්න මේ මල්ලිව. සුමල්. ලංකාවෙන්. මේ ළඟපු ඉන්නේ. මං චං වහාම ආචාර කළා. සුමලුත් දූන්නක් වගේ නැවිලා ආචාර කළා. කසුමි, සුමල් දිහා බලලා ලැජ්ජාවෙන් හිනාවුණා.

'ලංකාවෙ අක්කා කෙනෙක් අඳුනගන්න ලැබිච්ච එක ලොකු සන්තෝසයක්.' සුමල් කැඩිච්ච ජපන් බසින් කිව්වා.

'ඕනකමක් වුණොත් මට කතා කරන්න.'

'හොඳයි අක්කෙ.'

... උත්සවයටත් වැඩිය මගේ හිතට සතුටක් දුන්නෙ

කෙළිලොල්කමකුත් එක්ක මුසු වෙච්ච ගාම්භීරකමක් ඒ දේහ ලක්ෂණවලින් පෙනෙන්න තිබුණා. මම මොකටද පාලෙ තම්බවෙච්ච මිනිහෙකුගේ දේහ ලක්ෂණ ගැන හිතන්නෙත්. වයස කීයක් විතර ඇතිද කියලා නිකමට ප්‍රශ්නයක් හිතට ආවා. කීයක් වුණත් ඉතින් මොකද නුපා?

මං එං සුපිරි වෙළඳසැල ළඟ නතරවෙලා සුෂි කෑම තුනක් ගත්තා. එක කෑම එකක් යෙන් තුන්සිය අනූවයි. මේ මහන්සියෙ ගිහින් උයනවට පිහනවට වැඩිය කඩෙන් කෑම හොඳයි කියලා මං එං කිව්වෙ.

'මට සුෂි විතරක් මදි. චිකන් විංග්ස් එක්ක' කියලා සදුනි කිව්වම මං එං චිකන් විංග්ස් ටිකකුත් ට්‍රොලියට දාගත්තා.

ගෙදර ඇවිත් ටිකක් වෙලා රූපවාහිනිය බැලුවා. රූපවාහිනී තිරයෙ ලංකාවෙ පුපුරපු බෝම්බෙක සුලමුල කියන්න ගත්තා. එහෙම ගිහින් [illegible] දෙවැනි වෙඩි කියලා මං එං හිතාගෙන [illegible] ප්‍රකාශය නැද්ද වුණා.

'හලෝ'

'හලෝ අක්කෙ'

'ඔව් මල්ලි'

'පරිස්සමින් ගෙදර ගියාද කියල බැලුවෙ'

'පරිස්සමින් ආවා. බොහොම ස්තූතියි'

'අරිගතෝ ගොසයිමස්' කියන්න කියලා සුමල් හිනාවුණා.

'අරිගතෝ ගොසයිමස්'

'අක්කා ලංකාවෙ කොහෙද කියල අහන්න බැරි වුණානෙ'

'දියවන්නාවෙද?'

'දියවන්නාව කිට්ටුව'

'දියවන්නාවෙ හරියට තිබුල්ලු නේද?'

අපි දෙන්නම ඒ කතාවට හිනාවුණා. හිතලා බලන කොට ඒක හිනාවෙන්න දෙයක් තිබුණෙත් නෑ. හිනාහෙයන දේවල් හිනාවෙච්ච ඉස්කෝලෙ කාලෙ මතක් වුණා. පාර දිගට හිනාවෙවී ගිය කාලෙ. මං එං නොඉවසිලිමත්ව හිටියා.

'කන්නෙ නැද්ද නුපා'

'ඉන්න එනවා' කියලා මං ටිසිවරය අතින් වහගෙන [illegible] මුසලයා!

'සුමල්, මහත්තයා මං කෑමට එනකල් බලන් ඉන්නවා. පස්සෙ කතා කරන්නම්.'

'[illegible] කෑම උයනවද?'

'නෑ. කඩෙන් ගෙනාවා'

'මහත්තයා බලාගෙන ඉන්නවා නම් තියන්න මං පස්සෙ ගන්නම්'

මං එං ගෙ ඇස්දෙකේ තිබුණෙ නෝක්කාඩුවක්. සින්නක්කරේට ගත්තු ඉඩමෙ භුක්තිය තමන්ට ඕන විදිහටනෙ. සදුනි නම් රස කර කර චිකන් විංග්ස් කමින් හිටියා.

'කවුද ?'

'රෝසි'

'ඔච්චර හිනා වුණේ?'

නෙවෙයි කෝපයටත් පත්වුණා. 'තරහ ගන්නෙ මොකටද?' මං චං අසරණයෙක්. මං චං ගේ මුහුණ වියපත් රැළිවලින් පිරී ගිහින්, මං චංගෙ දෙකම්මුල් වළ ගැසී තිබුණු අතර මුහුණෙ කහපැහැය පාණ්ඩු වර්ණයකට පෙරළිලා.

'හිනා වුණේ මොන එහෙකටද?'

මං චං යළිත් ඇසුවේය. මං චං ගේ වචන බොහොම බර වැඩියි. සැර වැඩියි. මොන එකකට සිනාසුණත්. මට සිනාසෙන්න අයිතියක් නැද්ද? මං චං සතුටුවන්නේ මා ඔහුගේ සන්තකයෙහි තබා ගැනීමෙන් පමණකි. සන්තකය පිළිබඳ ඔහුගේ හැඟීම මට කිසිදු සතුටක්, ජීවත්වීමේ ආසාවක් ඇති කරන්නේ නැත.

මං චං දන්නවද හිනාවෙනවා කියන්නෙ මොකද්ද කියලා. ඔහේට නම් ජීවිතේට තේරුම් ගන්න බැරිවෙයි හිතේ සතුටක් ඇතිවෙන්න හිනාවෙන්න කොහොමද කියලා. කාටහරි හිනා වෙන්නත් බැහැනේ. මට හැමදේම ලැබිලා තියෙන්නෙ කියලා කිව්වට ඔයාට සන්තෝසයක් දැනෙන්නෙ හැඟෙන්නෙ නැහැනේද? සන්ජෝ නගරෙ කඩ කාමරේක රේන්ද විකුණන රේන්ද වෙළෙන්දි වගේ ඔයා නිතරම බුම්මගෙන ඉන්නවා. ඔය රේන්ද වෙළෙන්දි මහ එක විදිහක්. මූණෙ හිනා පොදක් නෑ. රේන්දවලට ගණන් කියන්නෙත් තමන් කැමති කෙනෙකුට විතරයි. පුංචි කඩකෑල්ල ඇතුළ රේන්දවලින් පුරවලා කාටවත් ඇතුළට යන්න බැහැ. වෙළෙන්දි ඉඳගෙන ඉන්නෙත් පාරෙ. මං චං ට තිබුණෙ අන්න ඒවගෙ රේන්ද වෙළෙන්දියක් කසාද බැඳගන්න.

'මේ රටේ තියෙන ප්‍රශ්න දිහා හොඳ සිහිකල්පනාවෙන් බලන කොට, හිතනකොට මහොම හිනාවෙන්න පුළුවන්ද? හෘදසාක්ෂියක් ඇති කෙනෙකුට?' මං චං ඇහුවෙ අසන්තෝසය තවදුරටත් පාලනය කරගන්න බැරුව. මේ මිස්සාත් එක්ක කතා කරලා වැඩක් නෑ. මං චං කියන්නෙ නින්ද යන්නෙ නැති මිනිසෙක් [illegible]

කසුමි තනමි පැදුරෙන් නැගිට්ටා. මං චං මා දිහා බලාගෙන ඉන්නවා.

'තූපා සාන් ඔය ඇස්දෙක වහගන්න. මට ඔයාට කතා කරන්න ඕන.'

'මං චං කතා කරන්න. මං ඇස් වහන්නෙ මොකටද?' බොහොම ඉවසීමෙන් මම ඇහුවා. කසුමි ඇහුවා මමා මම දත් මදින්නද - ටී වී බලන්නද කියලා. දත් මැදලා ටී වී බලන්න කසුමි නාන කාමරය දෙසට ගියා. කසුමිත් හැදෙන්නෙ මේ විකාර හොඩ මැද්දෙනෙ කියන හැඟිමත් එක්ක හිත කසුමි පස්සෙන් වැටුණා.

'ඇස් වහන්න' මං චං අණ කළා.

'හොඳයි' මම ඇස් වහගත්තා.

'ඇහෙනවද මකරෙක් කෑ ගහනවා.'

මං වහාම ඇස් ඇරියා.

'මකරු ඉන්නෙ චීනෙ'

'චීනෙ හිටියට ඔය ඇහෙන්නෙ. ඒ මකරෙක් තමයි.'

'විකාර' කියමින් මම තතමි පොළෙවෙන් නැගිට්ටා. මං චං ලංකාවට ගිහින් ආවට පස්සෙ සෝරා සාන් අවවාද කළා මං චං ට කරුණාවෙන් සලකන්න කියලා. එතකොට මට කරුණාවෙන් සලකන්නෙ කවුද? ඒක ඉබේම ලැබෙනවා. ජපානෙ මොනම දෙයක්වත් ඉබේම ලැබෙන්නෙ නැහැ. කොච්චර උත්සාහ ගන්නවද මං, මං චං ට කරුණාව දක්වන්න. ඒත් කරුණාව මැඩගෙන එන්නෙ පුපුරු ගහන කෝපය! ස්වාමි පුරුෂයා හින්ද නෙවෙයි මනුෂ්‍යයෙක් හින්දා. කසුමිගෙ තාත්තා හින්දා. සන්සුන් කරගත්තු මද් හිත. කන්න බොන්න දෙන මිනිහා හින්දා. වයසක කම් [illegible]

ඇහෙනවද මකරෙක් කෑගහනවා. අහගෙන ඉන්නවා එහෙනම්. පඩිපෙළ අඳුරුයි. මං විදුලි බුබුළ දැල්වුවා. කසුමි ඇඟපත හෝදගෙන කාමරයට ආවා. දොයියන්න ඉතින් පැටියෝ. කසුමි ළග එන්නෙ අමුතු සුවඳක්. මූණේ තියෙන්නෙ හඳ පායනකොට පොළොවට පතිත වෙන සෞම්‍ය එළිය. මල්පෙති සඳැලි සින් නැහැවිලා. දූගෙ මූණට, වසන්ත සඳේ ආලෝකය පතිත වෙලා තිබුණා. අම්මට මම ආදරෙයි ඒ මගේ මුළු හිතින්මයි කියලා නොකිව්වට කසුමිගෙ හැම ඇහිපිල්ලමකම, හැම සිනාවකම, හැම හැඬීමකම, හැම අංගචලනයකම තිබුණෙ, ආදරය. ඉල්ලන්නෙක් ආදරය - ලෝබ නැතුව දෙන්නෙත් ආදරය.

'දොයියන්න පැටියෝ.'

'වසන්ත උත්සවය බලන්න එක්කරගෙන ගියාට, මම්මාට ගොඩාක් ස්තුතියි' පුංචි කසුමි සිරුරෙ දැවටෙමින් කිව්වා. එන්න මගෙ මැණික මගෙ තුරුල්ලට. ඔය සිනිඳු මල්පෙති මූණ සිපගන්න.

'ඔයාටත් ගොඩක් ස්තුතියි. හොඳ ළමයෙක් වගේ හැසිරුණාට.'

කසුමි හිනාවුණා. ඒක කෘතඥතාව පිරුණු හිනාවක්. හැම ජපනෙක්ම වගේ කසුමිත් ඕනම පුංචි දේකට ස්තුතිය පළකරන, කෘතඥතාව පිළිබඳ හැඟීම ගැන ඉහළින් හිතන ළමයෙක්. හැම ජපනෙක්ම කියන්නත් බැහැ.

මං වං කාර්යාල කාමරයට ගිහින් දොර වහගත්තා. රට ගැන වගකීම ඉෂ්ට කරන්න! වෛද්‍යවරු මොන නිගමනවලට ආවත් තවමත් මං වං ලියුම් අරගෙන කාර්යාලවලට යනවා. හෙට අනිද්දා දවසක වැඩ කටයුතු හුගක් කරන්න තියෙන බව දුරකතනයෙන් සහෝදරියට කියනවා ඇහුණා. 'ඕක මට එපා වෙලයි ඉන්නේ' කියලා මං මගේ හිතට කිව්වා. මම ජනේලය ළඟට ගියා. අරින්න බැහැ. වසන්ත සුළඟ ඇවිත් මුහුණෙ වදියි. වසන්ත සුළඟට සෙලවෙන නගරයේ මල් වීදුන දකින්න ආසයි. ඒත් කසුමි ...

සෝරා සාන් ... අඳින්න. මහ අද්භූත දේවල් අරන් එයි. අද්භූත ගෙවල්. අද්භූත සත්තු. අද්භූත කල්පනාවල්. සියුමැලි පෙනුමක් තිබුණට සෝරා සානුත් අද්භූතයි කියලා යටිහිත කිව්වා. මොකද්ද අද්භූතකම? ස්වාමි පුරුෂයට ඇල්මකුත් නෑ. ඇල්මක් නැත්තෙත් නෑ. ස්වාමි පුරුෂයගෙ ස්ත්‍රී සමාගමයට කෝප නොවෙන බෝසත් භාර්යාවක්. ඒත්, ස්ත්‍රී සමාගමයට වඩා සුදුව හොඳයි කියලා හිතනවා. කරෝකෙ එකේ නටන, සින්දු කියන මිනිස්සුන්ගේ විගඩම්, අඳෝනා, දුක් ගැනවිලි පහන් සිතින් බලාගෙන ඉන්නවා - අහගෙන ඉන්නවා. මං වංට වෛර කරනවා. මං වං වෙනුවෙන් පෙනී හිටිනවා. හිතට සහනයක් ඕන වෙච්ච වෙලාවට පින්සල්, දිය සායම්, බැක් පැක් අරගෙන කැලේට යනවා. අඳිනවා එයාගෙම හිතනවා. කලකිරෙනවා, තේරුම් ගන්නවා, ජීවිතේ හැටි එහෙම තමයි කියනවා. මං වං වෙනුවෙන් දුක් වෙනවා. ඇයි හරාදා සාන් වෙනුවෙන් දුක් වෙන්නෙ නැද්ද? හරාදා සානුත් මානසික ලෙඩෙක් නොවෙයිද? මෙච්චර සුන්දර රූසපුවක් තියෙන කාන්තාවක් තමන්ගෙ සන්තකයේ ඉන්දැද්දි සංගමයට ගන්නෙම අංග පූලාවක් නැති ගෑනු. 'මට දරුවො දෙන්නෙක් ඉන්නනේ' කියලා දරුවන්ගේ පියා වීමේ හේතුවෙන් සින්නක්කර ලියාපදිංචි කර දීපු සමා පත්‍රයක් ස්වාමිපුරුෂයා වෙනුවෙන් අතේ තියාගෙන ඉන්නවා. ඒ සමා පත්‍රය දෝතින් පිළිගන්නනවා. ස්වාමිපුරුෂයා සම්පූර්ණයෙන්ම එපා වෙච්ච සෝරා සාන්ට වැඩිය වෙනස් නැහැනෙ එපා නොවෙච්ච ගෑනු උදවියගෙ මානසිකත්වයත්. රෝසි, ස්වාමිපුරුෂයට චෝදනා නොකරනවා නෙවෙයි. ස්වාමිපුරුෂයව පාච්චල් නොකරනවා නෙවෙයිනෙ. ගෞරව නොකරනවත් නෙවෙයිනෙ.

දවස් දෙකකට පස්සෙ ආයෙම දුරකතන ඇමතුමක් ආවා.

'මම සුමල්'

'ඒ කොහොමද?'

'කටහඬින්'

'අක්කගෙ කටහඬ පුංචි ළමයෙකුගෙ වගේ'

'සිංදුවකුත් කියන්නද මල්ලි?'

සුමල් හයියෙන් හිනාවුණා. සතුට තියෙන්නෙ ඔවගෙ පුංචි පුංචි දේවල්වල බව හිත දැනගෙන හිටියා. ඉතින් තටුසලා පියාඹන්න හදන්නෙ ඒ හිත.

'අපිට රෝසි කියලා අක්කා කෙනෙක් කෑම ගෙනත් දෙනවා. ලුණු මිරිස්, සම්බෝල පරිප්පු හොදි, ඉඳි ආප්ප' සුමල් විස්තර හුඟක් කියන්න පටන් ගත්තා. රෝසි හොඳ මිතුරිය. රෝසි හොඳ ගෑනි. ඒත් පොඩි අවදානමක් තියෙන බව හිත කියනවා. රෝසිත් ජපන්නු ළඟ හොයාගන්න නැති දේවල් හොයමින් වන්දනාවක යනවා. මේ වයසක ජපන්නුන්ට හිතකුත් නෑ කයකුත් නෑ. එහෙනම් වසන්ත උත්සවේදී තුම්බු වෙච්ච සුමල්ට රෝසිගෙත් දැනඇඳුනුම්කම තියෙනවා. පරණ වාහන ගන්න ආපු, ලංකාවෙ වාහන සේල් එකක් තිබුණ මැදි වයසෙ මිනිහෙක් කියපු කතාවක් චන්දනක්කා ලියලා එවලා තිබුණා.

'නාකි ජපන්නුත් එක්ක ගිහින් ඉන්න ලංකාවෙ තරුණ ගෑනුන්ට වීසා නැතුව ඉන්න ලංකාවෙ කොල්ලෙක් දැක්කම හරි හොද්ද.' බලන්න නංගි මෙහෙ ඉන්න උදවිය හිතන හැටි. කොච්චර නරකද? මං කිව්වා එහෙම අයත් ඇති - හැබැයි හුඟ දෙනෙක් එහෙම නෑ කියලා. මිනිහා කොච්චර හයියෙන් හිනාවුණා ද කිව්වොත්, හරි සද්දෙට වාතෙ පිට වෙනවත් ඇහුණා. අපේ රටේ මිනිස්සු කොහාට ගියත් කරන්නෙ මඩ ගහන එක. වාසනා ගෙදරටම රිංග ගත්තා. ඔයත් උල්පන්දම් දීලා ගියානෙ. කටුබැල්ලි වගේ ගෙට රිංගගෙන ඉන්නවා. අපි ඉන්න කොට ගෙදර තිබ්බව ලකයක් දැන් ඇත්තෙම නෑ. වත්තපිටිය වල් වැදිලා. දණක් [illegible]

[illegible] දොස් කියනවා ඇති. එක පැත්තකින් ගහක් ගලක් වගේ [illegible] අපේ සහෝදරයව මරාගත්තා. තව පැත්තකින් අපේ මුළු [illegible]ලක්ම ඇති දූඩි වෙච්ච ගෙයක් දොරක්, මිනිහා මරාගත්තු [illegible]නියෙකුට ගියා. අපේ ලනිල් කියන්නෙ අපේ පවුලෙ උදවිය [illegible] දූර්වලයි කියලා.

ඒ කතාවට නම් චන්දනක්කෙ හිනාවෙන්නද - අඬන්නද [illegible]යලා මං දන්නෙ නෑ. ලනිල්ට දඬුවමක් දෙන්න පුළුවන්කම [illegible]යෙන එකම ගෑනි උඹයි. ඒත් ඒ දඬුවම විඳින්න වෙන්නෙ උඹටමයි. ඒක හින්දා ලනිල් දැන් විඳින්නෙ අත්හිටවූ හිර දඬුවමක්. [illegible]රදක් කළොත් සම්පූර්ණ හිර දඬුවම බරපතල වැඩ ඇතිව. මතක [illegible]යාගත්තොත් හොඳයි අළුගෝසුවායි, විනිශ්චකාරයායි දෙන්නම [illegible]න්නේ තමුන්ගෙ සිරි යහනෙ එක පැත්තක. බලාගෙන ඔලුව [illegible]මෙත්තියෙ වැදුණොත් සිහි නොලබාම මිය පරලොව යයි ! [illegible]ස්සමෙන් !

'ඇයි වීසා නැතුව මෙහෙ ඉන්න හිතුවෙ?'

[illegible] අහපු ප්‍රශ්නෙ [illegible] පෙරළලා ඇඳපු රෙද්දක් වගේ [illegible]ලා හදාගන්න පුළුවන් එකක් නොවන බව දන්නවා. ඒත් දැන් [illegible]ලා ඉවරයි. මම ජපනෙත් කසාද බඳින්නෙයි - සුමල් මල්ලියෙ [illegible] වීසා නැතුව මේ රටට එන්නෙයි එකම මූලික වුවමනාවක් [illegible]ගන්නනෙ. යෙන්වලට තියෙනවා රුපියලට වැඩි මහා [illegible]ලයක්. අන්න ඒ බලය හොයාගෙන නේද අපි දෙන්නම ඇවිත් [illegible]න්නෙ? නෑ කියන්න එපා ඉතින්. මම ඔයාව දන්නවා ඔයා මාව [illegible]න්නවා. අපි දෙන්නා ඉන්නෙ අහසෙත් නෙවෙයි පොළොවෙත් නෙවෙයි. ඇයි ලංකාවේ දී හොඳ විවාහයක් කරගන්නෙ නැතුව [illegible]කොහොමටවත් නොගැලපෙන වයසක ජපනෙක්ව බැඳ ගත්තෙ [illegible]යලා සුමල් නිකමටවත්, විහිළුවටවත් ඇහුවෙ නැහැ.

එදා වේල කන්න නැතුව හිටපු ලංකාවෙ කොල්ලො [illegible]නෙට ඇවිත් යෙන්වලින්, මන්වලින් පෝසත්වෙලා ආපහු [illegible] මාලිගාවල් හදාගෙන නැව් වගේ වාහනවල

ලෝකයේ ඉහළම පෙළේ ආහාර පාන කමින් බොමින් විරාජමාන වෙන බව සුමල් කිව්වා. එතකොට සුමල් බලාපොරොත්තු වෙන්නෙත් එහෙම විරාජමාන වෙන්නද? ලංකාවට ගිහින් රජ්වෙන්න. නුවරනෙ ගම් පළාත. රජ වෙන්න බැරිකමකුත් නැහැ. වැන් හවුසන් කමිස ගැන මහ ලෝබකමක් තියෙනවා කියලා සුමල් නිතරම කිව්වා.

'මෙහෙ නැද්ද?'

'ඇයි අරන් දෙන්නද?' 'සුමල් ඇහුවෙ හිනාවෙමින්.

'මට සල්ලි නැහැ මල්ලි. තිබුණා නම් අරන් දෙනවා'

'අක්කා ඔසරිය ඇඳලා නැද්ද?'

මං සුමල්ට මඟුල් පින්තූරෙ පෙන්නුවා. ප්ලාස්ටික් මල් කළඹක් අතේ තියාගෙන හිනෙන් පිපිරි පිපිරි ගත්තු මඟුල් පින්තූරෙ. සුමල් පින්තූරෙ ළඟට කරලා බැලුවෙ ඇස් දෙකේ කැමරා කාචයක් තියෙනවා වගේ. 'තියෙනවත් නම්යි.

'මං ඉඳිආප්ප තැම්බුවා. මල්ලි එනවද?'

සුමල් ටික වේලාවක් කතා කළේ නැහැ. ඇයි මොකද?

'ඔයාටත් එක්කයි ඉඳිආප්ප තැම්බුවෙ'

'මසායා සාන් කැමති වුණාද?'

'කැමති කර ගත්තා. එනවද?'

මසායා සාන් උදව් වුණා ඉඳිආප්ප සම්බෝලය හදන්න. මම ලංකාවෙ රහට ඉස්සන් කරිය හැදුවා. මසායා සාන් ඇහුවෙ එකම ප්‍රශ්නයයි.

'විසා නැතුව ද ඉන්නෙ'

'[illegible] කොහොමද ඉන්නෙ'

'ලංකාවෙ ප්‍රථම [illegible] විසා නැතුව'

'ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයිනෙ මං වං'

'මොකද නැත්තෙ? මට වගකීමක් තියෙනවා වීසා නැතුව ඉන්න කෙනෙක් නම් නිලධාරින්ට අල්ලලා දෙන්න'

මසායා සාන් හිටියෙ ඉඳිආප්ප සම්බෝලෙට ලූණු කපමින්. [illegible] හිටියේ වතුර බේසම ළඟ. මම වහාම මං වං ඉදිරියට ගියා. [illegible] වංගෙ ඉරියව්වල කිසිම වෙනසක් නැහැ.

'මං දන්න කෙනෙක් එහෙම නිලධාරින්ට අල්ලලා දුන්නොත්?'

'ඒක මගේ වගකීම'

'ඒ වගකීම ඉටු කරමු බලන්න. මං කරන දේ කරන්නෙ [illegible]'

'මොකක් කරන්නද? පුරවැසියෙක් හැටියට මගෙන් රටට වෙන්න තියෙන යුතුකම ඉටු කළහම.'

'ඒක මං දැන් කියන්නෙ නෑ. කරන වෙලාවට බලමු'

මං වං කතා නොකර සම්බෝලෙ හැදුවා. මං මගේ ජීවිතේ [illegible] කරගන්න පුළුවන් පරිපූර්ණ මිනිහෙක් හොයමින් හිටියා. [illegible] ඒ පරිපූර්ණ මිනිහා වෙයි කියලා හිතුවා. ඒත් ජයනාථ [illegible] මිනිහා වෙනවා වෙනුවට මගේ ජීවිතේ පළවැනි [illegible] වුණා. ඒ රැවටිල්ල දඩාස් ගලා වැහෙන දොරක් [illegible] මගේ සැහැල්ලු ජීවිතයට පා පහරක් ගැහුවා. ඒත් ආදරය [illegible] ප්‍රේමය හරි කියන්නෙ කුමක්දැයි මා සොයමින් සිටියා. ඒ [illegible] මහා වෙහෙසකර අභ්‍යාසයක්. මගෙ පෙම්බරා ඉන්නෙ [illegible] හිත ඇතුළෙ. මගෙ ඉදිරි මුළු ජීවිතයම ගත වෙන්නෙ [illegible]

කියලා අහන සත් ගුණවත් ස්ත්‍රී පුරුෂයො හමුවෙන්න පුළුවන්. ළමයෙක් හම්බ වෙනවා කියන්නෙ හදවතේ ලේ නහරවල එහෙම නැත්නම් ශරීරයේ කොතනක හරි හැංගිලා ඉන්න මහා ප්‍රබල සත්ත්වයා ඉල්ලා සිටින, අතටවත්, ඇසටවත් අසු නොවන හෘදයාංගම බන්ධනය අත්අරින්න පුළුවන් සාධකයක් මුණ ගැහීම නෙවෙයි. මගේ ඉදිරි මුළු ජීවිතයම සොයා යන ශක්තිය, වේදනාව, සෞන්දර්ය යන සියල්ල රැඳී පවතිනවා ඇත්තෙ ඒ හැඟීම තුළ. ජීවිතය හැමදේම නොදෙන බව මම දන්නවා. ඒත් කිසි දෙයක් නොදෙන එකත් සාධාරණ නැහැ නේද? කසුමි ලබා ගත්තෙත් බලහත්කාරෙන්. කසුමිගෙ පැමිණීම වෙනුවෙන් කසුමිට මා ස්තුතිවන්ත විය යුත්තෙ ඒ හින්දයි.

සුමල් අප තුන්දෙනා ඉදිරියෙ ඉඳගෙන තතමි පොළවෙ හිටියා. මසායා සාන් ආහාර වසවිස වෙන ආකාරය සුමල්ට විස්තර කළා. සුමල් අහගෙන හිටියෙ ලොකු උද්යෝගයකින්. සැබෑම උද්යෝගයකින්ද මල්ලි?

'ජීවිතය පරිපූර්ණ වෙන්නෙ නැහැ තමුන්ගෙ යුතුකම ඉෂ්ට නොකරනවා නම්. මං මගේ රට වෙනුවෙන් යුතුකම ඉෂ්ට කරනවා. එතකොටයි ජීවත් වෙනවා කියලා තේරෙන්නෙ'

මසායා සාන් කියන දේ මම සුමල්ට සිංහලෙන් පැහැදිලි කරලා දුන්නා. ඔයාගෙ මිනිහට පිස්සුද කියලා නාහා සුමල් අහගෙන හිටියා. කසුමි කම්මැලිකමට දිග ඇනුමක් ඇරියා.

'මං පිරිමියෙක් වීමේ නියම අර්ථය අත් විඳිනවා. මං මගේ රට වෙනුවෙන් යන්න පුළුවන් ඕනම දුරකට යනවා' මං චං කිව්වා. මං චං මෙහෙම කතා කරන්න කෙනෙක් හමුවීමේ ප්‍රීතියයි, නිදහසයි අත් විඳිනවා. පිරිමියෙක් වීමේ නියම අර්ථය අත් විඳින්නෙ පෙත්සම් ගහල ද?

'මල්ලිට මේවා අහලා කම්මැලිද?' මං සිංහලෙන් ඇහුවා. සුමල් කිව්වෙ 'නැහැ' කියලා [illegible] සාන් සිටන්නර කිසි කෙනෙකුට [illegible]

[illegible] විචිත්‍රකමයි, [illegible], [illegible] සකුරා මල්වල [illegible] මල්වල විචිත්‍රකමයි, [illegible] සකුරා මල් එක්තරා කාලයක තමුන්ගෙ [illegible] අනන්‍යතාවයි. සකුරා මල් එක්තරා කාලයක තමුන්ගෙ [illegible] ලොකු අර්ථයක් ගෙන දුන් බව කිව්වේ රහස් ස්වරයකින්. [illegible] සාන් ගැන මුල්වතාවට ස්වකැමැත්තෙන්ම කතා කළා. [illegible] යන සුළඟයි, පායන හිරුයි, ජපන් මුහුදෙ රළ [illegible] තරමට හිත ඇතුළෙ සායො සාන් වෙනුවෙන් ආදරයක් [illegible] ඇති කියලා හිතෙන බව කිව්වා. කවුරුවත් ඇහුවෙ [illegible] ඒ වුණාට කිව්වා. ආදරයෙ ශක්තිය දැනගන්න අවස්ථ [illegible] ඇය තමා වෙතින් පලා ගිය බව විස්තර කළේ බුරුල් වුණු [illegible] පිසදමමින්. පලා ගියේ තමුන් ආදරය නොපෙන්නූ නිසා [illegible] කිව්වෙ නැහැ. ඒ ටික කිව්වෙ වෙන කවුරු හරි. මිනිස්සුන්ට [illegible] තියෙනවා නම් ජීවිතේ අර්ථයක් තියෙන බව මං චං [illegible] සුමල්ගෙ කෝප්පයට තව තේ ටිකක් එක් කරන ගමනුයි. [illegible] දුකක් ඇති මිනිහෙකුගෙ ජීවිතයෙ අර්ථයක් නැද්ද? මං [illegible] ජීවිතයේ අර්ථය දැනෙන්නෙ ඇති වෙන කොට නෙවෙයි [illegible] වෙන කොටයි.

කියන්න මගේ භාර්යාවට. සුමල් සාන්ගෙ මව් භාෂාවෙන් කියන්න, මං මගෙ භාර්යාවටයි, දෝණියන්දූටයි ආදරය කරනවා කියලා' කවදාවත් නැතුව මං චං ආදරය ගැන [illegible] කළා විතරක් නෙවෙයි ඒ ආදර කතාව හෙළිදරව් කරන්න [illegible] සම්බන්ධයක් නැති තුන්වැන්නෙකුත් විශ්වාසෙට ගත්තා. [illegible] කළේ වරින් වර මගේ මුණ බලන එක. මගේ මූණෙවත්, [illegible] හිතේවත් ඔය කියන කිසිදෙයක් ගැන සටහනක් තියාගන්න [illegible] කමක් නෑ සුමල්.

සුමල් මගෙ ස්වාමිපුරුෂයගෙ හිත දිනා ගත්තා. ඒත් විසා [illegible] සුමල් ඉන්න බව නොකියන්න අපි දෙන්නම ප්‍රවේසම් [illegible] කසුමි, සුමල්ට ආදරෙයි කිව්වා.

කසුමි ජීවිතය පුරවලා දෙනවා. මං ජීවත්වෙන්නෙ කසුමි [illegible] හිතන්න මං බලහත්කාරෙන් උත්සාහ කළා

ආදරය [illegible] මගේ ආදරය සම්පූර්ණයෙන්ම උදුරලා ගත්ත මනුෂ්‍යයෙක් මේ මිහිපිට ඉන්නවා නම් ඒ කසුම් තමයි. කසුම් ඒ බන්ධනය සදහටම තියාගන්න කසුම්. ඔයාගෙ ආදරය මට පණ නළ පිඹින හුස්ම පොද. දැස් පියාගෙන විඳින්න පුළුවන් දේ ඔයාගෙ ආදරය.

සුමල් යුරෝපීය පුරුෂයෙක් වගේ හැසිරුණේ. විසා නැතුව ඉන්න ශ්‍රී ලාංකික තරුණයෙක් වගේ බයෙන්, සැකෙන් නෙවෙයි. පාර පනින දරුවෙක් දෙපැත්ත බලලා පනින තරම්වත් පරිස්සමක්, බයක් තියෙන බව පෙනුණෙ නෑ. ඒත් බය ඇත්තෙ ඇතුළු හිතේ. කට්ටි පනිමින්, දහදුක් විඳිමින් තමයි ඉන්නෙ. කොල්ලො හතර දෙනෙක් ආගමන විගමනෙන් ඇල්ලුවා කියලා හොඳටම බයවෙලා ඉන්නෙ කියලා හිතාවුණා. හිරගෙදර පහසු නෑ කිව්වා. රෙජිමේන්තු පාලනයක් තියෙන ජපන් හිර ගෙදර ඉන්නවට වැඩිය හොඳයි සියදිවි නසාගන්න එක කියලා සුමල් කිව්වම මං කිව්ව මහ පුරුෂයෙක් වගේ ශරීරයක් තිබුණට ඒවගෙ ශක්තිමත් හිතක් නෑ වගේනෙ කියලා. සුමල් පොඩි ළමයෙක් වගෙ හිතාවුණා. සුමල් අපේ මල් [illegible] මෙහාටයි යන්න පටන් ගත්තා. [illegible] ඒ කාමර [illegible] මෙහාට ඇවිද්දෙත් ඔහොම තමයි. අක්කෙ, නගර සභාවට ගිහින් එන්න යමුද - අක්කෙ සාප්පුවට ගිහින් එන්න යමුද? පැය විසිහතරම වැඩ කරලා හරි මං පෝසතෙක් වෙනවා අක්කෙ. මට රංගන මතක් වුණා. රංගනව ගෙන්න ගන්න උත්සාහයක් ගත්තා නම් රංගනත් මේ කොල්ලො එක්ක ඉන්නවනෙ කියලා දුකක් ඇති වුණා. එහෙනම් තාම ජීවතුන් අතර. සුමල් තනි කාමරේක තට්ටු ගෙයක් ගත්තා. මං චංගෙ මිතුරෙකුට අයිති ගෙයක්. දුන්නෙ මං චංගෙ ඇඳුරුම් කමටයි. මං චං කිව්වෙ ලංකාවට මගේ විශේෂ නෑකමක් තියෙනවනෙ, උදව් කරන්න ඕන කියලා. සුමල්ගෙ ගෙදර ගිහින් කිරි ඉතිරෙව්වෙ මම. අපි ලංකාවේ විදිහටම කරමුද අක්කෙ. කිරි මුට්ටිය රවුමටම උතුරලා වැටෙනකොට සුමල් මගේ දැතින් අල්ලා ගත්තා. මට හරි යයිද අක්කෙ. ඔයාට හරියනවා මල්ලි. එකපාරටම සුමල් මගේ බෙල්ල ඉම්බා. බෙල්ල පිටිපස්ස ඉඹින්න ආසාවකින් හිටියෙ කිව්වා. ඒ [illegible]

[illegible] කිරි උතුරද්දී මගේ හිත ප්‍රමෝදයකින් උතුරලා ගියා. [illegible] මේ කසාද බැඳපු ගෑහැනියක්. අත්සන් කරපු කොළයක් තියෙනවනෙ.

'අක්කෙ සුපර්මාකට් යනවද?'

'ඕනකමක් නම් නෑ'

'අද මං රෑ වැඩ'

'ඉතින් සුපර්මාකට් යන්නෙ?'

'බඩු ගන්න. හෙටටත් එක්ක උයාගන්න ඕන.'

'ඇයි රෝසි කන්න ගෙනත් දුන්නෙ නැද්ද?'

'රෝසි අක්කා හැමදම එන්නෙ නෑ. විශේෂ කෑමක් හදපු දවසට ගෙනත් දෙනවා. එයා ලස්සනට ඩාන්ස් කරන්නත් දන්නවා.'

'එයා ඕගොල්ලො එක්ක ඩාන්ස් කරනවද?' කියලා මං ඇහුවෙ දුරකතනයෙ වයර් එකේ පැටලිලි අරින්න උත්සාහ කරමිනුයි. හිතට ආපු දෙවල් කියන්නයැ. මහ විශාල නොරුස්නා [illegible] හිත ඇතුළෙ එහා මෙහා වෙන්න පටන් ගත්තා. හරියට [illegible] වැරදි වැඩක් කරනවා වගේ හැඟීමක්. ඇඳුමෙනුයි, හැසිරීමෙනුයි, කල්ක්‍රියාවෙනුයි රෝසි කෙල්ලක් වෙන්න හදනවා කියන කුඩුකේඩු හැඟිමක් හිතේ ඇති වුණා. ඒ ගෑනි කොල්ලො ඉන්න තැනකට ගිහින් නටන්නෙ මොකටද? වෙන මොකටද? අවුස්සගන්න මිසක.

'රෝසි අක්කා අපිට නැගල යන සින්දු ගෙනත් දෙනවා. අපි සින්දු දාගෙන නටනවා. රෝසි අක්කත් නැටිල්ලට හරි හපන්'

එයා නැටිල්ලට හරි හපන් තමයි කියන්න හිතට ආවත් [illegible]

[illegible] කොල්ලො කියන්නෙ හොඳ [illegible] කියලා කියන බව චන්ද්‍රකාන්තා ලියලා එව්ව කතාව මතක් වුණා. රෝසි [illegible] කවුරුවත් ගැන කතා කරන්නෙ නැහැ.

'සුපර්මාකට් යමුද අක්කෙ?'

'මේ වෙලාවෙ බෑ' මං කතා කළේ හිත යට කැකෑරෙන තරහකින්. හරියට ඉස්කෝලෙ යන පුංචි කෙල්ලෙක් වගේ සුමල් එක්ක තරහ වෙන්නෙ මොකටද?

'ඔයා ලෑස්තිවෙලා ඉන්න. මං ගේ ළඟට එනවා' කියලා සුමල් කිව්වා. සුමල් හුගක් වෙලාවට ඒ වගෙ බලහත්කාරය භාවිතා කරනවා. 'මේ වෙලාවෙ බැහැ' කිව්වට කැමැත්ත හිත ඇතුළෙ තිබුණා. වයසක ස්වාමිපුරුෂයත් එක්ක එළියට බැහැලා යනවා වගේ නෙවෙයි. තරුණ ඉලන්දාරියෙක් එක්ක විදි දිගේ සක්මන් කරන එක. සුමල්, රංගන වගෙයි කියලා හිතන්න මම උත්සාහයක ගැනුණා. සුමල් එක්ක ගමන් කරනකොටත් කාන්දමක් වගේ ඇදෙන්න හිතෙනවා ළඟට.

රංගන සියදිවි නසාගත්ත කතාව මම සුමල්ට කිව්වා.

'ගැනිව ලනිල්ට බාර දෙන්නනෙ තිබුණෙ. රංගන සියදිවි නසාගත්තෙ මොන එහෙකටද?'

'ඒක මහ විහිළු කතාවක්නෙ. ගැනි, ලනිල්ට බාර දුන්න කියලා රංගනගෙ හිතේ වේදනාව නැති වෙනවද?'

'තමුන්ගෙ භාර්යාව හරි ස්වාමිපුරුෂයා හරි වෙන කෙනෙක්ගෙ ඇහිපිල්ලමකවත් නොවැදී ආරක්ෂා කරගන්න හදන එක මෝඩකමක්නෙ. ඒවගෙ සීමාවල් නැතුව ආදරය කරන්න පුළුවන් නම් අන්න ඒකටයි නියම ආදරය කියන්නෙ.

'ඕවා ප්‍රායෝගිකව කරන්න පුළුවන් දේවල් නෙවෙයි සුමල් රංගනට [illegible]

[illegible] බලාගෙන ඉන්න?' එතකොට ඉතින් රංගන තිකම්ම [illegible] එකෙත් වෙනවනෙ'

මම කසුමිත් වඩාගෙන, සුමල් එක්ක සුපිරි වෙළඳසැලට [illegible] මැදදි සුමල් කසුමිව වඩාගත්තා. මං එං ගෙදර නිදි. [illegible] නැත්නුමත්. නිදාගෙන නැගිට්ටම හරියයි. ඕගොල්ලො [illegible] එන්න. තරහ වෙන්න එපා කියලා සුමල්ට කියන්න. මට [illegible] එන්න බැහැ. මං එං කතගාටුව ප්‍රකාශ කළා.

'දෙන්න සුමල්, කසුමි මං වඩාගන්නම්. මහන්සියි නේද? රට වැඩ කරන්නත් ඕනනෙ. අනික මේ ළමයා ලොකුයිනෙ.'

සුමල්, කසුමිව දුන්නෙ නැහැ. පුළුන් රොදක් වගේ සැහැල්ලුයි කිව්වා හිත. එහෙම නම් කොච්චර හොඳද?

'මහන්සිය, බඩගින්න, නිදිමත සේරම යනවා නුපා ඔයාව දැක්කම.'

එතකොට මම අක්කා නෙවෙයිද? නුපා! ඒ නම ඔයා හරි [illegible] උච්චාරණය කළා නේද? වතුර ගුරුලේත්තුවක් කට [illegible] බොන්න තරමට පිපාසයක් එකපාරට දැනුණා. සකුරා [illegible] මිමිතුරුණ දිගේ අපි ගමන් කරමින් හිටියා. අහසේ පලක් [illegible] ඉන්න මගේ පෙම්බරා එක්ක ඇර මේ වගෙ මිමිතුරුණක් [illegible] ගමන් කරලා නෑ මීට ඉස්සර. පෙම්බරා එක්ක ගමන් කරපු මිමිතුරුණෙ සකුරාමල් පෙති විතරක් නෙවෙයි තාමල් පෙතිත් [illegible] තිබුණා. මං උත්තර දුන්නෙ නැහැ. ප්‍රශ්නයක් ඇහුවෙත් නැහැ. ගොළු වුණේ මොකද නුපා එකපාරටම? සුමල්ගෙ මූණෙ පෙම්බර හීනාවක් උතුරනවා. ඇස් මහ එළියකින් දිදුළනවා. හිත් [illegible] හඬකින් ස්වර ගායනාවක් කරනවා ඇහුණා. ඉස්කෝලෙ සංගීත කාමරේ කොට්ටුදලෙන් මෙහා පැත්තෙ, කොට්ටුදලේ [illegible] ඒ ස්වර ගායනාව අහගෙන හිටියා. ස්වර ගායනාව [illegible] තරුණ ශිෂ්‍යාවක්. පුහුණු කළේ සංගීතගුරුවරයා. [illegible]

අදිනා ලෙසේ පාද නූපා තබ තබා ගීතය ඇහුවෙත් කොටුදූලේ එල්ලිලා. තාත්තා මට නම තිබ්බෙ ඔය ගීතය අහගෙන ඉඳලයි කියලා ඒ දවස්වල අම්මා කිව්වම තාත්තා මහා ප්‍රාඥයෙක් වගේ යාත්තමට හිනාවෙනවා. පාද නූපා! ඒ ගීතය නම් දූහැනක්මයි. ඒ දූහැනින්ද මේ ස්වරය ඇහෙන්නෙ. සුමල් ඇස් මග අරින්න උත්සාහ කළේ නැහැ. මගේ කනටම කරලා මේ ගායනා කරන ගීතය මොකද්ද කියලා මං අහගෙන හිටියා. මගෙ හුස්ම වැටෙන්නෙ නැද්ද? නැහැ හුස්ම වැටෙනවා. හුස්ම සිරුරෙ එහි එහි හුළඟක් වගේ නැළවෙනවා. සීතලට සිරුරෙ දවවෙනවා. උණුසුමට කන්පෙතිවලට දූනෙනවා.

'ඔයා මට වැඩිය මහ හුඟක් වැඩිමල් නැහැනෙ. මට ඔයා ගැන දූකයි' සුමල්, කසුම්ව ට්‍රොලියක තබන ගමන් කිව්වා. කසුම් ට්‍රොලියෙ නැගලා යන්න හරි කැමතියි. ඇයි මං ගැන දූක්වෙන්නෙ කියලා මං ඇහුවෙ නැහැ.

දූක් වෙන්නෙ මේ වයසක ස්වාමිපුරුෂයෙකුගෙ බිරිඳ වීම ගැනද? ප්‍රශ්නෙ ඒ වචනවලින් ඇහුවෙ නැති වුණාට සුමල් ඒ ප්‍රශ්නෙට වචනවලින් උත්තර දූන්නා.

'ඔයාගෙ හිතේ සතුටක් නැති බව පේනවා. ඔයා අසරණ හැඟීම්වලින් හිත පුරවගෙන'

'මං චං මට හුඟක් ආදරෙයි'

'ඔයා මසායා සාන්ට හුඟක් ආදරේද?

'දන්නෙ නෑ'

'දන්නවා. ඔයා කියන්නෙ නැහැ'

කියන්නෙ මොකද්ද කියලා මම දන්නේ නැහැ. සුමල්ගෙ හඬ මහ ගැඹුරට කන ළඟම ඇහුණා. කනට පිඹින මහා හුස්මක් වගේ. උණුසුමක්. ඒ වෙනස් හඬක් වෙනස් උණුසුමක්. ගොදුර[illegible] [illegible]කාරයකුට එකිනෙකාට ළං වෙලා [illegible]

[illegible] පුළුවන්ද කියන [illegible] හිතට ආවා. [illegible] කියන්නෙ මොකද්ද? ස්වභාව ධර්මයේ නීතියට එකඟවෙන [illegible]ට විතරද ආදරය කියන්නෙ? ආදරය කියන්නෙ ස්වභාව [illegible]යෙවත්, ලෝක ධර්මයෙවත් නීතියට බලහත්කාරයෙන් අඩංගු [illegible] දෙයක් විතරක් නෙවෙයි. දඩයක්කාරයෙකුට වුණත් බැරිද [illegible]රකට ආදරය කරන්න. ගොදුරකට බැරිද දඩයක්කාරයට [illegible]දරය කරන්න?

අපි අපේ ජීවිතය සොයා ගන්න අවශ්‍යයි කියලා සුමල් [illegible]. මං චං බලාගෙන හිටියා. කියලා යන්න දෙයක් [illegible] නොකියා යන්න දේකුත් නෑ. ඔහේ එළියට බහිනවා. [illegible]ක්කාරයො හොයාගෙන යනවා. නැහැ එහෙම හිතන එක [illegible]යි. දඩයක්කාරයෙක් නෙවෙයි. රෝසිලා කිව්වෙ ගොදුර [illegible] කියලා. එතකොට දඩයක්කාරයා නූපා.

'දත් කොල්ලෙක් අල්ලගෙන නටනවා නේද?' කියලා [illegible] ප්‍රශ්නයක් මගදී මූණගැහිලා ඇහුවා. කවුරුත් කරන්නෙ [illegible] එකනෙ.

'කියලද ආවෙ මං චං ට?'

මොනවා කියන්නද? සුමල් මූණ ගැහෙන්න එනවා [illegible]න්නද? හිත ඇතුළෙ සටනක් තියෙනවා තමයි. මං චං ට [illegible]රයක්, දයාවක් නෑ කියලා හිතන්න හිතට දූකයි. පෙම්බරා - [illegible] උඩ වැඩ හිඳින්න. මට ඉන්නෙ නුඹ පමණයි.

සුමල් මල්ලි නෙවෙයි.

නූපා අක්කා නෙවෙයි.

අපි අපේ ජීවිත හොයාගෙන ගියා. අපිට අපේ ජීවිත අතපත [illegible], විඳින්න පුළුවන්කම තියෙන්න ඕන කියලා සුමල් කිව්වා. [illegible] කියන හැම දෙයක්ම අර්ථවත් බව දැනෙන්න වුණා. මහ [illegible] මහ ආදරණීය ස්වරයකින් [illegible]

අර්ථයක් තියෙන බව හිත කිව්වා. අපි අපේ ජීවිත යම්කිසි විදිහකට සංවිධානය කර ගනිමින් හිටියා. සෝරා සාන් මෙ කෑරෝගෙ එකට හිහින් සුමල්ව අඳුන්නලා දුන්නා. ළඟම ඥාති නෑගීමෙන්. සෝරා සාන් හිටියෙ අස්පස් කරමිනුයි. මිනිස්සුන්ගෙ විනෝදයෙ කෝෂයන් මේස යටයි, මේස උඩයි සකල තොවවල් ඔවට පත්වෙලා තිබුණා. මම සෝරා සාන්ට ඇත්ත කිව්වා. සෝරා සාන් ඇහුණෙ නෑ වගේ තමුන්ගෙ කාර්යෙ යෙදිලා හිටියා. ඇය හිටියෙ මම නම් ඕවා දන්නෙ නෑ කියනවා වගේ. මේ වගේ දේවල්වල ප්‍රතිවිපාකය මොකද්ද කියලා දන්නවද කියන ප්‍රශ්නෙ සෝරා සාන් ඇහුවෙත් නෑ.

සුමල් මගේ ජීවිතයෙ හැම හිස්තැනක්ම පුරවනවා කියලා මං සෝරා සාන්ට කිව්වම සෝරා සාන් කන්නාඩි කුට්ටමට උඩින් මා දිහා බැලුවා. සුමල් හිටියේ පැත්තක වාඩිවෙලා කිරි වීදුරුවක් බොමිනුයි. මං වං අනුර ගෙන හිටපු මගේ ජීවිතයේ යම් යම් ඉසව්වල සුමල් නිදහසේ සැරිසරමින් හිටියා. සෝරා සාන්, මම මෙහෙම කියන්නද [illegible] සෝරා සාන් ඇයි එහෙම [illegible] බැල්මකින් මා දිහා බලන්නෙ? මට මේ සන්තෝසයත් දුකකින් භුක්ති විඳින්න කියලද කියන්නෙ? දැනටමත් එහෙම තමයි. මම මේ සන්තෝසය භුක්ති විඳින්නෙ දුකකින්. ඉරණම කියන්නෙ නොපෙනෙන කෙනෙකුගෙ අතේ තියෙන හැන්දක්. ඒ හැන්දෙන් බෙදන්නෙ ඒ කෙනාට ඕන විදිහටයි.

සුමල් පෙම්වතෙකුගෙ බැඳීමෙන් මාව ගේ ළඟට ඇරලවලා ගියා. කසුමිව ගේ ළඟට වඩාගෙන ආවෙ සුමල්. ඇවිදින්න පුළුවන් ළමයව සුමල් වඩාගෙන එනවා. කසුමි, සුමල් එක්ක හුරතල් වෙන්න හරි කැමතියි.

මං වං බයකින් වගේ මා දිහා බලාගෙන හිටියා. මං, මං වං ළඟ ඉඳගන්න බය වුණා. සුමල්ගෙ ශරීරයෙ සුවඳ මගේ ශරීරයට මුහුවෙලා, ඒ සුවඳ මං වං ට දැනෙයි කියලා මට බයක් දැනුණා. පසුතැවිල්ලෙන් [illegible]

'ආදරය කියන්නෙ [illegible] චාරිත්‍රයක්ද?' කියලා මං වං බලාපොරොත්තු නොවෙච්ච ප්‍රශ්නයක් ඇහුවා. මම උත්තර දුන්නෙ නැහැ. ඒත් උත්තර දුන්නා නම් කියන්න තිබුණෙ, ආදරය කියන්නෙ චාරිත්‍රයක් නෙමෙයි කියලයි. ආදරය කියන්නෙ [illegible]න්නෙක් බෙදාහදාගන්න හැඟීමක්. කායිකව සැනසෙන්න [illegible]ක් නෙවෙයි, මානසිකව භාවනාවකට එළඹෙන්න.

'ඔයා මගේ ප්‍රශ්නෙට උත්තර දුන්නෙ නැහැ'

'ඔයාට සනීප නෑ. දැන් නිදාගන්න.'

'මට අසනීපයක් නෑ.'

'දැන් නිදාගන්න.'

'ආදරය කියන්නෙ චාරිත්‍රයක් තමයි. විවාහය කියන්නෙත් චාරිත්‍රයක්'

මේ මිනිහුව පිස්සු. මං වං [illegible] ඉන්න පුළුවන් නම් [illegible] මට කරන ලොකු උදව්වක්. ආදරය කියන්නෙ ආත්මයක් ශරීරයක් දෙකම එකතුවෙන තැන. ඔහේට තේරෙනවද? මට ශක්තියක් තිබුණට දැන් ශක්තිය පෙන්නන්න බැහැ. කොච්චර [illegible] කෝපයක් වුණත් හිස පහත් කරලා ආචාර කරන්නනෙ සෝරා සාන් කිව්වෙ. වියදමක් යන්නෙ නැහැ. වියදම් තියෙන්නෙ [illegible] ඇතුළෙ. කිසිදෙයක් දන්නෙ නෑ, අඳුරන්නෙ නෑ වගේ ඉන්න. [illegible] කිසිදෙයක් දන්නෙ නෑ අඳුරන්නෙ නෑ තමයි. සෝරා සාන් [illegible] ඒ හැමදේටම මූණ දීපු පරිණත ගැහැනියක්නෙ. කල් [illegible] පරිණත වෙලා. සෝරා සාන් කිව්වෙ කිහිලිකරු නැතුව [illegible] නගරයේ ඇවිදින්න කියලා. සෝරා සාන් මං වෙනස් වෙච්ච හැටි පේනවද? මගේ උරහිස්වලටයි, මස්පිඩුවලටයි ඒ වෙනස දැනෙනවා. මං හදාගත්තෙ ජපානෙට ගැළපෙන [illegible] මූණක්, දුන්නක් වගේ දෙකට නමලා

'ඔය කොම්පියුටරේ එල්ලිලා ඉන්නා එපා හැමතිස්සෙම' කියලා මං වං ගිරිය යටින් කෑගහන්න ගන්නා. කොහොමද හොවල්ලී? මගෙ පෙම්වතා අන්තර්ජාලයෙ බලාගෙන ඉන්නවා මං skype එකට එනකල්! පරිගණකයකින් කීදෙනෙකුට කතා කරන්න පුළුවන්ද? එහෙම දියුණු වෙච්ච තාක්ෂණයක් තියන රටක ඉඳගෙන නොමිලේම ලබන්න පුළුවන් සුව නොලබා කොහොමද? අන්තර්ජාලය හරි තරුණයි මං වං.

නූපා සාන්, පරිගණකය අල්ලගෙන මුමුණන්නෙ මොනවද? ඔය හිනාවෙන්නෙ, තොදොල් වෙන්නෙ, හුරතල් වෙන්නෙ කා එක්කද? මේ ලෝකෙ මේ තරම් දුෂ්ටකම් සිද්ද වෙනවද නූපා සාන්? මගේ බිරිඳ තරුණ පුරුෂයෙක් එක්ක, විදේශිකයෙක් එක්ක ඒ තිස්සෙ හුරතල් වෙනවා කියලා හිතන්න මට ඉඩ තියන්නෙ ඇයි? මේ සන්ජෝ නගරයම දනගනියි. කවුරුවත් මගේ මූණට අහන්නෙ නැතිවෙයි. ඒකම තමයි විඳින්න බැරි දේ. මට කියවන්න පුළුවන් අනික් මිනිස්සුන්ගෙ හිත්. මිනිස්සු මට ඊනවට වැඩිය අනුකම්පා [illegible] [illegible] [illegible] මගේකම මිනිස්සුන්ට [illegible] [illegible] [illegible] දුක්නෙ ඉරණම නම් ඒ ඉරණම වෙනස් වෙන්නෙ කොහොමද? මං ඔයාට වීසා ගන්න කුලියට කසාද බැන්දා නෙවෙයි. මං ඔයාගෙන් සායො සාන්ට හෙළිවෙ නැහැ. සායෝ සාන් විවාහයක් ඉල්ලා හිටියා. දුන්නෙ නැහැ. ඔයා එක්ක මං විවාහ වුණේ මගේ කැමැත්තෙන්මයි. ඔයා තොදොල් වෙන්නෙ පරිගණකයත් එක්ක. ඔයා ඔය වෙන භාෂාවකින් කතා කරන්නෙ මගෙන් තොලැවෙන ප්‍රේමයක් ගැනද? උණුසුමක් ගැනද? සන්ජෝ කියන්නේ මහ ලොකු නගරයක් නෙවෙයි. සන්ජෝ නගරයෙ ගහක් ගලක් ගානේ කන් තියෙනවා. මගේ විජාතික බිරිඳ, විජාතිකයෙක් එක්ක නගරයේ සැරිසරන එක ගහක් ගලක් ගානෙ කතාබහට ලක්වෙනවට මං කැමති නෑ.

ගිනිත් නිවාගන්න මං වං මම ටිකකින් එන්නම්. මොකද්ද [illegible] මෙලා මේ තැබිලා තියෙන පිස්සුව. යන්න ගිනිත් නිදා ගන්න [illegible]

[illegible] කරවන්න. මම skype [illegible] [illegible]. අපි පොදු භාෂාවක් කතා කරනවා. ඔයා ඒ භාෂාව දන්නෙ නෑ පැටියො.

'ඇයි ඔයා දුකෙන් වගේ'

'සතුටත් දුකක්'

'ඇයි සතුට දුකක් කරගන්නෙ?'

'කෙනෙකුගෙ සතුට තව කෙනෙකුට දුකක්'

'අපිට මග අරින්න බැරි දේවල් තියෙනවා. එහෙම තැන්වලදී නොදක්කා වගේ ඉමු'

'මං වං අහිංසකයි'

'දැන් ඔවා හිතලා දුක් වෙන්න එපා. නූපා හැමදේම ඕනවට වැඩිය හිතනවා.

එහෙම [illegible] [illegible]. මං වං [illegible] වාර්තාවට ගම් දා ඇත්මේ අලුත් අරමුණකට ගිහින්. නූපාගෙ නමත් ගීතස් පොතට [illegible]. දුවගෙ නමත් යනවා. මොකටද? මොකක් කළාවද? [illegible] මගෙන් අහන්න එපා. එහෙනම් කාගෙන්ද අහන්නෙ? මං [illegible] කන්නෙ බොන්නෙ නැතුව නිදාගත්තා. පරඬැලක් වගේ [illegible] හිටියා. මං වං නැගිටින්න. මේ සුප් ටික බොන්න. පපා [illegible]. පපා අපි පපාට ගොඩක් ආදරෙයි.

'මමා පපාට ආදරේද?'

'ඔව්'

'[illegible] අන්කල්ට වගේම ආදරෙයිද?'

[illegible] ඒ ප්‍රශ්නයෙන් මගේ හිතයි - [illegible] [illegible]

'ආදරෙයි නම් කියන්න පපාට. එතකොට පපා නැගිටියි'

මට ජීවිතය යම් දෙයක් දෙනවා. මම ජීවිතය දෙන දෙ භාරගන්නවා. ඒත් මම ජීවිතයේ වහලියක් නෙවෙයි. ඔව් - මම පපාට ආදරෙයි. මම මං චංගෙ ඇඳ ළඟ දණගහගත්තා.

'නැගිටින්න මං චං'

'ඇයි සායො සාන් මාව අතෑරලා ගියේ?'

ඔහු මේ ශෝක ගන්නේ සායෝ නම් වූ ඔහුගේ පූරාණ පෙම්වතිය වෙනුවෙන්ද?

'සායො සාන් ආපහු ආවොත් ඔයා සතුටු වෙනවද?'

'සමාව ගන්නවා. පුළුවන්ද ඇය කොහේද කියලා හොයන්න. මට ඒ නැනැත්තිගෙන් ඉල්ලන්න තියෙනවා.

'අපි සායෝ සාන්ව හොයමු මං චං. ඒත් ඊට ඉස්සර ඔයා ශක්තිමත් වෙන්න ඕනැ'

ඒක ඇත්ත නෙවෙයි. සායොට සමාව දීමේ කතාව ඇත්ත නෙවෙයි. ඒක බොරුවකුත් නෙවෙයි. බාග ඇත්තකුයි බාග බොරුවකුයි. ඔයා රවට්ට ගන්නෙ ඔයාවමයි මං චං.

මට ඇහෙනවා සායොගෙ බටනළාවෙ හඬ. වාදනය කරන්නද මම ජපන් ගිටාරය? සමිෂෙන් එක? ඔයාට ඒක විඳින්න බැහැ. බැහැ නේද නූපා සාන්.

මං චං ආවේශයෙන් වගේ නැගිට්ටා. කසුමි බයවෙලා දොර ළඟට දිව්වා. එකපාරට ශරීරයට ආව ශක්තියකින් මං චං මාව ඔසවලා බිමින් තිබ්බා.

කසුමි අඬන හඬ පිටුපසින් ඇහුණා. මං චං එකපාරටම මේසෙ යටට රිංගුවා. කවුරු හරි ගහයි කියලා හැංගෙන පුංචි ළමයෙක් වගේ. ඊට පස්සෙ අත් දෙකින් මූණ වහගෙන 'සායෝ' කියමින් අඬන්න පටන් ගත්තා.

මම ඔයා එක්ක තරහ නැහැ මං චං. මට දුකයි. මට සතුටුයි. අඩු ගණනෙ ඔයාට එහෙම අඬන්න, වැළපෙන්න සැබෑ ආදරයක් අතීතයෙ හරි තියෙනවා.

අන්තිමේ මං චං, කසුමිවයි මාවයි බදාගෙන අඬන්න පටන් ගත්තා. එතකොට දූන් ඔයා අඬන්නෙ ඇයි? බදාගෙන ඉන්නෙ කාවද දූන්? ඔයා බය කාටද මං චං? ඔයා ආදරය කරන්නෙ කාවද? ඔයා ජීවත් වෙන්නෙ කා වෙනුවෙන්ද? හැංගිලා අඬන්න එපා.

මං චං රෝහලට ගෙනියන්න උදව් කළේ සෝරා සාන්. කෑදර මැරෙන්න අරිනුමෙන කොහොමද? යන්නම බෑ කියලා ඇඬුවෙ පොඩි දරුවෙක් වගේ. එළිවෙන වේලෙන්දී මං චං මගෙ හොඳ කියලා අඬන්න පටන් ගත්තා. හිතේ අමාරුවට මනුෂ්‍යයෙක් මැරෙන්නෙ නැහැ නේද කියලා මං සෝරා සාන්ගෙන් ඇහුවා. නෑ මැරෙන්නෙ නැහැ. ඒ වුණාට හිතේ අමාරුව නිසා සියදිවි නසාගන්න පුළුවන්. විශේෂයෙන් ජපානය වගේ රටක සියදිවි නසා ගැනීම එක අතකට සංස්කෘතියෙම අංගයක්නෙ නූපා සාන්.

මං චං හොඳටම දුර්වල වෙලා. කතා කළේ අහුත දවල්. සායො සාන් විවාහ කරගත්තා නම් දූන් ලොකු දරුවො ඉන්නවනෙ කියලා කසුමිගේ හිස පිරිමැද්දා. යන්න ඇරියෙ ඔයාමනෙ. නිශ්ශබ්දව හිටියෙ ඔයාමනෙ.

'මාව ගෙදර අරන් යන්න නූපා සාන්'

'අරන් යන්නම්. සනීප වෙච්ච හැටියෙ. සනීප වෙන්න මං චං. හිතට දහිරිය අරන් සනීප වෙන්න.'

හැඟීමක්, දැනීමක් නැති මිනිහෙකුට කියන්නෙ මිනිහෙක් කියලද? නොදන්න, නොතේරෙන, නොපවතින දෙයකට පසුතැවිලි වෙන, වැළපෙන, ශෝකවෙන මිනිහෙකුට කියන්නෙ මිනිහෙක් කියලද?

'සායො සාන්ව පැහැරගෙන ගිහිල්ලා. ඔව් ඇයව පැහැරගෙන ගිහිල්ලා. සායො සාන් සකුරා මල් වියන යටින් එනකොට කවුරු හරි පැහැරගෙන ගිහිල්ලා.'

මං චං රෝහල දෙදරන්න කෑගහන්න ගත්තා. මං චං ඒක නේද හිත ඇතුළෙ තියාගෙන හිටියෙ? සායො සාන් වෙනුවෙන් සමිසෙන් වාදනය කරපු හිත එතැනමයි. අපි එකිනෙකාට නොබැඳුණේ එහෙනම් වයස නිසා නොවෙයි. අපි එතකොට කවුද? තමුන්ගෙ පරම්පරාව ගෙනියන්න දරුවෙක් හදලා දෙන්න ආපු යන්ත්‍රයක්ද? සුමල් මගේ හීනයෙ කොටස්කාරයෙක් වෙලා ඉන්න හින්දා මේ වේදනාව බර අඩුයි. ඒත් බර අඩු වුණාට වේදනාව එහෙමමයි.

'මට ගෙදර යන්න ඕන. මාව ගෙදර ගෙනියන්න. ඉස්පිරිතාලෙ දාම්මෙ මාව මරන්නද?'

පරඬැලක් වගේ ඇඳේ වැතිරිලා ඉන්න මං චං ගෙදර යන්න ඇඩුවට ගෙදර ගෙනියන්න එපා කියලා දොස්තරලා කිව්වා. මෙට්ටෙකටයි, කොට්ටෙකටයි කොටුවෙලා එකින් එක පැටලෙන සිතුවිලි වැලක් ලිහාගන්න බැරුව මහ අසරණ කමක වැටිලා ඉන්න මං චං දිහා මං මෙට්ටෙ පැත්තක ඉඳගෙන බලාගෙන හිටියා. නිදිමතයි. නිදිමතයි. නිදිමතයි. ඇස් ඇරුණු ගමන් බයයි. බයයි. බයයි. කසුමිව අරන් යන්න කවුද එනවා. කසුමිව පරිස්සම් කරගන්න. ඔයාට තනියම බෑ නූපා සාන්. ඔයාට තනියම බෑ. මාව ගෙදර ගෙනියන්න. තින්දක් නෙවෙයි මත්වීමක්. කසුමි අඬනවා. පපා ගෙදර යමු පපා. මමා, පපා ගෙදර ගෙනියමු.

'නූපා සාන් - මසායා සාන්ට ආදරය, කරුණාව හුඟක් අවශ්‍ය [illegible] රැකවරණය ඔන කරනවා. [illegible]

[illegible]වෛද්‍යවරයා කිව්වා. [illegible] ආදරය, රැකවරණය [illegible]රුණාව නැතුවද පිස්සු වැටුණෙ? ඔය හැමදේම නැති මට [illegible]පිස්සු වැටෙන්නෙ නැද්ද?

මං චං කිසිදෙයක් නොදන්න අත දරුවෙක් වගේ බලා [illegible]ගෙන ඉන්නවා. හොඳයි ඒකත් එහෙම නම් කරමු. දෛවය මට [illegible]රදෙන වැඩකටයුතු ටික කරමු. සෝරා සාන්ගෙ වාහනයෙන් [illegible]සායා සාන්ව ආපහු ගෙදර එක්කරගෙන ආවා.

ආදරය - රැකවරණය - කරුණාව දෙන්න. නූපාගෙ [illegible]න්සැලෙන්.

සායො සාන් ගෙනත් දෙන්න කාටද පුළුවන්? සමිසෙන් [illegible]නැවත වාදනය කළොත් සායො සාන් එයිද? බෙහෙත් ටික හරියට [illegible]බොමු. අනික් ටික එන විදිහකට බලමු.

10

කසුම් අමතක කරලා කවදාවත් සුමල්ට මුල් තැන දෙන්න බැහැ. සුමල් දෙවැනියම තමයි. එතකොට මංචං. මං චං තිකම්ම තුන්වැනියා වෙනවා. සුමල් තනි කාමරේ ගෙයක් ගත්තෙ මං හින්දා බව කිව්වෙ හුග දවසක් ගියාට පස්සෙ. ඒක එහෙම නම් මං චං ගෙ උදව්වෙන් ගේ ගත්තු එක හොඳ මදි කියලා මං සුමල්ට කිව්වා. මොකක් වුණත් හෘද සාක්ෂියක් කියලා එකක් තියෙනවනෙ. අනුන්ගෙ ගෑනියෙක් තමුන්ගෙ සන්තකයට ගැනීමේදි ඇතිවෙන හැඟීම මොකද්ද කියලා මං සුමල්ගෙන් ඇහුවා. මං කවදාවත් ඔයා අනුන්ගෙ කියලා හිතන්නෙ නෑ මගෙ මැණික කියලා සුමල් මගෙ හිස අත ගෑවා. අහන්න බැරි ප්‍රශ්නයි, අහන්න පුළුවන් ප්‍රශ්නයි දෙජාතියක් තියෙනවා. මං කොහොමද අහන්නෙ එහෙනම් කවදාහරි ඔයා මාව කසාද බඳිනවද කියලා. ඒ වගෙ ප්‍රශ්නයක් අහලා මේ සන්තෝසය නැතිකරගන්නෙ මොකටද? අපි කරන්නෙ අනාචාරයේ හැසිරීමක් නෙවෙයි කියලා සුමල් කිව්වා. නූපා මං චං එක්ක පොතේ බන්ධනය මිස වෙනත් බන්ධනයක් නැත්නම්, තමුන් ආදරය කරන මිනිහත් එක්ක ආදරයෙන් බැඳීම අනාචාරයක් වෙන්නෙ කොහොමද කියලයි සුමල් තර්ක කළේ. ඇත්ත තමයි කියලා හිත හදාගන්න බැරිකමක් තිබුණා. ඔයා කසාද බැඳලද කියලා මං කවදාවත් සුමල්ගෙන් අහලා තිබුණෙ නැහැ. හිතට තදට බැඳිලා තිබුණා සුමල් කසාද බැඳලා නෑ කියලා.

... කිව්වා. ...
... වෙලාවක ... නොදැකපු ස්ත්‍රියක් ගැන විශාල ඊර්ෂ්‍යාවකින් හිත ...නෙ. හුස්ම ගන්න බැරිකමක් දැනුණා. දරුවොත් ...ට පිඹුණා. ... ? නැහැ දරුවෝ නැහැ. ද්‍රෝහිකමක් කරනවා කියලා ...නවද? ...න්නෙ නැද්ද තමුන්ගෙ භාර්යාවට? මගේ ආදරය අඩුවක් ... මතින්ද්‍රිට. වැඩිවීමක් කියන්න බැහැ. මොකද වැඩිවෙන්න ... ඉතුරු නැති තරමට ඒ ආදරය ප්‍රබලයි - උපරිමයි. මතින්ද්‍රි ...ගේ සංසාර සහකාරිය. සංසාරෙ කවදාවත් අපි වෙන් වෙන්නෙ ... නැහැ.

එතකොට මම කවුද? කවදාවත් මං අනුන්ගෙ කියලා ...න්නෙ නැත්නම් මමත් තමුන්ගෙද? මං තමුන්ගෙ වෙන්නෙ ...යි ආකාරෙටද? ඔය තරම් විසක් ඇතුළෙ තියාගෙන හිටියෙ ...කොහොමද මිනිහෝ කියලා අහන්න ශක්තියක් නැති වුණා.

ඔයත් වෙන කෙනෙකුගෙ භාර්යාවක්නෙ. මමත් වෙන ...කෙනෙකුගෙ පුරුෂයෙක්. හොඳයි ඔයාට පුළුවන්ද මා එක්ක ... වෙන්න? ඔයා කසුම්ගෙ තාත්තාට ගෞරව කරන්නෙ ...ද්ද? මං මගේ භාර්යාවට ගෞරව කරනවා. එයා මගේ උත්තම ...ර්යාව.

ඔය උත්තම භාර්යාවට ගරු කරන විදිහද මේ? මහ ...සුම් ආදරේකින් මගෙ ගතයි-සිතයි දෙකම ගිනි වැට්ටෙව්වෙ ...කොහොමද උත්තම භාර්යාව හිත ඇතුළෙ පූජාසනයක වැඩ ...ද්ද?

මම ඔයාට ආදරෙයි නූපා.

කෙහෙල්මල්! ඔක නිකන් ලොකු වැස්සක් වැස්සම හේදිලා ... පස් ගොඩක් නේද? කෝම්පිට්ටුවක් නේද?

භාර්යාවටයි ... තව ගෑනියෙකුටයි දෙන්නෙකුට ආදරේ

එං සායෝ සාන්ට ආදරේ කරන්නෙ නැද්ද? මතින්ද්‍රි ගැන මම ඔයාට කියන්නමයි හිටියේ. ඒකට අවස්ථාවක් උදා වුණේ නැහැ. අපි දෙන්නා ආදරය කරලා කසාද බැඳපු දෙන්නෙක්. දෙන්නෙක් නෙවෙයි දැන් එක්කෙනෙක්. එයා හදවතට වහල් වෙන ගැනියෙක් නෙවෙයි. ඇයි සුමල් මට නොකියම නොහිටියෙ? දැන් ඉතින් මං ඔයාගෙන් දකින්නෙ ඔයා නෙවෙයි මතින්ද්‍රි. මං ඔයා ඉදිරියෙ එකපාරට අඟුටු මිට්ටෙක් වුණා නේද? ඔයා ඉදිරියේ ඉන්න මහා ප්‍රතාපවත් ගැහැනිය මතින්ද්‍රි නේද? ඔයාට මං කවුද? මං ඔයාගෙ කවුද? පෙම්බරී! පෙම්බරීට එක ගැනියෙක්. භාර්යාවට තව ගැනියෙක්. මං ඔයාට කසුම්ට වගේම ආදරය කළා සුමල්. මට ඔයා පොඩි ළමයෙක් වුණා. මං ඔයාට පොඩි ළමයෙක් වුණා.

'මතින්ද්‍රි දන්නවද මං ගැන'

මං ඇහුවේ මෝඩ ප්‍රශ්නයක් තමයි. මතින්ද්‍රි දැනගන්නෙ කොහොමද මං ගැන.

'මතින්ද්‍රි දැනගත්තොත් මං ජීවත්වෙන්නෙ නෑ'

මම අඬන්නෙ මුළු ශරීරයෙන්මයි. අභ්‍යන්තර ශරීරයෙන්. ඒ අභ්‍යන්තර ලේ ගලනයක්. කම්පනයක්. ඔයා ජීවත් වෙන්න. හැබැයි මම කොහොමද මේ බන්ධනයෙන් මිදෙන්නෙ? ඔයා මා බඳවා ගත්තෙ මිදිලා යන්න පුළුවන් බන්ධනයකින් නෙවෙයි. සුමල්. ඇයි එහෙම කළේ. මතකද අපි පන්සලට ගියා. අපි මල් පූජා කළේ සිරුරුවල දුවටි දුවටි. පන්සලේ ඒ කොනේ ඉඳලා මේ කොනට බොහොම හෙමින් ඇවිදගෙන ගියා. තාම ඇවිදින්න පුරුදු වෙන බබාලා වගේ. ඔයා ගියේ කසුම්ව අතින් අල්ලගෙන. ඔයාගෙම දරුවා වගේ. අපි පන්සලේ කඳුමුදුනෙ ඉඳලා පහළ බැලුවා මතකද? සූරි ගස් මහ විශාලෙට හැම තැනම. හරියට අපේ තේක්ක ගස් වගේ. තේක්ක ගස්වලට වඩා විශාලයි. පාටත් වෙනස්. අද්භූත ගතියකුත් තිබුණා. ඒත් අපි දෙන්නම හිතුවෙ ඒ අද්භූත කමේ අමුතු ලස්සනක් තියෙනවා කියලා නේද? ඒ පන්සල් වත්තේ නෙවෙයි අද්භූතකම තිබුණෙ අපේ හිත්වලයි.

...පොදකම ඔයා...
...දල් ගහයි. තාප්ප ගහයි. කෙටි තාප්ප. උස් තාප්ප. ඔයා
...න් එහා පැත්තෙ. මං මායිම ළඟ ඉඳගෙන ඔබේ ඡායාව
...න්නෙ කොයිවෙලාවෙද කියලා බලාගෙන ඉන්නවා. ඔයා
...ජලාශයක පිහිත පිහිත. ඔයාට පීනන්නත් පුළුවන්
...නා ඉන්නත් පුළුවන්. ඔයාගෙ ජීවිතය සැලසුම් කරපු,
...ර්මාණ ශිල්පියෙක් හදාපු අපූරු ගෙයක් වගේ. මම ගෙයක්
...වෙ සැලැස්මක් නැතුවනෙ. ඒ සැලස්මක් නැති ගෙය හිස
...වාවැටිලා දැන්. ඒත් එකම එක වාසනාවක් තියෙනවා. ඒ
...න් අතර නොදැවී පවතින ස්නේහය කසුම්.

ආදරය ජීවිතයේ ආත්මයයි - ශරීරයයි එක්කරන වග මට ...ලා දුන්නෙ ඔබයි. ඔයා තුළ ජීවත්වන සුන්දර පුරුෂයා මගේ ...තුළ අනවසරයෙන් ලැගුම් ගෙන.

...හෙත බහුභූතයක්ද? සුමල් සුන්දර පුරුෂයෙක් වෙන්නෙ ...ද? කසාද බඳිමු කියලා නොකිව්වට, මං එං ව දාලා ...ත් සන්තෝස වෙනවා කියන මායාදූලක මාව පටලවගෙන ...නෙ. මට දැන් ඉතින් පැරදුණාම ඕන කෙනෙක් හිතන විදිහට ...න් මට දෙන දේ විතරක් බාරගන්නවා කියලා යටහත් විදිහට ...දාගන්න උත්සාහ කරනවා. කන්ද ශිනාතො ගඟට ඉඩදීලා ...දෙපැත්තකට වෙලා ඉන්නෙ.

මතින්ද්‍රිගෙ දේපොළ අයිති මතින්ද්‍රිටයි. මුළු කඳුයායම ...මතින්ද්‍රිටයි. මතින්ද්‍රි තරුණ සුරූපී කාන්තාවක් කියමින් ...යි, ගුණ කදම්බයයි විස්තර කළේ සුමල්. ඒ පුවචානම් ...අහගෙන ආශිර්වාද කරන්න කියලද තමුන් මය ඉල්ලා ...න්නෙ?

මතින්ද්‍රි හිතන පතන දේවල් හරි පුදුමයි. අවුරුදු සීයක් එහා

අවුරුදු තියක් එකා හිතුවට මිනිහා දන් මොනවද කරන්නෙ කියලා හිතන්න බැ නේද? මං නිහඬව අහගෙන හිටියා. මිය ගැනියෙ පුච්චානම නවත්තන්න දන්. මං මේ වෛර කරන්නෙ කවදාවත් නොදකපු ගැනියෙකුට නේද කියලා දුකකුත් හිතේ ඇතිවුණා. දකලත් නෑ - දකින්න හිතකමකුත් නෑ. මං වෛර කරන්නෙ මට වරදක් කරලා නෙවෙයි- මං වරදක් කරලත් නැහැනෙ. මේ හැමදේම අමතක කරලා සුමල්ට පරණ විදිහටම සලකන්න පුළුවන් නම් හොඳයි කියලා හිත කිව්වා. ආදරය කියන්නෙ ජීවිතා වැටකොටු ගහන්න පුළුපු දෙයක් නෙවෙයිනෙ. ජීවිතයක්, බන්ධනයක් තියෙන තැන ආදරයක් නැහැ. කමක් නෑ සුමල්. ඔයා මතින්දිට ආදරය කරන්න. මං ඔයාට ආදරය කරන්නම්. පරණ විදිහටම. මං ඔයාට කෑම උයාගෙන එන්නම්. මං ඔයාගෙ ඇඳුම් ටික හෝදලා දෙන්නම්. මං ඔයා ළඟ ඉඳගෙන ඔයාගෙ කතා අහගෙන ඉන්නම්. මං ඔයාට රැකවරණය දෙන්නම්. විසා නැති බව මං කාටවත් කියන්නෙ නැහැ. විශේෂයෙන් මගේ ස්වාමිපුරුෂයාට කියන්නෙ නැහැ. ඔයාට දොස්තර ළඟට යන්න ඕන වුණහම මම එන්නම් තනි නොතනියට. ආදරය කියන්නෙ වෛරය නෙවෙයිනෙ.

මං වං සුවය ලබමින් හිටියා. ස්වාමිපුරුෂයා නැවියට මං වං දන්නවද මං මොන අගාධයකද වැටුණෙ කියලා. ඔයා දන්නෙ නෑ. මං වරදක් කියනවා නෙවෙයි. මගෙයි වරද. ඒත් මං ඒ වරද ගැන පසුතැවෙන්නෙ නැහැ.

'බිව්වද බෙහෙත් ටික?'

'මං පෙන්නුවෙනෙ නුපා සාන්ට බෙහෙත් ටික'

'පෙන්නලා හරියන්නෙ නැහැ. මා ළඟට ඇවිත් බොන්න.'

බෙහෙත් බොනවා වගේ පෙන්නලා විසි කරන පුරුද්දක් ඇති කරගෙන හිටිය හින්දයි මං වං මේ රෙගුලාසි. බෙහෙත් නොබිව්වොත් ආයෙම අගාධයට. එහෙම නේද? ඇයි හිතාවෙන්නෙ?

...න් වෙන්න නමුත් ටිකරක් ආස වුණාම ඇතිද?

ඔයා ජීවත්වෙන්න ආස කසුම් හින්දා මිසක මං හිතුවා ...වෙයිනෙ මං වං. විවාහයෙ සතුට කියන්නෙ මංවිං දරුවෙක් ...ම් විතරක් නෙවෙයිනෙ. ගැනුවත්, පිරිමිවත් සතුටු වෙන්නෙ, ...ගෙ පවත්තගෙන යන්නෙ දරුවෙක් නිසා පමණක් නම් එක ...පූර්ණ විවාහයක් නෙවෙයිද? ඔයාගෙයි මගෙයි විවාහය ...පූර්ණ විවාහයක්ද කියලා අපි මූණට මූණ ඉඳගෙන ඇහුවද? ...න හැම දවසකම. මාසෙ හැම දවසකම. අවුරුද්දෙ හැම ...කම එකිනෙකා කෙරෙහි අසන්තෝසෙන් ඉඳලා දරුවා හින්ද ...න් අපේ ජීවිතය සාර්ථකය කියලා මායාවක පැටලිලා ඉන්න ...ද සාර්ථක විවාහය කියන්නෙ. ස්වාමි පුරුෂයා භාර්යාව ...දින් පාලනය කරගෙන ඉන්න එකටද සාර්ථක විවාහය ...න්නෙ? විවාහය කියන්නේ එකිනෙකා පාලනය කරගෙන ...ම විතරක් නෙවෙයි මං වං. කනබොන එක, අඳිනපළඳින ... තෝරලා ... හිසදුරක් ... හැමෙන දනෙන එක, ... ලිංගික ...දීම වගේම, විශේෂයෙන්ම මානසික ඇලීම බැඳීම විවාහයෙදී ...ය බව ඔයා දන්නවද? ඔයා ඒ කිසිදෙයක් මගෙන් සමනිකට ...කම් කරන්නෙ නැත්තෙ අපේ සම්බන්ධතාවෙ මොකක් හරි ...ඩුවක් තියෙන හින්දා.

විවාහයක් නැති වුණාට සුමල් විවාහයකින් බලාපොරොත්තු වෙන ආදරය, කරුණාව රැකවරණය ලබා දුන්නා. අපි එකට ඉඳගෙන කොච්චර දේවල් කතා කරලා තියෙනවාද? සුමල් ... දෙයක් මං නොසලකා හිටපු වෙලාවට සුමල් කිව්වෙ 'මං ඔයාගෙ ස්වාමිපුරුෂයානෙ. මං කියන දේ අහන්න' කියලා. ඒ කාව බොරුවක් වුණාට ඒ ස්වාමි පුරුෂයා කතාවෙන් මං සැප ... වින්දනෙ. 'ඔයා මගේ භාර්යාව', මතින්දි ගැන කතාව ... කරන කල් සුමල් කිව්වෙ එහෙමයි. අපි හුගාක් කතා

හිනාවුණා. මං බලාපොරොත්තු වුණෙ කවුරුවත් මොකටද ඔයා ඉන්නවනෙ' කියයි කියලා.

'ඔයා එන්නෙ නැද්ද?'

'මට එන්න හිතක් නෑ'

'මම ඉන්නෙ හරි පාලුවෙන්'

'මතින්ද්‍රිට කතා කරන්න'

'මතින්ද්‍රිට කතා කළා. 'ඒත් මට පාලුයි. එන්නකො'

මට යන්න හිත දෙන්නෙ නැහැ. ගියත් සිද්ද වෙන දේ ආයෙම ඒ විදිහටම සිද්දවෙනවට මගෙ හිතේ කැමැත්තකුත් නැහැ. සුමල් කොහොමද මෙච්චර ඉක්මනට වෙනස් වුණේ? මතින්ද්‍රි ගැන හෙළිදරව් කළාට පස්සේ සුමල් හුඟාක් වෙනස් මිනිහෙක් වෙලා. පාලුව නැති වෙනවා විනාඩි දෙක තුනකින්. මං චං බලාගෙන ඇති නේද? කසුම් අඬනවා ඇති නේද? මට ඇඟට හරි මහන්සියි. හරියට කොන්ත්‍රාත්තුවකට සනීපාරක්ෂක සේවයෙන් ගෙන්න ගත්තු කම්කරුවෙකුගෙ පිරිසිදු කිරීම ඉවරවුණ හැටියෙ එළියට දාලා දොර වහගන්නවා වගේ. එක පාරට එළියට දාලා දොර වහනවා. ඔයා සතුටින්ද - ඔයා සතුටින් නම් මං සතුටින් කියලා සුමල්මනෙ එහෙම වෙනස් වුණේ. හිතෙන් එකපාරට එළියට විසිකරන්න පුළුවන් කෙනෙක් නෙවෙයි සුමල් කියන්නෙ. බයයි, දුකයි, සතුටයි, අවිනිශ්චිතකමයි.

බෑ කොහොමටවත් බෑ. ඔයා ජීවිතයෙන් පළවා හරින්න බෑ. අප දෙදෙනා බන්ධනයකින් බැඳිලා. ඔයා හැම වෙලාවෙම කිව්වෙ 'ඔයා මගේ භාර්යාව' කියලා. මම ඒ වචන අහගෙන හිටියෙ ලෝකයෙ මිහිරිම වචන කිහිපය අහනවා වගේ. මං ඔයාගෙ භාර්යාව නොවුණත් සුමල් ඒ වචනවලින් මම මොහොතකට හරි

වෙනවද? සතුටු වෙනවද කියලා ඔයාගෙන් ඇහුවට මම දන්නෙ නැහැ මම සතුටු වෙනවද දුක් වෙනවද කියලා. මගේ බඩට ඇවිත් ඉන්න ජීවියා ඔයාගෙ ලෙයින් හැදුණෙ. ඔයා මගෙ බඩෙ ඉන්න දරුවගෙ පියා. මේ කලලය මගේ හිතට අප්‍රමාණ ආදරයක් ලැබියදී හැදුණු කලලයක්. ඔයා මගේ ස්වාමිපුරුෂයා නෙවෙයි තමයි. ඔයා මතින්ද්‍රිගෙ වෛවාහික - පුරුෂයා. ඒත් මේ මගේ කුසට ඇවිත් ඉන්න දරුවගෙ ස්වභාවික පියා ඔයයි. සම්පූර්ණ ආදරයයි, තෘප්තියයි මැද පිළිසිඳුණු කලලය ඔයාට පිතෘත්වය දෙනවා. මතින්ද්‍රිගෙ කුස නෙවෙයි තමයි. ඒත් මම ඔයාට ආදරය කරනවනෙ. ඔයා මට ආදරය කරන බව කිව්වනෙ. අපි ජීවත් වුණේ සුමල්, මංචං ගෙ විශ්‍රාම වැටුපෙන් විතරනෙ. කසුම්ව තනියම දාලා ආයෙම රස්සාවට යන්න මට හිත දුන්නේ නැහැ. අපිට ලොකු අමාරුකම් තිබුණා. ඔයාටයි, මතින්ද්‍රිටයි සැපවත් ජීවිතයක් අනාගතයෙදී ඇති කරගන්න ඔයා හුඟාක් දුක් විඳිනවා කියලා කියපු දවසෙ මම හිතුවෙ ඒ සැපවත්කම අපට දෙන්න මංචං කොච්චර දායක වෙනවද කියල. ස්වාමිපුරුෂයා කියන්නෙ නීතියෙන් ලැබෙන තානාන්තරයක්නෙ. නීතිය නැතිව ස්ත්‍රියක් භුක්තිවිඳින පුරුෂයට කියන්නෙ 'අනියම් ස්වාමිපුරුෂයා' කියලා එතකොට සුමල්, මට අනියම් ස්වාමිපුරුෂයාට දාව දරුවෙක් පිළිසිඳිලා.

'සෝරා සාන්'

සෝරා සාන් තිගැස්සුණා. සෝරා සාන් හිටියෙ කරෝකෙ එක අස්පස් කරමින්. මම වීදුරු ටික හෝදන්න හරිබරි ගැහුණා. කසුම් දුවගෙන ගිහින් රෝසමල් ඉඹින්න පටන් ගත්තා.

'කසුම් ඉඹින්න එපා රෝසමල්. ඕවයෙ සත්තු ඉන්නවා. නහයෙ යයි' කියලා සෝරා සාන් අවවාද කළා.

සෝරා සාන් ... දැනට කරෝකෙ එකට විසා නැති කොල්ලො හුගක් එනවා කියලා සෝරා සාන් කිව්වා.

මම වීදුරු පෙළ හෝදමින් හිටියෙ. විසා නැති කොල්ලො. සෝරා සාන් විසා නැති කොල්ලෙක්ගෙන් මට දරුවෙක් පිළිසිඳිලා. ඔය වීදුරු ටික බිඳෙයි බලාගෙන. සෝරා සාන් හරි මිනිහෙක් පැදුර පැගුවත් අපේ පවුලෙ ගෑනුන්ට ළමයි හම්බ වෙනවා. හරි මිනිහෙක් පැදුර පෑගුවට ඒ මිනිහා හරි මිනිහා නෙවෙයිනෙ.

'හූපා සාන් බයක් හිතෙන්නෙ නැද්ද? කොහොමද ඔච්චර සැහැල්ලුවෙන් හිතන්නෙ?'

'මොකද බයක් නැත්තෙ. ස්වාමිපුරුෂයගෙ නොවන ළමයෙක් බඩේ ඉන්නකොට.' සෝරා සාන් වැඩ ඔක්කොම නවත්තලා මා දිහා බලාගෙන හිටියා.

'දැන් මාස කීයද?'

'මාස එකහමාරයි'

'සුමල් දන්නවද?'

'තවම කිව්වෙ නැහැ.

හූපාට මොළේ කළදක් නැද්ද කියලා සෝරා සාන් ඇහුවෙ නැහැ. කතාබහක් නැතුව මුළු ශාලාවම අතුගෑවා. කුණු අරන් දැම්මා. කසුමිට කන්න දුන්නා.

'මං ලොකු වුණාම සෝරා සාන් වගේ කරෝකෙ එකක් කරනවා' කියලා කසුමි කිව්වම කසුමිව ඉඹලා හිනාවෙන්න පටන් ගත්තා. කසුමි කිව්වා කෑම දුන්නට හුගාක් ස්තුතියි කියලා. සෝරා සාන් මං හෝදපු වීදුරු පිහ දමන්න පටන් ගත්තා.

'දන්නෙ නැහැ කියන්නෙ. ළමයා තියා ගන්නවද නැද්ද?' සෝරා සාන් අහපු ප්‍රශ්නෙට මම හිත ඇතුළෙන් උත්තර හොයමින් හිටියෙ. තියාගන්නවද නැද්ද? මගේ හුස්මෙන් ජීවත්වෙන දරුවා තියාගන්නවා මිසක නැති කරන්නෙ කොහොමද?

'සෝරා සාන් දන්නවනෙ මං කොච්චර දුක් විඳලද කසුමි හදාගත්තෙ. මං මේ ළමයා නැති කරලා දාන්නෙ කොහොමද?'

සෝරා සාන් කතා නැතුව වීදුරු පිහදැම්ම කරගෙන ගියා. ජයනාථගෙ දරුවා කුසට එනකොට මට වයස දාහතයි. එනකොට මාත් අවුරුදු දාහතක ළමයෙක්නෙ. තමුන්ගේ දුවට ළමයෙක් හම්බවෙන්න හිටියා කියලා අම්මලා දැනගෙන හිටියෙත් නැහැ. ගුබ්බෑයමකට ගිහින් කලලය ඉවතට ඇදලා දැම්මනෙ. කලලය ඉවතට ඇදලා දැම්මට පස්සෙ ලේ ගලලා මැරෙයි කියලා හිතෙන තරමට ලේ ගලන්න පටන් ගත්තා. යටි බඩ ඇතුළෙන් ... කැක්කුමක් ආවා. කලන්තයක් දැනුණා. ඉස්පිරිතාලෙට ... යයි කියලා බයට ... අම්මට කිව්වෙ නැහැ. ... කමට කරගෙන තියෙන දෙයක් කියලා හුරතල් කරන එකක් නැහැනෙ කියලා හිතුවා. ලේ වහනය වෙලා මං මැරෙයි. ලැජ්ජාව වසාගන්න බැරුව අම්මයි තාත්තයි මැරෙයි. දිගින් දිගට ලේ වහනය වෙනකොට මං හිතුවෙ ළමයෙක් ගබ්සා කරපු කෑලලක්වත් නොතේරෙන්න සියදිවි නසාගන්නයි. ඒත් සියදිවි නසාගත්තම, කෑලෑල් ගොඩක් ඉතුරු වෙනවනෙ. අනික ජීවත්වෙන ආසාව ලොකුවටම තිබුණා. මැරෙන ආසාවක් කොහොමටවත් තිබුණෙ නැහැ. දැන් මම කිරි දරුවෙක් නෙවෙයිනෙ. ළමයෙකුත් ඉන්න අම්මා කෙනෙක්. ඒ ඉන්න ළමයා හදාගන්න රස්සාවකුත් අත ඇරපු අම්මා කෙනෙක්. ඒ ඉන්න ළමයා වෙනුවෙන් ජීවිතේ ඕනම දෙයක් කැපකරන්න පුළුවන් අම්මා කෙනෙක්.

'ඔය කාරණාව සම්බන්ධයෙන් මං වංච රවට්ටන්න බැහැනෙ.' රවට්ටන්න බැහැ තමයි. ඇදේ අනික් ඇලයට හැරිලා

කියලා කියන්නෙ කොහොමද? ප්‍රාතිහාර්යයකින් ළමයා බඩට එන්නයැ?

'ළමයා නැතිකරගන්න එක ඇර වෙන හොඳ විකල්පයක් ඇති කියලා මට හිතෙන්නෙ නැහැ'

'සෝරා සාන් මට ළමයා තියාගන්න ඕන.'

නූපා සාන් කසුමි වෙනුවෙන් ඔයාට ඔය දරුව අත අරින්න වෙනවා. හිතන්න එපා ඒක මම එකගවෙන දෙයක් කියලා. මිනිමැරුමක්නෙ. ඒක කරන්නෙ කොහොමද? ඔයාට ළමයා තියාගන්නත් ඕන. මගෙ දුවටත් ළමයෙක් හම්බ වෙන්න ඉන්නවා කියලා ඔයා දන්නවනෙ. මම එයාට සුබ පතනවා, මම එයාගෙ දරුවගෙ ආරක්ෂාව වෙනුවෙන් මට පුළුවන් හැමදේම කරනවා. එහෙම කරන මට කියන්න බැහැ ඔයාගෙ බඩේ ඉන්න ළමයා මරන්න කියලා. ඔයාගෙ ජීවිතය අයිති ඔයාටයි නූපා සාන් ඔයා ගන්න තීරණයකට මම උදව් කරන්නම්. ඔයාගෙ ඔය පාර තෝර ගත්තෙ. ජපානෙට දීග ආවෙත් ඔයාගෙ කැමැත්තෙන්නෙ. සුමල් එක්ක සම්බන්ධයක් ඇති කරගත්තෙත් ඔයාගෙ කැමැත්තෙන්නෙ. මේක බඩේ ඉන්න දරුවා පිළිබඳ ප්‍රශ්නයක් විතරක් නෙවෙයි. ඉපදිලා හැදෙන වැඩෙන දරුවෙකුත් පිළිබඳ ප්‍රශ්නයක්. දුවෙකුගෙ සතුට දකින එකයි අම්මෙකුට සන්තෝසය. මං ඔයාව අත ඇරියෙ ස්වාධීන වෙන්නනෙ. මං ඔයාට බයිසිකල් පදින්න ඉගැන්වීමේ ඉඳලා තනියම කරගන්න වැඩ හුගාක් ඉගැන්නුවා. මං කළේ රැකවරණය, ධෛර්යය දෙන එක. මං හිතුවෙ මං නැති කලෙක වුණත් ඔයා ඔයාගෙ දෙපයින් නැගිටලා වැඩ කරගනියි කියලා. ඔයා ලංකාවේ කොහේ හරි තැනක, මං නොදන්න නාඳුනන මවකගෙ කුසින් බිහිවුණාට මට හිතුණෙ ඔයා වෙනුවෙන් ඉරණම මට වගකීමක් බාර දීලා තියෙනවා කියලා. ඔයා මට 'මමා' කියනවා. ඔයා මට දීපු ඒ පදවිය මම බොහොම සතුටින් බාර ගත්තු පදවියක්. කාත් කවුරුවත් නැතුව සන්ජෝ නගරයෙ සැරිසරමින් සිටි නූපා සාන් මම හැම වෙලාවම හිතුවෙ ඔයාට මම පිහිට වෙනවා කියලා. ඔයා සුමල් එක්ක එකතු වෙලා සතුටක්

[illegible] මෙතන ඉඳලා යන්න කියලා මම නූපා සාන්ට කිව්වා [illegible] මම බලාගෙන ඉන්නවා. ඔයා තමයි දැන් තීරණය ගත [illegible] මම මග අරිනවා කියලා හිතන්න එපා.

'මමා - මට දරුවා තියාගන්න ඕන මමා'

'කොහොමද තියාගන්නෙ?'

සාම්ප්‍රදායික පුරුෂයෙක් වුණත්, සාම්ප්‍රදායක නොවන පුරුෂයෙක් වුණත් තමන්ගෙ නොවන දරුවෙක්, තමන්ගෙ බිරිඳගෙ කුසෙහි නිරුපද්‍රිතව වැඩෙන්න දීලා බලා ඉඳියි කියලා හිතන්න පුළුවන්ද?

'ඉස්සෙල්ලම ළමයගෙ ස්වභාවික පියාට කියන්න.'

මම ළමයගෙ ස්වභාවික පියා සොයාගෙන ගියා. මම යන ගමනේ ළමයගෙ ස්වභාවික පියා හිටියෙ එයාගෙ උත්තම [illegible] සමග දුරකතන සංවාදයක. මා දුටු ගමන්ම සුමල් කටට ඇඟිල්ල කියලා කිව්වෙ කතා කරන්න එපා කියලා. කතාකරන්නෙ හිතේ කියලා තොල්වලින් කිව්වා. මම පිටතට වෙලා බලාගෙන හිටියට දෙබසට හොඳ කල්පනාවෙන් සවන් දුන්නා.

'මව් රත්තරනෙ මම ඉන්නෙ හරි පාලුවෙන්. තව ටික දවසක් ඉවසන්නකො. මම කොහොමහරි එන්නෙ සල්ලි ටිකක් හොයාගෙනමයි. එතකොට ඔයාගෙ හීන ඔක්කොම හැබෑ කරනවා.'

එහෙම කියලා සුමල් මට ඒ දෙබස ඇහුණද කියලා හිස සොලවලා බැලුවා. මම හිටියෙ අහක බලාගෙන. සුමල් නැවත කතා කරන්න ගත්තා. පුදුම බයපක්ෂපාත කමකින්. ආදරයකින්. [illegible] ඒ වගේම හුරතල් ස්වරයකුත් තිබුණා.

අපි ඉස්සෙල්ලා ශක්තිමත් වෙන්න ඕන. එහෙම නේද? එදාට මට ඕන ඔයාගෙ ඔය ලස්සන මූණ එහෙම පිටින්ම අරන් එන දූ පැටියෙක්. දෙනවා නේද රත්තරනෙ?'

ඒ දුරකතන ප්‍රේමය විනාඩි හතලිහක් විතර පැවතුණා. විරහ වේදනාවෙන් ඉන්න භාර්යාවකට, ස්වාමිපුරුෂයාගෙන් ලැබෙන දුරකතන ආදරය සැනසිල්ලක් වෙන්න ඇති. තමන්ගෙ ස්වාමිපුරුෂයාගෙ කටහඬ ඇසීමෙන්ම ගැබ්බර වෙන ගෑනු ඉන්නවා කියලා කවි සමයෙ තියෙනවා ඇත්තෙ ඒකයි. කතාව ඉවර වුණහම මං ගේ ඇතුළට ගියා. මේ ගෙදර හැම බඩුවක්ම ඒ ඒ තැන්වල තියෙන්නෙ මට කැමති විදිහට. දුරකතනය තියෙන්නෙ මම නියම කරපු තැනක.

'එනවා කිව්වෙ නැහැනෙ අද'

මම කතා නොකරම, අනවසරයෙන්ම ඇඳ කොනක ඉඳගත්තා. එනවා කියලා, කිසි කෙනෙක් එන්නෙ නැහැ. නොඑනවා කියලා නැවිත් ඉන්නෙත් නැහැ. නැවිත් ඉන්න හිතුවත් එන්න වුණා.

'මොකද්ද වෙලා තියෙන්නෙ?'

'මහලොකු දෙයක් වෙලා නෑ. ඒත් හෙට අනිද්දා ඒක මහ ලොකු දෙයක් වෙනවා'

'මොකද්ද? අනේ මේ විකාර කතා නොකර කියනවද කරුණාකරලා.'

මම, සුමල්ගෙ සමීපයට ගියා. සුමල්, මොහොම ආගන්තුක ස්වරූපයකින් බලාගෙන හිටියා.

අපේ සම්බන්ධය ඉරි තලලා යමින් තියෙන වෙලාවක මම කියන්න හදන්නෙ සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද කියලා මං දන්නෙ නැහැ සුමල්. මට ඔයාට යම් දෙයක් කියන්න තියෙනවා. යමක් සිද්ද වෙලා. අපි සතුටින් හිටියනෙ. ඒ සතුට අපිට දුන්

… දුන්නා. මං …
…න්නවා.

'අපිට දරුවෙක්'

සුමල් බලාගෙන හිටියෙ ගල්ගැහිලා වගේ. මතින්ද්‍ර වගේ ලස්සන දූ පැටියෙක් දෙන්න මට බැහැ. ඒත් මොකෙක් හරි පැටියෙක් මගේ කුස තුළ ඉන්නවා. ඒ ඔයාගෙ.

'මාස කීයද?'

'මාස එකහමාරයි'

'ඕක අස්කරමු?'

'මූත් ඔක්කොම එක වගේනෙ. අස්කරමු?

'…පෙට් හදා ගන්න බැරි?'

සුමල් බලාගෙන හිටියෙ පිස්සු කතාකරනවද, ගැනියෙ …ලා අහන ස්වරූපයකින්. මේ මගේ විවාහයෙ දරුවෙක් …වෙයි. ආදරයෙන් බැඳුණා තමයි. ඒත් තුපා මේ විවාහය …වෙයිනෙ. විවාහයෙන් පිට දරුවෙක් හදන්නෙ කොහොමද? …ට පුළුවන්ද විවාහයෙන් බාහිර දරුවෙක් හදන්න? අපි …ර්ය තේරුම් ගන්න ඕන. ඔයාට පුළුවන්ද මං චං ට ඔයාගෙ …ස් වෙන කෙනෙකුගෙ දරුවෙක් ඉන්නවා කියලා කියන්න. …ද්‍ර මම එතකල් මග බලාගෙන ඉන්නවා. මමයි - මතින්ද්‍රයි … වයස යන්න ඉස්සෙල්ලා දරුවෙක් හදන්න ඕන.

දරුවෙක් කියන්නෙ ආදරයෙ ඵලය කියලා ඔයා කිව්වෙ … මම ඔයාගෙ උරහිසට හිස තියාගෙන හිටිය වෙලාවක. ඔය … හැඩරුව තියෙන, දඟකාර කොලුපැංචෙක් කුස යනවට … …වෙක් හතරයි කිව්වා මතකද? ඒා, එහෙම

හිතන එක ගැන ඔයා මට ස්තුති කළා. එහෙම කීමෙන් ඔයාට ගෞරවයක් කළා කියලා ඔයා මගේ දෑතම සිපගත්තා. අපේ මුළු ප්‍රේමයම තිරවලින් වහපු වේදිකාවක කරපු රඟපෑමක් වගෙයි කියලා මම කිව්වොත් ඔයා එකඟ වෙනවද?

'අපි මේකෙන් නිදහස් වෙමු.'

'අම්මා කෙනෙකුට දරුවෙක් මරණ එක එච්චර ලේසි කටයුත්තක් කියලා හිතන්න එපා.'

'එහෙම නොවුණොත් මැරෙන්න සිද්ද වෙන්නෙ මට.'

'ඇයි ඔයා මැරෙන්නෙ? ලොකු වෙන්නෙ මගෙ බඩනෙ. ලෝකෙට පේන්නෙ මගෙ බඩනෙ. ඔයා නිකම්ම නිදහසන්නෙ'

සුමල් කතා නොකර බලාගෙන හිටියට හිටියෙ හොඳටම බය වෙලා. මහින්ද් [illegible] කියලා කියන්න හිතුණත් මං [illegible]. මහින්ද් [illegible] ස්වාමිපුරුෂයා. බඹසර රකිනවා කියලා ඔළුවෙ අතගහලා දිව්රලා නේද ආවෙ? එහෙම දිව්රන්න එපා රත්තරන් මට ඔයාව ඉරහඳ වගේ විශ්වාසයි කියලා මහින්ද් කියන්න ඇති. ඔයා මහින්ද්ගෙ බඹසර රකින පුරුෂ රත්නය. බය වෙන්න එපා.

'පුතා - ඔයයි මායි දෙන්නම නිදහස් වෙන දෙයක් කරමු. තේරුම් ගන්න අපි ජීවත්වෙන්නෙ. නිදහස් සමාජයක නෙවෙයි. අපි වෙනුවෙන් නිර්මාණය කරපු සමාජයක'

'මේ දරුවා නැති කරනවා නම් මංවං ඊකට කැමතියි කියලා [illegible] කරන්න ඕන'

අපි දෙන්නට කොහාට හරි ගුම්බෑයමකට රිංගලා මේ [illegible] කරලා දාන්න බැහැ සුමල්. මගෙ ස්වාමිපුරුෂයාට ඔයාගෙ බිරිඳ [illegible]

සුමල [illegible]

[illegible]රුම් යනවනෙ. ඔයා අනියම් ස්වාමිපුරුෂයා මිසක නීත්‍යානුකූල ස්වාමි පුරුෂයා නෙවෙයි. ඔයාට වගකීමකුත් නැහැ. වගකීම භාරගන්නත් පුළුවන්, බාර නොගෙන ඉන්නත් පුළුවන්. 'අඬන්න එපා පුතා' කියලා ඔයා මගේ හිස පිරිමැද්දට මට හැඬුම ආවෙයි. කුස තුළ වැඩෙන මගේ දරුවා වෙනුවෙන් - මං වෙනුවෙන් කඳුළු වෙනුවෙන් විතරක් නෙවෙයි මංවං වෙනුවෙනුත් මට අඬන්න සිද්ද වෙනවා. ඒ හැම දෙනාම වෙනුවෙන් මං අඬනවා. 'ඇඬීමෙන් මේ ප්‍රශ්නය නොවිසඳෙන බවත් මං දන්නවා.

'දැන් හිසරදේ හැමදෙයි අඬලම්'

සුමල්, ඔයාගෙ හඬ වෙනස්. පසුතැවීම නේද ඒ හඬේ තියෙන්නෙ? අපි දෙන්නට මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න තිබුණා කියලා කියන්න එපා. මම හිතුවෙ අපි දෙන්නා අතර [illegible] ජීවිතයෙ අප දෙදෙනාටම ලැබුණු වටිනාම වස්තුව [illegible]. ඒ වටිනාම වස්තුව [illegible] ආදරය. ඔයා ඊට උඩින් බොරුකතා කියන්න එපා දැන්. ආදරය කියන්නෙ මොකද්ද කියලා [illegible]න්න එපා. අපි මංමාවත්වල ඇවිදිමින්, පන්සල්වල ඇවිදිමින්, [illegible]වෙරළවල, ගංඉවුරුවල ඇවිදිමින් සුළං පොදක් වගේ විඳිමින් හිටියෙ ආදරය. හරි නිදහස් නේද ඒ දවස්? ඔයා තට්ටු නිවාසය [illegible] ඒ ආදරයෙ උපරිම ඵලය විඳින්න නේද? මහින්ද් නුඹ [illegible] හිටියෙ නෑ නේද උත්තම භාර්යාව වුණාට? නෑ මම [illegible] කියනවා නෙවෙයි. මිනිස් සිතේ හැටි කියලා හිතනවා [illegible]. මං වං වගේ මහලු ස්වාමිපුරුෂයෙක් බැඳිතම් නිසා [illegible] රක්කට ඔයා වගේ තරුණ මිනිහෙකුට බඹසර රකීම, [illegible] විශේෂයක තනිවෙලා ඉඳිද්දී බඹසර රකීම බොරුයි [illegible].

[illegible]තරක් නෙවෙයි වගල. පිරිමින් වගල වෙනවා නේද?

ඔය සිපගැනීම මට දැනෙන්නෙ නැහැ. උණුසුම් නැහැ, හරි සීතලයි. මහ රාත්‍රියේ හෝ ළඟට ඇවිත් මං චං ට හොරෙන් අත ඉඹලා ගියෙත් ඔයයි. ඒ සිප ගැනීම හරි උණුසුම්.

මං චං බෙහෙත් ටික පෙන්නලා බොනවා. හොඳ ළමයා. ඔයා බෙහෙත් බිව්වොත් සනීප වෙන්නෙ ඔයානෙ.

'නූපා සාන්' කියලා මංචං අත දිග ඇරලා පෙන්නනවා. අත්ලෙ බෙහෙත් අනූරක්. ආ වතුර වීදුරුව. බොන්න. බලාගෙන ඉස්මොල්ලෙ යයි. මං චං ආපහු නිදා ගන්න යන්නෙ. මං හරි හොඳ ළමයෙක් නේද නූපා කියලා අහනවා වගේ. කසුමි නතම් පැදුරෙ වැටිලා නිදි. පරිගණකය සුමල් එවන පණිවුඩ දනුම් දෙනවා. කසුමි ඔයා හදාගන්න මං කොච්චර වෙහෙසක් ගත්තද පුතේ? මමායි- පපායි දෙන්නම. කසුමිත් අරගෙන, බඩේ ඉන්න දරුවත් අරගෙන ලංකාවට යන්න පුළුවන් නම්. එතකොට මේ අහිංසකයා. එතකොට කසුමිගෙ අනාගතය. මේ රටේ පුරවැසියෙක් [illegible] කසුමිගෙ අනාගතය සහතික කරලා තියෙනවා. ඒ සහතිකය මට [illegible] බෑ [illegible]. මං පරිගණක පණිවුඩ දිහා නොබලාම කසුමි වඩාගෙන උඩුමහලට නැගුණා. මං චං සුව නින්දෙ. මංචං සුව නින්දෙ ඉන්න එක හොඳයි. ඔයාගෙ දුර්වල හිතට මේවගෙ බරපතල ගැටීම් ඔරොත්තු දෙන්නෙ නැහැ මංචං.

'මං චං' මං හීනෙන් වගේ මංචංව කුද්දන්න උත්සාහ කළා. [illegible] මංචං හොඳටම නිදි. කසුමි හොඳටම නිදි. සුමලුත් හොඳටම නිදි ඇති. මනුෂ්‍ය ප්‍රාණියෙක් මේ ලෝකෙට එන්න මවකගෙ කුස තුළට පැමිණීම කොයිතරම් පරිස්සමින් කළ යුතු දෙයක්ද? ගන්ධබ්බයෙකුට බුද්ධිය නැද්ද? ඇයි නොගැලපෙන තැන්වල පිළිසිඳගන්නෙ? දැන් ඔයා අම්මටත් බරක් - ඉපදුණොත් සමාජයටත් බරක්.

'සෝරා සාන් මම ජීවිතෙ දුර්වල වෙලා. ගමන් කළෙත් [illegible]

[illegible] වේදනාවෙ [illegible] වගකීම පවරන්න පුළුවන් කමක් නැහැ. එහෙම තත්වයක් [illegible] දැනෙන වෙලත් නැහැනෙ. නීත්‍යානුකූල විවාහය සිරියහනෙ [illegible] කොට, සිත නේද බැඳුණෙ? මම ඉල්ලා හිටියෙ සිත [illegible] සිඹින්න කියලා. සිත විතරක් සිඹින්න බෑ පිරිමියෙකුට. සිත [illegible] සිඹගම ඇත්වෙන්නෙත් නැහැ. ගැහියෙකුට ආදරය [illegible] සිතයි-ගතයි දෙකම. දැන් ඒ කිසිදෙයක් ඇත්තෙත් නෑ. [illegible] ගැනීමේ වුවමනාවකුත් නෑ. ආදරය කියන්නේ එහෙම නම් [illegible] විදිහක විකෘතියක්ද? දරුණුවට දැනෙන්නෙ හිසේ වේදනාවද [illegible] වේදනාවද කියන්න බෑ.

'මංචංගෙ උදව් නැතුව මේ කලලය නැති කරන්න බැහැ. උදව් ඉල්ලන්නම වෙනවා. නොඉල්ලුවොත් තව ටික දවසකින් බඩ ලොකුවෙනකොට දැනගන්නවනෙ'

'කොහොමද මමා මං චංට කියන්නෙ? දරාගන්න බැරි වෙයි. අනික මට [illegible] කරන්නෙ දරුවා තියාගන්න.'

[illegible] සෝරා සාන් [illegible] හදාගෙන ඇවිත් [illegible] දුන්නා. ජනේලෙන් එපිට පේන්නෙ ආකාසෙ. නිල්පාටයි. [illegible] දැඩිලිවම ආකාසෙ තිබුණට තව ටිකකින් [illegible] කියලා කවුද දන්නෙ? [illegible] [illegible] වැස්සක් වස්සන තරම් වලාකුළු [illegible] ඉන්නවා ඇති. [illegible] කරමින් [illegible] කළා.

[illegible]

වයසක මනුස්සයගෙ ස්වාමිපුරුෂයා, අනියම් ස්වාමි පුරුෂයෙක් බව දැන ගත්තෙ කතා බහ කරන කොට. සෝරා සාන් ඇතුළට ගියා. වයසක තැනැත්තිය සෝරා සාන් පසුපසින් ගියා. ඒ තැනැත්තිගෙ අනියම් පුරුෂයා මගේ පපුව අතගෑවා. පරබල්ලා. අවස්ථාව ආවහම පිරිමියෙකුට ජාතියක ජම්මයක වෙනසක් නෑ. ජපනත් එකයි - ශ්‍රී ලාංකිකයත් එකයි. ඒක හරියන වැඩක් නෙවෙයි කියලා හිත කිව්වට මං පපුව අතගෑව කතාව සෝරා සාන්ට කිව්වෙ නැහැ. සෝරා සාන් හාර හාර ප්‍රශ්න අහන ගැනියක් නෙවෙයි.

අවසානයෙදී තීරණය කළා මංවංට රහස අනාවරණය කරන්න.

'මට ළමයෙක් ලැබෙන්න ඉන්නවා. මං කැමතියි එයා උපදිනවට'

මං වං බලාගෙන හිටියෙ මං සෝරා සාන් එක්ක එකතුවෙලා විහිළුවක් කරනවා කියන හැඟීමෙන්ද? නෑ විහිළුවක් නෙමෙයි මං වං. අහම්බෙන් සිද්ද වෙච්ච දෙයක්. මංවං බලාගෙන හිටියෙ ගල්ගැහිලා වගේ. බලාපොරොත්තු නොවෙච්ච අවස්ථාවක සෝරා සාන් මං වං ඉදිරියේ දණ ගැහුවා.

'මසායා සාන් මේ දරුවා බිහිකරන්න නූපා සාන්ට අවසර දෙන්න'

මං වං පස්සට පැන්නෙ ගැරඩියෙක් දැක්කා වගේ.

'ඔහේට ඔළුව හොඳ නැද්ද? මටද කියන්නෙ කාගෙද කියන්න දන්නෙ නැති ළමයෙක් හදන්න කියලා.' මංවං එහෙම කියලා මහ ශක්තියකින් ආවේශ වුණා වගේ සෝරා සාන් පැත්තකට තල්ලු කළා.

'මං කතා ...

මං වං සෝ...

'ඔහේ මුල ඉඳලම මගේ ගැනිව තරක් කළා.' එහෙම කියලා මං වං, සෝරා සාන්ව තල්ලු කළා. සෝරා සාන් මගේ ඇඟේ ...ළුණා.

මම තතමී පොළවෙ එහෙමම වැටුණා. ඔව් ඇත්ත මං ...යයි. යෝන්වලින්, මන්වලින් විතරක් නෙවෙයි හෘදසාක්ෂියෙනුත් ...යයි තමයි. සෝරා සාන් තතමී පොළවෙ වැටුණ මාව සනසවන්න ...ත්සාහ කළා. කසුමි හිස ඇලකරගෙන පැත්තකට වෙලා ...ලාගෙන හිටියා.

'අනුන්ගෙ දරුවෙක් මේ ගෙදර හදන්නෙ නෑ' මං වං තීන්දුව ...න්නා.

'කවුද මිනිහා මං වන්දි ඉල්ලලා නඩු දානවා. මං රජයට දනුම් දෙනවා. මේ සන්ජෝ නගරයෙ' මං තම්බුකාර [illegible]

සෝරා සාන්, මං වං ව අස්වසන්න උත්සාහ කළා. මං ...ව කිසිම දවසක උමතු රෝගයක් නොතිබුණු ආකාරයට ...විකල්පනාවෙන් කතා කරන්න පටන් ගත්තා.

'මසායා සාන්, මේ කාන්තාව දනුම් තේරුම් නැති, බොහොම තරුණ කාන්තාවක් හින්දා අපි ලිහිලක් දක්වන්න අවශ්‍යයි නේද?' සෝරා සාන් බොහොම ප්‍රවේසමට වචන එකතු කරලා ඇහුවා. මංවං සෝරා සාන් දිහා බැලුවෙ, තරුණ වීම ස්වාමිපුරුෂයට ද්‍රෝහිවීමට වලංගු බලපත්‍රයක්ද කියලා අහනවා වගේ.

'සමාවෙන්න මෙහෙම කතා කරනවට. කා අතිනුත් වැරදි සිද්ද වෙන්න පුළුවන්.'

නෑ කියලා සෝරා සාන් දිවුරුවා. ඒත් පුරුෂයා කවුද කියලා කිව්වෙ නැහැ. පුරුෂයා කවුද කියලා මං වං ඇහුවෙත් නැහැ.

'මේ දරුවා නූපා සාන්ගෙ දරුවනේ. යහපතක්නෙ කරන්නෙ. මසායා සාන් යහපත් දේ කරන කෙනෙක් හැටියට මේ ගැන හිතලා බැලුවොත් හරිකද? නූපා සාන් මගේගෙ දරුවගෙ මව්.'

මං වං කිසිවක් කතා නොකර උඩුමහලට නැග්ගා. මට දැන් කරන්න දෙයක් ඉතුරුවෙලා නෑ කියනවා වගේ සෝරා සාන් අසරණ විදිහට බලාගෙන හිටියා. තනමි පැදුරෙ දිගෑදිලා තමුන්ගෙ සෙල්ලමක් කරමින් හිටිය කසුමි හෙමින් සැරේ මා ළඟට ආවා. එයාට නොතේරෙන දෙයක් සිද්දවෙමින් තියෙන බව නොදරුවා තේරුම් ගන්න ඇති. කුස ඇතුලෙ ඉන්න 'අවජාතක' (දුකයි මෙහෙම කියන්න) දරුවා ආරක්ෂා කරගන්න, ස්වාමි පුරුෂයගෙන් ආරක්ෂාව, උදව් උපකාර ඉල්ලීම අසාමාන්‍ය දෙයක් තමයි. ඒත් ස්වාමිපුරුෂයාගෙන් ඇය මොන ආකාරයෙන් ආරක්ෂාවක්, උදව්වක් ඉල්ලන්නද? සුමල්ට ආරක්ෂාවක් දෙන්න බැහැ. උදව්වක් කරන්න බැහැ. නූපත් දරුවෙක් වෙනුවෙන් දෙවැනි වතාවකටත් මේ වගේ දුකක් විඳින්න සිද්ද වෙයි කියලා හිතුවෙ නැහැ. මේ කතා පුවත් දෙකම අම්මා දැනගත්තා නම්, අම්මා ජීවත්ව හිටියා නම් කියයි නූපා කවදාවත් පාඩමක් ඉගෙන ගත්තෙ නෑ කියලා. මං හිටපු තත්ත්වයෙ අම්මා හිටියා නම් අම්මෙ අම්මත් පාඩමක් ඉගෙන ගන්නෙ නැහැ. ලෝක ස්වභාවය ඒකයි. සෝරා සාන් මගේ අතින් අල්ලගෙන හිටියා. මංවං උඩට වෙලා මොනවා කරනවාද කියලා බලලා එන්න හිතුණත් දෙපා වාරු නැහැ.

'මං වං ගෙන් දික්කසාදෙ ඉල්ලා ගත්තොත්?'

මට මං ගැනම කලකිරීමක් ඇති වෙයි කියලා බය හිතුණා. මම සුමල්ගෙ ... හුදකලා ජීවිතයට ...

වෙනම ජීවිතයක්. ඒ - ජීවිතය අයිති ඒ ආත්මයටයි. නොයාගෙන ඇවිත් තියෙන්නේ වැරදි තැනක් වුණාට, ජීවත්වීමේ අයිතිය ඒ කලලයට තියෙනවා.

සෝරා සාන් මං කියපු හැමදේටම එකඟයි කිව්වා. ඒත් දරුවා අස්කර ගැනීමේ විකල්පය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බව කිව්වා. දැන් බබා ලොකු වැඩි වුණත්, උතුරන උණුවතුර බෝතලයක් යටිබඩට තියාගන්න කියලා උපදෙසක් දෙමින් ඇය ඇගේ කඳුළු පිසදමා ගත්තා. තිය වතාවෙත් ඔහොම කළා සෝරා සාන්. ජයනාටයි එහෙම කරන්න කියලා දන්නෙ. උතුරන උණුවතුර බෝතලයක් තියලා පුච්චන්න කියන්නෙ මරන්න දරුවව නේද? කුසතුළ හිඳගෙන දරුවා මේ හැමදේම අසාගෙන ඉන්නවා ඇති.

වසන්ත උත්සවේදී මුණ ගැහිලා ඊළඟ වසන්ත උත්සවය එනකොටත් කලින් හැමදේම ශෝකයක් බවට පරිවර්තනය වෙලා තිබුණා. මිටියාවත් ... වගේ හිස් දිවියක්. පුවට ගලාගෙන එනනෙ හිරවෙච්ච කඳුළු ප්‍රවාහයක්. සෝරා සාන් සමාව ඉල්ලමින් යන්න ගියා. මේ මිනිස්සු හැමදේටම සමාව ඉල්ලනවා. කළ වරදටත්, නොකළ වරදටත්, අනුන් කළ වරදටත් සමාව ඉල්ලනවා. සන්ජෝ නගරය නිදි. සන්ජො නගරය රහස් හඬින් කතා කරනවා වගේ ඇහුණා. විශ්වාස කරන්න බැරි දෙයක් නෙවෙයිනෙ. ලෝක ධර්මය! මේ මොකවත් අභිරහස් නෙවෙයි. කටකතා පතුරුවන්නෙ බඩ තව ටිකක් ලොකු වුණාම. ඒත් බඩේ ඉන්නෙ කාගෙ කවුද කියලා කවුරුත් දන්නෙ නැහැනෙ. විවාහක ස්වාමිපුරුෂයා ඉන්නවනෙ.

විවාහයෙ ධජය පිටිපස්සෙ මේ දරුවටත් එන්න අවසරද?

'තමුන්ට පිස්සුද?'

11

'මට දික්කසාදය දෙන්න'

මම මං වං ව නැගිට්ටලා ඉල්ලා සිටියා. දික්කසාදය දුන්නොත් ඊළඟට වෙන්නෙ මොකද්ද - මම ඊළඟට කරන්නෙ මොකද්ද කියලා සැලැස්මක් මට තිබුණෙ නැහැ. යටිහිත බලාපොරොත්තු වෙනවා මගේ දික්කසාද ඉල්ලීම ගැන මං වං ගෙ හිතේ බයක් ඇති වෙයි කියලා. [illegible] ප්‍රතික්ෂේප කරන්න හොඳටම [illegible]. [illegible] නැතුව ඉන්න මිනිහා රැකවිලා ගන්නෙ මම. උමතුව හැදිලා හිටපු මිනිහෙක් මෙහෙත් පොඩි පොඩිං සුව කරගන්න වෙහෙස ගත්තෙ ඥාති මිත්‍රාදීන් නෙවෙයිනෙ. තව මළගිය ඇත්තෙත් මළවුන්ගේ අවුරුද්දට එකතුවෙයි කියලා බලාගෙන හිටපු බව මම දන්නවනෙ. ඥාති මිත්‍රාදීන් බලාගෙන ඉන්නෙ දේපොළ පැහැර ගන්න. ඉතුරුවෙලා යමක් ඇත්නම් බෙදා හදා ගන්න. මළවුන්ගෙ අවුරුදු දාට තව නෑදෑයෙක් එකතු කරගන්න. ඊත් මළවුන්ට ගෞරව කරන්න මිස, ජීවත් වෙද්දී ගෞරව කරලනෙ.

'දික්කසාදය දෙන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ'

'මට දික්කසාදය මිස තනුෂිගෙ අයිතියත් එක්කමයි. මට තනුෂිව මිස.'

මං වං [illegible]

[illegible] කරන්න පුළුවන් තරම් උණුසුමක් හිත ඇතුළෙ තිබුණා. දරුවා වෙනුවෙන් ඇති වෙච්ච උණුසුමක්. මං වෙනුවෙන් ඇති වෙච්ච උණුසුමක්.

'මට අනුන්ගෙ දරුවෙක් හදන්නත් බෑ මේ වහල යට. මගේ දරුවා දෙන්නත් බෑ. කරුණාකරලා මගෙන් ඉල්ලන්න එපා මට දෙන්න බැරි දේවල්' මං වංට පිරිමිකම ලැබිලා තියෙන්නෙ දැනුයි. ගැනියෙක් දුර්වල වුණාම තොයි පිරිමියන් [illegible] පුරුෂයො වෙන්න හදනවා.

මට දික්කසාදය ලැබුණට දුව ලැබෙන්නෙ නැහැ. එතකොට මට එක දරුවෙක් වෙනුවෙන් තව දරුවෙක් අහිමි කර ගන්න සිද්ද වෙනවා. එක්කෙනෙක් නවම කලලය. අනික් දරුවා අම්මගෙ ආදරය ඉල්ල ඉල්ලා පසුපස එන බිළිඳු දරුවෙක්. මං වං ට හොරෙන් ලංකාවට යන විකල්පය තිබුණාට ඒක හොඳ [illegible] වෙයි. තනුෂිට දුක් විඳින්න සිද්ද වෙයි. [illegible] ලංකාවට යන තනුෂිට [illegible] පවුලෙ අයගෙ [illegible] ආර්ථික තත්ත්වයෙ හැටියට දුක් විඳින්න සිද්ද වෙයි. හොඳ [illegible] නැතිවෙයි. හොඳ ආහාරපාන නැති වෙයි. හොඳ ඇඳුම් පැළඳුම් නැතිවෙයි. තනුෂිව අත අරින්න හරි, අරන් [illegible] විඳින්න හරි අම්මා හැටියට මට බැහැ. [illegible] [illegible] තමන්ට ගන්නෙ [illegible] [illegible] [illegible] කළා. [illegible] ආදරය කළා.

'අම්මට මහන්සි වෙන විදිහට දඟලන්න එපා' කියලා මං [illegible] කියලා [illegible] [illegible] [illegible] කියලා.

කිව්වා. සෝරා සානුත්, කුස තුළ ඉන්න කසුමිට කිව්වා සාමාන්‍ය විදිහට ලෝකෙට එන්න කියලා.

ඒ හැමදේම කසුමි අහගෙන හිටියා.

'ඔන්න පැටියො තාත්තා අපි ළඟ ඉන්න වෙලාවක එළියට එන්න. තේරුණා නේද? එතකොට තාත්තා අපි දෙන්නට ගොඩක් ආදරේ වෙයි'

ඒ කියපු දේත් කසුමි ඇහුවා. තාත්තා ළඟ ඉන්න වෙලාවක කසුමි මේ ලෝකෙට ආවා. කසුමි මගේ දෝතට එනකොට රෑ දහයයි වෙලාව. කසුමි එදා ඉඳලා අද වෙනතුරු ඔයා මගේ හුස්ම පොද. ඔයාට මොනම ආකාරෙකවත් දුකක් දෙන්නෙ නැහැ. මම අසාධාරණයක් කරන්නෙ නෑ පුතේ ඔයාට.

කවුද දැන් බඩේ ඉන්න දරුවගෙ පියා කියලා නොඅසා ඉන්න තරම් හික්මීමක් මංඑංට තිබුණා. ජපනුන්ට හිත ඇතුළෙ තියෙන හැඟීම් වසන් කරගෙන ඉන්න පුළුවන් කියලා කිව්වෙ රෝසි. රෝසි දැන් වැඩි හොඳක් නෑ. රෝසි දැක්කත් නොදැක්ක වගේ යනවා. 'නූපා, කොල්ලන්ව උස්සනවා' කියලා පන්සලට ගිය වෙලාවක රෝසි, බණමඩුවේදි කියලා තියෙනවා. සුමල් වෙනම ගෙයක් අරගෙන ගිය වෙලාවෙ රෝසි පන්සලේදි එහෙම කියලා තිබුණෙ.

'හිරෝෂිමා පැත්තෙ කවුරුහරි හොයමුද නූපාව බාර ගන්න කැමති කෙනෙක්' සෝරා සාන් විකල්ප යෝජනා කිහිපයක් අතරෙ හිරෝෂිමා යෝජනාවත් ගෙනාවා. මං 'හිරෝෂිමාවෙ මල්' කියෙව්වෙ ඉස්කෝලෙ පුස්තකාලෙන්. ඒක කියෙව්වට පස්සෙ දැනුණෙ හිරෝෂිමාවට නෙවෙයි මං ඉන්න බත්තරමුල්ලට පරමාණු බෝම්බ වැටුණා කියලා. හිරෝෂිමාවේ හුගක් තනිකඩ මිනිස්සු ඉන්නවා කියලා සෝරා සාන්ට දැනගන්න ලැබිලා තියෙනවා. හිරෝෂිමාවෙන් මිනිහෙක් බැඳගන්න බැහැනෙ. එකක ...

...ගෙ. අනික් දරුවා සුමල්ගෙ. සෝරා සාන් අන්තර්ජාලය ඔස්සෙ, හිරෝෂිමාවෙ මිනිස්සු ගැන හොයලා බැලුවා. පරමාණු බෝම්බය දැමීමෙ ඉතිහාසය ආරක්ෂා කරලා තියෙන හිරෝෂිමා කෞතුකාගාරයෙ ඇවිදින කොට පපුව පැළිලා යන වේදනාවක් දැනෙනවා කියලා සෝරා සාන් මහ දුකකින් කියා සිටියා. හිරෝෂිමාවෙ යෝජනාව ඉදිරිපත් කළාට සෝරා සාන් ඒ ගැන වැඩිදුරට ක්‍රියා කළේ නැහැ. හොඳ මිනිහෙක් මුණ ගැහෙයි කියන බලාපොරොත්තුව තියාගන්නෙ කොහොමද බරපොදි ඇතුළෙයි පිටයි දෙකේම තියෙද්දි. ඔය කියන හොඳ මිනිහා වුණත් වයසක මිනිහෙක් වෙන්න ඕනනේ. මං එං ඉවසීමෙන් ඉන්නවා කියලා පෙන්නන්න උත්සාහ කළා. මං එංට බෙහෙත් නැතුවම සනීප වෙනවද? ගොත ගහන මිනිහට සින්දු කියන්න පුළුවන් වගේ, භාර්යාව සම්බන්ධයෙන් කාරණයක් ඉදිරිපත් කරනකොට ඉවසීමෙන් කටයුතු කරන්න මංඑංට පුළුවන් වෙලා තියෙනවා. මංඑං කඩෙන් කෑම ගේනවා. උදාසන රෝගයෙන් මං අසීමිතව පීඩා විඳින්න ගත්තා. උයන්න කෙනෙක් නෑ. කසුමිට ආදරය දක්වන්න කෙනෙක් නැහැ. මම ඇඳට වෙලා නිදාගෙන හිටියා දවසම. නිදාගන්න, ගන්න කකුල්දෙක බර වෙනවා. පණ නැතුව යනවා. නිදාගන්න ආසාව තිබුණට ඇඟ රිදෙන්න ගන්නවා. එතකොට නින්ද එන්නෙ නැහැ. බඩගින්න තිබුණට කන්න පුළුවන්කමක් නෑ.

'මසායා සාන් මම ලංකාවට යන්නද?'

'ගියාට ප්‍රශ්නෙකුත් නෑ'

'මට දරුවා ගෙනියන්න ඕන'

මසායා සාන් ඉවසීමේ උත්සාහයක යෙදී හිටියට, ඒ උත්සාහය අසාර්ථක වෙන බව පෙනුණා. මසායා සාන් හුන් තැනින් නැගිට්ටා.

බඩේ. මගේ දරුවා මට තියලා කොහේ ගියත් මට කමක් නෑ.'

මං චං කතා කළේ වෙව්ලිල්ල හැදිලා වගේ. ඔරලෝසුවෙ කටු මහ හයියෙන් සද්ද කරන්න ගත්තා. කසුමි නින්දෙ. අහිංසක කසුමි මේ මොන දෙයක්වත් නොදැන නින්දෙ. ඒත් ගේ ඇතුළෙ කිසියම් දෙයක් සිද්දවෙමින් තිබෙන බව ඇගේ පුංචි හිතට වැටහෙනවා ඇති. කසුමි හැමවෙලාවෙම ඇහුවෙ 'මමා පපා එක්ක තරහද' කියලා. 'නැහැ පුතේ' කියලා මම ඈ සිපගත්තට ඈය එය විශ්වාස කළ බවක් පෙනුණෙ නැහැ. මට ඔයාව දාලා යන්න බැහැ පුතේ. මගේ දුක දරා ගන්න උදව්වෙන්න වෙන කෙනෙක් ඉන්නවා නම් ඒ සෝරා සාන් විතරයි. මගේ හිත කිව්වා සුමල් ප්‍රදේශය අතඇරලා පලා යයි කියලා. 'ඇයි මං විතරක්' කියන හැඟීම මොහොතකට හිතට ආවා. සුමල් මේ දුක විඳිය යුතු නැද්ද?

'ඔය කලලය නැති කරගෙන මේ ගෙදර ඉන්නැපුළුවන්. කලලය ආරක්ෂා කරගන්න [illegible] කරලා යන්න පුළුවන්. මං මේ කාරණාව නැවත වතාවක් කියන්න කැමැත්තත් නෑ'

මං චං ප්‍රබල පුරුෂයෙක් වෙමින් හිටියා. මම ඇදේ එහෙමම දිගා වුණා. කලලය නැති කිරීම විකල්පයද? එකම විකල්පයද? මම එක් වතාවක් දරුවෙක් නැති කරපු අම්මා කෙනෙක්. ප්‍රේමයක් නැති වුණත්, ගැනියෙකුගෙ බඩට එන දරුවා අම්මගෙ සිතටයි, ගතටයි බද්ධ වෙනවා. ඒත් මං මගේ කුසට ආව පළමු කලලය ලේ ගසක පා කළා. තවත් වතාවක් ඒකම කරන්නෙ කොහොමද?

'සමාජය වෙනුවෙන් වගකීම් ඉෂ්ට කරනවා කියලා මංචං කියනවනෙ. මේ කලලය වෙනුවෙන් මට වගකීමක් තියෙනවනෙ. අපි දරුවට ඉපදෙන්න ඉඩ දෙමු. ඊට පස්සෙ මට පුළුවන් දරුවව සුජාතක්කට දෙන්න හරි'

...සීන ශබ්දය ඇහුණා. චළං, පිගන්, හැඳි එහා මෙහා වෙන ශබ්දය. කසුමි වෙනුවෙන් ආහාර පිළියෙළ කළේ මං චං. මහ හඬින් යමක් බිඳී වැටෙන ශබ්දයක් ඇහුණා. වෙව්ලීම නිසා භාජනයක් අත ඇරෙන්න ඇති. සුමල් සොයා යා යුතු යැයි හිතමින් මම අනෙක් ඇලයට හැරුණා. කසුමි සැහැල්ලු ස්වරූපයකින් නින්දෙහි සිටිනවා. මම ඇගේ මුහුණ සිපගත්තා. ඇගේ මුහුණෙහි ශාන්ත ස්වරූපය දිහා මම බලාගෙන හිටියා. එවි හඬ නැවතත් උඩුමහලට එන ශබ්දය ඇසුණා. මගේ දරුවො දෙන්නටම ආරක්ෂිත ස්ථානයක් අවශ්‍යයි. ඉපදිච්ච දරුවටයි, ඉපදෙන්න ඉන්න දරුවටයි. හිටපු ගමන් ගමන් විදුලි කොටන්න පටන් ගත්තා. සන්ජෝ නගරය නොසන්සුන් වෙලා. ගහකොළ ඇඹරෙන ශබ්දය ඇහුණා. තවමත් ඉර පායලා නැහැ. මම ඉන්නෙ රාත්‍රියෙද, දවාලෙද, අළුයමද, උදෑසනද කියලා නොතේරෙන පටලැවිල්ලක් හිතේ තිබුණා. හදිසියෙම මට පහළ මාලයේ කොනක තබා තිබෙන මහ පෙට්ටගමක් මතක් වුණා. මගේ කුසතුළ ඉන්න දරුවා ඒ පෙට්ටගමට [illegible] තියාගෙන හදන්න [illegible] කියන [illegible] හිතට ආවා. [illegible] මංචං ගෙ අතේතෙ පෙට්ටගමේ යතුරු තියෙන්නෙ. මං චං නැති වෙලාවකවත්, හොර රහසෙවත් ඒ පෙට්ටගම ඇරලා බලන්න ඕන කියන වුවමනාවක් මට තිබුණෙ නැහැ.

මං චං දෙළුම් ගෙඩියක් කපාගෙන පීරිසියක තියාගෙන ආවා. කිසිදෙයක් කන්න බැරි, කන්න ප්‍රිය නැති තමන්ගෙ [illegible] මට වෙනුවෙන් හදිසියෙ ඇති වෙච්ච අනුකම්පාවකින් මං චං කටයුතු කරනවද? එක අතකට ජපානයෙ පුරුෂයෙක් වෙච්ච නිසා මේ වගේ මහා ඉවසීමකින් කටයුතු කරනවා. ලංකාවේ මිනිහෙක් වුණා නම් මේ වගේ කාරණා සාකච්ඡා කරන්නෙ නැහැ. [illegible] පාරට ඇදලා දානවා. නැත්නම් කරන්න පුළුවන් සියලුම මානසික වද හිංසා කරනවා. ඒ පවුලේ පරම්පරා අග අතර [illegible] ඇතිවෙන්න තර්ජනය කරනවා. නින්දා කරනවා. [illegible]

'ඔය කළලය අයින් කරමු.'

මං චං නැවත නැවතත් ඒකාග්‍රතාවයකට පැමිණීමේ උත්සාහයක යෙදුණා. ගැබක් දරාගෙන ඉන්න අම්මා කෙනෙකුගෙ හිතේ තියෙන බරපතල හැඟීම තේරුම් ගන්න කිසිකෙනෙකුට බැහැ. ඇයි මං චං ඔයාට අසාමාන්‍ය පුරුෂයෙක් වෙන්න බැරි? මේ කලලයට ජීවත් වෙන්න අවස්ථාව දෙන්න බැරි ඇයි? මම මේ දරුවට ආදරේ කරන්නෙ ඒ දරුවා මගේ කුස ඇතුළෙ හැදෙන වැඩෙන හින්දා. ඒ දරුවට පිළිසරණක් නැහැ. ඒ දරුවට ඉවෙන් වගේ තේරෙනවා ඇති නේද තමුන් අවදානමක ඉන්න බව. හැමදෙනාම එකතුවෙලා දරුගැබ ඇතුළෙ ගල් ගැහිලා, වකුටුවෙලා ඉන්න තමුන්ව එතනින් ඉවතට ඇදලා දාන්න උත්සාහ කරනවා ඇති කියලා මහ බයකින් ඉන්නවා ඇති නේද? අම්මගෙ කුස ඇතුළෙ බය වෙන්න සිද්ද වුණේ ඇයි? ඇයි මේ නොදරුවෙකුට වෛර කරන්නෙ මං චං. කසුමිට තනිනොතනියට කවුරු හරි ඉන්නවනෙ. ඔයත් මැරිලා යාවි. මාත් මැරිලා යාවි. එහෙම දවසකට සහෝදරයෙක් හරි සහෝදරියක් හරි. 'අනේ අම්මා මාව බේරගන්න' කියලා දරුගැබ ඇතුලෙ ඉඳගෙන මේ නොදරුවා මරණ බයෙන් අඬන වැළපෙන සද්දෙ මට ඇහෙනවා මං චං. බැහැ මට මේ දරුවා මගේ දරුගැබෙන් ඉවතට ඇදලා දාන්න ඉඩ දෙන්න බැහැ.

'මම සෝරා සාන් මූණ ගැහිලා එන්නම්'

'කසුමි තියලා යන්න'

'කසුමිත් එක්ක යන්න හිතුවෙ'

'නෑ - කසුමි යන්නෙ නැහැ'

මං චං ගේ අණසක බලවත් වෙමින් තිබුණා. කසුමි 'මමා' කියලා අඬද්දි ...

... ලයෙන් වෙළිලා ඉපාරා වෙලාවක, ගෙට ගොඩවෙලා 'මගේ දරුවා බේරගන්න උදව් කරන්න' කියලා සුමල්ගෙ උරහිසට, මගේ හිස තබාගෙන අඬන්න පුළුවන් කමක් නැහැ. පිටරටකට ආවම ලැබෙන අසීමිත ලිංගික නිදහස පිරිමියෙකුට කිසි බයක් සැකක් නැතුව භාවිතා කරන්න පුළුවන්නෙ. භාර්යාවෝ හිතන්නෙ ස්වාමිපුරුෂයින් රටෙන් පිටවුණාට පස්සෙ තමුන් වෙනුවෙන් බඹසර රකිනවා කියලනෙ.

සුමල් රෑ වැඩ කරලා ඇවිත් නිදාගෙන හිටියා. හුඟාක් වෙලා දොරට තට්ටුකළාට පස්සෙයි දොර ඇරියෙ. සුමල්, එක පාරටම බැලුවෙ බඩ දිහා. තාම එච්චර ලොකුවෙලා නැහැ. හෙට අනිද්දා වෙනකොට ලොකුවට පේන්න ගනියි. තවම නැහැ. ඒත් කලලය වැඩෙමින් ඉන්නවා. ඔබේ ලෙයින්. මගේ ලෙයින්.

මම සුමල්ගෙ ඇඳ කොණක වාඩි වුණා.

'මොනවද බොන්නෙ?'

'මොනවත් එපා'

'තූපා මා එක්ක තරහින්ද ඉන්නෙ?'

'තරහ වෙන්නෙ මොකටද?'

'මට පිහිට වෙන්න බැරි හින්දයි නිශ්ශබ්දව ඉන්නෙ. මං හරියට හිතුවා මොන විදිහටද මට ඔයාට පිහිට වෙන්න පුළුවන් කියලා' සුමල් දුරකතන රිසීවරය අරගෙන පැත්තකින් තිබ්බා. ජංගම දුරකතනය ක්‍රියා විරහිත කළා. සුමල්ට ඕන වුණේ ප්‍රශ්නය ගැන කතා කරන්න නෙවෙයි. සුමල් මගේ ශරීරය පොළඹවා ගැනීමේ උත්සාහයක යෙදුණා. මගෙ හිත පිරුණාත්ත වෙලා. මම ඔයා ළඟට ආවෙ මගේ ජීවිතේ බරපතලම ප්‍රශ්නය අරගෙන. ඔයාටත් ඒ ප්‍රශ්නයට සම්බන්ධයක් තියෙනවා. ... ඒත් මට ...

ඇතුළෙ වැඩෙන්නෙ තමුන් ඉන්නෙ ලෝකයේ ආරක්ෂතම ස්ථානයෙ කියලා හිතාගෙන. අපි මොකද කරන්නෙ සුමල්? ඔයාට ඔයාගෙ ලේ ගැන කැක්කුමක් නැද්ද? සුමල් ඇහුණෙ නෑ වගේ අහගෙන හිටියා. සුමල් ආදරෙයි. බැඳීමයි පෙන්නන්න වගේ මාව තුරුල් කරගත්තා. එහෙම ආදරයක්, බැඳීමක් තියෙනවද නැද්ද කියලා මම දන්නෙ නැහැ. මගේ තනපුඩු හොයන දරුවෙක් කුස ඇතුළෙ වැඩෙමින් ඉන්නවා. ඒ දරුවා රැක ගැනීමේ වගකීම ස්වාභාවික පියා හැටියට සුමල් ඔයාට තියෙනවා.

'නූපා - ඔයා මේ දුවන්නෙ මිරිඟුවක් පස්සෙ. ඔය දරුවා හදනවා නම් අපි නැති කරගන්නෙ අපිවමයි. ඒ දරුවා තවම කළලයක්නෙ. අපි ඉක්මනට එයාගෙන් නිදහස් වෙමු. එතකොට එයා වෙන සුදුසු මව්කුසක් හොයාගෙන යයි. ඒ දරුවට ඉපදෙන්න දීලා දුකක් දෙනවට වැඩිය එයාට බොහොම ඉක්මණින් හොඳ මව්කුසක් තෝරගන්න අවස්ථාව දෙන එක නේද හොඳ නූපා?

'මසායා සාන් මොකද කියන්නෙ?'

'අස්කරලා දාන්නලු'

'ඔයාගෙ මහත්තයා හොඳ වැඩියි නූපා. අපිට තියෙන හොඳම විකල්පය තමයි දරුවා අස්කරලා දාන එක'

'මේ දරුවා ඉන්නෙ මතින්ද්‍රිගෙ කුසේ නම් ඔයා අස්කරලා දාන්න ඉඩ දෙනවද?'

ඒ ප්‍රශ්නෙන් සුමල් කෝපයට පත්වුණු බව පෙනුණා. ඒත් ඒ කෝපය මැඩගැනීමේ උත්සාහයක සුමල් යෙදිලා හිටියා. මතින්ද්‍රිට දේවත්වයෙන් සලකන ස්වාමිපුරුෂයෙක් ඉදිරියෙ, මතින්ද්‍රිගෙ කුසේ ඉන්න පුළුවන් සිහින දරුවෙක් ගබ්සාවකට ලක්කරනවද කියලා අහන ප්‍රශ්නෙන් ඒ ස්වාමිපුරුෂයා කෝපයට පත්වෙන එක අහන්න දෙයක් [illegible]

මතින්ද්‍ර [illegible] දෙවඟනනෙ. නූපා කියන්නෙ පූසෙකුට අහුවෙච්ච මී පැටියෙක්. අපි රණ්ඩු වුණා. හොඳටම රණ්ඩු වුණා. මතින්ද්‍රිව කතාවෙන් අත අරින්න කියලා මතින්ද්‍රිගෙ ස්වාමිපුරුෂයා නූපාට තර්ජනය කළා. අවසානයේදී හැමදේටම සමාව ඉල්ලුවා. මගෙන් නෙවෙයි සමාව ඉල්ලන්න ඕන. කුස තුළ තැන්පත් කරපු කළලයෙන්. ඒ තැන්පත් කිරීමට කිසිම වගකීමක් නැති මං වං ගෙන්. සියල්ල අවසාන වුණේ පැයකටත් අඩු කාලයකදී. මතින්ද්‍රිගෙන් එන දුරකතන ඇමතුමට කලින් සියල්ල සඳහා සුමල් කාලය සැලසුම් කරගත යුතු වුණා. නීත්‍යානුකූල බිරිඳගෙ දුරකතන ඇමතුමට කලින් අනියම් බිරිඳගෙන් සන්තර්පනය වෙලා 'එහෙනම් පරිස්සමින් යන්න' කියලා දොර ඇරලා වහාම දොර වැහුවෙ සුමල්. තවමත් රවටෙනවා නේද කියන හැඟීමෙන් මම මගදිගට අඬන්න ගත්තා. මේ ප්‍රශ්නයට විසඳුමක් නැහැ. කසුම්ගෙ ජීවිතය විනාශ කරන්න බැහැ. කුස තුළ වැඩෙන කලලය විනාශ කරනවා නම්, ඒ කලලයත් සමඟ මාත් විනාශ විය යුතුය කියන හැඟීම වහාම සිතට ආවා.

සුමල් 'පරිස්සමින් යන්න' කියලා දොර වහපු හඬ කන්දෙකේ දෝංකාර දෙන්න වුණා. සුමල් එක්ක කඩමණ්ඩියක ඉඳගෙන ජපන් ගීත අහමින් ඔනිගිරි (බත්ගුලි) කාපු හැටි හදිසියෙ සිහියට ආවා. පන්සලක් ළඟ. පන්සල වටේ කැලෑව සාරෙට වැවිලා තිබුණා. සුමල් කිව්වෙ කැලෑව, කැලෑවටම ගිහින් කියලා.

'අපි යමුද නූපා ඉස්සර මරණ දඬුවම දුන්නු තැනක් ළඟ පාත තියෙනවා බලන්න.'

තරුණ ප්‍රේමයකින් මුසපත්වෙලා හිටිය අවදියක දංගෙඩිය වුණත් පෙනුණෙ නැරඹිය යුතු ස්ථානයක් හැටියටයි. අපි පාර අහගෙන අහගෙන ගියා. මං මේ ගැන කියවලා තියෙනවා නූපා [illegible] දඬුවම ක්‍රියාත්මක වෙලා තියෙනවා මීට අවුරුදු

තැන තිබුණ පැතලි කොටය එහෙමම තියෙනවා. ඔය දකුණු පැත්තෙ ඉදල බෙල්ල කපන්නෙ එක පහරින්. වදකයො එන්නෙ අර පැත්තෙ ඉදලා. බෙල්ල කැපිලා වැටෙන්නෙ අන්න අර වළට. අනේ ඔවා තියන්න එපා සුමල්. මෙතන දහස් දෙනෙකුගෙ හිස් ගසා දාලා තියෙනවා. ඒ බෙලි දහස වෙරළ දිගේ තියලා ප්‍රදර්ශනය කරලා තියෙනවා. පව්කාරයට ගල් ගහපල්ලා!

'ඔයා හොඳයි පර්යේෂකයෙකුට'

'පඩියක් නඩියක් ගෙවනවා නම්'

අපි දෙන්නම හිනාවුණා. ඒත් ඒ හිනාව හිරවෙනවා වගේ දැනුණා. සැප්තැම්බර් පළවැනිදට මෙතන මැරිච්ච අය වෙනුවෙන් උත්සවයක් පවත්තනවා කියලා කියපු සුමල් කිව්වෙ මිනිහෙක් මරපු හෘද සාක්ෂියෙන් කාටවත් බේරෙන්න බැහැ කියලා.

එතකොට මගේ කුසතුළ ඉන්න දරුවා අස්කරලා දැම්මා (අස්කරනවා කියන්නෙ මරනවා කියන එකමනෙ) කියන හෘද සාක්ෂියෙන් මට නිදහස් වෙන්න පුළුවන් වෙයිද? මේ හැමදේටම වඩා හොඳ සියදිවි නසාගන්න එක කියලා හදිස්සියෙ හිතුණා. ඔය දහස්ගණන් මිනිස්සු සියදිවි නසාගන්නෙ. යසුනුරි කවබතා සියදිවි නසාගත්තෙ. මං ඉබේම සන්ජෝ දුම්රිය පොළට ගියා. පූජ් කන්දට යන්න පුළුවනි. විදුලි දුම්රියේ නැගලා පූජ් කන්ද බලන්න යනවා. ඔකිගහාරා වනාන්තරය තියෙන්නෙ ජීවිතය එපාවෙච්ච අය වෙනුවෙන්. ජීවිතය එපා නම් බලහත්කාරයෙන් පවත්ත ගන්නෙ ඇයි. ටෝකියෝ බලා යන විදුලි දුම්රියේ නගින්න ප්‍රවේශ පත්‍රයක් මිලදී ගත්තා. අවසාන වශයෙන් කසුමිව දැකීමේ තදබල වුවමනාවක් හිතේ ඇති වුණා. නැහැ එතකොට හිත වෙනස් වෙයි. සියදිවි නසා ගැනීම වරදක් කියලා හිතෙයි. ආපහු හැරෙන්න සුදුසු නැහැ. විදුලි දුම්රිය, හිතගමන් කරනවටත් වැඩිය වේගයෙන් ගමන් කළා. කසුමි මොහොතින් මොහොත ඇස් ඉදිරියට පා[...]

[...] නැහැ කසුමි. අතහැර යන්න බැරි කසුවක් මම අතහැර යනවා [...]මයි. අරන් යන්න බැරි හින්දා. ඔයාගෙ ජීවිතය අයිති ඔයාටයි. [...]න්ගෙ අවුරුදු දාට මං එන්නම් ඔයා බලන්න. මගේ මුළු [?]ජීවිතයම, මගේ මුළු යොවුන කාලයම රැවටිලිවලින් පිරිලා තිබුණ. තවදුරටත් එහෙම රැවටිල්ලෙන් ජීවත් වෙන්න බැහැ කසුමි. [?]නුසන් කලලය ඔයාගේ සහෝදරයා නැත්නම් සහෝදරී. මගේ බඩ [?]නැගනවා කසුමි. බඩ ගිනියි. මට හොඳටම බඩගිනියි. ඒත් කව [?]මහ වෙලාවක් නෙවෙයි. මේ කලලය ආරක්ෂා කරගන්න කාටවත් වුවමනාවක් නැහැ. දරුවගෙ පියාට නැති වුවමනාව දරුවගෙ මවගෙ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයාට තියෙන්න බැහැනෙ. තිල මුද්‍රාව තියෙන්නෙ බිරිඳගෙ අයිතිය, ස්ත්‍රියකගෙ ශරීර අයිතිය හංවඩු ගහගන්න.

විදුලි දුම්රියෙ වේගය අතරින් තරුණ පිරිසකගෙ හිනා හඬ ඇහුණා. තරුණ පිරිස දුම්රියට කොහෙන් නැග්ගද කියලා [?]දන්නෙයක් නැහැ. ඔවුන් එකිනෙකාට සරදම් කරනවා. එයින් [?]එක්කෙනෙක් හිටපු හැටියෙ ගීයක පදයක් මුමුණන්න පටන් ගත්තා. ජීවිතය හුඟක් ලස්සනයි තමයි. තවදුරටත් තියාගන්න වටිනවා තමයි. ඒත් මගේ ජීවිතයෙ අභ්‍යන්තර හැලහැප්පීම් එක්ක සිංදු කියන්න, නටන්න බැහැ. තවදුරටත් ජීවත්වෙන්න බැහැ. මං වං උපදින්න ඉන්න දරුවා බාර ගන්නෙ නැහැ.

මම දුම්රියෙන් බැහැලා ඔකිගහාරා වනාන්තරය දක්වා ගමන් කළා. මහා ගැඹුරු මහා සංකීර්ණ වනාන්තරයක්. එතකොට මම සියදිවි නසාගන්නෙ කොයි ආකාරයටද? කන්දෙන් පහළට පැනලා? එල්ලිලා. එල්ලෙන්න පුළුවන් කොහොමද? එල්ලෙන්න ඕනකම හිතෙනවා නම් එල්ලෙන්න පුළුවන්. උගුරු දණ්ඩ කැඩිලා යනකොට රිදෙයිද? රිදුණත් එක සැරයනෙ. මරණාන්ත රිදීම අවසාන රිදීමද? නැහැ ඒක නව රිදීමක ආරම්භය. වනාන්තරයේ [...]යි ඇහෙන්නෙ. ගස් මහා හඬින් සර සර ගාන

වෙනුවෙන්ම නේද? ඇයි පාලනය කරගන්න බැරි වුණේ? පාලනය කරගන්න බැරි තරම් පීඩාවක්, වේදනාවක්, දුකක් හිත ඇතුළෙ තියෙනවා ඇති. පුංචි කාලෙ සියදිවි නසාගන්න හිතිලා නැද්ද? අවුරුදු දහතේදි බඩහැඩිබර වුණු අවස්ථාවේ සියදිවි නසාගන්න හිතුණනෙ. ඒත් සියදිවි නසා නොගත්තෙ අම්මලා ලැජ්ජාවට පත්වෙයි කියලනෙ.

ඔකිගහාරා වනාන්තරය මාව බොහොම සාදරයෙන් පිළිගත්තා.

අපි උදව් කරනවා. අපි උදව් කරනවා. කියලා මුළු වනාන්තරයම කෑගහන්න පටන් ගත්තා. ජීවිතේ එපාද? ජීවිතේ එපා වුණා නම් ඔබ වෙනුවෙන් ඔකිගහාරා වනාන්තරය ඔබගේ ජීවිතය අරගෙන රැකබලා ගන්නවා. කන්දෙන් පහළට පනිමු. නැත්නම් මහ ගහක එල්ලෙමු. පහසු කොයි එකද කියලා තමුන්ටම තෝරගන්න පුළුවන්. හිතට එකඟව තීරණයක් ගත්තු එක හොඳයි. එපා නම් මොකටද ජීවත් වෙන්නෙ. මනුෂ්‍යයෙකුට විඳවීමේ, දුක්විඳීමේ සීමාවක් තියෙනවා. ඒ සීමාවට එළඹුණාට පස්සෙ තීරණයක් ගන්න වෙනවා. එහෙම තීරණයක් ගන්න පුළුවන් වෙන එක නිර්භීත කමක්. දුප්පත්කමයි, අසාධාරණකමයි ලෝකෙ පුරාම තියෙද්දි දුප්පත්කමෙන් මිදෙන්න මං මගක් හොයමින් හිටියා. මං චං තමයි දේවදූතයා වුණේ. ඒත් ජපානයේ පොදු තත්ත්වය අරන් බැලුවහම මංචං පොහොසතෙකුත් නෙවෙයි. මම ඔකිගහාරා වනාන්තරයෙ ගහකොළ ඇති තැනක ඉඳගත්තා. කාටවත් පේන්නෙ නැහැ. අනික පෙනුණත් තවත් මං වගේම කෙනෙකුටනෙ. සියදිවි නසාගන්න හොඳම ක්‍රමය මොකද්ද කියලා අහන්න කෙනෙක් හිටියෙත් නැහැනෙ. මම හිටියේ සීතලෙන් ගැහෙමින්. ඉදිරියට යනවද ආපහු හැරෙනවද? මම දැන් මේ මොහොතෙ ඉන්නෙ මගේම ලෝකෙක.

මං චං මවාගත්ත ලෝකය, ඒ වහළය යටම ජීවත් වෙන මගේ ලෝකයට [illegible]

[illegible] කවුරු හරි ඇවිත් මගෙ සීතල වනාන්තර [illegible] කියලා බලාපොරොත්තුවකුත් හිතට ආවා. ඒත් කවුරුවත් නැහැ. වෙලාව ගතවෙනවා දැනෙන්න අතේ ඔරලෝසුවත් නැහැ. වනාන්තරය ගස් නිසා කොහොමත් අඳුරුයි. සරසර ශබ්දයි. [illegible] විලාප දෙන ශබ්දයයි. උරගයින් එහා මෙහා යන ශබ්දයයි ඇරුණාම මහා නිශ්ශබ්දතාවක මුළු වනාන්තරයම ගිලිලා ඉන්නෙ මගෙ හිතත් එක්කමයි. සන්තෝ නගරෙ සැරිසරන්නිය දැන් සියදිවි නසාගන්නට ප්‍රසිද්ධ වනාන්තරයෙ. ඒත් හිත බත්තරමුල්ලෙ සැරිසරන්න ගියා. බත්තරමුල්ල හන්දියෙ මේ මළත් බත්තරමුල්ල හන්දිය එහෙමම තියෙයි. දියුණුවක් නම් වෙයි. ඒත් බත්තරමුල්ල එහෙමමයි. නුගේගොඩ නාවල පාරෙ වෙළෙන්දෙ දිගටම නානකාමර කට්ටල විකුණයි. ජයනාථත් එක්ක ගිහින් බේරිලා එන්න බැරිවෙච්ච බංගලාවත් එහෙමම තියෙයි. ඔය වාසනා ජීවත් වෙන්නෙ. රංගන යන්න ගියාට එහෙ ජීවත් වෙනවානෙ. කවුරුවත් මැරුණට තව කෙනෙක් මැරෙන්නෙ නැහැ. මං චං මිනිය ලංකාවට අරින්න අදාළ එකක් නැහැ. අනික මිනියෙ සුනබුන් එකතු කරගන්න අමාරු වෙයි. චන්දනක්කා විලාප තියලා අඬයි දැන ගත්තොත්. අපේ පවුලෙ අය ආරෙට දිවි නසාගන්නවද කියලා පපුවෙ අත් ගහගෙන විලාප දෙයි. සුජාතක්කා පපුවෙ හිර කරගෙන දුක්විඳියි. රූබට් අයියා 'ඇයි බං නූපාට ආපහු ලංකාවට එන්න තිබුණනෙ. මං හදාගන්නවනෙ ඔය ළමයව' කියලා කියයි. මැරෙන්න ඉස්සරින් ලංකාවට රවුමක් ගියා හිතින්. මහගෙදරට. ඉස්කෝලෙට. නාන ළිඳට. සමූපකාර කඩේට. කොහිල කොටුවට. නුගේගොඩට. බත්තරමුල්ලට. මහ ඉස්පිරිතාලෙට. ප්‍රේමදාස මහත්තයා අර කතාව පවත්තපු වේදිකාව ළඟට. ජයනාථත් එක්ක ඇවිදගෙන ගිය වෝඩ් පෙදෙසෙ ඇස්වාට්ටුව කෙළවරේ ඉඳලා බොරැල්ල පන්සල කෙළවරට. බොරැල්ල හන්දියේ බෝගහ යටට ගිහින් බාරයක් වුණා [illegible]යම. ජයනාථගෙ කළලය නැතිකරන්න ඉස්සරින්, [illegible] එපා. බෝධිය වටේ [illegible]

සිරිමය එකඳිය නිළියෙකුයි - තරුවෙකුයි. දෙන්නා සිරිමය ප්‍රේමණීය විලාසයකින්. චිත්‍රපටිවල කතා ඇත්ත ජීවිතෙට වඩා සුන්දරයි කොහොමත්. නාට්‍යවල තදබදය තරියට. සන්තෝෂ නගරයටත් අවසාන වශයෙන් සිහින් එන්න ඕන. සන්තෝෂ නගරය මට ජීවිතයේ වටිනාම විත්තිය උන්නා. කුසුම්! කුසුමියි, සන්තෝෂ නගරයයි දෙකක් නොවෙයි එකක්. කුසුම් ඔයාට මමා නැතිවෙයි තමයි. මම කරන්නෙ වැරද්දක් තමයි. ඔයාට මමා කියලා ඉතුරුවෙන්නෙ සුන්දර සුවඳක් විතරයි. ඒ සුන්දර පොඩි මතක තියාගන්න එපා. ඔයා බිම් කරගන්න ඕනා පුද්ගලයෙක් කරලා, ඔයාව තුරුළු කරගෙන කිරි දීපු, ඔයා වෙනුවෙන් විශාල හිතක් තිබිච්ච අම්මාව මතකයෙ තියා ගන්න. ජීවිතේ අත්හැරලා ගියේ ඇයි කියලා පුන්නොට කවදා හරි ඔයාට උත්තර ලැබෙයි. සාප කරන්න එපා පැටියො. මගේ සුන්දර වෙච්ච සරීරය මලන්න ඔයා එන්න එපා පැටියෝ.

මම ලියුමක් ලියන්නෙ නැහැ. ලියුමක් ලියන්න ඕන හැමදේම මම කලින් හැමදෙනාටම කියලා තියෙනවා. [illegible] යන්න වේදනාවක් නැහැ. මම මගේ වේදනාව බෙදලා යන්නෙ නැහැ. ඒක මමම අරගෙන යන්නම්. මම කිසිදෙයක් ඉගෙන ගෙන නැහැ. මම ජීවිතය අත අරින්නෙ ආදරය වෙනුවෙන්ද, මං වෙනුවෙන්ද, කලලය වෙනුවෙන්ද, කුසුම් වෙනුවෙන්ද කියලා මම දන්නෙ නැහැ. සෝරා සාන් මට සමාව දෙයි. කරෝතෙ එකේ පැත්තක ඉඳගෙන සෝරා සාන් අඬයි. වතුරු වෙලා අඬයි. හොඳටම අඬයි. සෝරා සාන් නුඹ මගේ දෙවැනි අම්මා.

මම නැගිට්ටා. හිත වෙනස් වුණොත් ආපහු යන්න සිද්ද වෙනවා. වෙනස් කරගන්න තරම් ඉඩක් හිතට දෙන්න සූදානම් නැහැ. ඉතින් යමු. තව ටික දුරයි. හැමදේම ඉවරයි. සුමල් මහින්ද්‍රගෙ කුසේ පැන්සත් කරන්න සුජාත කලලය. මම මේ අවජාත කලලයත් එක්ක අතුරුදහන් වෙනවා.

මේ වනාන්තර [illegible]

[illegible] ඒ වේදනා [illegible] කොහෙන්ද? පරිසරය මාව වැළඳ ගන්නවා දැනුණා මට සිතුණියි.

මම දැනවීම් පුවරුවක් ළඟ නතර වුණා. මේ දූපත ගැනව පෙළස්කරන කරන දැනවීම් පුවරුවක්.

'මදකට නතරවෙන්න.

'ඇයිද්?'

'එමගේ අය ගොඩා දැම්මට අපට උදව් කළ හැකියි. ආපසු ගෙදර යන්න. අප අමතන්න'

දුරකතන අංකයකුත් සඳහන් කරලා තිබුණා.

'නිසැකයෙන්ම එමගේ අය මරින් අපි ඔබ නිදහස් කරමු'

මම ඉදිරියට ගමන් කළා. මේ අයගෙන් මාව නිදහස් කරන්න කාටවත් බැහැ. [illegible] බැරිය. මටා කිරීම. මගේ පරමේශ [illegible] නිදහස

ප්‍රේමය
ඇතිවෙන - නැතිවන
ස්වභාවයකි.
ජීවිතයද
ඇතිවෙයි - නැතිවෙයි
ඉඩදෙන්න
ජීවිතයට
ගලායන්න ගඟක් සේ
ගල් බොරළු
සිප සිප
ගලායන ජීවිතය
හරි ලස්සනයි
[illegible]සන

මග බලාගෙන ඉන්නවා
ආදරය කරන
හුග දෙනෙක්
එක්කෙනෙක් වෙනුවෙන්
හුග දෙනෙක්
අඬවන්න එපා
යන්න යන්න
ආපහු ගෙදර යන්න.

සියදිවි නසාගන්න යන අය ආමන්ත්‍රණය කරන දැන්වීම පුවරු දිගටම තිබුණා. මං සියදිවි නසාගන්නෙ ප්‍රේමය වෙනුවෙන්ද? ප්‍රේමය වෙනුවෙනුත් තමයි. ප්‍රේමය - ධරන ප්‍රේමය. එතකොට කසුමි වෙනුවෙන් වින ධරන ප්‍රේමය ප්‍රේමය නොවෙයිද?

'මම්මා හරි ලස්සනයි. මම්මාගෙ ඇඳුමත් ගොඩක් ලස්සනයි'

'කසුමිත් ලස්සනයිනෙ'

'මම්මා, මට වැඩිය ලස්සනයි. මට ගොඩක් ආදරේද?'

දවසක ඔයා ඇහුවා නේද මම්මා සුමල් අන්කල්ටත් ආදරේද කියලා. මට ආදරෙයි. පපාටත් ඒ වගේම ආදරේද? මම්මා අද රෑ ආපහු එන්නෙ නෑ කසුමි. කසුමි මග බලාගෙන ඉන්නවා. රෑ වෙනවා. මංචා කසුමිව සනසනවා. මම්මා එයි කසුමි. මම්මා එයි. ඒත් මම්මා එන්නෙ නැහැ. මම්මා ඒ වෙනකොට සුන්බුන් වෙලා කසුමි. හෙට උදේටත් එන්නෙ නැහැ. එන්න බැහැ. එතකොට සුන්බුන් විතරයි. ඔයාගෙ පපා, මම්මාව මුදලට ගත්තෙ. ගත්ත ගණන හරියටම දන්නෙ නැහැ. පපා ගණන කිව්වෙත් නැහැ. ඒජන්සිකාරයො කිව්ව ගණනක් දෙන්න ඇති. පින්තූර ගොඩකින් තෝරගෙන තිබුණෙ මාව. හෙට උදේ ඔයා අඬන්න එපා. මම්මාට එන්න විදිහක් නැහැ. මම්මා පුප් කන්දට ආවා. ඔතිගහාරා විනාශාන්තරය [illegible]

අයිති නැහැ. මම අයිති නැති දෙයක් මට අයිති නැතිවට කරදර කරනවා. ඔයාගෙ සහෝදරයා හරි සහෝදරී හරි වෙනුවෙන්. මං දෑස් දෙක පියාගන්නවා. තව මොහොතයි. අවසාන මොහොතෙ දැනෙන්නෙ මොනවද? දුකක්ද? වේදනාවක්ද? සතුටක්ද?

කසුමි මා ඉදිරියේ නෑ ගහලා අඬන්න පටන් ගන්නවා. විලාප දෙන්න පටන් ගන්නවා. ඔයාට පුදුමයක් නෑ මම්මා මාව අතර මං කරලා යන්න. පපා කියන්නෙ මම්මා නෙවෙයි. ඔයා වැරදි කෙනෙක් නෙවෙයි මම්මා. ඉපදුනෙත් නැති කෙනෙකුට ආදරේ කරන ඔයාට මාව අනාථ කරලා යන්න පුළුවන්ද? ඔයා මාව හදාගන්න කොච්චර වෙහෙසක් ගත්තද මම්මා? [illegible] මාව ගන්න දුන්නෙ නෑ නේද මම්මා? මම්මා කිව්වා නේද දුවෙක් [illegible] ලොකු වගකීමක් තියෙනවා කියලා. මිනිස්සු කියන්නෙ [illegible] කිව්වෙ. ඉතින් මේ සන්තෝෂ නගරය [illegible] නෑ කියලද කියන්නෙ? පපාට ඒ [illegible] මාව බේරගන්න බැරිවෙයි [illegible] මට [illegible]

කසුමි විලාප දෙමින් අඬන වැලපෙන සද්දෙට විනාශාන්තරය පුපි ගේ මහ පුළුගකට වගේ ඇහිරෙන්න වුණා. කසුමිගෙ විලාපයයි, ගහකොළවල විලාපයයි එකට මුසු වුණා.

'මාව බේරගන්න මම්මා' කියලා කසුමි කෑගහන සිහින් හඬ විනාශාන්තරය පුරා දෝංකාර දෙන්න වුණා. කසුමි [illegible] නෑ වල්ලේ කැරකිලා, කැරකිලා, කැරකිලා බිමට අත අදිනවා වගේ පෙනුණා. අත ඇරුණොත් බිම. එතකොට සුන්බුන් වෙන්නෙ මම නොවෙයි කසුමි.

අනේ කසුමි මම ආපහු එනවා කසුමි. මම ආපහු එනවා.

[illegible] වල්ලේ කැරකෙන්න පටන් ගන්නවා. කසුමි කඳුළුරේලේ [illegible]

'මගෙ දෝතට පනින්න කසුම්. බයවෙන්න එපා මගෙ දෝතට පනින්න'

කසුම් එකපාරටම කඳුවළල්ලෙන් පිටතට පනින්න සූදානම් වුණා.

'එපා එපා කසුම් පනින්න එපා. පනින්න එපා. වැටෙයි. තුවාල වෙයි. මොකක් වෙයිද දන්නෙ නෑ කසුම්. පනින්න එපා.'

කසුම්ව බේරගන්න. දුවන්න. පය පැකිලිලා වැටෙයි. බලාගෙන දුවන්න - දුවන්න - දුවන්න.

මගෙ තුරුලට දුවගෙන. දුවගෙන එන්න කසුම්.

ඉතින් නාඩා ඉන්න. මැරෙන්න බෑ. මැරෙන්න අවසර නෑ. මගත් දුර ගෙනල්ලා අත[illegible] වෙනුවෙන්. නුපන් දරුවෙ[illegible] ජීවිතේ සුන් කර ගැනීමෙයි තරාදිය දැන් මගේ අතේ.

උපන් දරුවටත්, නුපන් දරුවටත් අම්මා කෙනෙකුගෙ හිතේ වෙනසක් නෑ පුතේ!

12

මහ රෑ වෙලා. සන්ජෝ නගරයෙ දුම්රිය ස්ථානයෙන් බැහැලා මම පයින්ම ගමන් කළා. දිව්වා. හිත ඇතුළෙ ඉන්න අම්මා කිව්වෙ නැහැ දුවන්න එපා කලලය ගබ්සා වෙයි කියලා මහ සීතලේ. කමායක් නැහැ. අතුල් පතුල් පුපුරු ගෙනවා. ඒත් දුවනවා. කිරිකැටියෙක් ගෙදර බලාගෙන ඉන්නවා. ඒ කිරිකැටියගෙ අම්මා මැරෙන්නෙ නැහැ. මැරෙන්න බැහැ. පාර [illegible] බැරි [illegible] වෙලා. පාරවල් දිගේ දුවමු - දුවලා දුවලා යමු. සන්ජෝ නගරය නුමි තඩක් නොනගා බලාගෙන ඉන්නවා. සන්ජෝ නගරය සීතලට ගුලි ගැහිලා.

'මමා' කියලා කසුම් මාව බදා ගත්තා. අඬලා, අඬලා රතුවෙලා. සෙම, හොට්ටු, කඳුළු!

'රත්තරනෙ. මං ආදරෙයි මගෙ රත්තරනෙ' කියලා මං නොරක් නැතුව කසුම්ව සිපගත්තා. සුන්බුන් වෙන්න බැහැ. සුන්බුන් වෙලා බැහැ. මට වගකීමක් තියෙනවා කසුම් ඔයා වෙනුවෙන්. මට වගකීමක් තියෙනවා. කසුම් ඉකිගහන සද්දෙ ඇහුණෙ කනට නෙවෙයි පපුවටයි. කොහෙද ගියේ කියලා මං වං ඇහුවෙ නැහැ. කොහේ ගියත් කමක් නැද්ද මං වං. මහට ලෝකයේ තියෙන ඉහළම සතුට දුන්නෙ ඔයයි මං වං.

'කළලය අස්කරගන්න කැමතියි?'

'ඔව් මම කැමතියි'

සුමල්ට අයිති කළලය මං වංගෙ මුදලින් අස්කරන්න, මංවං විවාහයෙ නිල මුද්‍රාව තැබුවා. සුමල් මම මහන්සි වුණා මේ කළලය රැකගන්න. හුගක් මහන්සි වුණා. මේ කලලය බේර ගන්න ඔයා මට උදව් කළෙත් නැහැනෙ. දුක හිතෙනවා කියලා බොරුවට කියන්න එපා. ඔයාගෙ කලලය වෙනුවෙන් මම විතරක් නෙවෙයි කසුමිත් දුක් වින්දා. මං වං දුක් වින්දා. සෝරා සාන්, මං වං ඉදිරියෙ දණගහලා ඉල්ලුවා කලලය බේරලා දෙන්න, දරුවට උපදින්න ඉඩදෙන්න කියලා. ජපානයෙ රැඳිලා ඉන්න මට අවස්ථාවක් හොයන්න මට පිහිටවෙන්න කෙනෙක් හෙව්වා සුමල්. නීතියෙ රැකවරණය ලබා දෙන්න උත්සාහ කළා. ඔයා ඒ කලලය වෙනුවෙන් මොකවත් කළේ නැහැනෙ.

'මටයි කියලා ගෑනියෙක් ඉදිරිදි මං කරගත්තු දෙයක්'

ඔයා පසුතැවුණෙ ඔයාටයි කියලා හිටපු ගෑනි ගැනනෙ. ඔයාගෙ භාර්යාව ගැනනෙ. මගේ කුසතුළ ඉඳලා මගේ ස්වාමිපුරුෂයගෙ පිහිටෙන්, එළියට ඇදලා දාන, ඔය හැමදෙනාම අස්කරලා දානවා කියන අමුතු භාෂාවකින් කියන මිනීමැරුමට මං දැන් ලැස්තියි සුමල්. ඔයා එහෙම මරණයට ලක්වෙන දරුවගෙ පියා. ඔයා අහක බලාගෙන ඉන්නෙ ඔයාගෙ දරුවා වෙනත් කෙනෙකුගෙ මුද්‍රාව යටතේ අස්කරලා දානකම්.

ජපානයට එන හැමදෙනාටම මෙහෙම සිද්ද වෙන්නෙ නැති වුණත් බොහෝ දෙනෙකුට අඩු වැඩි වශයෙන් වේදනාවට පත්වෙන්න සිද්ද වෙනවා ඇති. රෝසි වගේම නයෝමිත් ජපානෙට එනකොට, නයෝමිගෙ වයස විසිතුනනෙ. නයෝමිගෙ ජපන් ජාතික ස්වාමිපුරුෂයට හතලිස් හයයි. නයෝමිගෙ පවුල් ජීවිතේ සාර්ථක නැහැ කියලා රෝසි කියනවා. රෝසිගෙ පවුල් ජීවිතේ සාර්ථක නැහැ කියලා නයෝමි කියනවා. [illegible]

සෝරා සාන් කසුමිව බලා ගත්තා. මගෙ ස්වාමි පුරුෂයා මංවං, කලලය අස්කරන්න මාව රෝහලට අරන් ගියා. මං වං මොන හිතකින්ද මෙහෙම කරන්නෙ? මං වංගෙ හිතේ මං ගැන තියෙන්නෙ ආදරයද අනුකම්පාවද? ඔයාගෙ දරුවා වෙනුවෙන් මං මගෙ කුස තුළ ඉන්න දරුවා කැප කරනවා. කසුමි ඔයාගෙ විතරක් නෙවෙයි. කසුමි ඔයාගෙයි මගෙයි දෙන්නගෙම.

'මගේ භාර්යාවගේ ජීවිතය ආරක්‍ෂා වෙයි නේද?' කියලා මං වං වෛද්‍යවරුන්ගෙන් පුන පුනා ප්‍රශ්න කළා.

'මසායා සාන් බයක් හිතට ගන්න එපා' වෛද්‍යවරු සහතික වුණා. මට මං වංගෙ හිත මගේ අතට අරගෙන බලන්න බැරි හැටි. මොන වගේ හැඟීමකින්ද මං වං කටයුතු කරන්නෙ?

'කාලෙකට පස්සෙ මේකෙ බලපෑමක් ඇතිවෙයිද?' මං වං ප්‍රශ්න කළේ පොතක ලියාගෙන ආපු ප්‍රශ්න වැලක්. වෛද්‍යවරු මං වං සමඟ දීර්ඝ ලෙස කතා කළා.

මගේ දරුවා, එයා සිටින ආරක්ෂිතම ස්ථානයෙන් ඇදලා එළියට දැම්මා. මාස තුනකට ටිකක් අඩු කලලය කෑලි කෑලිවලට කැඩි කැඩි එළියට ආවා. අනේ අම්මා ඇයි මට මෙහෙම කරන්නෙ කියලා මරණ බයින් තැති ගත්ත මගේ කිරිකැටියා අහන්න ඇති. ඒකට දෙන්න උත්තරයක් මට නැහැ මගෙ පුතේ. මම ගමන් කරපු මාර්ගයෙ වරදක් තිබුණා කියලා කවුරු හරි කියන්න ඉඩ තියෙනවා. ඒ ගැන මට කිසිදෙයක් කියන්න බැහැ. මගේ ගමන් මාර්ගය තීරණය කළේ, මගේ දෛවය වෙන්න බැරිද පුතේ? සුමල් වැරදිකාරයා කියලා හංවඩුවක් තියන්න ඇත්මම මම සූදානම් නැහැ. ඉදිරියට එහෙම හංවඩුවක් මගේ අතින් තැබෙන එකකුත් නැහැ. මගේ මහළු ස්වාමිපුරුෂයා ගැන මට මහ දුකක් ඇතෙනවා. වෛරයක් වගේම මෛත්‍රී සහගත හැඟීමකුත් ඇති වෙනවා. කලලයේ මරණයෙන් පස්සෙ මම මගේ ස්වාමිපුරුෂයත් [illegible] ගියා. මම මගේ දරුවා වෙනුවෙන්,

වරටත් කිව්වට ඒ වතාව අවසාන වතාව වෙන්න බැහැ. මට සමාවෙන්න පුතේ කියලා කිව්වෙ නැති වුණාට, මම මහන්සි ගත්තා පුතේ උඹව බේරගන්න කියලා මම නැවත නැවතත් කිව්වා. මං චං, කසුම්වත් අල්ලගෙන ඇතට වෙලා බලාගෙන හිටියා. මම අඬලා ඉවරවුණාට පස්සෙ මං චං ඇවිත් පහන පත්තු කරන්න උදව් කළා. කවදාහරි, කොහේහරි හොඳ තැනක උපදින්න පුතේ. ඔයා දැන් ගන්ධබ්බයෙක්නෙ. ඔයාට බැරිවෙයි නීතියෙන් විවාහවෙලා ඉන්නෙ කොයි අම්මා තාත්තාද කියලා තෝර බේර ගන්න. ඒත් පරිස්සම් වෙන්න. නීතියන් විවාහ නොවෙච්ච අම්මා කෙනෙකුගෙ කුස යහනට වඩින්න එපා. ඔයාට මෙහෙම අනතුරක් ජාති ජාතිවත් වෙන්න එපා කියලා මම මුළු සංසාරෙ පුරා පින්දෙනවා නුපන් පුතේ. මං චංගෙ ඇසෙ කඳුළු පිරිලා. මමායි, පපායි දෙන්නම අඬන්නෙ ඇයි කියලා ඔයාට කවදාහරි වටහ ගන්න පුළුවන් වෙයි.

'අරිගතෝ ගොසායිමස්' [illegible] මං චං [illegible] උරහිසින් අල්ලගෙන ස්තුති කළා. [illegible]?

'මේ ප්‍රශ්නය බේරගන්න හිත හදා ගත්තට'

මම කතා කළේ නැහැ. අපි පන්සලේ පඩි බැහැගෙන බැහැගෙන ආවා. කසුම්වත් කිසිදෙයක් කතා කළේ නැහැ. මහ ගස් සෙලවෙන ශබ්දය පමණක් ඇහුණා.

'අස් කළාද?'

දරුවගේ ස්වාභාවික පියා ප්‍රශ්න කළා.

'අස්කළා නෙවෙයි මැරුවා. මිනී මැරුමක් කළා.'

කිසිදෙයක් කර කියා ගන්න බැරි අසරණ බිළිඳු හැඩියෙක්. [illegible] කියලා [illegible] [illegible] රිදවලා රිදවලා කුසෙන් එළියට [illegible]

රූඩක නිළියකුයි එකතුවෙලා හදපු සෙල්ලම් බෝනික්කා ඉතින් නෑ. දැන් හිත සැහැල්ලුද?

'අපිට බැරිවුණානෙ දරුවා ආරක්ෂා කර ගන්න'

ඔහොම බොරු කරන්න එපා මිනිහෝ!

බලාගෙන මහින්ද්‍රගෙ බඩට අර දරුවා එන්න පුළුවන්. පරිස්සමින්.

මං චං මට ආදරයෙන් සලකන්න පටන් ගත්තා. ඒත් ඒ ආදරය වැළඳගන්න මගේ හිත සූදානම් නැහැ.

සුමල් පොලිසියට අහුවුණා. පොලිසියට අහුවුණේ තට්ටු නිවාසයේදීමයි. පිලිපීන ගැහැනියකගේ ස්වාමිපුරුෂයා ඔත්තුව දුන්නා කියලා රෝසි කිව්වෙ. කවුද දන්නෙ? සුමල් මහින්ද්‍රව [illegible] නෙවෙයි [illegible] හිත මොහොතක් [illegible] සුමල් මට [illegible] බව මම තේරුම් අරගෙන හිටියා. එකම අයිතිය, එකම බන්ධනය බිඳිලා ගියා.

පෙම්බරා ප්‍රේමය කියන්නෙ නොනවතින ප්‍රවාහයක් නෙවෙයි. මගේ පෙම්බරාට නමක් නෑ. මගේ හිත විතරක් හඳුනන පෙම්බරා. අහසෙ පලකයක් බැඳගෙන ඉන්න. මේ [illegible] ඇවිත් කිලුටු වෙන්න එපා. මගේ හිස පිරිමදින්න. ආදරෙයි කියන්න. මම සඳුන් තෙල් පහන දල්වනවා. සිතාර් වාදනය ඇහෙනවා නේද? මම මනසින් ඔයාව මුණ ගැසෙනවා. මේ මහ පොළව මත මට සොයාගත නොහැකිවූ ප්‍රේමය මම පලක් බැඳ සිටින ඔබ වෙතින් සොයා එනවා. සඳ පසුපස ඇවිදින් සඳ මෙන් සිසිල දෙන ඒ ප්‍රේමය සොයාගෙන මා එනවා.

මං චං මා පසුපසින් එන හඬ මට ඇහුණේ නැහැ. [illegible]
[illegible]

ආදරය කළේ සායෝ සාන්ට. තවමත් සොයා යන්නේ සායෝ සාන්ගෙ සෙවනැල්ලද?

නැහැ - මම කැමතියි නූපා සාන් වෙනුවෙන් සම්සෙන් වාදනය කරන්න.

මම මං චං සමීපයට ගියා. මගේ ජීවිතය මා කිසිත් නොදැන භාරදුන්නේ මේ මහළු පුරුෂයාටයි. මේ උන්මත්තක පුරුෂයාටයි. සත් මුහුදක් පිහිනා මා ආවේ නුඹගේ රැකවරණය ලබන්නටයි.

'වෙච්ච හැම දේටම සමාවෙන්න' මං චං ඉල්ලා සිටියේ ඇත් එක්කරමින්.


'මට හාද්දක් දෙන්න' මා දුබල හඬින් ඉල්ලා සිටියා.

'හාදු නම් කොච්චර දෙන්න බැරිද?'

'ඉතින් දෙන එකක්යැ'

මංචං වෙව්ලන ඇත් එක්කොට මගේ ඇත අල්ලාගත්තා. අතීතයයි අනාගතයයි බෙදා වෙන් කර ගන්නට අඳින ඉරක් මත අප දෙදෙනා ඔවුනොවුන් දෙස බලා සිටියා.

පෙම්බරා, ඔබ පලකය මත වැඩ හිඳින්න!



'සාරා' ලුවිස් ලෝරන්ස්ගේ 'Children of the Dust' නම් අතිශය ජනප්‍රිය නවකතාවක සිංහල අනුවාදයයි. පහළොස් වියැති 'සාරා' නම් ඇරිය, යුද්ධයක බිහිසුණු අත්දැකීම් මැද අන් අයගේ ජීවිත බේරා ගැනීම වෙනුවෙන් කැප වෙයි. කුඩම්මා කෙනෙකුගේ හදවත තමා වෙනුවෙන් සසල කරන්නට සමත් වන සාරා, යුද්ධයේ රුදුරු කම විසින් ගොදුරු කරගනු ලබයි. එහෙත් ඇය කුඩම්මාගේ දරුවන් දෙදෙනා වන විලියම්ට හා කැතරින්ට මෙන්ම කුඩම්මා වන වෙරෝනිකාටද, සනාසිපාවාටද දැක්වූ ආදරය මගින් මිහිමත වෙසෙන සියලු දෙනාව ශේෂ කර යන්නේ මනුෂ්‍යත්වයේ අප්‍රමාණ වූ ගුණ සමුදායයි.

කුඩම්මා කෙනෙකුගේ හදවත වෙනස් කළ දියණිය සාරා නම් වන්නීය.

සුමිත්‍රා රාහුබද්ධ

කන්දක් සේමා

නූපා ජපානයේ නීගතාවට යන්නේ [illegible] මල් පිපුණු අරුමය බලන්න නෙවෙයි.

තමුන්ගේ රටේ සමාජ ආර්ථිකයයි, සංස්කෘතියයි, දේශපාලනයයි නූපාව ජපානයට පිටුවහල් කරනවා.

නූපා, නීගතාවෙ සන්ජෝ නගරයෙ සැරිසරන්තිය වෙන්නෙ කවුරු හරි සොරා ගත්තු තමුන්ගෙ තරුණ ජීවිතය නැවත සොයා ගන්නයි.

සුමිකාවා පරම්පරාවෙ මළවුන් ඇවිත්, ලංකාවෙන් ආව ඥාතියා ප්‍රතික්ෂේප කළාට, සන්ජෝ නගරයෙ සැරිසරන්තිය - නගරයටයි, [illegible] සංස්කෘතියටයි බද්ධ වෙනවා.

[illegible] දෙකක් උපන් රටේදියි, දිග ගිය රටේදියි එළියට ඇදලා දානවා.

මෙ සැරිසරන්තිය සොයා යමු.

ISBN 978-955-1470-19-7